257 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 257 - இல. 3
**Volume 257 - No. 3**

**2017 නොවැම්බර් 20 වන සඳුදා**
2017 நவம்பர் 20, திங்கட்கிழமை
**Monday, 20th November, 2017**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**වරප්‍රසාද:**
පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දුරකථන ඇමතුම් පිළිබඳ විස්තර අනාවරණය කිරීම

**තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ විශේෂ කාරක සභාව**

**විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට ආනුෂංගික කරුණු විමර්ශනය කර වාර්තා කිරීම පිණිස වූ විශේෂ කාරක සභාව**

**විසර්ජන පනත් කෙටුම්පත, 2018 [නවවන වෙන් කළ දිනය]:**
[ශීර්ෂ 110, 205, 228-231, 233-235] (අධිකරණ); [ශීර්ෂ 195, 296] (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය) - කාරක සභාවේදී සලකා බලන ලදී.

**ආනයන හා අපනයන (පාලන) පනත:**
නියෝග

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**சிறப்புரிமை:**
பாராளுமன்ற உறுப்பினர்களின் தொலைபேசி அழைப்பு விபரங்களை வெளிப்படுத்தியமை

**நீடித்து நிலைக்கக்கூடிய அபிவிருத்திக்கான ஐக்கிய நாடுகளின் 2030 நிகழ்ச்சிநிரல் மீதான தெரிகுழு**

**வெளிநாட்டிலுள்ள இலங்கையர்களுக்கு எதிர்வரும் தேர்தல்களில் வாக்களிப்பதற்கு வாய்ப்பளித்தல் மற்றும் அவற்றின் இடைநேர்விளைவான விடயங்களை ஆராய்ந்து அறிக்கையிடுவதற்கான தெரிகுழு**

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2018 [ஒதுக்கப்பட்ட ஒன்பதாம் நாள்]:**
[தலைப்புகள் 110, 205, 228-231, 233-235 (நீதி); தலைப்புகள் 195, 296 (அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தகம்)] – குழுவில் ஆராயப்பட்டது.

**இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் (கட்டுப்பாடு) சட்டம்:**
ஒழுங்குவிதிகள்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

PRIVILEGE:
Disclosure of Telephone Call Details of Members of Parliament

SELECT COMMITTEE ON THE UNITED NATIONS 2030 AGENDA FOR SUSTAINABLE DEVELOPMENT

SELECT COMMITTEE TO LOOK INTO AND REPORT ON THE POSSIBILITY OF ENABLING SRI LANKANS EMPLOYED OVERSEAS TO EXERCISE THEIR FRANCHISE IN FUTURE ELECTIONS AND MATTERS INCIDENTAL THERETO

APPROPRIATION BILL, 2018- [Ninth Allotted Day]:
Considered in Committee – [Heads 110, 205, 228-231,233-235 (Justice); Heads 195, 296 (Development Strategies and International Trade) ]

IMPORTS AND EXPORTS (CONTROL) ACT:
Regulations

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2017 නොවැම්බර් 20 වන සඳුදා*

*2017 நவம்பர் 20, திங்கட்கிழமை*

*Monday, 20th November, 2017*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස්විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2017 නොවැම්බර් 18 වැනි දින ගරු කථානායකතුමා විසින් "අපරාධ වැළැක්වීමේ (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

### II

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීවරුනි, 2018 අය වැය කාරක සභා අවස්ථාවේ වැඩසටහනෙහි අමාත්‍යාංශ වැය ශීර්ෂ කිහිපයක් විවාදයට ගැනීමට නියමිතව තිබූ දිනයන් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේද අනුමතිය ඇතිව සංශෝධනය කර තිබෙන බැවින් එකී ප්‍රතිශෝධිත දිනයන් පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කිරීමට නිවේදනයක් කරනු කැමැත්තෙමි.

2017 නොවැම්බර් මස 18 වැනි සෙනසුරාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2017 නොවැම්බර් මස 20 වැනි සඳුදා එනම් අද දිනද;

2017 නොවැම්බර් මස 25 වැනි සෙනසුරාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2017 නොවැම්බර් මස 28 වැනි අඟහරුවාදාද;

2017 නොවැම්බර් මස 27 වැනි සඳුදා විවාදයට ගැනීමට නියමිතව තිබූ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2017 නොවැම්බර් මස 28 වැනි අඟහරුවාදාද;

2017 නොවැම්බර් මස 28 වැනි අඟහරුවාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ විදේශ කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2017 නොවැම්බර් මස 25 වැනි සෙනසුරාදාද;

2017 නොවැම්බර් මස 28 වැනි අඟහරුවාදා විවාදයට ගැනීමට නියමිතව තිබූ විදේශ රැකියා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2017 නොවැම්බර් මස 27 වැනි සඳුදාද,

2017 නොවැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා විවාදයට ගැනීමට නියමිතව තිබූ සංවර්ධන කාර්යභාර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 2017 නොවැම්බර් මස 25 වැනි සෙනසුරාදාද,

විවාදයට ගැනීමට නියමිත බවත්, එකී සංශෝධන ඇතුළත් ලේඛනයක් සෑම මන්ත්‍රීවරයෙකුගේම සහා මේසය මත තබා තිබෙන බවත් කාරුණිකව දන්වා සිටිමි.

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**
(மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி)
(The Hon. J.M. Ananda Kumarasiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වගන්තිය යටතේ නියෝග;

(ii) 2015 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව;

(iii) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iv) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ

(v) 2012 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව

මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා (අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා හා බුද්ධ ශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த - நீதி பிரதி அமைச்சரும் புத்தசாசன பிரதி அமைச்சரும்)
(The Hon. H.R. Sarathie Dushmantha - Deputy Minister of Justice and Deputy Minister of Buddha Sasana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවිස්සාවේල්ල, මාදොල, නිල්මිණි උයන, අංක 162/121/18 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.කේ. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොලොන්න, නව නගරය යන ලිපිනයෙහි පදිංචි ආරච්චිගේ ශිරානි දමයන්ති මැණිකේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රඹුක්කන යෝධගම, කොස්ගොල්ල යන ලිපිනයෙහි පදිංචි ජී.ජී. ප්‍රේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු තලතා අතුකෝරල මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ගාමිණී ලොකුගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 1 -112/'15-(2), ගරු බුද්ධික පතිරණ මහතා. සමාජ ප්‍රශ්න අහන්න ඔබතුමා හැම දාම උදෙන්ම එනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. ඇමතිතුමා ලංකාවේ නැහැ නේද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

Sir, on behalf of the Minister of Health, Nutrition and Indigenous Medicine, I ask for two weeks' time to answer that Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***

*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 2 -1153/'16-(2), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -1176/'16-(2), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා. - [බාධා කිරීමක්] උසින් අඩුයි තමයි. නමුත්, පාර්ලිමේන්තුවට එනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Public Enterprise Development, I ask for two weeks' time to answer that Question.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***

*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
( மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 4 -1199/'16-(2), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -1416/'16-(2), ගරු බන්දුල ගුණවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

### උමා ඔය ව්‍යාපෘතියෙන් පීඩාවට පත් ජනතාව : ජල පහසුකම් ලබාදීම
### உமா ஓயா கருத்திட்டத்தினால் பாதிப்புற்ற மக்கள் :நீர் வசதி வழங்கல்
### PEOPLE AFFECTED BY UMA OYA PROJECT: PROVISION OF WATER FACILITIES

1540/ '17

6. **ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ජල මූලාශ්‍ර සිඳී යෑමෙන් උඩපේරුව, අරාවත්ත, මකුල් ඇල්ල සහ එගොඩගම ඇතුළු බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව විශාල පීඩාවකට ලක් වී ඇති බව දන්නේද;

(ii) එම ජනතාවට පානීය හා වෙනත් ජල පහසුකම් ලබාදීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உமா ஓயா அபிவிருத்திக் கருத்திட்டம் காரணமாக நீர் மூலங்கள் வற்றியமையால் உடபேருவ, அராவத்த, மக்குல் எல்ல, எகொடகம உள்ளிட்ட பதுளை மாவட்ட மக்கள் பாரிய பாதிப்புக்கு உள்ளாகியுள்ளனர் என்பதை அறிவாரா;

(ii )மேற்படி மக்களுக்கு குடிநீர் மற்றும் ஏனைய நீர் வசதிகளை பெற்றுக்கொடுப்பதற்கு அமைச்சு எடுத்துள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply:

(a) Will he inform this House-

(i) whether he knows that the people living in the District of Badulla including the areas of Udaperuwa, Arawatta, Makul Ella and Egodagama have undergone much agony as a result of the water sources being dried up due to the Uma Oya Development Project; and

(ii) the steps taken by the Ministry to provide drinking and other water facilities to the aforesaid people?

(b) If not, why?

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)**

( மாண்புமிகு றவுப் ஹக்கீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)

(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) මකුල් ඇල්ල, කුරුඳුගොල්ල, වෙහෙරගල තැන්න ප්‍රදේශ ආවරණය වන පරිදි ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ජල ව්‍යාපෘති 03ක් සැලසුම් කොට පසුව එය එගොඩගම, හිල්ඔය, උඩපේරුව, පල්ලේපේරුව, කිතල් ඇල්ල යන ප්‍රදේශද ආවරණය වන පරිදි පුළුල් කර උමා ඔය ව්‍යාපෘති ප්‍රතිපාදන රුපියල් මිලියන 352ක මුදලකින් ඉදිකිරීම් ක්‍රියාත්මක කරන ලදී.

ජල සම්බන්ධතා 1,350ක ධාරිතාවය ඇති මකුල්ඇල්ල ජල යෝජනා ක්‍රමයද,

ජල සම්බන්ධතා 750ක ධාරිතාවය ඇති වෙහෙරගලතැන්න ජල යෝජනා ක්‍රමයද,

ජල සම්බන්ධතා 300ක ධාරිතාවය ඇති කුරුඳුගොල්ල ජල යෝජනා ක්‍රමයද යන යෝජනා ක්‍රම 03හි සියලු වැඩ අවසන් කොට ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**

( மாண்புமிகு சமிந்த விஜேசிறி)

(The Hon. Chaminda Wijesiri)

පිළිතුර සැපයීම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. එතුමා සඳහන් කළා, ව්‍යාපෘති ගණනාවකට උමා ඔය ව්‍යාපෘතියෙන් තමයි අරමුදල් සපයා ගත්තේ කියලා. අපි සතුටු වෙනවා, එසේ කරලා තිබෙනවා නම්. මම දන්නවා, ඒක අපේ රජය විසින් දරනවා කියන එක. ගරු ඇමතිතුමනි, ඔබතුමා පසු ගිය දිනෙක ඇවිල්ලා මේ ව්‍යාපෘති සියල්ල ජනතා අයිතියට පත් කළා. ඔබතුමාට ඒ ප්‍රදේශයේ ජනතාවගේ පීඩනය හා පීඩාව පිළිබඳ යථා තත්ත්වය හොඳට තේරෙන්නට ඇති. පවුල් 1,300ක ජල ව්‍යාපෘතියට දහදෙනායි සම්බන්ධ වෙලා තිබියේ.

ගරු ඇමතිතුමනි, එයට ප්‍රධානම හේතුව තමයි මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරලා ජනතා අයිතියට පත් කළාට, මෙම ජල සැපයුම් ලබා දුන් ගෙවල්වලටත් තවම ජල බවුසර්වලින් තමයි දෛනිකව වතුර සැපයීම කරන්නේ. ඔබතුමන්ලා දැවැන්ත වියදමක් දරා ලබාදුන් ජල සැපයුම තිබියදීත්, උමා ඔය ව්‍යාපෘතිය හරහා ජල බවුසර්වලින් තමයි තවම මුලින් පැවසූ පවුල් එක්දහස් ගණනක ජනතාවට සහ ඔය ජල ව්‍යාපෘති තුන තුළම කියැවෙන ජනතාවට අවශ්‍ය ජලය සපයන්නේ. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය යටතේ සිදු කරපු එම ව්‍යාපෘති තුනම අසාර්ථක ව්‍යාපෘති හැටියට මම යෝජනා කරනවා. ඔබතුමා ඒක පිළිගන්නවාද?

**ගරු රවුෆ් හකීම් මහතා**

(மாண்புமிகு றவுப் ஹக்கீம்)

(The Hon. Rauff Hakeem)

එහෙම නොවෙයි. අපිට ඒක පිළිගන්න බැහැ. තාවකාලික විසඳුමක් හැටියටයි අපි මේක කරන්නේ. විශේෂයෙන්ම මෙම ප්‍රශ්නයෙන් පීඩාවට පත් වූ ජනතාව වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාගේ නියෝගයක් යටතේ අප මැදිහත්වීමක් කළා. නමුත් මම කියා සිටින්න ඕනෑ, මෙම ගැටලුවට දීර්ඝ කාලීන විසඳුමක් ලෙස උමා ඔය ව්‍යාපෘතිය මඟින් ඉදිවෙන ඩයබරා ජලාශයෙන් ජලය ලබා ගෙන බණ්ඩාරවෙල, දියතලාව හා හපුතලේ කියන ප්‍රදේශ ආවරණය වන පරිදි ජල සම්පාදන ව්‍යාපෘතියක් පටන් ගැනීමට අප දැන් තීරණය කර තිබෙනවා කියන එක. මෙම යෝජිත ජල ව්‍යාපෘතිය මඟින් උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් පීඩාවට පත්ව ඇති සියලුම ප්‍රදේශ ආවරණය වෙන පරිදි, බණ්ඩාරවෙල, හපුතලේ, හාලිඇල, ඇල්ල සහ වැලිමඩ කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ග්‍රාම නිලධාරි වසම් 55ක ජනගහනය වන 110,000ක් සඳහා පානීය ජලය සැපයීමට අප යෝජනා කරලා තිබෙනවා. ඒක ඉතාම ඉක්මනින් ක්‍රියාත්මක වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**

( மாண்புமிகு சமிந்த விஜேசிறி)

(The Hon. Chaminda Wijesiri)

ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළ එම යෝජනා පිළිබඳවත්, එම යෝජනා ඉක්මනින් ක්‍රියාත්මක කරවීම පිළිබඳවත් ඇත්තටම සතුටු වන අතර, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මා ඉදිරිපත් කරනවා. ගරු ඇමතිතුමනි, ඒ තරම් දුර යන්න ඕනෑ නැහැ.

ඔබතුමාත්, අතිගරු ජනාධිපතිතුමාත් පසුගිය දිනක ඇවිල්ලා දෙමෝදර බදුල්ල ජල ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කළා. ඔබතුමා හිටපු නැති අවස්ථාවේ අපේ ගරු සභානායකතුමා මගේ ප්‍රශ්නයට පිළිතුරු දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වෙලාවෙත් මම මේ සම්බන්ධයෙන් කිව්වා. තවම වැඩ අවසන් වෙලාත් නැහැ. හාලි ඇල ප්‍රදේශයේ තමයි තවම බට එළාගෙන යන්නේ. හැබැයි, ජනතා අයිතියට පත් කළා. කමක් නැහැ. ගරු

[ගරු චමින්ද විජේසිරි මහතා]

ඇමතිතුමනි, දෙමෝදර ඉදන් ඇල්ල, මකුල් ඇල්ල, බණ්ඩාරවෙල කියන කොට්ඨාසවලට කිලෝමීටර දහයක්වත් නැහැ. මේ ව්‍යාපෘතිය එක්තරා දේශපාලන නායකයෙකුගේ,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතුරු ප්‍රශ්නය අහන්න තමයි හදන්නේ. එදා මම ප්‍රශ්නය අහපු වෙලාවේ ගරු ඇමතිතුමා හිටියේ නැති නිසා පැහැදිලි කිරීම සඳහා පුංචි කාලයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්නයෙන් පැන නැඟුණු කාරණයක් සම්බන්ධයෙන් තමයි ඔබතුමාට අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන් වන්නේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
පොඩ්ඩක් විස්තර කළොත් තමයි එය සාර්ථක වන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කාලය පිළිබඳ අවධානය යොමු කරන්න වෙනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය අපේ ප්‍රදේශයට බලපාන බරපතළ ප්‍රශ්නයක්. ඒක විසඳාගන්නයි පසු පෙළේ ඉඳගෙන මේ උත්සාහ දරන්නේ. ඔබතුමාත් ඊට සහයෝගය දෙන්න. එතුමා ප්‍රකාශ කළ විධියට පවුල් විශාල සංඛ්‍යාවකට මේ කාරණය බලපානවා. නමුත් තවම ඒ ප්‍රශ්නය විසඳා ගන්න බැරි වුණා. කැබිනට් අනු කමිටුවේ ගරු ඇමතිතුමාත් ඉන්නවා. මේ ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කරලා, මේ තුළින් මේ ජල සැපයුම් ටික ඔක්කෝම ලබා දෙන්න පුළුවන්, ගරු ඇමතිතුමනි. මම දන්නවා, ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක් බව. ඔබතුමාට කවුරුවත් මේ විධියට මීත් පෙර යෝජනා කරන්න නැතුව ඇති. අද නැවත වතාවක් මම යෝජනා කරනවා, දෙමෝදර බදුල්ල ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන්.

හාලි ඇල බට එළන එක දැන් නවත්වලා මා සඳහන් කරපු ගම්මානවලට මේ ජල ව්‍යාපෘති ටික කඩිනම්ව දෙන්න බැරිද? මොකද, ඉතා ළඟ තිබෙන්නේ. බට එළලා, ටැංකි හදලා දැන් ඔක්කෝම කටයුතු කරලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, connections ටික දෙන්න විතරයි තිබෙන්නේ. ඔබතුමාට එය කරන්න පුළුවන් නම්, අපේ ආගමේ විධියට ඔබතුමාට පින් සිද්ධ වෙනවා. ඔබතුමාගේ ආගම අනුව ඔබතුමාට දේවාශිර්වාදය ලැබෙන්න ඕනෑ.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)
මේ පවිත්‍රාගාරයේ වැඩ නිම වෙලා, අපට ඒ ව්‍යාපෘතිය භාර දුන්නාට පස්සේ තමයි මේ කටයුතු කෙරෙන්නේ. මේ හාලිඇල ව්‍යාපෘතිය ඇමෙරිකානු එක්සිම් බැංකුවෙන් ණය අරගෙන අපි ක්‍රියාත්මක කරපු ඉතාම උසස් අන්දමේ ජල ව්‍යාපෘතියක්. ඒක අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් එදා ආරම්භ කළා. හැම ජල ව්‍යාපෘතියකම යම් scope එකක් තිබෙනවා. හිටපු ගමන් ඒ scope එක වෙනස් කළාම අපට ඒ කොන්ත්‍රාත්තුවෙන් පිට යන්න වෙනවා. ඔබතුමා සඳහන් කරන ප්‍රදේශවලට අපි වෙන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන්න සූදානම්ව සිටින බැවින්, මේ පිළිබඳව සොයා බලා ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, විශාල ටැංකි ඉදි කරලා තිබෙන්නේ. ඒවාට ජල සැපයුම පමණයි දෙන්න තිබෙන්නේ. ඇත්තෙන්ම ඒක ඉතා ලේසි කාරණයක්. ඒකට අලුත් ප්‍රතිපාදන ඕනෑ නැහැ. ඔබතුමන්ලා ඒ ව්‍යාපෘතිය ජනතා අයිතියට පත් කළාට මකුල්ඇල්ල ප්‍රදේශයේ තිබෙන ජල ටැංකියට පොම්පාගාරයෙන් තවම ජලය පොම්ප කරන්නේ නැහැ. ඉතා ඉක්මනින් ඒ ටැංකියට ලබා දීලා මේ කටයුත්ත කරන්න පුළුවන්. ඒක ඇත්තටම ඔබතුමාට කරන්න පුළුවන් වැඩ පිළිවෙළක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please. The Hon. Speaker will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, කථානායකතුමා [ගරුකරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* SPEAKER [THE HON. KARU JAYASURIYA] *took the Chair.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7-1595/'17 (2), ගරු අශෝක ප්‍රියන්ත මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8-1615/' 17 (2), ගරු හේෂාන් විතානාගේ මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

## බදුවිලවත්ත ඉඩමේ සංචාරක නිවාස ව්‍යාපෘතිය: විස්තර

### பதுவிலவத்தவில் சுற்றுலாத்துறை வீடமைப்புக் கருத்திட்டம் : விபரம்

### TOURIST BUNGALOW PROJECT IN BADUWILA WATTA: DETAILS

1153/'16

2. **ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා වෙනුවට)**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. (Dr.) Nalinda Jayathissa)
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) හෝමාගම හා බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශ දෙකටම අයත් අක්කර 98ක වපසරියකින් යුත් බදුවිල වත්ත ඉඩමේ සංචාරක නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අනුමතිය ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගමේ නම හා ලිපිනය කුමක්ද;

(iii) එම නිවාස ව්‍යාපෘතිය හේතුවෙන් එම ප්‍රදේශයේ බලවත් පාරිසරික හානියක් සිදු වන බව දන්නේද;

(iv) එම නිවාස ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමතිය ලැබී තිබේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා පරිසර අධ්‍යයන වාර්තාවක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹோமாகம மற்றும் பண்டாரகம ஆகிய இரண்டு பிரதேச சபை ஆளுகைப் பிரதேசங்களுக்கும் சொந்தமான 98 ஏக்கர் பரப்பளவுகொண்ட பதுவிலவத்த காணியில் சுற்றுலாத்துறை வீடமைப்புக் கருத்திட்டமொன்றை செயற்படுத்த அங்கீகாரம் வழங்கப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், இக்கருத்திட்டத்தை செயற்படுத்தும் கம்பனியின் பெயர் மற்றும் முகவரி யாது;

(iii) இவ்வீடமைப்புக் கருத்திட்டம் காரணமாக இப்பிரதேசத்தில் பலத்த சுற்றாடல் பாதிப்பு ஏற்படுகின்றதென்பதை அறிவாரா;

(iv) இவ்வீடமைப்புக் கருத்திட்டத்துக்கு இலங்கை முதலீட்டு சபையின் அங்கீகாரம் கிடைத் துள்ளதா;

(v) இக்கருத்திட்டத்துக்குச் சுற்றாடல் ஆய்வறிக்கை தயாரிக்கப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Megapolis and Western Development:

(a) Will he inform this House -

(i) whether permission has been granted to implement a tourist bungalow project in the land called Baduwila Watta which is of 98 acres in extent that is situated in both Homagama and Bandaragama Pradeshiya Sabha areas;

(ii) if so, of the name and the address of the company that implements aforesaid project;

(iii) whether he is aware that a serious environmental damage is caused in the area due to aforesaid housing project;

(iv) whether the approval of Board of Investments of Sri Lanka has been granted for this housing project; and

(v) whether an environmental assessment report has been prepared in connection with aforesaid project?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මෙම ව්‍යාපෘතිය සඳහා මූලික සැලසුම් නිර්දේශ ලබා ගැනීම පිණිස නාගරික සංවර්ධන අධිකාරිය වෙත අයදුම් කර ඇත. ඒ සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශද ලබා ගත යුතුව ඇත.

(ii) ඇමරෝස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 8 A,
සර් අර්නස්ට් ද සිල්වා මාවත,
කොළඹ 07.

(iii) මධ්‍යම පරිසර අධිකාරිය විසින් පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් සකස් කිරීමට නියමිතව ඇත.

(iv) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇතිද යන්න පිළිබඳව විස්තර මෙතෙක් නාගරික සංවර්ධන අධිකාරියට ලබා දී නොමැත.

(v) මධ්‍යම පරිසර අධිකාරිය මඟින් පාරිසරික තත්ත්ව වාර්තාවක් සකස් කිරීම සිදු කළ යුතුව ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -1199/'16- (2), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## යෝජිත විනිමය කළමනාකරණ පනත: අරමුණු
### உத்தேச செலாவணி முகாமைத்துவச் சட்டம் :நோக்கங்கள்
### PROPOSED EXCHANGE MANAGEMENT ACT: OBJECTIVES

1416/'1

5. **ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා (ගරු බන්දුල ගුණවර්ධන මහතා වෙනුවට)**

(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில - மாண்புமிகு பந்துல குணவர்தன சார்பாக)

(The Hon. Udaya Prabhath Gammanpila on behalf of the Hon. Bandula Gunawardane)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2016 අය වැයෙහි අංක 199 යෝජනාවට අනුව, විනිමය පාලන පනත අහෝසි කිරීමට යෝජනා කිරීමේ අරමුණු කවරේද;

(ii) උක්ත අරමුණු ඉටු කර ගැනීමට අදාළ වන අයුරින් හඳුන්වා දීමට අපේක්ෂිත විනිමය කළමනාකරණ පනතෙහි අඩංගු වන ප්‍රධාන වෙනස්කම් කවරේද;

(iii) විනිමය කළමනාකරණ පනත මඟින් ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලාවෙහි ප්‍රාග්ධන ගිණුම විවෘත කිරීමට අදහස් කරන්නේද;

(iv) සාර්ක් කලාපය ඇතුළු දකුණු ආසියාතික රටවල ගෙවුම් තුලාවෙහි ප්‍රාග්ධන ගිණුම විවෘත කර ඇති රටවල් කවරේද සහ එම රටවල ඇති වූ විදේශ මූල්‍ය ප්‍රවාහ ප්‍රවණතා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தின் 199ஆம் இலக்க முன்மொழிவுக் கமைவாக செலாவணிக் கட்டுப்பாட்டுச் சட்டத்தை இரத்துச் செய்வதற்கு முன்மொழியப் பட்டதன் நோக்கங்கள் யாவையென்பதையும்;

(ii) மேற்படி நோக்கங்களை நிறைவேற்றிக் கொள்வதற்கு ஏற்புடையதாக அமைகின்ற வகையில் அறிமுகம் செய்வதற்கு எதிர்பார்க்கப் படுகின்ற செலாவணி முகாமைத்துவச் சட்டத்தில் உள்ளடங்குகின்ற பிரதானமான மாற்றங்கள் யாவையென்பதையும்;

(iii) செலாவணி முகாமைத்துவச் சட்டத்தின் மூலம் இலங்கையின் சென்மதி நிலுவையில் மூலதனக் கணக்கினைத் திறப்பதற்கு எதிர்பார்க்கப் படுகின்றதா என்பதையும்;

(iv) சார்க் வலயம் உள்ளிட்ட தெற்காசிய நாடுகளில் சென்மதி நிலுவையில் மூலதனக் கணக்கினைத் திறந்துள்ள நாடுகள் யாவையென்பதையும், அந்நாடுகளில் ஏற்பட்ட வெளிநாட்டு நிதிப் பாய்ச்சல் போக்குகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், என்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) the objectives of proposing to repeal the Exchange Control Act as per Proposal No. 199 of Budget 2016;

(ii) what main changes are included in the Exchange Management Act that is intended to be introduced so that the aforesaid objectives could be achieved;

(iii) whether the Capital Account of the Balance of Payment of Sri Lanka is intended to be opened through the Exchange Management Act; and

(iv) what South Asian countries including the SAARC region have opened the Capital Account of the Balance of Payment and what foreign cash flow trends were brought about by it in such countries?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 1. විදේශිකයන්ට ඉඩම් බදු දීමේදී පනවා ඇති බදු ඉවත් කිරීමට යෝජනා කරන අතර රට තුළට ආයෝජන ආකර්ෂණය කර ගැනීමට බාධාවක්ව පවතින (ඉඩම් බැහැර කිරීම්/ සීමා කිරීම) පනත යටතේ, හඳුනාගත් ආයෝජනවල හිමිකාරිත්වය සම්බන්ධයෙන් පනවා ඇති සීමා ඉවත් කිරීමට සලකා බැලීම.

2. විනිමය පාලනය, ආයෝජන ආකර්ෂණය කර ගැනීම සම්බන්ධයෙන් මත භේදයට තුඩු දී ඇති ප්‍රධාන කරුණකි. එබැවින්, අපැහැදිලි හා රළු පනතක් සේ සැලකෙන විනිමය පාලන පනත අහෝසි කිරීමට හා ආයෝජන හිතකාමී විදේශ විනිමය කළමනාකරණ පනතක් හඳුන්වා දීමට යෝජනා කිරීම මඟින් සාර්ක් කලාපයේ සහ ලෝකයේ අනිකුත් රටවලින් විදේශ විනිමය ආකර්ෂණය කරගැනීමට හැකි වනු ඇත.

3. විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන අය හා විදේශීය සමාගම් විසින් ලැයිස්තුගත කොටස්වල ආයෝජනවලින් ලැබෙන ලාභාංශ ආදිය ආදායම් බද්දෙන් නිදහස් කිරීමට කටයුතු කිරීම.

4. ආයෝජන මණ්ඩලය වෙනුවට පිහිටුවනු ලබන සංවර්ධනය සඳහා වන නියෝජිතායතනය විදේශ ආයෝජනයක් සඳහා වන ඉල්ලුම්පත් සම්පූර්ණ කර දින 50ක් තුළ වැඩ ආරම්භ කිරීම සහතික කරනු ඇත. ආයෝජන ප්‍රවර්ධනයට මෙය නිසැකයෙන්ම නැවුම් ප්‍රවේශයක් වනු ඇත.

(ii) ඇමුණුම්* අංක 01 මඟින් දක්වා ඇත. (ඇමුණුම 01 බලන්න.)

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(iii) ඔව්. දැනටමත් ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමට අවසර ලබා දී ඇත.

(iv) සෑම රටකම ප්‍රාග්ධන ගිණුම යම් සීමාවක් දක්වා විවෘත කර ඇත.

සාර්ක් කලාපය ඇතුළු දකුණු ආසියාතික රටවල ප්‍රාග්ධන ගිණුම සම්පූර්ණයෙන් විවෘත කර නොමැත.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -1595/'17- (2), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඇඹිලිපිටිය දැවි තෙල් විදුලි බලාගාරය: පරිසර හානිය
## எம்பிலிப்பிட்டிய எரி எண்ணெய் மின் உற்பத்தி நிலையம்:சுற்றாடல் சேதம்
## FURNACE OIL-RUN POWER PLANT IN EMBILIPITIYA: ENVIRONMENTAL DAMAGE

1665/'17

8. **ගරු බුද්ධික පතිරණ මහතා (ගරු හේෂාන් විතානගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு ஹேசான் விதானகே சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Heshan Withanage )
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දැවි තෙල් ආශ්‍රිතව විදුලි බලය නිපදවීමේ බලාගාරයක් ඇති බවත්;

(ii) මෙම බලාගාරයෙන් දැඩි පාරිසරික හානියක් සිදු වන බවත්;

(iii) මෙම බලාගාරය සඳහා පාරිසරික බලපත්‍ර ලබා දීම නිසි පරිදි සිදු නොවන බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) මෙම බලාගාරය අයත් සමාගම කවරේද;

(ii) මෙම සමාගම සමඟ ගිවිසුම්ගත කාල සීමාව කවරේද;

(iii) මෙම පාරිසරික හානිය අවම කර ප්‍රදේශයේ ජන ජීවිතයට සහනයක් සැලසීම සඳහා වැඩ පිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில், எம்பிலிப்பிட்டிய பிரதேச செயலாளர் பிரிவில் எரி எண்ணெய் சார்ந்ததாக மின்சாரம் உற்பத்தி செய்யும் மின்உற்பத்தி நிலையமொன்று உள்ளது என்பதையும்;

(ii) இந்த மின்உற்பத்தி நிலையத்தின் மூலம் பலத்த சுற்றாடல் சேதம் ஏற்படுகின்றது என்பதையும்;

(iii) இந்த மின்உற்பத்தி நிலையத்துக்கான சுற்றாடல் உரிமப்பத்திரம் உரிய முறையில் வழங்கப்படுவதில்லை என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) இந்த மின் உற்பத்தி நிலையம் உரித்தாயுள்ள கம்பனி யாது;

(ii) இக்கம்பனியுடன் உடன்படிக்கை செய்துகொண்டுள்ள கால எல்லை யாது;

(iii) மேற்படி சுற்றாடல் சேதத்தைக் குறைத்து பிரதேச மக்கள் வாழ்க்கைக்கு நிவாரண மளிப்பதற்கான வேலைத்திட்டம் ஒன்று உள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he admit that -

(i) a furnace-oil-run power plant is situated in Embilipitiya Divisional Secretary's Division in the Ratnapura District;

(ii) the aforesaid power plant causes a severe damage to the environment; and

(iii) issuing of the environmental protection licence for this powerhouse is not taking place in a proper manner?

(b) Will he inform this House -

(i) the name of the company to which the aforesaid power plant belong;

(ii) the period of time for which the agreement has been entered into with the aforesaid company; and

(iii) whether an arrangement is in place to minimize the damage caused to the environment in order to provide relief to the residents of the aforesaid area?

(c) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) නැත. BOI ආයතනයේ ලිපියෙහි 2 (a) පැහැදිලි කිරීමට (ඇමුණුම* A) සහ පරිසර ආරක්ෂණ බලපත්‍ර 03 අනුව, එම බලාගාරය මඟින් පරිසරයට දැඩි හානියක් ඇති විය නොහැක.

(iii) නැත. ඇමුණුම්** B, C සහ D අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර නිසි ආකාරව නිකුත් කර ඇත.

(ආ) (i) ඔව්. එම බලාගාරය වන්නේ ACE Power Embilipitya (Pvt) ලිමිටඩ් ය.

(ii) 2017 අප්‍රේල් 06 දින සිට 2018 අප්‍රේල් 05 දක්වා අවුරුද්දක කාලයක් සඳහා එම සමාගම සමඟ ලංවීම ගිවිසුමට එළඹී ඇත.

(iii) ඉහත (අ) (ii) සහ (iii) ප්‍රශ්නවල පිළිතුරු අනුව අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

## වරප්‍රසාද: පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දුරකථන ඇමතුම් පිළිබඳ විස්තර අනාවරණය කිරීම
## சிறப்புரிமை: பாராளுமன்ற உறுப்பினர்களின் தொலைபேசி அழைப்பு விபரங்களை வெளிப்படுத்தியமை
## PRIVILEGE: DISCLOSURE OF TELEPHONE CALL DETAILS OF MEMBERS OF PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, 2017 නොවැම්බර් මස 16වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද අපරාධ පරීක්ෂණ වාර්තාවක් විමර්ශන කොමිෂන් සභාව හමුවේ තබන ලදී.

මෙම වාර්තාව තුළ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ - කෝප් කමිටුවේ - සාමාජිකයන් 28දෙනාගේම දුරකථන ඇමතුම් පිළිබඳ විස්තර අන්තර්ගත විය.

මෙම වාර්තාව මඟින් පෙන්වන පරිදි සාමාජිකයන් පස් දෙනකු වෙත අර්ජුන් ඇලෝසියස්ගෙන් ඇමතුම් ලැබී ඇත.

මෙහි සැබෑ තත්ත්වය වනුයේ, අර්ජුන් ඇලෝසියස් විසින් තමාට පක්ෂව කෝප් වාර්තාවේ යම් වෙනස්කම් සිදු කිරීමේ අපේක්ෂාවෙන් මෙම සාමාජිකයන් පස් දෙනා අමතන ලද්දේ නම් ඔහු, ඔවුන් වෙතින් කිසිදු ආකාරයක අනුග්‍රහයක් ලබා ගැනීමට අපොහොසත් වී ඇති බවයි.

මෙම සාමාජිකයන් පස්දෙනා විසින් ද අත්සන් කරන ලද එක් ඒකමතික නිර්දේශයක් කෝප් කමිටුව විසින් ඉදිරිපත් කරන ලදී. එනම්, සියලු වැරදිකරුවන්ට එරෙහිව අවශ්‍ය කටයුතු කළ යුතු බවට සියලු දෙනා එකඟත්වයකට පැමිණීමයි.

කොමිෂන් සභාව වෙත පැවරී ඇති විධි නියෝගය වන්නේ කරුණු විමර්ශනය කොට වාර්තා කිරීමය යන්නද සිහිපත් කළ යුතුය. වාර්තා කිරීම පමණයි, ගරු කථානායකතුමනි.

එය අධිකරණයක් නොවන අතර, කිසිවකු කිසිදු වරදකට වරදකරු බවට හඳුනාගෙන නොමැත. අවම වශයෙන් මෙම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතරින් කිසිවකුට හෝ එරෙහි වූ කිසිදු කරුණක් සොයා ගෙන නොමැත.

මෙමඟින් අප වෙත පැන නඟින ප්‍රශ්නය වනුයේ, විශේෂයෙන් මෙම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දුරකථන වාර්තා රහසිගතව සටහන් කරන ලද්දේ කවරකුගේ උපදෙස් මතද සහ කවර අරමුණක් වෙනුවෙන්ද යන්නයි. මෙය වූ කලී පැහැදිලිවම මෙම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ කිරීමකි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා ඡන්දදායකයන් අතර සන්නිවේදන කටයුතු සිදු කිරීම මන්ත්‍රීවරයකු සතු වරප්‍රසාදයක් වන අතර, ඡන්දදායකයන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ මෙසේ සන්නිවේදනය කිරීමේ හිමිකම සුරකිනු පිණිස පරිපාලනමය ක්‍රියා මාර්ග ගනු ලැබූ අවස්ථා ද පවතී. දුරකථනය යනු ඡන්දදායකයකු හට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සමඟ සන්නිවේදන කටයුතු සිදු කිරීමේ මාධ්‍ය අතරින් එකක් ලෙස හඳුනා ගෙන ඇත.

මෙම තත්ත්වය තුළ කොමිෂන් සභාව විසින් කිසිදු නිගමනයකට පැමිණ නොමැත්තේය යන කරුණ සැලකිල්ලට භාජන කරන කල, මෙම තොරතුරු ප්‍රසිද්ධියට පත් කිරීම අතිශයින් වැරදි සහගත කාර්යයක් වේ.

එබැවින්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ නීතිපති දෙපාර්තමේන්තුව පවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ දුරකථන ඇමතුම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ප්‍රථම කථානායකවරයාගේ අවසරය ලබා ගත යුත්තේය යන්න අපගේ අදහසයි. මෙම කිසිදු දෙපාර්තමේන්තුවක් එම කටයුත්ත සිදු කර නොමැත.

මෙම තත්ත්වය නොලසකා, රහස්‍ය තොරතුරු පොදු මහජනතාවගේ දැන ගැනීම පිණිස හෙළිදරව් කොට ඇත. That is the point, Sir. තවද, මේ වන විට ජනමාධ්‍යද කඩිමුඩියේ මෙම තොරතුරු විෂයයෙහි විවිධාකාරයේ විකෘති කිරීම් හා අර්ථ දැක්වීම් සිදු කරමින් පවතී.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නා වශයෙන් ඔබතුමා විසින් මෙම කරුණ පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පක්ෂ නායක රැස්වීමක් කැඳවා, නම් සඳහන්ව ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ද ඇතුළත්ව සෙසු සියලු වගකිව යුතු පක්ෂද කැඳවා මෙම කරුණ පිළිබඳ විභාග කොට මේ අවස්ථාවේ දී සුදුසු යයි හැඟෙන්නා වූ පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමි. පාර්ලිමේන්තුවේ සභානායක හැටියට පක්ෂ භේදයකින් තොරව සියලු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කිරීම මගේ යුතුකමකි.

ගරු කථානායකතුමනි, අපි පරීක්ෂණවලට විරුද්ධ නැහැ. නමුත් මේ පරීක්ෂණවලින් ලැබෙන තොරතුරු රහස්‍යගතව තියා

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගන්න ඕනෑ. රහස්‍යගතව තබාගෙන, එම තොරතුරු Commission එකට භාර දෙන්න ඕනෑ. ඉන් පසුව, කොමිෂන් සභාවෙන් අධ්‍යයනය කරලා ඒ ගැන තීරණයක් දෙන්න පුළුවන්. අපි කියන්නේ ඒකයි. මෙම කාර්ය ප්‍රසිද්ධ කිරීමෙන් තමයි මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ කෙරෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි, ගරු සභානායකතුමනි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ සම්බන්ධයෙන්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පක්ෂ නායක රැස්වීමක් පවත්වන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, මෙය ඉතාම වැදගත් කාරණයක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සියලු මන්ත්‍රීවරුන්ට.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ඔව්. සියලු මන්ත්‍රීවරුන්ට. මන්ත්‍රීවරු සිර භාරයට ගන්නකොටත් ඔය තත්ත්වය තිබෙන්න ඕනෑ. අනෙක් එක, මේ කොමිෂන් සභාවෙන් මතු වුණා, හිටපු මුදල් ඇමතිතුමා සල්ලි ගත්තාය කියලා. එතුමා පිළිගත්තා, තමන් නොදැනුවත්ව ගත්තා කියලා. එතුමාගේ ගණකාධිකාරිවරයා පිළිගත්තා, පොත්පත්වල නැතුව සල්ලි ආවා කියලා. කෝ, ඒ ගැන විභාගයක්? දූෂණය, වංචාව ගැන කථා කරනවා. ඇමතිකමෙන් ඉවත් වුණාට හරි යන්නේ නැහැ නේ. ප්‍රසිද්ධියේ පිළිගත්තා, සල්ලි ගත්තා කියලා. තමන්ගේ නෝනා තට්ටු නිවාස ගත්තා කියලා. කෝ, විභාගයක්? නිකම් කාර් එකක් දුන්නාය කියලා මන්ත්‍රීවරුන්ව මාස ගණන් රිමාන්ඩ් බන්ධනාගාරගත කරනවා. නමුත් මේ සම්බන්ධයෙන් ක්‍රියා කරලා තිබෙනවාද? දැන් මෙතැන ඇවිල්ලා නිකම් නළවන්න හදනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අපි පක්ෂ නායක රැස්වීමක් කැඳවනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උදය ගම්මන්පිල මැතිතුමා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උදය ගම්මන්පිල මැතිතුමාට අවස්ථාව දෙනවා. ඊට පසුව ගරු රංජිත් සොයිසා මැතිතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා ඉදිරිපත් කළ ප්‍රකාශය වැරැදි සහ ගරු සභාව නොමඟ යවන සුළු ප්‍රකාශයක් වීම නිසා අපේ වරප්‍රසාද කඩ වෙනවා. මේක නොමඟ යවන සුළු ප්‍රකාශයක් වෙන්නේ කොහොමද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පැහැදිලි කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු සභානායකතුමා ප්‍රකාශ කළා, වැරැදිකරුවන්ට දඬුවම් ලබා දිය යුතු බවට COPE එකේ සියලුම සාමාජිකයන් ඒකමතිකව වාර්තාවක් ඉදිරිපත් කළා කියලා. එහෙම නොවෙයි, ගරු කථානායකතුමනි. මේ නිශ්චිත කාරණයට අදාළව සැකයට පාත්‍ර වී සිටින අර්ජුන් අලෝසියස් නමැති පුද්ගලයා සමඟ කෝප් එක පැවැති කාලයේ දුරකථන සබඳතා පවත්වපු පස් දෙනාගෙන් හතර දෙනෙකුම පාද සටහන් යොදමින්, වාර්තාව පිළිගැනීම ප්‍රතික්ෂේප කරමින්- [බාධා කිරීමක්]

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදයක් නොවෙයි. He gave his explanation.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පක්ෂ නායක රැස්වීමක්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පක්ෂ නායක රැස්වීමක් පවත්වනවා. I will get that done.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
Let me explain my point. Hon. Kiriella. I patiently listened to you. Please, do the same for me.

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

ගරු කථානායකතුමනි, COPE වාර්තාව ඒක මතික වාර්තාවක් නොවන බව අපි ඉතාම ගෞරවයෙන් සැල කරනවා. විශේෂයෙන්ම පාද සටහන් යොදමින් අර්ජුන් ඇලෝසියස්ට වාසිසහගත ලෙස හැසිරුණු මන්ත්‍රීවරු හතරදෙනෙක් බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් COPE එකේ පරීක්ෂණ සිදු කළ කාල සීමාව තුළ අර්ජුන් ඇලෝසියස් සමඟ දුරකථන සංවාදයේ යෙදී තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවධානය යොමු විය යුතු දෙවෙනි කාරණය මෙයයි. සමහර අයට අර්ජුන් ඇලෝසියස් සමඟ පෞද්ගලික සබඳතා තිබෙන්නට පුළුවන්. මොකද, අර්ජුන් ඇලෝසියස් හඳුනන අය ඕනෑ තරම් ඉන්න පුළුවන්. හැබැයි, මහ බැංකුවේ බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ කරන කාල වකවානුවේ තමන් COPE එකේ සාමාජිකයෙකුව සිටියදී අර්ජුන් ඇලෝසියස් සමඟ සමීප සම්බන්ධයක් තිබෙනවා නම්, ඒ මන්ත්‍රීවරයා කළ යුතුව තිබුණේ තමන් එක්ක තිබෙන බැඳියාවේ ගැටුම - conflict of interest - හෙළි කරලා එම කමිටුවේ විමර්ශනවලින් බැහැර වීමයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කරුණ අපි සාකච්ඡාවට ගන්නවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ඔබතුමා වහාම මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කළ යුතුයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.
ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரி. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා ඉදිරිපත් කළ කරුණු සම්බන්ධව මට අපැහැදිලි තැනක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාගෙන් පැහැදිලි කර ගන්නයි, මා මේ විමසීම කරන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ දුරකථන ඇමතුම්වලට හොරෙන් සවන් දීම, ඒ ගැන අධීක්ෂණයක් කිරීම වැරැදි දෙයක් හැටියට එතුමා අර්ථ නිරූපණය කළා. හැබැයි, මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ සාමාන්‍ය දුරකථන ඇමතුම් නොවෙයි. අර්ජුන් ඇලෝසියස් නැමැති බැඳුම්කර ගනුදෙනුවේ ප්‍රධාන චූදිතයා, මේ මන්ත්‍රීවරුන්ට කථා කරපු දුරකථන දත්තයි මේ හෙළිදරව් කරගෙන තිබෙන්නේ. ඒක එහෙමද, අනෙක් පැත්තද කියලා මා දැනගන්න කැමැතියි.

අනෙක් එක, ඔබතුමාගේ අනුමැතිය නොගෙන COPE එකේ මන්ත්‍රීවරුන්ගේ දුරකථන සංවාද පිළිබඳව හෙළිදරව් කර ගැනීම සම්බන්ධයෙන් ගරු සභානායකතුමාට බොහොම හිතේ අමාරුවක් ඇති වෙලා තිබෙනවා. එතකොට මේ පාර්ලිමේන්තුව තුළදී සභානායකතුමාම නේද කිව්වේ, කථානායකතුමාගේ අවසරය නැතිව හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු අත් අඩංගුවට ගන්න පුළුවන් කියලා. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු අත් අඩංගුවට ගන්න කොට සභානායකතුමාට "හ්ම්" කියන්නත්, අර පැත්තට ගන්නවා නම් මෙහෙමයි කියන්නත්, සභානායකතුමාගේ මේ නීතිය මොකක්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සම්බන්ධයෙන් අපි විවාදයක් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. [බාධා කිරීමක්] ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙතැන කවුරුවත් අත් අඩංගුවට අරගෙන නැහැ, ගරු කථානායකතුමනි. මෙතැන නඩුවක් නැහැ. කිසි කෙනෙක් වැරැදිකරුවකු කරලත් නැහැ. "කොමිෂන් සභාව" තොරතුරු ඒක රාශි කිරීමේ ක්‍රියා මාර්ගයක්. මම ඒකයි කියන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, අපේ ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාට මම අවස්ථාව ලබාදෙනවා. කෙටියෙන් කියන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම මතු කරන්නේ කරුණු දෙකයි. ඉන් පළමුවැනි කාරණය මේකයි. මේ කොමිෂන් සභාවේ කටයුතු තවම අවසන් නැහැ. කොමිෂන් සභාව තව කීදෙනෙක් කැඳවයිද කියා අප දන්නේ නැහැ. දෙවැනි කාරණය මේකයි. මෙතුමන්ලා කියන විධියට මන්ත්‍රීවරු කීපදෙනෙකුගේ දුරකථන තොරතුරු ගත්ත එක ප්‍රශ්නයක් නම්, ගරු කථානායකතුමනි ඔබතුමා ඇතුළු අපි 225දෙනාගේම ගනිමු කියලායි මම කියන්නේ. කිසිම ප්‍රශ්නයක් නැහැ එතකොට ඉවරයි නේ. ඕනෑ නම් ජනාධිපතිතුමාගේත් ගනිමු. එතකොට ඉවරයි නේ. අපි හය නැහැ.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩ වුණාය කියලා ගරු සභානායකතුමා කියනවා. මොන කරුණුද, මොන වරප්‍රසාද ද කඩ වෙලා තිබෙන්නේ කියා මේ ගරු සභාවට කියන්න කියා මම එතුමාට කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිබඳව සාකච්ඡා කරන්න අප පක්ෂ නායක රැස්වීමක් පවත්වනවා. මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් කළා නම් මට ඒවා හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න වෙනවා. මොකද, එහෙම කරන්න දෙන්න බැහැ. ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමා මොකක්ද කියන්නේ?

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, මට කියන්න තිබෙන්නේ, "අබ කෑ මිනිසුන්ගේ තමයි මොළය දන්නේ" කියන කථාව තමයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

## තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ විශේෂ කාරක සභාව
## நீடித்து நிலைக்கக்கூடிய அபிவிருத்திக்கான ஐக்கிய நாடுகளின் 2030 நிகழ்ச்சிநிரல் மீதான தெரிகுழு
## SELECT COMMITTEE ON THE UNITED NATIONS 2030 AGENDA FOR SUSTAINABLE DEVELOPMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That the Select Committee of Parliament on the United Nations 2030 Agenda for Sustainable Development, appointed by the Hon. Speaker, on 17th November, 2016, presented an Interim Report on its findings within the time limit granted by the motion agreed to by Parliament on 25th October, 2016 and that in terms of Standing Order No. 96, this Parliament do grant, an extension of time till 20th November 2018 to present the Final Report."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## විදේශගත ශ්‍රී ලාංකිකයන් හට ඉදිරි මැතිවරණවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති ඉඩකඩ සලසා දීමේ සහ ඊට ආනුෂංගික කරුණු විමර්ශනය කර වාර්තා කිරීම පිණිස වූ විශේෂ කාරක සභාව
## வெளிநாட்டிலுள்ள இலங்கையர்களுக்கு எதிர்வரும் தேர்தல்களில் வாக்களிப்பதற்கு வாய்ப்பளித்தல் மற்றும் அவற்றின் இடைநேர்விளைவான விடயங்களை ஆராய்ந்து அறிக்கையிடுவதற்கான தெரிகுழு
## SELECT COMMITTEE TO LOOK INTO AND REPORT ON THE POSSIBILITY OF ENABLING SRI LANKANS EMPLOYED OVERSEAS TO EXERCISE THEIR FRANCHISE IN FUTURE ELECTIONS AND MATTERS INCIDENTAL THERETO

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That in terms of Standing Order No. 96 of the Parliament, this Parliament do grant the Select Committee of Parliament to look into and report on the possibility of enabling Sri Lankans employed overseas to exercise their franchise in future elections and matters incidental thereto appointed by the Hon. Speaker, on 17th November, 2016, an extension of time till 20th May, 2018 as the Committee is unable to report its findings to Parliament within the time limit granted by the motion agreed to by the Parliament on 06th April, 2016."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## විසර්ජන පනත් කෙටුම්පත, 2018
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2018
## APPROPRIATION BILL, 2018

කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී. - [ප්‍රගතිය : නොවැම්බර් 18]
[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் மேலும் ஆராயப்பட்டது [தேர்ச்சி : நவம்பர் 18]
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered further in Committee - [Progress: 18th November]
[MR. SPEAKER in the Chair.]

### 110 වන ශීර්ෂය.- අධිකරණ අමාත්‍යවරයා
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන -පුනරාවර්තන වියදම, රු. 922,600,000

### தலைப்பு 110.- நீதி அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 922,600,000

HEAD 110. - MINISTER OF JUSTICE
Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 922,600,000

### 195 වන ශීර්ෂය.- සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.267,110,000

### தலைப்பு 195.- திறமுறை அபிவிருத்தி மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்
நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 267,110,000

HEAD 195. - MINISTER OF DEVELOPMENT STRATEGIES AND INTERNATIONAL TRADE
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 267,110,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අධිකරණ අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 110, 205, 228 සිට 231 දක්වා සහ 233 සිට 235 දක්වාද, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 195 සහ 296 සලකා බැලීම - පූර්ව භාග 10.00 සිට අපර භාග 12.30 දක්වා සහ අපර භාග 1.00 සිට අපර භාග 7.30 දක්වා. වැය ශීර්ෂ කපා හැරීමේ යෝජනාව ඉදිරිපත් කරන්නේ, ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා.

**[பி.ப. 9.58]**

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ தவிசாளர் அவர்களே, 2018ஆம் ஆண்டுக்கான ஒதுக்கீட்டுச் சட்டமூலம் தொடர்பாக, இன்றைய தினம் குழுநிலையில் விவாதத்திற்கு எடுத்துக்கொள்ளப்படுகின்ற அமைச்சுக்கள் மற்றும் அவற்றின்கீழ்வரும் திணைக்களங்கள்

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

மற்றும் நிறுவனங்களுக்குரிய 110, 205, 228, 229, 230, 231, 233, 234, 235 மற்றும் 195, 296 ஆகிய இலக்கங்களைக் கொண்ட செலவினத் தலைப்புக்களின் கீழான ஒவ்வொரு நிகழ்ச்சித்திட்டத்துக்குமுரிய அனைத்து மீண்டுவரும் மற்றும் மூலதனச் செலவின ஒதுக்கீடுகளிலிருந்து 10 ரூபாய் வெட்டப்படவேண்டும் எனச் சம்பிரதாயபூர்வமாக நான் முன்மொழிகின்றேன்.

மேலும், நீதி அமைச்சு, அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சு ஆகியன தொடர்பான இன்றைய குழுநிலை விவாதத்தினை ஆரம்பித்துப் பேச அனுமதித்தமைக்காக கௌரவ தவிசாளர் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

நீதி அமைச்சுத் தொடர்பில் இருந்துவந்த பல்வேறு விமர்சனங்களுக்கு மத்தியில், அண்மையில் புதிதாக ஒரு நீதியமைச்சர் நியமிக்கப்பட்டுள்ளார். கடந்த காலத்தில் வடக்கு, கிழக்கில் தமிழ் மக்களுடைய அரசியல் அபிலாசைகளை முன்னிறுத்தித் தமிழ் இளைஞர்கள் ஆயுதமேந்திப் போராடினார்கள். அதனால், தமிழ் மக்களுடைய விடுதலைக்காக, அரசியல் ரீதியாகப் போராட்டத்தில் பங்குபற்றியதற்காக, அதனை அடக்கியொடுக்கும் வகையில் அந்தக் காலத்திலிருந்த அரசாங்கங்கள் தொடர்ச்சியாகப் பயங்கரவாதத் தடைச் சட்டத்தை இந்த நாட்டில் அமுல்படுத்திக்கொண்டே வந்தன. ஆனால், ஆயுதப் போராட்டம் 2009ஆம் ஆண்டு மே மாதம் 18ஆம் திகதி யுத்தம் முடிவடைந்த பின்பும் அந்தப் பயங்கரவாதத் தடைச் சட்டம் இன்றுவரை, அதாவது 2017ஆம் ஆண்டு 11ஆம் மாதம் 20ஆம் திகதிவரை, நீடித்துக்கொண்டே இருக்கின்றது. யுத்தம் முடிவுற்று 8 ஆண்டுகளுக்கும் மேலாக பயங்கரவாதத் தடைச்சட்டம் இந்த நாட்டில் அமுலில் இருப்பதென்பது, ஓர் இன மக்களைத் தொடர்ந்தும் ஒடுக்குமுறையின்கீழ் வைத்திருப்பதற்காகத்தான் என நான் கருதுகின்றேன். அந்த விடயத்தை நான் இந்தச் சபைக்குத் தெளிவுபடுத்த விரும்புகின்றேன்.

யுத்தம் காரணமாக வடக்கு, கிழக்கிலிருந்து கிட்டத்தட்ட இருபது இலட்சம் தமிழ் பேசும் மக்கள் இடம்பெயர்ந்து, குறிப்பாக ஐரோப்பிய நாடுகளுக்குப் புலம்பெயர்ந்து, அந்த நாடுகளில் வாழ்கின்றார்கள். அவர்களுக்குத் தங்களுடைய பொருளாதாரத்தைத் தாய்நாட்டில் முதலிடுவதற்குத் தற்போது வசதியிருக்கின்றது. ஆனால், அவர்கள் தாயகப் பிரதேசத்துக்கு வந்து முதலீடுகள் செய்வதற்கு அச்சப்படுகின்றார்கள். அவ்வாறே இலங்கையில் பயங்கரவாதத் தடைச்சட்டம் அமுலிலிருக்கின்ற காரணத்தினால் வேறு பல முதலீட்டாளர்களும் இலங்கையில் வந்து முதலீடு செய்வதற்கு அச்சப்படுகின்றார்கள். ஏனென்றால், பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் சந்தேகத்தின் அடிப்படையில் ஒருவரைக் கைதுசெய்ய முடியும். ஆதாரமின்றிக் கைது செய்வதற்குரிய முழு அதிகாரமும் அந்தப் பயங்கரவாதத் தடைச்சட்டத்தின்கீழ் வழங்கப்பட்டிருக்கின்றது. 2015ஆம் ஆண்டு ஐ.நா. மனித உரிமைகள் பேரவையில் பயங்கரவாதத் தடைச் சட்டத்தை மிக விரைவில் நீக்கவேண்டுமென்று தீர்மானம் நிறைவேற்றப் பட்டது. ஆனால், இரண்டு வருடங்கள் முடிவடைந்தும் இன்னமும் அது நீக்கப்படவில்லை.

இந்த நாட்டில் யுத்தத்தால் பாதிக்கப்பட்ட பல விடயங்கள் இருக்கின்றன. தற்பொழுது இந்த நாட்டை அபிவிருத்தி செய்வதாக இருந்தால், இந்த நாட்டில் பயங்கரவாதம் இல்லையென்ற ஒரு செய்தியை சர்வதேசத்திற்குத் தெரிவிப்பதாக இருந்தால், முதலில் பயங்கரவாதத் தடைச் சட்டத்தை மிக விரைவில் நீக்கி, சர்வதேச விழுமியங்களுக்குட்பட்ட ஒரு சட்டத்தை இங்கு நடைமுறைப்படுத்த வேண்டுமென்பதை இன்றைய இந்த விவாதத்தில் முதலாவது கோரிக்கையாக கௌரவ நீதி அமைச்சர் அவர்களுக்கும் மேதகு ஜனாதிபதி அவர்கள், கௌரவ பிரதமர் உட்பட இந்த அரசாங்கத்திற்கும் விடுக்க விரும்புகின்றேன். அத்துடன், இந்தப் பயங்கரவாதத் தடைச்சட்டம் எப்போது நீக்கப்படும் என்ற விபரத்தையும் கௌரவ அமைச்சர் அவர்களின் பதிலுரையில் நான் எதிர்பார்த்து நிற்கின்றேன். இது என்னுடைய கருத்து மட்டுமல்ல, இலங்கையில் வாழுகின்ற சிங்கள மக்கள் உட்பட தமிழ் பேசும் மக்கள் அனைவரும் இந்தப் பயங்கரவாதத் தடைச்சட்டத்தை நீக்கவேண்டுமென்ற ஒரு மனநிலையில்தான் இருக்கிறார்கள். ஆகவே, இந்த நாட்டில் யுத்தமற்ற சூழ்நிலை தற்பொழுது நிலவிக்கொண்டிருக்கின்ற வேளையில், பயங்கரவாதத் தடைச்சட்டத்தை நீக்கி, நாட்டில் யுத்தமற்ற சூழல் நிலவுகின்றதென்ற செய்தியைச் சர்வதேசத்திற்குத் தெளிவுபடுத்த நீங்கள் முயற்சிசெய்ய வேண்டும்.

இந்தப் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைது செய்யப்பட்டவர்களில் சிலர் பாரிய குற்றங்களை இழைத்திருக்கலாம். ஆனால், யுத்த காலத்தில் போராளிகளுக்கு ஒருசில சிறிய உதவிகள் செய்த கிட்டத்தட்ட 132 பேர் குறிப்பாக, பாதை காட்டியவர்கள், சாப்பாடு கொடுத்தவர்கள்கூட இச்சட்டத்தின்கீழ் கைதுசெய்யப்பட்டு 10 வருடங்களுக்கு மேலாக இன்றும் சிறையில் இருக்கிறார்கள். அவர்களுடைய விடுதலை தொடர்பாக இந்தப் பாராளுமன்றத்தில் தமிழ்த் தேசியக் கூட்டமைப்பினரால் பல ஒத்திவைப்புப் பிரேரணைகள் கொண்டுவரப்பட்டிருக்கின்றன; பல கோரிக்கைகள் விடுக்கப்பட்டிருக்கின்றன. எனவே, அவர்கள் அரசியல் கைதிகள் என்ற வகையில், இது அரசியல் ரீதியாக அணுகவேண்டிய ஒரு விடயமென்பதால், தனியே சட்டத்தை மாத்திரம் பார்க்காமல், அவர்களை விடுதலை செய்ய சட்ட மாஅதிபர் திணைக்களம் மிக விரைவில் உரிய நடவடிக்கை எடுக்க வேண்டும்.

இந்த நாட்டில் போரற்ற சூழ்நிலையொன்று உருவாக வேண்டும்; தமிழர்களுக்கு எப்படிப்பட்ட தீர்வு கொடுக்க வேண்டுமென்று தமிழீழ விடுதலைப் புலிகளுடன் ஓர் அரசியல் தத்துவங்களுக்குட்பட்ட வகையில் இரண்டு அரசாங்கங்களும் - ஐக்கிய தேசியக் கட்சி அரசாங்கமும் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி அரசாங்கமும் - பேச்சுவார்த்தைகளை நடத்தியிருக்கின்றன. அந்தவகையில், அரசியல் கைதிகளின் விடுதலையை வெறுமனே பயங்கரவாதத் தடைச் சட்டத்தின் அடிப்படையில் பார்க்காமல், அரசியல் ரீதியாக ஒரு தீர்மானம் எடுக்கப்பட வேண்டும். அவர்கள் குற்றம் செய்யவில்லையென்று நான் கூறவில்லை. செய்த குற்றத்திற்குரிய தண்டனைக்கு மேலாக அவர்கள் தண்டனை அனுபவித்துக்கொண்டிருக்கிறார்கள் என்றுதான் நான் கூறுகின்றேன்.

அவர்களின் வழக்குகளை நடத்துவதற்கென அநுராதபுரத்தில் விசேட நீதிமன்றம் அமைக்கப்பட்டது. ஆனால், அங்கு சரியான முறையில் விசாரணைகள் நடைபெறுவதில்லை. நீண்டகால அடிப்படையில்தான் தவணை வழங்கப்படுகின்றது என்பதையும் நான் இந்த நேரத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். விசேட நீதிமன்றத்தில் கஞ்சா, 'குடு' போன்ற விசாரணைகளுக்கு முன்னுரிமை அளிக்கப்பட்டு, சம்பந்தப்பட்டவர்களை விடுதலை செய்கின்ற சூழ்நிலைதான் இருக்கின்றது. என்ன

காரணத்திற்காக விசேட நீதிமன்றம் உருவாக்கப்பட்டதோ, அதன் பயனை அரசியல் கைதிகள் அனுபவிக்கவில்லை. அவர்கள்மீதான வழக்குகளுக்கு நீண்ட காலத் தவணை வழங்கப்படுகின்றது. அரசியல் கைதிகளினுடைய விடுதலையில் சட்ட மாஅதிபர் திணைக்களமும் கௌரவ நீதி அமைச்சர் உட்பட சம்பந்தப்பட்டவர்களும் நெகிழ்வுத் தன்மையைக் கடைப்பிடிக்க வேண்டும். அவர்கள் விடயத்தில் அரசியல் ரீதியான ஒரு முடிவை மேதகு ஜனாதிபதி அவர்களுடைய பரிந்துரையின்கீழ் எடுக்க நீங்கள் முயற்சி செய்ய வேண்டும். அந்த வகையில், அவர்களுடைய விடுதலை உறுதி செய்யப்பட வேண்டுமென்று நான் இந்த நேரத்தில் கௌரவ அமைச்சர் அவர்களிடம் தயவாகக் கேட்டுக்கொள்கின்றேன். ஏனென்றால், நீண்ட காலமாக - 10 வருடங்களுக்கும் மேலாக - தங்களுடைய மனைவி, பிள்ளைகளைப் பிரிந்து அவர்கள் சிறைச்சாலைகளிலே இருக்கின்றார்கள். அவர்களுடைய வழக்குகள் சரியான முறையில் விசாரணை செய்யப்பட்டு ஜனநாயக ரீதியில் தீர்ப்பு வழங்கப்பட்டிருந்தால் இன்று அவர்கள் தங்களுடைய வீடுகளில் குடும்பத்தாருடன் வாழ்கின்ற சூழ்நிலையை எங்களால் உருவாக்கியிருக்க முடியும். அரசியல் கைதிகளுடைய மன நிலையை அறியாது போர்க் குற்ற உணர்வுகளைத் தூண்டுகின்ற வகையில் தொடர்ந்தும் செயற்பாடுகளை முன்னெடுத்துக் கொண்டிருந்தால் நல்லிணக்கம் ஏற்பட முடியாது. ஜனநாயக ரீதியில் அவர்கள் வாழ்வதற்குரிய வழிவகைகளை மேற்கொள்ள வேண்டும்.

இன்று நாட்டில் உள்ள பிரச்சினைக்கு அரசியல் தீர்வொன்றை முன்னெடுப்பதற்கு இரண்டு பிரதான கட்சிகளும் முயற்சி எடுத்து வருகின்ற நிலையில், ஒரு நல்லிணக்க அடிப்படையில் பயங்கரவாதத் தடைச் சட்டத்தை நீக்கி, அரசியல் கைதிகள் எதிர்பார்க்கின்ற தீர்ப்பு அவர்களுக்கு மிக விரைவில் கிடைக்க ஆவன செய்யவேண்டுமென்று நான் கௌரவ நீதி அமைச்சர் அவர்களிடமும் அரசாங்கத்திடமும் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ நீதி அமைச்சர் அவர்களே, வவுனியா நீதிமன்றத்தில் நடைபெற்று வந்த மூன்று அரசியல் கைதிகளுடைய வழக்கு விசாரணைகள் அநுராதபுர சிறைச்சாலைக்கு மாற்றப்பட்டது தொடர்பாக வடக்கு, கிழக்கிலிருக்கின்ற அனைத்து தமிழ் பேசும் மக்களும் இந்த அரசாங்கத்திற்கு ஒரு கோரிக்கையை முன்வைத்தார்கள். அவர்களுடைய வழக்கு விசாரணைகளைத் தொடர்ந்தும் வவுனியா நீதிமன்றத்திலேயே நடத்த வேண்டுமென்ற அவர்களுடைய கோரிக்கை நியாயமான ஒன்றாகும். அவர்கள் உண்ணாவிரதம் இருந்தார்கள்; வடக்கு, கிழக்கில் கடைகள் மூடப்பட்டு எதிர்ப்புத் தெரிவிக்கப்பட்டது; அவர்கள் சார்பில் கோரிக்கைகள் முன்வைக்கப்பட்டன. ஜனாதிபதி அவர்களிடமும் தங்களிடமும் விடுக்கப்பட்ட அந்தக் கோரிக்கைக்கு இன்றுவரையும் பதில் இல்லை. சாட்சி வழங்குபவர்களுக்கு வவுனியாவுக்கு வர முடியாதென்று காரணம் கூறி அநுராதபுரத்திற்கு அந்த வழக்கை மாற்றியிருக்கிறீர்கள். அப்படியானால், வவுனியாவுக்கும் அநுராதபுரத்துக்கும் இடையில் இருக்கின்ற வித்தியாசத்தை நீங்களே சர்வதேசத்திற்கு ஒரு செய்தியாகத் தெரியப் படுத்துகின்றீர்கள்! வவுனியா இந்த அரசாங்கத்தினுடைய கட்டுப்பாட்டில் இல்லையா? அங்கிருக்கின்ற நீதிமன்றம் உங்களுடைய கட்டுப்பாட்டில் இல்லையா? சாட்சி ஒருவர் அநுராதபுரத்துக்கு வர முடியுமென்றால் ஏன், அவரால் வவுனியாவுக்கு வர முடியாது? சாட்சிக்கு வவுனியாவுக்கு வருவதற்குப் பயம் என்றால் ஏன், அரசாங்கம் பாதுகாப்பு அளிக்க முடியாது? அந்த அரசியல் கைதிகளுக்குத் தெரியாத பாஷையில் அநுராதபுர நீதிமன்றத்தில் வழக்கு விசாரணைகள் நடைபெறுகின்றன. அவர்களுடைய சட்டத்தரணிகள் வவுனியாவில் இருக்கின்றார்கள். அவர்கள் அங்கு வருவதில்லை. சட்டத்தரணிகளுக்கு பிரச்சினை இருக்கின்றது. மிக முக்கியமாக மொழிப் பிரச்சினை இருக்கின்றது. சிங்கள மொழியில் விசாரணைகள் நடைபெறுகின்றபோது என்ன கதைக்கிறார்கள், தங்களுக்கு எதிராக என்ன குற்றச்சாட்டை முன்வைக்கிறார்கள், நீதிபதி தங்களுக்கு என்ன ஆலோசனை வழங்குகிறார் அல்லது என்ன தீர்ப்பு வழங்குகிறார் என்ற எந்தவொரு விபரமும் புரியாமல், வெளியில் வந்து என்ன நடந்தென்று கேட்கின்ற சூழ்நிலைதான் அநுராதபுரம் நீதிமன்றத்தில் இருக்கின்றது. ஆகவே, தயவுசெய்து அந்த மூன்று பேருடைய வழக்கையும் மீண்டும் வவுனியா நீதிமன்றத்துக்கு மாற்ற வேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ நீதி அமைச்சர் அவர்களே, அந்தக் கைதிகள் உண்ணாவிரதம் இருந்த வேளையில் எமது எதிர்க்கட்சித் தலைவர் கௌரவ இரா. சம்பந்தன் ஐயா அவர்கள் இச்சபையிலே ஓர் ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்திருந்தார். அந்த வேளையில் தாங்கள் இலங்கையிலில்லாது வெளிநாட்டில் இருந்தமையால், சட்டம் ஒழுங்கு அமைச்சர் சாகல ரத்நாயக்க அவர்களும் பிரதி நீதி அமைச்சர் மாண்புமிகு சாரதீ துஷ்மந்த அவர்களும் "மூன்று தினங்களின் பின்னர் நீங்கள் இலங்கைக்கு வந்தவுடன் சட்ட மாஅதிபரை இப்பாராளுமன்றத்துக்கு அழைத்து, எமது கட்சித் தலைவர், நீதியமைச்சர், சட்டம் ஒழுங்கு அமைச்சர் உட்பட்ட அனைவரும் ஒரு கலந்தாலோசனையை மேற்கொண்டு இவ்விடயம் தொடர்பில் ஒரு முடிவெடுப்போம்" என்று ஓர் உறுதிமொழியை வழங்கியிருந்தார்கள். ஆனால், இன்று வரையில் அவ்வாறான ஒரு கலந்தாலோசனை நடந்ததாகத் தெரியவில்லை.

கௌரவ நீதியமைச்சர் அவர்களே, எங்களுடைய மக்களுக்கிடையில் காணப்படுகின்ற முக்கிய பிரச்சினைகளில் ஒன்றாக இந்த அரசியல் கைதிகள் தொடர்பான விடயம் காணப்படுகின்றது. அவர்களை நாங்கள் ஜனநாயக வழிக்குக் கொண்டுவரவேண்டும். அவர்கள் குற்றமிழைத்திருந்தாலும் அவர்களுக்கு மேலதிகமான தண்டனைகள் வழங்கப் பட்டிருக்கின்றது. பலர் 10 வருட காலம் சிறைத்தண்டனை அனுபவித்திருக்கிறார்கள்; வேறு பலர் 15 வருட காலம் சிறைத்தண்டனை அனுபவித்திருக்கிறார்கள். கிட்டத்தட்ட 132 கைதிகள் மாத்திரம்தான் விசாரணைக்குட்படுத்தப்பட்டுத் தண்டனை வழங்கப்பட்ட கைதிகளாக இருக்கின்றார்கள். கௌரவ நிதியமைச்சர் அவர்களே, நாங்கள் இந்த வரவு செலவுத் திட்டத்தை ஆதரித்து வாக்களித்திருந்தோம். நாங்கள் எமது கிராமங்களுக்குச் செல்கின்றபொழுது அங்குள்ள எமது மக்கள் எங்களிடம், "இந்த மூன்று அரசியல் கைதிகள் விடயம் தொடர்பாக நீங்கள் ஏன் அரசாங்கத்துக்கு அழுத்தம் கொடுக்கவில்லை? அரசாங்கம் அது தொடர்பாக முடிவெடுக்காத சூழ்நிலையில் நீங்கள் ஏன் அரசாங்கத்துக்கு ஆதரவாக வாக்களித்தீர்கள்?" எனக் கேட்கின்றார்கள். மக்களுடைய இந்தக் கேள்வி நியாயமானதே. அந்த வகையில் எங்களுக்கு இந்த அரசியல் கைதிகளின் விடயம் தீர்வு காணப்படவேண்டியது மிக முக்கியமானது.

நாங்கள் அரசியல் தீர்வொன்றைப் பெற்றுக்கொள்ள வேண்டும் என்ற நோக்கத்துக்காக -இந்த இரண்டு பெரும்பான்மைக் கட்சிகளும் இணைந்திருக்கின்ற இச்சந்தர்ப்பத்திலே ஒரு தீர்வைப் பெற்றுக்கொள்ள வேண்டும் என்ற எமது கட்சியின் தலைவரது - இப்பாராளுமன்றத்தின்

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

எதிர்க்கட்சித் தலைவரது சிந்தனையின் அடிப்படையில் இணக்கப்பாட்டுடன் செயற்பட்டுக்கொண்டிருக்கின்றோம். ஆனால், இந்த அரசாங்கத்தினால் தீர்த்து வைக்கக்கூடியதாக இருக்கின்ற எங்களுடைய மக்களுடைய பல விடயங்கள்கூட அக்கறையின்றிக் கைவிடப்பட்டிருக்கின்றன. அவ் விடயங்களில் மிக முக்கியமானவை, பயங்கரவாதத் தடைச்சட்டத்தை நீக்குதல், அரசியல் கைதிகளின் விடுதலை, அதிலும் மிக முக்கியமாக 3 அரசியல் கைதிகளின் வழக்குகளை வவுனியா நீதிமன்றத்திலிருந்து அநுராதபுர நீதிமன்றத்துக்கு மாற்றப்பட்டமை தொடர்பான பிரச்சினை. இந்த மூன்று அரசியல் கைதிகளின் வழக்குகளையும் தாங்கள் சட்ட மாஅதிபருடன் கலந்தாலோசனை செய்து அவர்களுக்குத் தெரிந்த மொழியில் அவர்கள் நியமித்த சட்டத்தரணிகள் கடமையாற்றுகின்ற நீதிமன்றத்துக்கு மாற்றுவதற்குரிய நடவடிக்கை எடுக்கவேண்டுமென மீண்டும் கேட்டுக் கொள்கின்றேன். புதிதாக அவ்வழக்குகள் அநுராதபுர நீதிமன்றத்தில் ஆரம்பிக்கப்பட்டிருந்தால் நாங்கள் அது தொடர்பில் கேட்க வேண்டிய அவசியமில்லை. ஆனால், இவ்வளவு காலமும் வவுனியா நீதிமன்றத்தில் நடைபெற்ற வழக்கைத் தற்பொழுது இடைக்காலத்தில் அனுராதபுர நீதிமன்றத்துக்கு மாற்றுவது ஒரு ஜனநாயக விரோதச் செயல் ஆகும். ஆகவே, கௌரவ நீதி அமைச்சர் அவர்களே, இந்த விடயம் தொடர்பில் முக்கிய கவனமெடுத்து அதற்குரிய நல்ல தீர்வை விரைவில் வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அதேநேரத்தில், மாலைதீவு நீதிமன்றத்தினால் தண்டனை அளிக்கப்பட்ட 3 கைதிகள் இலங்கைச் சிறைச்சாலைக்கு அனுப்பிவைக்கப்பட்டார்கள். அவர்களுடைய தண்டனைக் காலம் 2017ஆம் ஆண்டு யூலை மாதத்துடன் முடிவடைந்து விட்டது. தண்டனைக் காலத்தை அனுபவித்து முடிந்த பின்னரும் அவர்கள் தொடர்ந்தும் சிறைத் தண்டனையை அனுபவித்துக்கொண்டிருக்கிறார்கள். கௌரவ நீதியமைச்சர் அவர்களே, இது நியாயமான விடயமா? இது அரசியல் யாப்புக்கே முரணான விடயமல்லவா? மூன்று நபர்களுக்கும் ஒரு நீதிமன்றத்தினால் அளிக்கப்பட்ட தீர்ப்பின் பிரகாரம் அவர்களது தண்டனைக் காலம் முடிந்த பின்னரும் அவர்களை விடுதலை செய்யாமல் இன்றுவரையில் தொடர்ந்தும் சிறையில் வைத்துக்கொண்டிருக்கின்றார்கள். இவ்விடயம் தொடர்பில் நான் நீதி அமைச்சராகிய உங்களுக்குக் கடிதம் அனுப்பியிருக்கிறேன். அவ்வாறே, சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்ற அமைச்சருக்கும் கடிதம் அனுப்பியிருக்கிறேன். அதற்கு சிறைச்சாலைகள் அமைச்சர் அவர்கள், தங்களுக்கு மாலைதீவிலிருந்து வந்த சட்டக் கோவையானது - அந்த நீதிமன்றத்தின் தீர்ப்பானது - அந்த நாட்டின் மொழியிலே அனுப்பப்பட்டிருக்கிறது; தற்பொழுது, அது மொழிபெயர்ப் புக்காக வெளிநாட்டலுவல்கள் அமைச்சுக்கு அனுப்பப் பட்டிருக்கிறது; எனினும், 04 மாதங்களாகியும் இன்னமும் அதன் மொழிபெயர்ப்புத் தங்களுக்குக் கிடைக்கவில்லை என்று குறிப்பிட்டிருக்கிறார்.

நான் நீதி அமைச்சர் அவர்களைக் கேட்க விரும்புகின்றேன், இது சட்டத்திற்கு விரோதமான செயலா, இல்லையா? என்று. அவர்கள் 10 வருடங்களாகச் சிறையிலே இருக்கிறார்கள். வெளிநாட்டலுவல்கள் அமைச்சுக்கு அனுப்பியிருந்த அவர்களுடைய fileஐ ஏன், இவ்வளவு காலமும் மொழிபெயர்ப்பு செய்து பெற்றுக்கொள்ளவில்லை? நான் இது தொடர்பில் இப்பாராளுமன்றத்தில் கேள்வி கேட்ட பின்புதான், அந்த fileஐ மொழிபெயர்ப்புக்காக வெளிநாட்டலுவல்கள் அமைச்சுக்கு அனுப்பியிருக்கிறார்கள். நான் இவ்விடயம் தொடர்பில் கடந்த ஜூலை மாதம் முதல் கேட்கின்றேன். அதாவது, அவர்களது தண்டனைக் காலம் முடிந்த நாள் முதல் இப்பாராளுமன்றத்தில் சுட்டிக்காட்டி வருகின்றேன். வெளிநாட்டலுவல்கள் அமைச்சுக்கு அனுப்பி 04 மாதங்களாகியும் இன்னமும் அது மொழிபெயர்க்கப்பட்டு வரவில்லை. அது கிடைத்தவுடன் அதனைப் பார்த்துத்தான் அவர்களை விடுதலை செய்ய முடியும். எனவே, தங்களது தண்டனைக் காலம் முடிந்தும் சிறையில் இருக்கின்ற அந்த 03 கைதிகளினது fileஐ மிக விரைவில் மொழிபெயர்ப்பு செய்து, அவர்களுடைய விடுதலையைத் துரிதப்படுத்துவதற்கான முயற்சியை எடுக்கவேண்டும் என்று கௌரவ நீதி அமைச்சர் அவர்களிடம் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் முயற்சி செய்தால் இந்த வரவு செலவுத் திட்டம் நிறைவேற்றப்படுவதற்கு முன்பு அவர்களை விடுதலை செய்ய முடியும். நீங்கள் வெளிநாட்டலுவல்கள் அமைச்சுடன் தொடர்புகொண்டால், அதன் மொழிபெயர்ப்பை உடனடியாக உங்களால் பெறமுடியும். இன்றோ, நாளையோ அதற்கான முயற்சிகளை எடுத்து, அதன் மொழிபெயர்ப்பைப் பெற்று, அவர்களை மிக விரைவில் விடுதலை செய்யவேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அந்த 03 கைதிகளில் ஒருவரான யோகராசா என்பவர் திருமணம் முடிப்பதற்குக் காத்திருக்கிறார். எங்களுடைய அரசியல் கைதிகளின் மனவேதனை, அவர்கள் சார்பாக அவர்களுடைய உறவினர்கள் படுகின்ற வேதனை என்பவற்றுக்குக் காரணம் ஒவ்வொரு அரசாங்கமும் காட்டுகின்ற சின்னச்சின்ன அலட்சியங்கள்தான். கௌரவ நீதி அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயத்தை மிக முக்கியமாகப் பார்க்கவேண்டும். அவர்கள் தங்களது தண்டனைக் காலம் முடிந்தும் சிறையில் இருப்பதென்பது சட்ட விரோதமானது. இலங்கையின் சட்டவிதிகளை, அரசியல் யாப்பின் விதிகளை அமுல்படுத்தவேண்டியது நீதியமைச்சின் கடமை. அந்த வகையில் நான் இங்கு குறிப்பிட்ட விடயங்கள் மிக முக்கியமானவை.

இன்று நான் இங்கு குறிப்பிட்ட விடயங்களுக்கு அப்பால், யுத்தத்துக்குப் பின்பு எங்களுடைய மக்கள் பல்வேறு வகையிலும் துன்பங்களை அனுபவித்துக்கொண்டிருக் கிறார்கள். நீங்கள் வெறுமனே வாயினால் 'நல்லாட்சி' என்று கூறுவதில் அர்த்தமில்லை. அதற்காக நல்லிணக்கம் ஏற்படக்கூடிய வகையில் செயற்பாடுகளை முன்னெடுக்க வேண்டும் என்று நான் இந்த நேரத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இந்த வரவு செலவுத் திட்டத்தின் 2ஆம் பின்னிணைப்பில் 188, 189 ஆகிய இலக்கங்களின்கீழ் காட்டப்பட்டுள்ள முன்மொழிவுகளின் நிறைவேற்றத்துக்கான பொறுப்பு நீதிக்குப் புறம்பான முறையில் வழங்கப்பட்டிருக்கின்றது. அதாவது, ஓர் அமைச்சுடன் சம்பந்தப்பட்ட வேலைத்திட்டத்தை மேற்கொள் வதற்காக இன்னோர் அமைச்சுக்கு நிதி ஒதுக்கப்பட்டிருக்கிறது. 2015ஆம் ஆண்டு கௌரவ மைத்திரிபால சிறிசேன அவர்கள் ஜனாதிபதியாகத் தெரிவுசெய்யப்பட்டதன் பின்பு, எந்தெந்த அமைச்சுக்குக்கீழ் என்னென்ன அரச நிறுவனங்கள் வருகின்றன என்பது தெளிவாகக் குறிப்பிடப்பட்டு இருக்கின்றது. குறித்ததோர் அமைச்சுடன் சம்பந்தப்படாத வேலைத்திட்டங்களை அந்த அமைச்சுக்குக் கொடுப்பதானது சட்ட விரோத செயல்; அரசியல் யாப்புக்கு முரணான செயல். இந்த விடயம் தொடர்பில் நாங்கள் கௌரவ பிரதமருடன் கதைத்திருக்கிறோம். அவர் இதற்கு நல்லதொரு பதிலைத்

தருவதாகக் கூறியிருக்கின்றார். இருந்தாலும், இது நீதி சம்பந்தப்பட்ட விடயம் என்றபடியினால், நான் இதை உங்களின் கவனத்துக்கும் கொண்டுவருகின்றேன்.

கௌரவ நீதியமைச்சர் அவர்களே, இன்று நீங்கள் இந்த நாட்டில் நீதியமைச்சராகப் பொறுப்பேற்றிருக்கின்றீர்கள். நீங்கள் பதவியேற்ற பின்பு சில முன்னேற்றகரமான விடயங்கள் நடைபெறுவதை நான் அவதானித்திருக்கின்றேன். அதற்கு முன்னர் நிகழ்ந்த ஒரு சிறிய விடயத்தை உதாரணமாகச் சொல்கின்றேன். நான் பாராளுமன்ற உறுப்பினராகத் தெரிவுசெய்யப்பட்ட பின்னர் சமாதான நீதவான் பதவிக்குரிய சில படிவங்களை நிரப்பி உரிய இடத்திற்கு அனுப்பியிருந்தேன்; அந்த விண்ணப்பதாரர்களில் ஒருவர் இரண்டு மாதங்களுக்கு முன்பு இறந்தும்விட்டார். அந்த விண்ணப்பங்கள் எதுவும் அனுமதிக்கப்பட்டதைப் பற்றி எங்களுக்குச் சம்பந்தப்பட்ட அதிகாரிகள் அறிவிக்கவில்லை; அவர்கள் அதற்குரிய தரவுகளை எங்களிடம் கேட்பதுமில்லை. குறித்த காரியாலயத்திற்கு நாங்கள் போய்க் கேட்டாலும் சரியான பதில் கிடைப்பதில்லை. ஆனால், நீங்கள் நீதியமைச்சராக வந்த பின்பு உங்களுடைய அமைச்சில் பல மாற்றங்கள் நடைபெற்றிருக்கின்றமையை நான் அங்கு சென்றபோது அவதானித்தேன். இப்பொழுது அங்கு பாராளுமன்ற உறுப்பினர்களுடைய விடயங்களைத் தனித்தனியாகக் கையாளுகின்றார்கள். அந்த வகையில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

முன்னர் குறிப்பாக தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்கள் அங்கு சென்றால் அவர்களுக்குச் சில அதிகாரிகள் மதிப்புக் கொடுப்பதில்லை. மட்டக்களப்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் கௌரவ யோகேஸ்வரன் அவர்கள் என்னிடம் ஒரு நாள் ஒரு விடயத்தை முறையிட்டிருந்தார். அதாவது, தன்னுடைய ஒரு விடயம் சம்பந்தமாகத் தான் அங்கு சென்றபோதிலும் அது நடக்காததனால் குறித்த அதிகாரியுடன் முரண்பட்டுக்கொண்டு வந்ததாகச் சொன்னார். எனவே, அமைச்சுக்களின் அதிகாரிகள் பாரபட்சமற்ற முறையில் நடக்கின்றார்கள் என்பதைத் தாங்கள் உறுதிப்படுத்த வேண்டும். குறித்த அதிகாரிகள் 225 பாராளுமன்ற உறுப்பினர்களையும் ஒரேமாதிரிப் பார்க்கின்ற - மதிக்கின்ற நிலையை உறுதிப்படுத்த வேண்டும். ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினரும் அதிகாரிகளால் மதிக்கப்படுகின்றபோது அவர்களுக்கு வாக்களித்த மக்கள்தான் மதிக்கப்படுகின்றார்கள். உங்களுடைய அமைச்சில் மட்டுமல்ல, எல்லா அமைச்சுக்களிலும் இப்படியான ஒரு சூழ்நிலை வரவேண்டும். அதாவது சகல பாராளுமன்ற உறுப்பினர்களையும் ஒரே விதமாகப் பார்க்கின்ற ஒரு சூழ்நிலை வர வேண்டும். பாராளுமன்ற உறுப்பினர்களுடைய விடயத்தில், தாங்கள் கட்சி பேதமற்றவர்கள், மொழிபேதமற்றவர்கள் என்பதை அந்த அதிகாரிகள் உறுதிப்படுத்த வேண்டும் என்பதை இந்த நேரத்தில் நான் கௌரவ நீதியமைச்சர் அவர்களிடம் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have four more minutes.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Okay.

கௌரவ நீதியமைச்சர் அவர்களே, நான் இங்கு குறிப்பிட்ட விடயங்கள் தொடர்பாக நீங்கள் கவனமாகச் செவிமடுத்திருந்தீர்கள். கௌரவ அமைச்சர் மலிக் சமரவிக்கிரம அவர்களுடைய அமைச்சு சம்பந்தப்பட்ட விவாதமும் இன்று நடைபெறவிருக்கின்றது. அமைச்சர் அவர்கள் இப்பொழுது சபையில் இல்லை. ஆனால், நீங்களும் உங்களுடைய கௌரவ பிரதியமைச்சர் அவர்களும் இங்கு அமர்ந்திருந்து எங்களுடைய கருத்துக்களை அவதானித்துக் கொண்டிருக்கின்றீர்கள். அந்த வகையில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ நீதியமைச்சர் அவர்களே, பயங்கரவாதத் தடைச்சட்ட நீக்கம், அரசியல் கைதிகளுடைய விடுதலை, மூன்று பேருடைய வழக்கு மாற்றம், மாலைதீவுக் கைதிகள் சம்பந்தப்பட்ட file மொழி மாற்றம், அவர்களின் விடுதலை ஆகிய இந்த நான்கு விடயங்கள் சம்பந்தப்பட்ட கோரிக்கைகளையும் நான் உங்களிடம் மிக விநயமான முறையில் முன்வைக்கின்றேன். நான் குறிப்பிட்ட விடயங்கள் என்னுடைய தனிப்பட்ட கருத்தல்ல. ஒட்டுமொத்த தமிழ் மக்களின் கருத்து. நான் குறிப்பிட்ட விடயம் இலங்கையில் மட்டுமல்ல, உலகத்தில் வாழ்கின்ற அனைத்துத் தமிழ் மக்களுடைய மனங்களிலும் நீங்கா வடுவாக இருக்கின்றது. நீங்கள் நினைத்தால் இதற்குரிய நடவடிக்கைகளை உடன் எடுக்க முடியும். மாலைதீவிலிருந்து வந்த, தண்டனைக் காலம் முடிந்தும் சிறையில் இருக்கின்றவர்களை நீங்கள் நினைத்தால் பத்து நாட்களுக்குள், அதாவது இந்த வரவு செலவுத் திட்டம் முடிவதற்குள் விடுதலை செய்ய முடியும். அதற்குரிய அதிகாரம் உங்களிடம் இருக்கின்றது. ஆகவே, குறித்த மூன்று அரசியல் கைதிகளுடைய விடுதலையை இந்த வரவு செலவுத் திட்ட விவாதம் முடிவடைவதற்கு முன்பு - எதிர்வரும் டிசம்பர் 09 ஆம் திகதிக்கு முதல் நீங்கள் தயவுசெய்து உறுதிப்படுத்த வேண்டும். குறித்த file இன் மொழிமாற்றம் செய்வதற்கு நான்கு மாதங்கள் செல்கின்றனவா? அந்த file பத்து வருடங்களாகத் திணைக்களத்தில் இருந்திருக்கின்றது. 2007ஆம் ஆண்டு அந்தக் கைதிகள் இலங்கைக்கு அனுப்பப்படும்போது ஏன், அந்த file வெளிநாட்டு அமைச்சுக்கு அனுப்பப்பட்டு மொழி மாற்றம் செய்யப்படவில்லை? அவர்களுடைய தண்டனைக் காலம் முடிந்து, இந்தப் பாராளுமன்றத்தில் நான் கேள்வி எழுப்பியதன் பின்புதான் அந்தப் file ஐ மொழிபெயர்ப்புக்காக அனுப்பப்பட்டிருக்கின்றது. இது எந்தவிதத்திலும் ஏற்றுக் கொள்ள முடியாத விடயம். அவர்கள் தண்டனைக்காலம் முடிந்தும் சிறையிலிருக்கின்றார்கள். கௌரவ நீதியமைச்சர் அவர்களே, இந்த விடயங்களை உங்களிடம் விநயமாக முன்வைக்கின்றேன். இது எங்களுடைய மக்களுக்கு நன்மை செய்வதற்காக எடுக்கின்ற முயற்சி மட்டுமல்ல, இந்த நாட்டில் ஒரு நல்ல அரசியல் தீர்வு வருவதற்கான நல்லெண்ண அடிப்படையாகவும் அமையும்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, please wind up.

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Okay.

ஆகவே, கௌரவ நீதியமைச்சர் அவர்களே, இந்த விடயங்கள் தொடர்பாக நீங்கள் கூடியளவு கவனம் எடுக்க வேண்டும் என்றும் தாங்களும் எங்களுடைய எதிர்க்கட்சித் தலைவரும் இணைந்து சட்ட மாஅதிபருடன் பேச்சுவார்த்தை

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

நடத்தி அந்த மூன்று கைதிகளுடைய நீதிமன்ற இடமாற்றம் தொடர்பில் மிக விரைவில் முடிவெடுக்க வேண்டுமென்று கேட்டுக்கொண்டு,விடைபெறுகின்றேன். நன்றி.

**[පූ.භා. 10.28]**

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

ගරු සභාපතිතුමනි, යුක්තිය පසිඳලීමට අදාළ කාරණා කීපයක් පිළිබඳව මෙම අවස්ථාවේදී කථා කිරීමට මා කැමැතියි. මුලින්ම, යුක්තිය පසිඳලීම නිසි පරිදි සිදුවී ඒ සඳහා ජනතාවගේ ප්‍රසාදය ලැබීමට නම්, හොඳ විනිශ්චයකාරවරුන් පත් කිරීම අත්‍යවශ්‍ය වෙනවා. විනිශ්චයකාරවරුන් පත් කරන්නේ නීතිඥ වෘත්තියේ යෙදෙන අයගෙන් පමණයි. නමුත් වඩාත් දක්ෂකම් තිබෙන නීතිඥවරු පෙළඹෙනවා private bar එකේ වැඩ කරන්න. ඒක තමයි අද ඇතිවී තිබෙන ප්‍රශ්නය. ඒකට එක හේතුවක් තමයි, විනිශ්චයකාරවරුන්ට ලැබෙන මාසික වැටුප ඉතාම අඩුවීම. මහෙස්ත්‍රාත්වරයෙකුගේ මූලික වැටුප -basic salary- රුපියල් 49,079යි. කවුද ඒ ගණනට මහෙස්ත්‍රාත්වරයෙක් වෙන්න එන්නේ? නීතිඥ පවුල්වලින් එන සමහර අය යුතුකමක් හැටියට හිතනවා, නීතිඥ වෘත්තියට යන්නේ නැතිව විනිශ්චයකාරවරයෙක් හැටියට ඇවිල්ලා වැඩ කරන්න ඕනෑ කියලා. නමුත්, බොහෝ දෙනෙක් හිතන්නේ ඒ විධියට නොවෙයි. එම නිසා විනිශ්චයකාරවරුන්ගේ වැටුප ආකර්ෂණීය විය යුතුයි. අධිකරණ විනිශ්චයකාරවරයකු ලෙස කටයුතු කිරීම ආකර්ෂණීය විය යුතුයි. නැතිනම්, හොඳ නීතිඥවරු විනිශ්චයකාර තනතුරුවලට එන්නේ නැහැ. මේ පිළිබඳව 2008 වසරේදී මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංගමයට සිදු වුණා උසාවි යන්න.

ඉතිහාසයේ පළමුවැනි වරට විනිශ්චයකාරවරු උසාවියට ගියා නඩුවක් පවරන්න. ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් අංක 66/2008 දරන නඩුවේදී ඔවුන් කියා සිටියා, "අපට සාධාරණ වැටුප් ලැබෙන්නේ නැහැ." කියලා. ඒ අවස්ථාවේදී එම සංගමය වෙනුවෙන් පෙනී සිටියේ ඩී.එස්. විජේසිංහ ජනාධිපති නීතිඥතුමායි. මම එතුමාගේ කනිෂ්ඨ නීතිඥවරයා හැටියට පෙනී සිටියා. එම නඩුව 2008 ජූලි 14වැනි දා අවසන් කරනු ලැබුවා. සරත් එන්. සිල්වා අග්‍රවිනිශ්චයකාරතුමාත්, අමරතුංග විනිශ්චයකාරතුමාත් සහ ශ්‍රීපවන් විනිශ්චයකාරතුමාත් ඉදිරියේ ආණ්ඩුව එදා පොරොන්දුවක් දුන්නා, මේ ප්‍රශ්නය දිහා සානුකම්පිතව සලකා බලනවා කියලා. ඉන්පසු මේ කරුණ Salaries and Cadre Commission එකට ඉදිරිපත් කළා.

එහෙම ඉදිරිපත් කරලා දැන් අවුරුදු දහයක් වෙනවා. විනිශ්චයකාරවරුන්ගේ සංගමය ඒ ගැන මුලින්ම සාකච්ඡාව පවත්වා තිබෙන්නේ 2007.12.27 වැනි දා. දැනට අවුරුදු දහයක් ගත වෙලා තිබුණත්, ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ. Salaries and Cadre Commission එක කියනවා, "අනෙක් රජයේ සේවකයනුත් පඩි වැඩිවීම් ඉල්ලයි. එම නිසා විනිශ්චයකාරවරුන්ට පමණක් විශේෂයෙන් සලකන්නට බැහැ" කියලා. විනිශ්චයකාරවරුන්ට ඕනෑතරම් දීමනා - allowances - ලබා දෙන්න පුළුවන් වුණත්, එය pensionable allowance එකක් හැටියට, විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා පාවිච්චි කිරීමට ඇතුළත් කිරීමට ඔවුන්ගේ අකමැත්තක් තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නයට අද වනතුරු විසඳුමක් නැතිව අවුරුදු දහයක් තිස්සේ ඇදී යනවා.

ඒ අතරතුර, විනිශ්චයකාරවරුන්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා වෙනම වැටුප් ව්‍යුහයක් - separate salary structure - එකක් සෑදීමට නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදීත් යෝජනා කර තිබෙනවා. ඒක ඉතාම වැදගත්. ඒ සඳහා යම් ප්‍රමුඛත්වයක් අධිකරණ අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් සිදු වෙයි කියා මා බලාපොරොත්තු වනවා.

ගරු සභාපතිතුමනි, එක තර්කයක් තිබෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් විශ්‍රාම ගත්තාට පස්සේ උසාවියට ගිහිල්ලා නීතිඥවරු හැටියට වැඩ කරන්න පුළුවන් කියලා. නමුත්, කීපදෙනයි ඒ ආකාරයට කටයුතු කරන්නේ. විශේෂයෙන්, හොඳ විනිශ්චයකාරවරු එහෙම කරන්න යන්නේ නැහැ. ඒ නිසා ඒක තර්කයක් නොවෙයි. ඒ නිසා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුයි.

මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ සංඛ්‍යාව වැඩි කළ හැකි ආකාරයට අධිකරණ සංවිධාන පනතට ගෙනා සංශෝධනයක් මෑතකදී අපි සම්මත කළා. ඒ පිළිබඳව පැවති විවාදයේදී මම කිව්ව ආකාරයට, ඔවුන්ගේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා සුදුසු ලෙස ඔවුන් පුහුණු කිරීම අත්‍යවශ්‍ය වනවා. ඒක ඉතාම වැදගත්.

විනිශ්චයකාරවරුන් පත් කිරීමේදී, අංශ තුනකින් විනිශ්චයකාරවරු පත් කර ගන්න අපට පුළුවන්. ශ්‍රේෂ්ඨාධිකරණය වේවා, අභියාචනාධිකරණය වේවා, මහාධිකරණය වේවා, ඊට පහළ අධිකරණ වේවා, බොහෝ විට සිදුවන පරිදි -මේ ගැන කවුරුත් විරුද්ධ වෙන්නේ නැහැ- පහළ අධිකරණවල සිටින විනිශ්චයකාරවරුන් සහ විනිශ්චයකාරතුමියන් උසස් කිරීමෙන් විනිශ්චයකාරවරු හැටියට පත් කිරීම එක ක්‍රමයක්. නමුත්, ඒත් සමඟම, නීතිපති දෙපාර්තමේන්තුවෙන් සහ විශේෂයෙන්ම පෞද්ගලිකව නීතිඥ වෘත්තියේ යෙදෙන අයගෙනුත් විනිශ්චයකාරවරයෙක් ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය වෙනවා. ඒක ඉතාම වැදගත්. එවැනි මිශ්‍රණයක් තිබෙන විටයි වඩා හොඳ නඩු තීන්දු ආදිය අධිකරණයෙන් ලැබෙන්නට ඉඩ තිබෙන්නේ. ඒ නිසා ඒක ඉතා වැදගත්.

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති වුණාට පසුව එක්තරා අවස්ථාවක මහාධිකරණයට කරන ලද පත්වීම් තිහකින් පමණ විනිශ්චයකාරවරුන්ගෙන් පිටස්තරව පත්වීම් දෙකයි සිදු කළේ. එක් අයෙකු නීතිපති දෙපාර්තමේන්තුවෙන් පත් කළා. විනිශ්චයකාරවරුන්ගෙන් පිටස්තරව කරපු අනෙක් පත්වීම තමයි, පෞද්ගලිකව නීතිඥ වෘත්තිය කළ කන්නන් මහත්මයාට දීපු පත්වීම. ඒ වෙලාවේ එතුමාට විරුද්ධව අතිවිශාල ඝෝෂාවක් කළා. නමුත් අද වනකොට එතුමා ඉතාම හොඳ විනිශ්චයකාරවරයකු ලෙස හැම දෙනාම පිළිගන්නවා. ඒ නිසා මේ මිශ්‍රණය ඉතාම වැදගත් වාගේම, එය අවශ්‍යයි.

ඊළඟට, උසස්වීම් - promotions - ලබා දීම ජ්‍යෙෂ්ඨත්වය මත පමණක් නොවිය යුතුයි. විනිශ්චයකාරවරුන්ගේ නඩු තීන්දු පිළිබඳව ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරුන් සහ අධිකරණ සේවා කොමිසම විසින් නිසි ඇගැයීමක් කළ යුතුයි. උසස් වීම් ලබා දීමේදී නඩු තීන්දුවල ගුණාත්මකභාවය - quality එක - කාරණයක් විය යුතුයි.

ගරු සභාපතිතුමනි, තවත් ප්‍රායෝගික ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. මූලික අයිතිවාසිකම් නඩු දමනකොට යම් යම් නිල දරන අය අත්‍යවශ්‍යයෙන්ම නම් කරන්න ඕනෑය කියලා නීතියක් නැහැ. අභියාචනාධිකරණයෙන් තීන්දු දෙනවා, රිට් ආඥාවල එහෙම කරන්න පුළුවන් කියලා. බොහෝ විට ඒ කටයුත්ත කෙරෙන්නේත් නැහැ. ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේදී විශාල වශයෙන් ප්‍රශ්න මතු වනවා. අද කෙනෙකු ආදේශ කරන්න ගියාම ප්‍රශ්න ඇති වනවා.

සමහර වෙලාවට පළාත් සභාවක ඇමතිවරුන් පස්දෙනාම වග උත්තරකරුවන් හැටියට නම් කරනවා. වරින් වර ඔවුන් මාරු වෙනවා; නැත්නම් ඉල්ලා අස් වෙනවා. ඒ නිසා නැවත කෙනෙකු ආදේශ කිරීම මාස ගණනකින් කල් යනවා. ඒ නිසා අද අවශ්‍යවෙලා තිබෙනවා, රීති - Supreme Court rules - මඟින් මේ පිළිබඳව පැහැදිලි නියෝග ලබා දෙන්නට. ඒ වාගේම මේ තත්ත්වය පැහැදිලි කිරීමත් අද අවශ්‍ය වෙලා තිබෙනවා. එවැනි අවස්ථාවලදී නිල නාමයෙන් නම් කිරීම අවශ්‍යයි; එය ප්‍රමාණවත්. කැබිනට් මණ්ඩලයට විරුද්ධව මූලික අයිතිවාසිකම් නඩුවක් දමනකොට හෝ පළාත් සභාවක අමාත්‍ය මණ්ඩලයට විරුද්ධව නඩුවක් දමනකොට, ඒ සියලුදෙනාම නම් කරන්නේ නැතිව, කවුරු හෝ අමාත්‍යවරයෙකුට විරුද්ධව පෞද්ගලික චෝදනාවක් තිබෙනවා නම් ඔහු හෝ ඇය පමණක් නම් කරලා, කැබිනට් මණ්ඩලයේ ලේකම් නැත්නම් පළාත්බද අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා පමණක් නම් කිරීම ප්‍රමාණවත් විය යුතුයි. එහෙම නැතිව රජයේ ආයතනයක අධ්‍යක්ෂවරු සියලුදෙනාම නම් කරන්න අවශ්‍ය නැහැ. ඒ වෙනුවට එහි ලේකම්වරයා නැත්නම් ප්‍රධාන විධායක නිලධාරියා නම් කිරීම ප්‍රමාණවත් විය යුතුයි. අද අපට තිබෙන ශ්‍රේෂ්ඨාධිකරණ රීති යල් පැන ගිය ඒවා. ඒවා වෙනස් කළ යුතුයි. ඒ සඳහා දැන් කාලය පැමිණ තිබෙනවා. ඒ කාරණය පිළිබඳව විශේෂ අවධානය යොමු වෙයි කියා මා විශ්වාස කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, you have three more minutes.

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
I will finish my speech quickly, Sir.

නඩු කල් යෑම හැම උසාවියකම සිද්ධ වනවා. දවල් දොළහ වනකොට විනිශ්චයකාරවරුන්ට පුළුවන් වෙන්න ඕනෑ, මොන නඩුද කල් යන්නේ, මොනවාද කල් යන්නේ නැත්තේ කියලා assessment එකක් කරන්න. නමුත් සමහර විනිශ්චයකාරවරුන් නඩුව කල් යනවාය කියන්න සවස දෙක, තුන වනතුරු බලාගෙන ඉන්නවා. ඒ පිළිබඳව කිසිම uniformity එකක් නැහැ; උසාවි අතර uniformity එකකුත් නැහැ; එකම උසාවියේ වෙන වෙනම benches අතර uniformity එකකුත් නැහැ. අමරතුංග විනිශ්චයකාරතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු කාලයේ උදෙන්ම ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥවරුන්ගෙන් අහනවා, "ඔබතුමන්ලාගේ නඩු කල් යෑමට ඉඩ තිබෙනවාද, විභාග කරනවාද?" කියලා.

එහෙම නම්, කල් දානවා. ඇයි? ජනාධිපති නීතිඥවරයෙකුට තමයි, හැම උසාවියකටම යන්න සිදු වන්නේ. ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් තමයි, හැම උසාවියකටම යන්නේ. අනෙක් උසාවිවල ඔවුන් භාර ගන්නා නඩුත් කල් යනවා, එක උසාවියක හිරවී සිටීම නිසා. අග්‍රවිනිශ්චයකාරතුමා ප්‍රමුඛ අධිකරණ සේවා කොමිසම මේ පිළිබඳව රීති හදන්න ඕනෑ. එහෙම නැත්නම් පැහැදිලි instructions දෙන්න ඕනෑ. ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, පහළ අධිකරණය එහෙම නඩු කල් දානවා නම්, දවල් 12.00, 1.00 වෙන කොට දක්ෂ විනිශ්චයකාරවරයෙකුට පුළුවන් assessment එකක් කරන්න, මොන නඩුද ගන්න පුළුවන්, මොන නඩුද කල් යන්නේ කියලා. ඒක නිසා නීතිඥවරුන් හවස් වෙන කල් එතැන තියාගෙන ඉන්න එකේ කිසිම තේරුමක් නැහැ. ඒකෙන් වෙන්නේ ඔවුන්ට වෙනත් අධිකරණයක නඩුවක් සඳහා පෙනී සිටීමට තිබෙන අවස්ථාව වැළකෙන එකයි. ඒකෙන් නඩු තවත් කල් යනවා. මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න කියලා, ගරු ඇමතිතුමියගෙන් සහ එතුමිය තුළින් අධිකරණ සේවා කොමිසන් සභාවෙන් මා ඉල්ලා සිටිනවා.

මා කලින් දවසේ සඳහන් කළා, අධිකරණ සංවිධාන පනත යටතේ දැරණියගල සහ දෙහිඕවිට පොලිස් වසම්වල නඩු තවමත් යන්නේ අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයට කියලා. ඒක තිබෙන්නේ බස්නාහිර පළාතේ. ගරු ඇමතිතුමියනි, ඒකෙන් ආදායම් පිළිබඳ ප්‍රශ්නයක් මතු වෙනවා. මොකද, මහේස්ත්‍රාත් උසාවිය එකතු කරන දඩ මුදල් යන්නේ අදාළ පළාත් සභාවට. දැරණියගල සහ දෙහිඕවිට අයිති වෙන්නේ සබරගමුව පළාතට. ජනතාවට සිදුවන කරදරයට අමතරව, දැරණියගල සහ දෙහිඕවිට පළාතේ සිදුවන අපරාධවලින් එකතු වෙන දඩ මුදල් බස්නාහිර පළාතට යවන්න කිසිම හේතුවක් නැහැ. ඉතාම ඉක්මනින් ඒ පිළිබඳ ප්‍රශ්නය විසඳනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු විජිත හේරත් මැතිතුමා.

**[පූ.භා. 10.38]**

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු සභාපතිතුමනි, අධිකරණ අමාත්‍යාංශය පිළිබඳව සාකච්ඡාවට ගැනෙන මේ අවස්ථාවේ දී පළමුවෙන්ම මේ කාරණය පිළිබඳව සඳහන් කරන්නට කැමැතියි. මීට පෙරත් අවස්ථා කිහිපයකදීම මූලික අයිතිවාසිකම් නඩු පිළිබඳව ජනතාව මුහුණ දෙන ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මේ ගරු සභාවේ දී අපි මතු කළා. ඇත්තටම දෙකෝටියකට වැඩි ජනගහනයක් සිටින අපේ රටේ, යම් අයෙකුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සම්බන්ධයෙන් කරුණු දැක්වීම ඒ පුද්ගලයාට කොළඹ ශ්‍රේෂ්ඨාධිකරණයටම එන්න සිදු වෙනවා. මේක එක පැත්තකින් ඉතාම දුෂ්කර කාර්යක්; අනෙක් පැත්තෙන් වියදම් අධික කාර්යක්. ඒ නිසාම තමයි පසු ගිය දවස්වල මේ පිළිබඳව ලොකු සාකච්ඡාවක් ඇති වුණේ, දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබෙන අතිවිශාල නඩු ප්‍රමාණයක් කඩිනමින් අහලා ඉවර කිරීම සඳහා, එහි ව්‍යුහයේ යම් වෙනස්කමක් කළ යුතුයි කියලා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණයේ දැනට ඉන්නේ විනිශ්චයකාරවරු 11දෙනයි. මේ 11 දෙනාට, දහස් ගණනක් වුණු මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු අසා ඉවර කරන්න විශාල කාලයක් යනවා. ඒ නිසාම එම විනිශ්චයකාරවරුන් විශාල පීඩනයකින් ඉන්නේ. බොහෝ වේලාවට අවුරුදු ගණන් එම නඩු තීන්දු ප්‍රමාද වෙනවා. සමහර වේලාවට නඩු අහලා ඉවර වුණත්, නඩු තීන්දුව ලියන්න තවත් බොහෝ කාලයක් යනවා. ඒ නිසා වහාම කළ යුතු කාර්යක් වන්නේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය වැඩි කිරීමයි. එම ප්‍රමාණය වැඩි කිරීම සඳහා ව්‍යවස්ථා සංශෝධනයක් අවශ්‍යයි. ඔබතුමන්ලා ඒකට උත්තරය විධියට දිගින් දිගටම කියන්නේ, "දැනට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදනවා, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒ පිළිබඳව යෝජනා කරලා තිබෙනවා, එම යෝජනාවට අනුව ඉදිරියේ දී ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් වැඩි කරන්න පුළුවන්" කියලායි. නමුත් මේ අලුත් ව්‍යවස්ථාව එන්නේ කවදාද කියලා අපි කාටවත් කියන්න බැහැ. ඒකට දින නියමයක් නැහැ. ඒක එයිද, නැද්ද දන්නේත් නැහැ. සමහර වේලාවට ඒක නොවෙන්නත් පුළුවන්. එහෙම වුණොත් මේ ප්‍රශ්නයට උත්තරයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසාම ඔබතුමියට කලින් හිටපු අධිකරණ ඇමතිතුමා වන ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමාට අප දිගටම යෝජනා කළා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය වැඩි කිරීම සඳහා ව්‍යවස්ථා සංශෝධනයක් අරගෙන එන්න කියලා. ව්‍යවස්ථා සංශෝධනයක් හරහා මෙම කාර්ය කරන්න පුළුවන්.

[ගරු විජිත හේරත් මහතා]

අපිට ව්‍යවස්ථාව සම්පූර්ණයෙන් වෙනස් කරන්න බොහෝ කාලයක් යනවා. ව්‍යවස්ථා සංශෝධනයකට මේ පාර්ලිමේන්තුවේ කවුරුවත් විරුද්ධ වෙන්නේ නැහැ කියලා මම හිතනවා. ඒ නිසා ඉතා පැහැදිලිව එම සංශෝධනය සම්මත කර ගැනීමේ හැකියාවක් තිබෙනවා. ඒ නිසා මම නව ඇමතිතුමියට නැවත වතාවක් යෝජනා කරනවා, පුළුවන් නම් කඩිනමින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය වැඩි කිරීම සඳහා වන ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනෙන්න කියලා. මම හිතන්නේ මේ වෙන කොට, එම සංශෝධනයට අදාළ මූලික වගන්ති සකස් කරලා තිබෙනවා. ඒ නිසා අලුතින් මහන්සි වෙන්න දෙයකුත් නැහැ.

මීට කලින් මෙම ප්‍රශ්නය ගැන නිතර සාකච්ඡා වුණා. එම සාකච්ඡාවල ප්‍රතිඵලයක් විදියට යම් යම් කෙටුම්පත් සකස් කෙරුණා. දැන් තිබෙන්නේ එය මේ පාර්ලිමේන්තුවට රැගෙන ඒම පමණයි. ඒකට මේ පාර්ලිමේන්තුවේ සියලු දෙනාගේම එකඟතාව පහසුවෙන්ම ගන්න පුළුවන්. ඒ වාගේම මේ රටේ දහස් ගණනක්, ලක්ෂ ගණනක් වන සාමාන්‍ය ජනතාවගේ මූලික අයිතිවාසිකම් පිළිබඳ වන නඩු කටයුතු කඩිනම් කරන්න පුළුවන්; ඔවුන්ට සාධාරණය ඉෂ්ට කරන්න පුළුවන්. මොකද, මෙම විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය වැඩි කිරීමෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තිබෙන මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු අසා ඉවර කරන්න යන කාලය අඩු වෙනවා වාගේම, ඒ සඳහා යන වියදමත් අඩු කරන්න පුළුවන්. මොකද, දැන් ඒ පිළිබඳව තිබෙන දුෂ්කර තත්ත්වය නිසාම, මෙවැනි නඩුවලට පෙනී සිටින නීතිඥවරුන්ගේ ගාස්තුවත් වැඩි වෙලා තිබෙනවා. අද සාමාන්‍ය කෙනෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයේ හරියාකාරව නඩුවක් දමා ගන්න ලක්ෂ 8ක්, 10ක් විතර වැය වෙනවා. ඒක කරන්න පුළුවන් ඉතාම අතළොස්සකට විතරයි. අද ශ්‍රේෂ්ඨාධිකරණයේ අහන නඩුවලින් බහුතරය එහෙම යමක්-කමක් කරකියා ගන්න පුළුවන් අය විසින් දමපු ඒවායි කියන එක අපි දකිනවා. ඉතාමත් අහිංසක දුප්පත් මිනිසුන්ට අපේ රටේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න හැකියාවක් නැහැ. සමහර අවස්ථාවකදී නීති ආධාර සංගමයකින්, එහෙම නැත්නම් තවත් සිවිල් සංවිධානයක් හරහා ඒ අයගේ උදව් උපකාර ඇතිව යන අවස්ථා අපි දකිනවා. නමුත් ස්වාධීන පුද්ගලයෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න ඉතාමත් දුෂ්කර තත්ත්වයක් තිබෙනවා. එම නිසා කඩිනමින් මේ ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ගෙනෙන්න කියලා අපි ඔබතුමියට නැවත වතාවක් සිහිපත් කරනවා.

පළාත් අභියාචනාධිකරණ ඇති කිරීම පිළිබඳවත් කියන්නට ඕනෑ. මෙයත් අලුත් දෙයක් නොවෙයි. වසර ගණනාවක් තිස්සේ සිට මේ පිළිබඳව පොරොන්දු දෙනවා; සාකච්ඡා කරනවා. නමුත් අද වෙනතුරු ක්‍රියාවට නැඟිලා නැහැ. එම නිසා මේ වනවිට ඒ පළාත් අභියාචනාධිකරණ පිහිටුවීම පිළිබඳව තත්ත්වය මොකක්ද, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විදියට ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියන එක ඔබතුමියගෙන් දැන ගන්නට කැමැතියි.

ගරු සභාපතිතුමනි, අද විශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා, මේ අධිකරණ ක්ෂේත්‍රය තුළ විනිශ්චයකාරවරුන්ට තමන්ගේ රාජකාරිය කර ගෙන යාමේ දී ඒ වෘත්තියට ගැළපෙන ගරුත්වයක් සහිතව රාජකාරිය කරගෙන යන්න අපහසු වෙලා තිබෙනවා කියලා. ඔවුන් සඳහා ලබා දෙන දීමනා, ඒ වාගේම ඔවුන්ගේ වැටුප් පිළිබඳව පමණක් නොවෙයි ඔවුන්ගේ අනෙකුත් යටිතල පහසුකම් පිළිබඳ ප්‍රශ්න එයට ප්‍රධානතම හේතුවක් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මහාධිකරණ, දිස්ත්‍රික් අධිකරණ, මහෙස්ත්‍රාත් අධිකරණ, යන අධිකරණ පද්ධතීන්වල වැඩකරන විනිශ්චයකාරවරුන් වසර ගණනාවක් තිස්සේ තමන්ගේ මේ ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙනවා. ඔවුන්ට ඒ පිළිබඳව වැඩ වර්ජනය කරන්න බැහැ; වෘත්තිය සමිති ක්‍රියාමාර්ග ගන්න බැහැ. අනෙකුත් ක්ෂේත්‍ර වාගේ ඔවුන්ට ඒ ඉල්ලීම් දිනා ගැනීම සඳහා සටන් ක්‍රියා මාර්ගවලට යන්න බැහැ.

ඒ නිසාම තමයි මීට වසර 10කට පෙර මේ පිළිබඳ සාකච්ඡා කරලා, එකඟතාවන් ඇති කරගෙන, ඒ පැවතුණු රජයන්ගෙන් පොරොන්දු අරගෙන, බැරිම තැන තමයි අවසානයේ වැටුප් පිළිබඳ ප්‍රශ්නය විනිශ්චයකාරවරුන් විසින් අපේ රටේ ඉහළම අධිකරණය වූ ශ්‍රේෂ්ඨාධිකරණයට අරගෙන ගියේ. ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ ඒ අනුව තමයි 2008දී ඒ පිළිබඳ පැහැදිලි තීන්දුවක් ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් දුන්නේ. මීට අවුරුදු දහයකට ඉහතදී වැටුප් ව්‍යුහය පිළිබඳ දීපු ඒ තීන්දුව තවමත් එහෙමම තිබෙනවා. ඒ පිළිබඳ කැබිනට් මණ්ඩලය කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නැහැ. මේ ප්‍රශ්නය ඔබතුමියට පෙර හිටපු අධිකරණ ඇමති විජයදාස රාජපක්ෂ මැතිතුමාට ඉදිරිපත් කළාම, එතුමා ප්‍රසිද්ධියේම මේ සභාවේ "එය කළ යුතුයි, එය මම පිළිගන්නවා" කියා පිළිගත්තා. විනිශ්චයකාරවරුන් එක්ක පැවැති සාකච්ඡාවලදී එතුමා පිළිගත්තා, මේක කඩිනමින් කළ යුතු දෙයක්; මම ඒකට ඉක්මනින් මැදිහත් වෙනවා කියලා. මීට අවුරුද්දකට පෙර හිටුණු අය වැයේදීත් මේ ප්‍රශ්නය පිළිබඳව අපි සාකච්ඡා කළා. එදත් සභාවේ කිව්වා, "එකඟ වෙලා තිබෙනවා; ඔක්කෝම හරි; අපි කඩිනමින් ඒක ක්‍රියාත්මක කරනවා" කියලා. නමුත් අද වෙන තුරු නැහැ.

ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදීපු තීන්දුවට අනුව, අධිකරණ අමාත්‍යාංශය විසින් ඇති කර ගත් එකඟතාවට අනුව විශේෂයෙන් අපේ රටේ මහාධිකරණ සහ අනෙකුත් පහළ අධිකරණවල විනිශ්චයකාරවරුන්ගේ වැටුප් පිළිබඳ, එම වැටුප් ව්‍යුහය සම්බන්ධයෙන් ඔබතුමියලා අරගෙන තිබෙන ක්‍රියා මාර්ගය කුමක්ද? කැබිනට් මණ්ඩලය මේ පිළිබඳව ගත් තීන්දුව කුමක්ද? මෙය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළාද? කැබිනට් මණ්ඩලයෙන් ප්‍රතික්ෂේප වුණා ද? එහෙම නැත්නම් කැබිනට් මණ්ඩලය අනුමත කරලා, මුදල් අමාත්‍යාංශයේ ප්‍රමාදයක් ද තිබෙන්නේ? අධිකරණ ක්ෂේත්‍රයේ විනිශ්චයකාරවරුන් අද බලාගෙන ඉන්නවා, ඒ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියා මාර්ගය මොකක්ද කියලා. මොකද, එය ඉතාම වැදගත්. ඒ හරහා තමයි විනිශ්චයකාරවරුන්ගේ ගරුත්වය ආරක්ෂා වෙන්නේ. ඔවුන්ගේ වැටුප් සහ අනෙකුත් දීමනා පිළිබඳව සෑහීමකට පත් වෙන්න පුළුවන් වන්නේ වෘත්තීමය තත්ත්වය හා ගරුත්වය ආරක්ෂා වෙන තත්ත්වයකට ආවොත් පමණයි. ඔවුන්ට තමන්ගේ රාජකාරිය ස්වාධීනව කරන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙන්නේ එවිටයි. ඒ නිසා ඒ පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයෙන් මේ වෙනකොට අරගෙන තිබෙන ක්‍රියා මාර්ගය කුමක්ද කියන එක මා දැන ගන්න කැමැතියි.

විශේෂයෙන්ම එය වැදගත් වෙන්නේ මේ ප්‍රශ්නයට දීර්ඝ කාලයක් ගතවෙලා තිබෙන නිසා. අවුරුදු දහයකටත් වැඩියි. ඒ අවුරුදු දහයකටත් වැඩි කාලය තුළ දිගින් දිගටම පොරොන්දු දුන්නා. ජනාධිපතිවරු සමඟ සාකච්ඡා පවත්වා තිබෙනවා. ඒ ජනාධිපතිවරුත් මේ පිළිබඳව එකඟතාව පළ කරලා, මෙය කළ යුතුයි කියලා පිළිගෙන තිබෙනවා. නමුත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

උසාවි නියෝගයක් ලැබිලා තිබියදීත්, මේ රටේ අධිකරණවල කටයුතු කරන විනිශ්චයකාරවරුන්ගේ ප්‍රශ්නයට ආණ්ඩුව මැදිහත් වෙලා විසඳුම් ලබා දෙන්නේ නැත්නම්, අපේ රටේ වැඩ කරන සාමාන්‍ය කම්කරුවෙකුගේ, නුවරඑළියේ, බදුල්ලේ වැඩ කරන වතු කම්කරුවෙකුගේ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ආණ්ඩුව කටයුතු කරන්නේ කොහොමද කියලා ඔබතුමියට හිතා ගන්න පුළුවන්.

අධිකරණ විනිශ්චයකාරවරුන්ගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය එකඟතාවක් තිබියදී, අවුරුදු 10ක් තිස්සේ විසඳුමක්

දෙන්න බැරිනම්, - ප්‍රතිපත්තිමය එකඟතාවක් නැත්නම් ප්‍රශ්නකාරි වෙන්න පුළුවන්. "මෙය කළ යුතුයි" කියලා ආණ්ඩුව ප්‍රතිපත්තියක් විධියට පිළිගන්නවා. හැබැයි, කරන්නේ නැහැ.- එතකොට ප්‍රශ්නයක් තිබෙනවා. එම නිසා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් වහාම මැදිහත් විය යුතු වෙනවා. ඒ salary structure එක සම්බන්ධයෙන් ඔබතුමියලා ගන්න ක්‍රියා මාර්ගය මොකක්ද කියලා අද දවස තුළදී අපි දැන ගන්න බලාපොරොත්තු වෙනවා. මොකද, මේක පොරොන්දුවලට විතරක් සීමා වුණු එකක් දෙයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ පොරොන්දුවලින් එහාට ගිහින් මෙය ක්‍රියාත්මක කිරීම සඳහා වූ සහතිකයක් මේ රටේ අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය වැඩි කළා. ඒක හොඳයි. හැත්තෑපහක්ව තිබුණු ප්‍රමාණය එකසියදහය බවට පත් කළා. මම එදත් මේ ප්‍රශ්නය මතු කළා. ඒක හොඳයි. හැබැයි, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. දැනටමත් මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ 75ක cadre එකක් තිබෙනවා. හැබැයි, දැනට ඒ cadre එකෙන් පුරවලා තිබෙන්නේ හැත්තෑවයි. තව පස්දෙනෙකුගේ පුරප්පාඩු තිබෙනවා. අදත් පුත්තලමේ සිටින විනිශ්චයකාරවරයා තමයි අනුරාධපුර උසාවියේත් නඩු අහන්නේ. දැනට පවතින මේ පුරප්පාඩු පහ පුරවන්නේ නැතිව තව හතළිහකගේ පුරප්පාඩු පුරවන්නේ කොහොමද ? ඒකට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? අධිකරණ පද්ධතියට අවශ්‍ය යටිතල පහසුකම් පිළිබඳ ඇස්තමේන්තුවක්, එහෙම නැත්නම් ඒ පිළිබඳ සැලැස්මක් ඇති කරලාද මේ වැඩි කිරීම සිදු කළේ? මහාධිකරණ විනිශ්චයකාරවරුන්ට අධිකරණ කටයුතු කිරීමට අවශ්‍ය ගොඩනැඟිලි පහසුකම් නැහැ. අපි සමහර තැන්වල ඒ අඩුපාඩුව දකිනවා. ගොඩනැඟිලි පහසුකම් නැතිව, විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය විතරක් වැඩි කළාට එම කාර්ය සම්පූර්ණ කරන්න බැහැ. වැඩි කිරීම හොඳයි. හැබැයි, ප්‍රායෝගිකව ක්‍රියාවට නැඟීම සඳහා ඉතිරි පහසුකම් ටික ලබා දීමට අවශ්‍ය කඩිනම් ක්‍රියා මාර්ග ගත යුතුව තිබෙනවා.

යටිතල පහසුකම් සම්බන්ධයෙන් ගත්තොත්, බොහෝ තැන්වල අධිකරණ කටයුතු කිරීම සඳහා සුදුසු අධිකරණ ශාලා නැතිකම අද අපට තිබෙන විශාල ප්‍රශ්නයක්. අද තිබෙන සමහර අධිකරණ ශාලා සුද්දාගේ කාලයේ ඉඳලා තිබෙන ඒවා. ඒවා දිරාපත් වෙලා. සමහර වේලාවට අධිකරණ ශාලාවල තිබෙන fans වැඩ කරන කොට ශබ්ද ඇහෙනවා. උසාවියේ නඩු අහන්න බැහැ. Fan එක කැරකෙනකොට කර කර ගානවා. සමහර fans වැඩ කරන්නේ නැහැ.

ඒ විතරක් නොවෙයි. ඒ උසාවිවලට යන සාමාන්‍ය ජනතාව අද මුහුණ දෙන බරපතළම ප්‍රශ්නයක් තිබෙනවා. අද විනිශ්චයකාරවරුන්ගේ වැටුප්, විනිශ්චයකාරවරුන්ගේ පහසුකම් ගැන විතරක් නොවෙයි බලන්න ඕනෑ, ගරු අමාත්‍යතුමියනි. අද අධිකරණයකට යන සාමාන්‍ය දුප්පත් මිනිසකුට යන්න වැසිකිළියක් නැහැ. එය ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ ඉඳලා සාමාන්‍ය නගරවල මහේස්ත්‍රාත් අධිකරණ දක්වාම තිබෙන ප්‍රශ්නයක්. අධිකරණයට යන සාමාන්‍ය පුද්ගලයකුට හදිසියකට යන්න ඒ අධිකරණ භූමිය තුළ වැසිකිළියක් නැහැ. තිබෙන වැසිකිළිවල තත්ත්වය ඉතාම දුර්වලයි. ඒ පහසුකම් සැපයීම අධිකරණ අමාත්‍යාංශයේ වගකීමක්. සමහර අධිකරණ ගොඩනැඟිලි තිබෙන්නේ තවමත් අර පරණ තත්ත්වයේයි. අධිකරණ නීති, පනත් සංශෝධනය කරලා විදේශගත ශ්‍රී ලාංකිකයන්ට තමා සිටින රටවල ඉඳලා නවීන තාක්ෂණය යටතේ -ඩිජිටල් තාක්ෂණය යටතේ- සාක්ෂි දීමට පහසුකම් සැලසීම ආදි දේවලට අපි අණපනත් හදනවා; ඊට අදාළ කටයුතු සිදු කරනවා. ඒක හොඳයි. හැබැයි ඒ ගැන කතා කරන කොට ගමේ සාමාන්‍ය උසාවියේ තිබෙන ප්‍රශ්නය සම්බන්ධයෙන් අවශ්‍ය කරන මැදිහත් වීමත් අප කළ යුතුයි. එහෙම නැත්නම් අපට පෙනෙන්නේ මතු පිට පෙනෙන දේවල් ටිකක් විතරයි.

ඇත්තටම අභ්‍යන්තරයේ තිබෙන සැබෑ ප්‍රශ්නවලට විසඳුම් ලබා දීමක්, අවශ්‍ය කරන පහසුකම් ලබා දීමක් සිද්ධ වන්නේ නැහැ. කතා කරන විට එය සරල කාරණාවක් විධියට අපට පෙනෙන්න පුළුවන්. සමහර කෙනකුට හිතෙන්න පුළුවන්, 'මෙය හරි පුංචි දෙයක් නේ. මේක පාර්ලිමේන්තුවේ කතා කරන්න ඕනෑ දෙයක්ද?' කියා. නමුත් මෙය ඒ තරමම බරපතළ ප්‍රශ්නයක්. මොකද, කෙනකු අධිකරණයකට යන්නේ ඉතාම තීරණාත්මක නඩු තීන්දුවක් ගන්නයි. ජීවිතය පිළිබඳ තීන්දු තීරණ ගන්නා, මරණ දඬුවම ආදි දඬුවම් ලබා දීම පිළිබඳ තීන්දු තීරණ ගන්නා තැනක්, එය. එහෙම නැත්නම්, තමන්ගේ දේපළ පිළිබඳ වැදගත් තීන්දු ගන්නා තැනක්, එය. ඒ වාගේ තැනකට යන ජනතාව ඒ ස්ථානවල වැඩි කාලයක් ගත කරනවා. එවිට අත්‍යවශ්‍ය දෙයක් තමයි, වැසිකිළි පහසුකම් කියන එක. ගරු අධිකරණ අමාත්‍යතුමියනි, නීතිඥවරියක විධියට ඔබතුමිය මේ ගැන දන්නවා. කොළඹ අලුත්කඩේ පිහිටි ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉඳලා ගම්වල තිබෙන සාමාන්‍ය උසාවි දක්වා වූ උසාවි පද්ධතියට ඒ පහසුකම් තවමත් සපයා නොතිබීම බරපතළ ප්‍රශ්නයක්.

ගරු අමාත්‍යතුමියනි, අධිකරණවල තිබෙන තවත් බරපතළ ප්‍රශ්නයක් තමයි, නඩු තීන්දු පිළිබඳ තත්ත්වය. සමහර විනිශ්චයකාරවරු සමහර නඩු සම්බන්ධයෙන් ඇප ලබා දෙනවා. එවැනිම චෝදනාවකට අදාළව තවත් උසාවියකින් ඇප දෙන්නේ නැහැ. සමහර වෙලාවට ඒ ඇපයේ මුදල් ප්‍රමාණය වෙනස් වෙනවා. ගෙවා ගන්න බැරි, දරා ගන්න බැරි ඇප මුදල් ප්‍රමාණයක් නියම කරනවා. බැලුවාම, චෝදනාව එකයි. හැබැයි තීන්දු දෙකක්. ඒ පිළිබඳව ඒකමතිකත්වයක් නැහැ. විනිශ්චයකාරවරු අතර ඒ පිළිබඳව ඒකමතිකත්වයක් නැහැ. ඒකෙන් පැහැදිලි වෙනවා, මෙතැන මොකක් හෝ ගැටලුවක් තිබෙන බව. මේ ගැන දිගින් දිගටම කථා කළා. සමහරු කියනවා, අසවල් විනිශ්චයකාරවරයාගෙන් ඒ තීන්දුව ගන්න පුළුවන්; ඇප ගන්න පුළුවන්. අහවලා නම් ඇප දෙන්නේ ම නැහැ කියා. එතකොට පුද්ගලයා මත මේක තීන්දු වෙන්නේ.

සමහර වෙලාවට විනිශ්චයකාරවරයාගේ පෞද්ගලික ස්වරූපය අනුවත් තීන්දුව වෙනස් වන බව සමහරු කියනවා. ඔහු ටිකක් රළු නම්, දැඩි නම් ඇප දෙන්නේ නැහැ කියනවා. ඔහු ටිකක් සංවේදී කෙනෙක් නම් ඔහුගෙන් ඇප ගන්න පුළුවන් කියනවා. එහෙම වන්නට බැහැ. නීතිය නම් කාටත් එක හා සමාන වෙන්න ඕනෑ. මෙතැන තිබෙනවා, නොවිසඳුණු ගැටලුවක්. හැමදාම අපි එය දකිනවා. එම නිසා එය වෙනස් කිරීම සඳහා ඒ විනිශ්චයකාරවරු තුළ නීතිය පිළිබඳ ඒකමතිකත්වයක් ඇති කරන්න අමාත්‍යාංශය පැත්තෙන් වැඩ පිළිවෙළක් අත්‍යවශ්‍යයි. අපි අසා තිබෙනවා, සමහර විනිශ්චයකාරවරු තමන්ගේ අත් දැකීමෙන් කියා තිබෙනවා, මීට දශක දෙකකට තුනකට කලින් මහේස්ත්‍රාත් උසාවියේ නඩු අහනකොට ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක් ඒ නඩුව අහගෙන ඉන්න පහළ උසාවියට එන බව. ඇවිල්ලා පැත්තකින් වාඩි වෙලා මහේස්ත්‍රාත් උසාවියේ විනිශ්චයකාරවරයා නඩුව අහන විධිය බලාගෙන ඉන්නවා. පානදුර උසාවියේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව අහනකොට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයා ඇවිත් පැත්තකට වෙලා වාඩි වෙලා බලාගෙන ඉන්නවා, කොහොමද නඩුව අහන්නේ කියා. එහෙම පසු විපරම් කරලා එහි වැරදි තිබෙනවා නම්, අඩු පාඩු තිබෙනවා නම්, ඉහළ උසාවියේ - ශ්‍රේෂ්ඨාධිකරණයේ- විනිශ්චයකාරවරයා ඒ මහේස්ත්‍රාත් උසාවියේ විනිශ්චයකාරවරයාට උපදෙස් දෙනවා.

එහෙම ක්‍රමයක් අද නැහැ. අද ශ්‍රේෂ්ඨාධිකරණයේ ඉන්න සමහර ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරු ඉතිහාසයේ අත් දැකීම් ලබා තිබෙනවා. ඔවුන් පහළ උසාවිවල වැඩ කරද්දී, මහේස්ත්‍රාත් උසාවිවල වැඩ කරද්දී, මහාධිකරණවල වැඩ කරද්දි ඔවුන්ගේ නඩු කටයුතු පිළිබඳ පුහුණුවක් තිබුණා; ඔවුන්ගේ නඩු කටයුතු

[ගරු විජිත හේරත් මහතා]

පිළිබඳ පසු විපරමක් තිබුණා; ඔවුන්ගේ නඩු කටයුතු පිළිබඳව ඇගයීමක් තිබුණා. අද එහෙම එකක් නැහැ. ඇගයීමක් නැති වුණාම විනිශ්චයකාරවරයාට අවශ්‍යා පරිදි, ඔහුගේ කැමැත්ත පරිදි තීන්දු ලබා දෙනවා. සමහර විනිශ්චයකාරවරු ඉන්නවා, අවුරුදු ගණන් නඩු තීන්දු ලියන්නේ නැහැ. නම් වශයෙන් කියන්න මම කැමති නැහැ. ඕනෑනම් නම් ගම් තිබෙනවා. සමහර විනිශ්චයකාරවරුන්ට නඩු තීන්දු ලියා ගන්න බැහැ. ස්ථාන මාරුවීමක් ආවාම කලින් උසාවියේ නඩු තීන්දු තවමත් ලියා අවසාන කර නැහැ. නඩුව අහලා ඉවරයි; තීන්දුව දීලාත් ඉවරයි. හැබැයි නඩුවේ තීන්දුව ලිඛිතව ඉදිරිපත් කරන්න, නඩු තීන්දුවේ ලිඛිත පිටපත දෙන්න අවුරුදු පහ හය යනවා. සමහර විනිශ්චයකාරවරු ඉන්නවා, නඩු තීන්දුව ලියා ගන්න හැකියාවක් ඇත්තේම නැහැ. ඒ තත්ත්වය වෙනස් කරන්නේ කොහොමද? ඔහුට හෝ ඇයට නඩු අහන්න පුළුවන්. හැබැයි තීන්දුව ලියන්න බැහැ.

තීන්දුව ලියන්නේ නැති වුණාම, ඒ අදාළ පාර්ශ්වයට නඩු තීන්දුව ලැබෙන්නේ නැහැ. මොකක්ද, මෙහි තිබෙන ගැටලුව? ඒ විනිශ්චයකාරවරුන් සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහනක් කිරීමට අධිකරණ අමාත්‍යාංශය මඟින් තවමත් කටයුතු කර නැහැ. හිටපු ගමන් ඉහළ උසාවිවල සමහර විනිශ්චයකාරවරුන්ට විදේශ ශිෂ්‍යත්ව හෝ විදේශ පුහුණුව සඳහා යම් අවස්ථාවන් දෙනවා. හැබැයි, පහළ උසාවි, මහාධිකරණ උසාවි, දිස්ත්‍රික් උසාවි සහ මහෙස්ත්‍රාත් උසාවිවල විනිශ්චයකාරවරුන්ව පුහුණුවට ලක් කරන්න ඒකෙන් බැහැ.

සමහර නඩු තීන්දුවලදී හිතාගන්න බැරි නඩු තීන්දු ලැබෙනවා. ඒ සිද්ධිය සම්බන්ධයෙන්ම වෙනත් උසාවියකදී සම්පූර්ණයෙන්ම වෙනස් තීන්දු ලැබෙනවා. ඒ නිසා මේකේ පරස්පරයක් මතු වෙලා තිබෙනවා. ඒ පරස්පරයේ තත්ත්වය දකින්න මූලික හේතුවක් වෙලා තිබෙන්නේ, මේ විනිශ්චයකාරවරුන් පිළිබඳව පසු විපරමක් නැහැ. නඩු තීන්දු ලබා දීම පිළිබඳව, නඩු තීන්දු ලිවීම පිළිබඳව, ඒ නඩුව අහන්නේ කොහොමද කියන එක පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් විතරක් නොවෙයි, ඔහු මේ කටයුත්ත කොයි තරම් ප්‍රමාණයකට සාර්ථකව ඉටු කරලා තිබෙනවාද කියලා පසු විපරමක් කළ යුතු වනවා. ඔබතුමන්ලා ඇගයීමට ලක් කරන්නේ, නඩු කීයක් අහලා තිබෙනවාද, නඩු කීයක් සමතයකට පත් කරලා තිබෙනවාද, නඩු කීයක් අවසන් කරලා තිබෙනවාද කියලායි. එච්චරයි. ඉතින්, ඉක්මනින් නඩු අවසන් කරපු විනිශ්චයකාරවරයා හොඳයි. නිර්ණායකය විය යුත්තේ ඒක නොවෙයි. ඒකෙන් මනින්න බැහැ, විනිශ්චයකාරවරයෙක්ගේ නිවැරදිභාවය; සාධාරණභාවය.

ගරු සභාපතිතුමනි, අද අපේ රටේ තිබෙන බරපතළ ප්‍රශ්නයක් තමයි විනිශ්චයකාරවරුන්ගේ කටයුතු පිළිබඳ ඇගයීමක්; පසුවිපරමක් නැතිකම. සමහර විනිශ්චයකාරවරු තමන්ගේ රාජකාරිය ඉතාම ඉහළින්, ඉතාම හොඳින් කරනවා. ඒ අය සමහර වෙලාවට පාන්දර දෙකට-තුනට නැඟිටලා එදාට අදාළ නඩු තීන්දුව ලියා ගෙන තමයි උසාවියට එන්නේ. එහෙම විනිශ්චයකාරවරු අපේ රටේ ඉන්නවා. හැබැයි, ඒ අය පිළිබඳ ඇගයීමකුත් නැහැ. අර වැඩ නොකරන, තීන්දුව ලියා ගන්න බැරි විනිශ්චයකාරවරු පිළිබඳ ඇගයීමක් නැහැ වාගේම; පසු විපරමක් නැහැ වාගේම හරියට වැඩ කරන හොඳට වැඩ කරන විනිශ්චයකාරවරු පිළිබඳ ඇගයීමේ ක්‍රමවේදයකුත් නැහැ. ඔවුන්ට පහළ උසාවියෙන්, ඉහළ උසාවියට යන්න උසස්වීම් දෙනවා. මොකක්ද නිර්ණායකය? ජ්‍යෙෂ්ඨතාව. ඒක තමයි ප්‍රධාන එක. කොච්චර පරණද? කොච්චර senior ද? ඒක තමයි බලන්නේ. Seniority එකෙන් ඔහුගේ හැකියාව මනින්න බැහැ. ඒක තමයි අධිකරණ පද්ධතිය තුළ යම් ව්‍යාකූලත්වයක් නිර්මාණය වෙලා තිබෙන්නේ.

ගරු අධිකරණ අමාත්‍යතුමියනි, එම නිසා මෙම විනිශ්චයකාරවරුන් පිළිබඳ පසු විපරම් කිරීම වාගේම, ඇගයීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුයි කියලා ඔබතුමියට නැවත මතක් කිරීමක් කරනවා. ඇත්තටම ගත්තොත් මේ නැවත මතක් කිරීම කියලා කියන්නේ, මේවා මීට කලින් අවස්ථා කිහිපයකදීම කථා කරලා තිබෙනවා. නමුත්, ක්‍රියාවට නැඟිලා නැහැ. එය ක්‍රියාවට නැඟීම නව ඇමතිතුමිය හැටියට ඔබතුමියගේ වග කීමක්; ඔබතුමියට කරන්න පුළුවන් දෙයක් කියලා මම හිතනවා. ඔබතුමියගේ පැත්තෙන් එහෙම කරයි කියන බලාපොරොත්තුවක් ඇතිවයි මා මෙය ඉදිරිපත් කරන්නේ. තව අවුරුද්දකින් නැවත ඔබතුමියට මේ දේවල් කියන්න ඉඩ තියන්න එපා කියලාත් මම කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, පහසුකම් ගැන කථා කරද්දී විනිශ්චයකාරවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කරන්නත් ඕනෑය කියන එක මම කියන්න කැමැතියි. ඔබතුමිය දන්නවා ඇති, දැනට පහළ උසාවිවල ඉන්න විනිශ්චයකාරවරුන්ට ලබා දී තිබෙන වාහනවල අවුරුදු 10 කාලසීමාව ඉක්මවා තිබෙන බව. ඒ වාහන වෙනුවෙන් නව වාහන බලපත්‍ර, නව වාහන ලබා දීමේ අවශ්‍යතාව තිබෙනවා. තවමත් ඒක සිද්ධවෙලා නැහැ. දැනට තිබෙන ක්‍රමවේදය අනුව, යම් කිසි අවස්ථාවකදී විනිශ්චයකාරවරයකුගේ වාහනයක් යම් කිසි අනතුරකට ලක් වුණොත්, නැත්නම් එහි කාර්මික දෝෂයක් ඇති වුණොත් ඒ වාහනය අර ගෙන එම විනිශ්චයකාරවරයාම ඒ අදාළ ආයතනයට යා යුතුව තිබෙනවා. යාපනයේ වැඩ කරන විනිශ්චයකාරවරයාගේ වාහනයේ එවැනි ප්‍රශ්නයක් මතු වුණොත්, යාපනය උසාවියේ නඩු ඇහිල්ල නතර කරලා, ඒ විනිශ්චයකාරවරයාටම කොළඹ ඇවිල්ලා ඒ වාහනයේ නඩත්තු කටයුත්ත කර ගන්න, එහෙම නැත්නම් ඒ කාර්මික දෝෂය නිවැරදි කර ගන්න සිදු වෙනවා. ඒ නිසා මේ සඳහා යම් කිසි ක්‍රමවේදයක් හැදිය යුතුව තිබෙනවා. ඒ ලබා දෙන වාහනය පිළිබඳව විනිශ්චයකාරවරු වග කියන්න ඕනෑ. ඒ පිළිබඳව විවාදයක් නැහැ. හැබැයි, ඔහු විසින් හෝ ඇය විසින්; විනිශ්චයකාරතුමා හෝ විනිශ්චයකාරතුමිය විසින් ඒ වෙනුවෙන්ම කොළඹ ඇවිල්ලා ඒ වාහනයට අදාළ කටයුත්ත කර ගන්න ගියොත් ඒකෙන් නඩු ප්‍රමාද වෙනවා. ඒවා සුළු කරුණු -minor issues- විධියට අපට පෙනුණාට, සමහර වෙලාවට ඒ විනිශ්චයකාරවරයා උසාවියට යන්නේ නැතිව වාහනය අරගෙන කොළඹ ආවොත් දහස් ගණනකගේ නඩු අවුරුදු ගණනක් කල් යනවා. පුංචි දෙයක්. හැබැයි, ඒ පුංචි දෙයින් ඇති වන ප්‍රතිඵලය බරපතළයි. ඒ පිළිබඳවත් ඔබතුමියගේ අවධානය යොමු කරවනවා.

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමිය කැබිනට් පත්‍රිකාවක් දමලා වෙනම අධිකරණයක් පිහිටුවන්නට යෝජනාවක් සම්මත කළා. ඒක හොඳයි. ඒ Trial-at-Bar එක හොඳයි. ඒකෙදි කිව්වේ, "අල්ලස් හා දූෂණ නඩු ඒ උසාවියේ අහන්න පුළුවන්. ඒ නඩු කටයුතු කඩිනමින් අවසන් කරන්න පුළුවන්. එතකොට ඒ නඩු ප්‍රමාද වන්නේ නැහැ." කියලායි. ඒක හොඳයි. හොඳයි කියනවා වාගේම, දැන් ඔබතුමිය දන්නවා, අදත් රටේ බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙන මහා පරිමාණ බැඳුම්කර මගඩිය; බැඳුම්කර වංචාව පිළිබඳව. ඒ පිළිබඳව COPE කමිටුවෙන් ඉතාම පැහැදිලි වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. මෙයට වග කියන්න ඕනෑ කවුද, වග උත්තරකරුවන් කවුද කියන එක නිරවුල්ව පැහැදිලිව ඒ COPE වාර්තාවෙන් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාව ඉදිරිපත් කරලා දැන් අවුරුද්දක් විතර වෙනවා. ඒ වාර්තාව ඉදිරිපත් කරලා අවසන් වෙනකොට තමයි, ජනාධිපතිවරයා විසින් විශේෂ ජනාධිපති කොමිසමක් පිහිටෙව්වේ. ඒ ජනාධිපති කොමිසම සාක්ෂි විමසමින් තව තවත් කරුණු එළියට අදිමින් තිබෙනවා. ඒකෙන් ගොඩක් ඒවා එළියට එනවා.

හැබැයි, දැන් මේ කොමිසමේ කටයුත්ත අවසන් වුණාම මොකක්ද වෙන්නේ? ජනාධිපති කොමිසමෙන් කරන්නේත්

වාර්තාවක් හදලා, ඒ වාර්තාව අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කිරීම. ජනාධිපතිතුමාට නැවත සිදු වෙන්නේ, ඒ වාර්තාව උසාවියට ඉදිරිපත් කරලා, උසාවිය මඟින් නැවත නඩු විභාගයක් පවත්වාගෙන යන්න. ජනාධිපති කොමිසමේ කටයුතු ඉවර වෙන්න තව මාස කිහිපයක් තිබෙනවා කියලා කියනවා නේ.

අද අගමැතිවරයා ඒ කොමිසම හමුවේ සාක්ෂි දෙනවා. අගමැතිවරයා සාක්ෂි දීලා දින කිහිපයකින් පසුව බොහෝ වෙලාවට කොමිසමේ කටයුතු ඉවර වෙන්න පුළුවන්. ඊට පස්සේ වාර්තාව එනවා. ඒ වාර්තාව උසාවියට යවනවා. ආයෙත් උසාවිය මුල ඉඳලා නඩු අහනවා. නඩු අහලා ඉවර වෙනකොට තව අවුරුදු තුනක් විතර යනවා. එතකොට ආණ්ඩුවේ කාලය ඉවරයි. එතකොට මේ කෝප් මගඩියට අදාළ අයට දඬුවම් ලැබෙන්නේ නැහැ, යුක්තිය ඉටු වෙන්නේ නැහැ, ජනතාව බලාපොරොත්තු වන සාධාරණය ඉටු වෙන්නේ නැහැ. ඒ නිසා COPE වාර්තාව මත පදනම් වෙලා උසාවියට යන්න ඔබතුමියලාට පුළුවන්, ගරු ඇමතිතුමියනි. ඒ COPE වාර්තාව කථානායකතුමා හරහා නීතිපති දෙපාර්තමේන්තුවට යැව්වා. කොයි තරම් හදිස්සි වුණාද කියනවා නම් අපට මතකයි, කථානායකතුමා හරහා ඒ වාර්තාව යවන්න කලින් ගරු අගමැතිතුමා -එතුමාම- මැදිහත් වෙලා ඒ වාර්තාව නීතිපති දෙපාර්තමේන්තුවට යැව්වා; මීට අවුරුද්දකට කලින්. ඒ නිසා ජනාධිපති කොමිසමේ සාක්ෂි විමසීම යන අතරේ- ඒ වාර්තාව ඉදිරියේදී ඒමට නියමිතව තිබෙනවා. ඒකට යම් කාලයක් ගත වෙනවා. දැන් ඔබතුමියට පුළුවන්, ඔය පිහිටවපු අධිකරණයෙන් -ඔය පිහිටවපු Trial-at-Bar එකෙන්- ඉස්සර වෙලාම මහ බැංකු බැඳුම්කර වංචාව පිළිබඳ නඩුව අහලා පෙන්වන්න. පුළුවන් නම් අහලා පෙන්වන්න.

දැන් ඒක පටන් ගන්න. ඒක තමයි හොඳම පූර්වාදර්ශය. එතකොට රටටම කියන්න පුළුවන්, ඔන්න අපි අධිකරණයක් පිහිටෙව්වා, ඔබතුමිය අධිකරණ ඇමතිවරිය විධියට පත් කළ නිසාම ඔබතුමිය මැදිහත් වෙලා- දැන් ඔබතුමියලා කියනවා නේ, ආණ්ඩුව තමයි COPE එකේ සභාපති පත් කළේ කියලා. ආණ්ඩුව නොවෙයි පත් කළේ. කථානායකතුමා පත් කළේ. නමුත් එහෙම කියනවා. එහෙම නම් අපි කියනවා, ආණ්ඩුව අධිකරණ ඇමතිවරිය විධියට ඔබතුමිය පත් කළා, පුළුවන් නම් කරලා පෙන්වන්න, දූෂණ වංචා පිළිබඳව පිහිටවපු අධිකරණයේ -Trial-at-Bar එකේ- පළමුවෙන්ම අහන නඩුව විධියට බැඳුම්කර වංචාව පිළිබඳ නඩුව අහලා පෙන්වන්න කියලා. ඒකට ජනාධිපති කොමිසමේ වාර්තාව එනතුරු ඉන්න ඕනෑ නැහැ. ඒකට ජනාධිපති කොමිසමේ වාර්තාව එනකල් ඉන්න කිසිම අවශ්‍යතාවක් නැහැ. මොකද, දැනටමත් COPE වාර්තාව තිබෙනවා; COPE වාර්තාව නීතිපති දෙපාර්තමේන්තුවට යවලා තිබෙනවා. දැන් අවුරුද්දක් වෙනවා, ඒ අවුරුද්ද ඇතුළත දැන් ඒ පිළිබඳව තිබෙන නීතිමය දේවලුත් ලිහලා ඇති. ඒක වෙන්න එපායැ. අපි දැන ගන්න කැමැතියි, අවුරුද්දකට කලින් යවපු වාර්තාව පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් අරගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද කියලා.

සාමාන්‍යයෙන් මේක පුංචි සිද්ධියක් නොවෙයි නේ? රටේම බරපතළ සිද්ධියක්. ඒ බරපතළ වංචාව පිළිබඳව මීට අවුරුද්දකට පෙර මේ පාර්ලිමේන්තුවේ COPE එකෙන් යැවූ වාර්තාව පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවෙන් ගත් ක්‍රියා මාර්ග මොනවාද? නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගෙන නැති හින්දා නේ තවම නඩු දමා නැත්තේ? ක්‍රියා මාර්ග ගත්තා නම්, මේ වනකොට උසාවියේ නඩුවක් ගොනු කර තිබෙන්න ඕනෑ නේ? ඒකට කොමිසම බාධාවක් නැහැ. කොමිසම අධිකරණයක් නොවෙයි නේ? කොමිසමේ කටයුත්ත එහෙම ගියදෙන්. ඒකේ වාර්තාවත් නිකුත් කළොත්, ඒක උසාවියට තවත් පහසුයි. දැන් නීතිපති දෙපාර්තමේන්තුවට කලින්ටත් වඩා ලේසියි. COPE වාර්තාවත් තිබෙනවා, කොමිසමේ විභාග වුණු සාක්ෂිත් තිබෙනවා, මාධ්‍ය හරහාත් තොරතුරු ලැබිලා තිබෙනවා. ඒ සියල්ලම එකතු කරලා නීතිපති දෙපාර්තමේන්තුවට මේ සම්බන්ධයෙන් වහාම නීතිමය ක්‍රියා මාර්ග ගන්න පුළුවන්. එම නිසා අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාගේ සභාපතිත්වයෙන් පාර්ලිමේන්තුවේ පිහිටු වූ නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් යෝජනා කරපු විධියට ඔබතුමන්ලා දැන් අධිකරණයක් පිහිටුවන්න යනවා.

ගරු තලතා අතුකෝරල ඇමතිතුමිය ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකත් හොඳයි. ඒ අනුව දැන් විශේෂ අධිකරණයක් පිහිටුවන්න ඕනෑ. ඒ අධිකරණය ඉක්මනින් පිහිටුවා, එහි පළමුවෙනි කාර්යය විධියට මහ බැංකු බැඳුම්කර වංචාවට සම්බන්ධ නඩුව අහන්න. අපි අභියෝග කරනවා, පුළුවන් නම් ජනතාවට ඒ පූර්වාදර්ශය ලබා දෙන්න කියලා. ඔබතුමන්ලාට පුළුවන් නම්, ඒ අභියෝගය භාර ගන්න. අධිකරණ ඇමතිතුමිය විධියට ඔබතුමියට අපි ඒ අභියෝගය එල්ල කරනවා. මේ රටේ සිදු වූ බරපතළම දූෂණ වංචා පිළිබඳ සිද්ධිය වන මහ බැංකු බැඳුම්කර නඩුව, මේ පිහිටුවන්න යන වෙනම අධිකරණයේ, Trial-at-Bar එකකින් පළමුවෙනි නඩුව විධියට අසා මේ රටේ ජනතාවට යුක්තිය හා සාධාරණය ඉටු කරන්න. එසේ යුක්තිය හා සාධාරණය ඉටු කරලා පෙන්වන්න කියලා ඉල්ලා සිටිමින් මා නතරවනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අජිත් මාන්නප්පෙරුම මැතිතුමා.

**[පූ.භා. 11.07]**

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම 2015 ජනවාරි 08වැනි දා මේ රටේ ජනතාව තමන්ගේ පක්ෂ දේශපාලනය, තමන්ගේ ආගම, තමන්ගේ ජාතිය, තමන්ගේ කුලය කියන හැම දෙයක්ම අමතක කරලා එකට එකතු වෙලා ලොකු විප්ලවයක් කළා. ධනයෙන්, බලයෙන්, අවනීතියෙන් ආරූඪ කර ගත් පාලන කාලයක් නිමා කරන්නයි, මේ හැමදෙනාම පෙළ ගැසිලා කටයුතු කළේ. ඒ හැමදෙනාගේම ඉල්ලීම වෙලා තිබුණේ; මේ විප්ලවයේ හේතුව වෙලා තිබුණේ මේ රටේ යහ පාලනය ස්ථාපිත කරන්න ඕනෑය කියන එකයි. ඒක වර්තමාන රජය බොහොම කැමැත්තෙන්, බොහොම ඕනෑකමින් පිළිගත්තා. පිළිගෙන, වර්තමාන රජය පිහිටුවනවාත් එක්කම යහ පාලනයට ගැළපෙන විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනස් කරන්න ඕනෑ තැන් ටික සොයා බලා ජනමත විචාරණයකින් තොරව සම්මත කර ගන්න පුළුවන් සංශෝධන ටික අපි එදා දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වශයෙන් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළු කරලා දුන්නා.

මේ මුළු පාර්ලිමේන්තුවේම සහභාගිත්වයෙන්, එහි සිටින මන්ත්‍රීවරු 225දෙනාම එකතු වෙලා සාකච්ඡා කරලා, විවිධ කමිටු පත් කරලා ඒවායේදීත් සාකච්ඡා කරලා, සියලුම දිස්ත්‍රික්කවලට ගිහින් ජනතාවගේ අදහස් අරගෙන, ජනමත විචාරණයකින් වෙනස් කරන්න ඕනෑ කාරණා ටිකත් ස්ථිරසාර ලියවිල්ලක් විධියට සකස් කරන්න ඉතාම පුළුල් ලෙස අප සාකච්ඡා කරමින් පවතින යුගයක් තමයි අද මේ තිබෙන්නේ. අප ඒ කටයුතු කරන අතරේ, අධිකරණ සේවාව, පොලිස් සේවාව ඇතුළු අනිකුත් සේවාවන් රටේ වාතාවරණය අනුව, යහ පාලනයට අවශ්‍ය පරිදි, ස්වාධීන කොමිෂන් සභා යටතට පත් කළා. ඒ අනුව ස්වාධීන කොමිෂන් සභා 9ක් ඇති වුණා. ගරු සභාපතිතුමනි, මේ ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කරන්න ඕනෑය කියන කාරණය

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

වෙනුවෙන් ඔබතුමා එදා විපක්ෂයේ ඉඳගෙන බොහොම සටන් කළා. අපේ නව රජය පත් වුණාට පසුව ඔබතුමාගේ ඒ අදහස මල්ඵල ගන්වන්න හැකියාව, ශක්තිය ලැබුණා.

රටක පොලීසිය ගැන, අධිකරණය ගැන ජනතාව තුළ විශ්වාසයක් නැත්නම් මොකද වන්නේ කියා අප දන්නවා. පොලීසිය දේශපාලන කාර්යාලයක් නම්, එය බලය තිබෙන දේශපාලන පක්ෂයක ශාඛා සමිතියක් නම්, OIC මහත්මයාගේ පුටුවේ ඉඳගන්නේ දේශපාලනඥයා නම්, රටේ මිනිසුන්ට යහ පාලනය ගැන, ප්‍රජාතන්ත්‍රවාදය ගැන විශ්වාස කරන්න බැහැ. රටේ පාලකයා අධිකරණයට telephone call එකක් දීලා නඩු තීන්දුව මේකයි කියා කියනවා නම්, අධිකරණයේ ඉන්න විනිශ්චයකාරවරු පාලකයාට වෙනස් කරන්න පුළුවන් නම්; තමන්ට ඕනෑ තැනට ගන්න පුළුවන් නම් ජනතාවට ඒ පිළිබඳව තිබෙන විශ්වාසය නැතිව යනවා. එතකොට රට එපා වෙනවා. ඒ නිසාම මේ රටේ සිටින බුද්ධිමතුන් බොහෝදෙනෙක් රට හැම දමා ගොස් තිබෙන ආකාරය අප දැක්කා.

මේ රටේ සිදුවන සියලු කාර්ය භාරයන් පිළිබඳව ජනතාවට දැනගැනීමට හැකිවන පරිදි, ජනතාවට ඒවාට අත පෙවීමට හැකිවන පරිදි, ඒවාට ජනතාවගේ සහභාගිත්වය ඇති කිරීම පිණිසත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ස්ථාපිත කරලා, අපි මේ රටේ ජනතාව පාලන බලයට එකතු කර ගත්තා. ජනතාව ශක්තිමත් කළා වාගේම, මේ රටේ රාජ්‍ය තන්ත්‍රය ජනතාවට අවශ්‍ය පරිදි මෙහෙය වන්න පුළුවන් හැකියාව ලබා දුන්නා; ඔවුන්ට ඒ පාර විවර කර දුන්නා.

ඊළඟට, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත ගෙනැත්, මෙතෙක් කල් බලවත් වී සිටි අපරාධකරුවන් මර්දනය කරන්න කටයුතු කළා. ගුරුවරු දණ ගස්වපු මන්ත්‍රීවරු පසු ගිය කාලයේ සිටියා; සංචාරකයා මරලා ඔහු සමඟ සිටි සංචාරක කාන්තාව දූෂණය කළ ප්‍රාදේශීය සභා සභාපතිවරු සිටියා. නඩු අහලා ප්‍රාදේශීය සභා භූමියේදී සමෘද්ධි නිලධාරියාව ගහේ බැඳපු ඇමතිවරු සිටියා. අන්න එවැනි දේවල් නැති කරන්න ඕනෑ නිසා අප අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත ගෙනාවා.

ඒ විතරක් නොවෙයි, මගේ ප්‍රදේශයේ වතුර ඉල්ලා කෑ ගහපු, උද්ඝෝෂණය කරපු දරුවන් වෙඩි තියලා මැරුවා. නමුත් දෙමව්පියන්වත් සාක්ෂි දෙන්න ගියේ නැහැ, භය නිසා. නමුත්, නීතිය ඉදිරියේ ඒ අයව ශක්තිමත් කරන්නට අවශ්‍ය අණපනත් ගෙනාවා. ඒ විතරක් නොවෙයි, පසුගිය දවස්වල සුදු වෑන් සංස්කෘතිය තුළින් ජනතාව බලහත්කාරයෙන් අතුරුදහන් කෙරෙව්වා. නමුත්, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය අණ පනත් ගේන්න වර්තමානයේ සිටවත් ක්‍රියාත්මක වෙන්න කියලා අද අපි ඉල්ලා සිටිනවා.

රජයේ ආයතනවල දූෂණ, වංචා සොයන කමිටුවේ සභාපති ලෙස මෙතෙක් කල් කටයුතු කළේ ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙක්. අද ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා බොහොම ආඩම්බරයෙන් හා උජාරුවෙන් කථා කරනවා, මහ බැංකු බැඳුම්කරය පිළිබඳ වූ වංචා දූෂණ සොයන්න; ඒ සඳහා නඩු පවරන්න කියලා. හැබැයි, ගරු මන්ත්‍රීතුමාම විශ්වාස කරනවා ඇති, එදා මේ වාගේ කාරණා ගැන කථා කරන්නවත් පුළුවන්කමක් තිබුණේ නැහැ. පාර්ලිමේන්තුවේ තිබුණු රජයේ වංචා හා දූෂණ සෙවීමේ කමිටුවට ජනාධිපතිවරයාට හිතෙෂි ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙක් තමයි කටයුතු කළේ. නමුත්, අද ඒක විපක්ෂයට භාර දුන්නා; විපක්ෂයට කථා කරන්න ඉඩ දුන්නා. අඩු පාඩු තිබෙනවා නම් අපට ඒ ගැන කථා කරන්න පුළුවන්. ඒ සඳහා දොරගුළු විවෘත කරලා; මාවත විවෘත කරලා කථා කිරීමට අවස්ථාව අපි ලබාදී තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මෙවැනි තීන්දු රැසක් අරගෙන අපි මේ රට ක්‍රමක්‍රමයෙන් යහ පාලන සංස්කෘතියට ඇතුළත් කරගෙන යනවා. ගරු සභාපතිතුමනි, යහ පාලන සංස්කෘතිය කියන එක switch එකක් දානවා වගේ ක්ෂණයකින් ඇති කරන්න බැහැ කියලා අපි දන්නවා. ඒ සඳහා සියලුදෙනාගේම මනස වෙනස් කරන්න ඕනෑ; හිතන පතන විධිය වෙනස් කරන්න ඕනෑ. එදා වගේ ධනයට බලයට වැඩක් කරගන්න පුළුවන් කියලා හිතන්නේ නැතුව, ප්‍රජාතන්ත්‍රවාදය නිවැරදි තැනට යොමු කරමින්, සාධාරණත්වයට අනුව තමන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරගන්න පුළුවන් කියන මතය රට තුළ නිර්මාණය කරන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, එවැනි පියවර රාශියක් අපි රැගෙන තිබෙනවා.

යුක්තිය පසිඳන ක්‍රියාවලියත් මේ වාගේම වැදගත් දෙයක්. රටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, ක්‍රියාත්මක වෙන්න බොහෝ කාලයක් ගතවෙනවා නම්, එම යුක්තිය පසිඳන ක්‍රියාවලිය ගැන ජනතාව තුළ විශ්වාසයක් නැතුව යනවා. ඒ කියන්නේ අපි අධිකරණය නිවැරදියි කියලා දන්නවා නම්, ඒ වාගේම අධිකරණය පිළිබඳ විශ්වාසය තිබෙනවා කියලා දැනගත්තත්, අධිකරණ ක්‍රියාවලිය නිමවීම සඳහා පරම්පරා ගණනක් ගතවෙනවා නම් එය ප්‍රමාණවත් වෙන්නේ නැහැ. අද වින්දිතයෙක් අධිකරණයට ගියාම සාධාරණය ඉෂ්ට වෙන්නේ ඔහුගේ මුණුබුරාට නම්, ඒ අධිකරණ තීන්දුව කොච්චර නිවැරදි වුණත් ඒක රටට වැඩදායී වෙන්නේ නැහැ; යහපත් වෙන්නේ නැහැ කියන එකත් විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ.

අපේ රටේ නඩුවක් අධිකරණයට පැවරුවාම ඒකේ තීන්දුව එන්න, යුක්තිය පසිඳන්න බොහෝ කාලයක් ගතවෙනවා. අපේ වාර්තා අනුව කියනවා, ඒ සඳහා ගතවන කාලයේ සාමාන්‍ය අගය අවුරුදු දහයහමාරකට ආසන්න වෙනවා කියලා. චූදිතයා appeal කළොත්, තවත් අවුරුදු 7ක් විතර ගතවෙනවා. විශේෂයෙන් මෙන්න මේ දේවලුත් ඉක්මන් කිරීම සඳහා අපි කටයුතු කරන්න ඕනෑ කියලා මම කියනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම මේ කාරණයත් අවධානයට යොමු කරවනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ අංශයට 2016 දී ලිපි ගොනු 4,814ක් ඇවිල්ලා තිබෙනවා. ඒ ලිපි ගොනුවලින් වැඩ අවසන් කරලා තිබෙන්නේ 4,274ක පමණයි. වැඩ අවසන් කරන්න නොහැකිව ලිපිගොනු 13,000ක් ගොඩගැහිලා තිබෙනවා. ඒ කියන්නේ අනිත් වැඩ ඔක්කෝම නවත්තලා අවුරුදු 3ක් මේ ලිපිගොනු ටික බැලුවත් ඉවර කරගන්න පුළුවන්කමක් නැහැ. එහෙම නම් අපි නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කරන්න ඕනෑ. යහ පාලන ප්‍රතිපත්තියට ඒක අත්‍යවශ්‍ය වෙනවා. ළමා අපචාර ගැන බැලුවත් ඒ සඳහා උපදෙස් පතලා ලිපි ගොනු 3,651ක් නීතිපති දෙපාර්තමේන්තුවට ගිහිල්ලා තිබෙනවා. උපදෙස් දීලා තිබෙන්නේ ලිපි ගොනු 2,700කට පමණයි. නමුත් ළමා අපචාර නඩු 17,662ක් තවමත් නීතිපති දෙපාර්තමේන්තුවේ තිබෙනවා, උත්තරයක් දී ගන්න බැරිව file එක දිගහැර ගන්න අවශ්‍ය කාර්ය මණ්ඩලය නැතිව.

අධිකරණ ක්ෂේත්‍රය දෙස බැලුවොත්, එදා සිටම දිනෙන්-දින, දිනෙන්-දින නඩු කල් ගිහින්, නඩු විසඳීම අඩුවෙලා තිබෙනවා. අධිකරණ ක්ෂේත්‍රයට, අධිකරණ පද්ධතියට, ප්‍රජාතන්ත්‍රවාදයට සහයෝගයක් දෙන්නේ නැතුව, කැලෑ නීතිවලින් නඩු අහපු යුගයක් තමයි අපේ රටේ තිබුණේ. මේ රටේ මරණීය දණ්ඩනය නැහැයි කිව්වත්, සුදු වෑන්වලින් අරගෙන ගිහින් අප්‍රසිද්ධියේ මරා

දැමුවා. ආයුධ පෙන්වන්න කියා අරගෙන ගිහින් අප්‍රසිද්ධියේ මරා දැමුවා. එහෙම කැලෑ නීතිය රජ කරපු කාලයක් තිබුණු නිසා සැබෑ නීතිය, ප්‍රජාතන්ත්‍රවාදී නීතිය ශක්තිමත් කිරීම සඳහා පසුගිය කාලවල සිටි පාලකයෝ ශක්තිමත් වුණේ නැහැ.

2014 දෙස බැලුවොත්, උසාවිවලට ලැබුණු නඩු ප්‍රමාණය 14,06,644යි. එයින් සියයට 51යි විසඳිලා තිබෙන්නේ. ඉතිරි නඩු ඊළඟ අවුරුද්දට එකතු වනවා. 2015 දෙස බැලුවොත්, නඩු 13,37,000ක් එකතු වෙලා තිබෙනවා. එයින් සියයට 46යි විසඳිලා තිබෙන්නේ. 2014, 2015 වනකොට විසඳපු ප්‍රමාණය සියයට 51 සිට සියයට 46 දක්වා අඩු වුණා. 2016 දෙස බැලුවාම, නඩු 11,28,665ක් අධිකරණයට යොමු වෙලා තිබෙනවා. ඒකෙන් විසඳිලා තිබෙන්නේ නඩු 3,82,000යි. ඒ කියන්නේ සියයට 34යි විසඳා තිබෙන්නේ. යුක්තිය පසිඳලීම එන්න-එන්නම, එන්න-එන්නම පමාවන ලකුණු තමයි පෙනෙන්නේ. ගරු සභාපතිතුමනි, ඒ නිසා තමයි විශේෂයෙන්ම ඔබතුමා විසින් පත් කරන ලද නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව මේ පිළිබඳව සොයා බලා, මේ පිළිබඳව කටයුතු කරලා -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් වෙමින් පවතිනවා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අවසන් කරනවා, ගරු සභාපතිතුමනි.

අපරාධ යුක්තිය පසිඳලීම කඩිනම් කිරීමට හා කාර්යක්ෂම කිරීමට අදාළව නිර්දේශ වාර්තාවක් 2017 සැප්තැම්බර් 20වන දා අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එය අතිගරු ජනාධිපතිතුමාගේත්, අතිගරු අගමැතිතුමාගේත්, ඒ වාගේම විෂය භාර අමාත්‍ය තලතා අතුකෝරල මැතිනියගේත් අධීක්ෂණයට යොමු කළා. විශේෂයෙන්ම නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් සියලුදෙනාම මේ පිළිබඳව සාකච්ඡා කරලා, ඔවුන්ගේ අදහස් අනුව ක්‍රියාත්මක වනවා. මේ වනකොට සියයට 40ක් වැනි ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ සඳහා මා ගරු ඇමතිතුමියටත්, ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුවේ හා අධිකරණ අමාත්‍යාංශයේ සියලුදෙනාටත් ස්තුතිවන්ත වෙනවා. මේ සියලු නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කළොත්, නඩුවලට ගතවන අවුරුදු දහහතහමාරක් වන ආයු කාලය අවුරුදු දෙකහමාරක් දක්වා අඩු කිරීමේ හැකියාව තිබෙනවා. ඒ තුළින් ජනතාව විශ්වාස කරන ආකාරයට රටේ යහපාලනය ඇති කිරීමට හැකියාව ලැබෙනවා. ඒ සඳහා යම් මුදල් ප්‍රමාණයක් ලබා දීම ගැන මුදල් ඇමතිතුමාටත් ස්තුතිවන්ත වනවා. බොහොම ස්තුතියි.

**[11.18a.m.]**

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)
Mr. Chairman, I am going to speak on a matter on which I have spoken before. That is the question of the number of persons who are being held in custody under the Prevention of Terrorism Law - Tamil political prisoners. Some of them have been convicted, some of them have not been charged and some of them have been charged and their cases are pending. I have discussed this matter, Sir, with His Excellency the President. I have also discussed this matter with the Hon. Prime Minister and we have always found that their positions have been quite reasonable when we discussed this issue with them. We now have a new Minister of Justice and we are looking forward to being able to resolve this matter in a reasonable manner with the new Minister of Justice. I am not blaming the former Minister of Justice. He did not disagree with us, but there was no action being taken by him; things have continued in the same way and nothing else happened.

Sir, there are two main fundamental issues that one has to consider when dealing with this question. One is that those are persons who have committed certain crimes for political reasons. They are not persons who have committed crimes for personal benefit or against society, in that sense of the word. These crimes have been committed for political reasons. That is indisputable. In regard to crimes committed for political reasons, political decisions have been made that those persons can be pardoned and can be released. That has happened in the past in this country. I have said that before a number of times in Parliament. In the insurrection in 1971 and subsequently, during the insurrection in 1987, 1988 and 1989, a large number of persons who committed crimes for political reasons were granted an amnesty, a pardon and they were released

Sir, I have posed this question before and I want to pose it again: why can the same thing not be done now in regard to these persons? If you feel that a person has committed a crime, not for a political reason, but for a personal reason or for some other reason, I would not press you. But, if you are in agreement that these persons have committed these crimes for political reasons, then they must be viewed in the same way in which such cases were viewed earlier in 1971, 1987, 1988 and 1989.

Sir, the second matter that I want to emphasize is that all these persons have been taken into custody under the Prevention of Terrorism Law. Your Government has conceded and accepted that the Prevention of Terrorism Law is an obnoxious law and that you will repeal it. You have made such commitments to the United Nations Human Rights Council, not once, several times and you are, in fact, engaged in a process of drafting a new law and repealing the Prevention of Terrorism Law. That is because the manner of arrest, the manner of investigations, extracting confessions, basing prosecutions entirely on extracted confessions, the manner of prosecution, the nature of the evidence and the manner of judicial finding under the Prevention of Terrorism Law are very different from the rules of justice that prevail when proceedings are conducted under the normal laws of the country.

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

When you yourself admit that the law is obnoxious, the law must be repealed and you are taking steps to repeal the law, my question is, how do you justify keeping persons in custody under that law, at whatever stage their case may be? So, that is an additional factor which I submit in the strong reason for these matters to be considered separately.

His Excellency the President pardoned the person who tried to assassinate him. Why? Because the President was convinced that that man tried to assassinate him for a political reason, not for a personal reason. If a person who tried to assassinate the President can be granted a pardon, why can other prisoners not be granted pardon for crimes which are much lesser in seriousness than that particular crime? These are matters, Sir, that need to be addressed; these are matters which you need to think about.

Very unfortunately, the former Minister of Justice had not paid his attention, in my view, adequately to this matter. I would earnestly make a request to the new Minister. Hon. Minister, after you come back from Korea - I know you are going to Korea with His Excellency the President - and at the convenience of the Hon. Prime Minister, kindly summon a meeting of the Attorney-General, the officials of the Ministry of Law and Order and other persons who should be summoned and we will discuss this matter and try to work out some arrangement because there are a number of demonstrations and fasts that are taking place, both in the North and the East on behalf of these prisoners. Sir, I have got here with me a letter sent to me by the students of the University of Jaffna, asking me to come to Jaffna to meet with them, to explain to me their position. I am unable to go to Jaffna because I have other commitments in Colombo, which are more important. But, I understand the feelings of those students. They are wondering why these persons have been held in custody when other persons who were charged with political crimes earlier on have been released. So, Sir, I think this matter should come to an end.

I was here listening to my honourable Colleague from Mannar when he talked about the three cases that have been transferred to Anuradhapura from Vavuniya. I took that matter up in Parliament by way of an Adjournment Motion some time ago and you were not in the country at that point of time. There was a commitment that when you retuned, there would be a meeting and this matter would be sorted out. But, that matter has not yet been sorted out.

I know that there are persons in this country who are trying to promote communal tensions by raising issues on all these matters to prevent the right thing being done. There are persons who will even say that if these prisoners are released, the country will be divided; there are persons who will say such absurd things. But, we cannot be intimidated and threatened by these people for all time. At some point of time, you must do the right thing. Your Government has been in office for almost three years and these matters have been pending; these issues have been pending for three years.

Sir, I want to appeal to the Hon. Minister, kindly, after you return from abroad, summon a meeting. We will consult the Hon. Prime Minister; we will consult His Excellency the President and we will consult the Attorney -General; you will be present and we will come to a decision in regard to some of these matters. I do not think, Sir, these matters should be allowed to drag on indefinitely because that is not good for the country; that is not good for reconciliation and that is not good for harmony.

These young people must not feel that they are being treated differently. After all, in this country, the armed conflict has come to an end. The LTTE is no more. We do not want the LTTE to return. We do not want violence. We want a resolution of the conflict within the framework of a united, undivided, perpetually indivisible Sri Lanka. That is something we publicly state. So, why do we not try to make harmony with people? Why do we not try to reconcile our differences in a way in which these differences are normally resolved? I would like to appeal both the Hon. Minister and the Hon. Deputy Minister who were present in Parliament when we had the Adjournment Debate to kindly address this question seriously. And Hon. Minister, I would be grateful if on your return, you will convene a meeting where we can discuss this matter and arrive at some decisions.

Thank you.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திநின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

[පූ.භා. 11.30]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම මා අධිකරණ අමාත්‍යාංශය යටතේ කරුණු කීපයක් දැක්වීමට අදහස් කරනවා.

ගරු සභාපතිතුමනි, මූලික අයිතිවාසිකම් පිළිබඳව එක්තරා නඩු විභාගයක් තිබුණා, ශ්‍රේෂ්ඨාධිකරණයේ. එහි අංකය 209,

වර්ෂය 2017. මම තමයි ඒ නඩුවේ පෙත්සම්කරු හැටියට හිටියේ. නිහාල් අමරසේකර මහතා තමයි මූලික කටයුතු සම්පාදනය කරලා ඒ සඳහා මගේ පාර්ශ්විකත්වය ඔහු විසින් ඉල්ලා සිටියේ. ඒ නඩුවේ අවසාන තීන්දුව අනුව, ඒ නඩුවට අදාළ පාර්ශ්ව ගැන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමත්, පොලිස් පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් වැඩිදුර පරීක්ෂා කළ යුතු බව නියම කර තිබුණා. හේතුව, මේ නඩුවට අදාළ කාරණය වන ලංකා මැරයින් සර්විසස් සමාගමේ ඒ ගනුදෙනුව අයථා ගනු දෙනුවක් එහෙම නැත්නම් වංචනික ගනු දෙනුවක් හැටියට ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කිරීමයි. ඒ තීන්දුවෙන් පසු, ඒ වංචනික ගනුදෙනුවට වගකීම් දරන අය අතර හිටපු ජනාධිපතිතුමිය වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියට විරුද්ධව එම පරීක්ෂණ කරන ලෙසත් නියම කර තිබුණා.

මේ අනුව, 2007 මුල සිටම මේ ගැන වැඩිදුර කරුණු විමසුවත්, සාධනීය පිළිතුරක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් අපට ලැබිලා නැහැ. ඉන්පසුව මේ ගැන මෑත කාලයක් වනතුරුම පියවරෙන් පියවර, ලියුමෙන් ලියුම ලියලා යම් කිසි පිළිතුරක් ලබා ගැනීමට විමසීම් කළා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් අන්තිමට අපට ලිපියක් එවා තිබෙනවා. එහි සඳහන් වෙනවා, “You are kindly informed that your complaint dated 09.06.2017 on the above subject has been received.” යනුවෙන්. එහි heading එක : "Former President Chandrika Bandaranaike Kumaratunga."

අපි මේ පැමිණිල්ල දැම්මේ 2017.06.09 දින නොවෙයි. ඒක අවසානයට යැවූ පැමිණිල්ල. අවසානයට ඒ පැමිණිල්ල යැව්වේ, 2017 වසර තුළ මේ ගැන කරන ලද පැමිණිලි ගැන පිළිතුරක් නොමැතිව තිබියදීයි. ඒ අතරතුර, ජනාධිපතිතුමා විසින් මෙවැනි කරුණු විභාග කිරීමේ ප්‍රමුඛතාව ලබාදීම පිළිබඳව විමසා බලන්න අධීක්ෂණ කමිටුවක් පත් කළා. ඒ අධීක්ෂණ කමිටුවට අපි ලියමුක් ලියමින්, අපි යැවූ පැමිණිල්ලේ පිටපතක් තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට යැව්වේ. එම ලියුමේ කියා තිබෙන්නේ, මෙවැනි සැකයට භාජන වුණු පුද්ගලයන්, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නම් කළ පුද්ගලයන් එහෙමත් නැත්නම් විභාගයට භාජන කළ යුතුයි කියන පුද්ගලයන් මෙවැනි කමිටුවක ඉන්නේ කොහොමද කියන එකයි. ඉතින් පසු ගිය හයවැනි මාසයේ ඉඳලා අද වන විට මාස හතරකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත්, මේ ගැන තවම අපට හැලහොල්මනක් නැහැ. මේ කරුණ වෙනත් තැනක විභාග වෙමින් තිබෙනවා නම් හෝ කරුණු විමසමින් තිබෙනවා නම් ඒකට යටත්ව මේකට පිළිතුරු ලබා දීම කල් යනවා කියලා අපට කියන්න පුළුවන්.

මේ ගැන කරුණු විමසමින් තිබෙන වෙනත් කොමිසමක්වත්, වෙනත් කිසියම් වූ කමිටුවක්වත්, වෙනත් කිසියම් වූ ක්‍රියාදාමයක්වත් නැහැ. එසේ තිබියදී, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම මේ ගැන පියවරක් නොගන්නේ ඇයි කියන එක තමයි මගේ පළමුවන ප්‍රශ්නය.

මා මතු කරන්න බලාපොරොත්තු වන දෙවන කාරණය මෙයයි. මේ කාරණාවටම සම්බන්ධව තවත් කරුණුත් ඇතුළත් වූ ලිපියක් නියෝජ්‍ය පොලිස්පතිතුමා මා වෙත එවා තිබෙනවා. ඒ ලිපියේ දිනය තමයි 2015.11.08. මට එවා තිබෙන පිළිතුරු ලිපියේ මෙසේ සඳහන් වනවා:

"01. එහි සඳහන් Lanka Marine Services Ltd. (LMSL) සමාගමේ වත්කම් අක්‍රමික ලෙස විකිණීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක SCFR 209/2007 යටතේ ගොනු කර ඇති පෙත්සමට අදාළව ලබා දී ඇති නඩු තීන්දුවෙන් මතුකරනු ලැබූ කරුණු සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කරන ලෙසට 2007.07.21 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත නියෝග කර ඇත.

එම නියෝගයට අනුව විමර්ශන සිදුකර විමර්ශන උධෘත නීතිපති උපදෙස් සඳහා 2008.12.08වන දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇතත්, මෙතෙක් ඊට අදාළව උපදෙස් ලැබී නොමැත."

විමර්ශන උධෘත දැන් යවන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට නොවෙයි, නීතිපතිතුමාට.

ගරු ඇමතිතුමියනි, මා පළමුව කථා කළේ ඔබතුමිය යටතේ තිබෙන ආයතනයක් ගැන. ඔබතුමිය නම් කියන්නේ ඔබතුමිය යටතේ නොවෙයි තිබෙන්නේ, එය නිදහස් ස්වාධීන කොමිෂන් සභාවක් කියලායි. ඒක ඇත්ත. ස්වාධීන කොමිෂන් සභාවල විෂය ඔබතුමියගේ අමාත්‍යාංශයට විෂයක් හැටියට නම් වෙලා තිබෙනවා කියලායි මම හිතන්නේ. එහෙම නැති වුණත් අධිකරණය ගැන ඔබතුමියට පොදු වගකීමක් තිබෙනවා කියලා මම අනෙක් අතට හිතනවා. අධිකරණය ගැන, අධිකරණයේ යුක්තිය පසිඳලීම ගැන සොයා බැලීමේ පොදු වගකීමක් ඔබතුමියට තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. අධිකරණමය ක්‍රියාදාමයන් ගැන, අධිකරණයේ යුක්තිය පසිඳලීම ගැන මහ ජනයා වෙනුවෙන් අපි කරන පැමිණිලිවලට ඇහුම් කන් දෙන්නට අධිකරණ ඇමතිතුමිය හැර මේ සභාවේ වෙන කවුද ඉන්නේ? අපට කියන්නට වෙන කවුරුවත් නැහැ නේ. එම නිසා ඔබතුමියට විෂය නම් කරලා භාර කරලා නොතිබුණාට මේක භාර ගන්නට වෙනවා. වෙන කවුරුවත් නැති අනාථ විෂයක් හැටියට මේක කවුරුන් හෝ භාර ගන්නට ඕනෑ. ඒක ඔබතුමිය භාර ගන්නවා ඇතියි කියලා මම විශ්වාස කරනවා.

මම දැන් කියන්නේ නීතිපතිතුමා ගැන. නීතිපතිතුමාත් ඔබතුමියගේ අමාත්‍යාංශය යටතේ නොවෙයි නේද ඉන්නේ? [බාධා කිරීමක්] එහෙම නම් කමක් නැහැ. පොලිස්පතිතුමා විසින් 2008.12.08වෙනි දින මේ පරීක්ෂණයට අදාළ ලිපි ගොනුව නීතිපතිතුමාට යවලා තිබෙනවා. නමුත්, "තවම උපදෙස් ලැබී නැත." ඒ කාරණය තමයි මම ඒ ලියුමෙන් අරගෙන පෙන්වන්නට උත්සාහ කරන්නේ. පොලීසිය නීති උපදෙස් ඉල්ලලා වැඩක් නැහැ, ඒ උපදෙස් ලැබෙන්නේ නැත්නම්. උපදෙස් ලැබිලා නැති නිසා එතැනින් ඒ කථාව නතර වුණා. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දෙනවා යම්කිසි අයථා ගනුදෙනුවක් සම්බන්ධව. "මේ ගනුදෙනුව වංචනික එකක්, ඒකෙන් මේ රටේ මහ ජනයාට අලාභයක් වෙලා තිබෙනවා" කියලා. මහ ජනයා වෙනුවෙන් නඩු පැවරූ කෙනෙක් හැටියට මට පක්ෂව ඒ නඩු තීන්දුව ලැබෙනවා.

ඊළඟට, කියනවා මේ වරද පිළිබඳ සැකකරුවන් වන මෙන්න මේ පුද්ගලයන් ගැන වැඩි දුර පරීක්ෂා කර බලන්න කියලා. පොලීසිය යම් පරීක්ෂණයක් කරලා, ඒ සම්බන්ධයෙන් නීතිපතිතුමාගේ උපදෙස් ඉල්ලා ලිපි ගොනුව නීතිපතිතුමාට යවනවා. නමුත් උපදෙස් එන්නේ නැහැ. ඉන් පසුව ඒ කථාව එතැනින් නතර වෙලා තිබෙනවා. මෙහෙම යන කොට නීතියේ ආධිපත්‍යයක් ඉතිරි වෙන්නේ නැහැ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය කියන්නේ මේ රටේ හිටපු ජනාධිපතිතුමිය. එතුමියට මේ රටේ විශේෂ තත්ත්වයක් තිබෙනවා. ඒක ඇත්තයි. නමුත් අපි කවුරුත් නීතියට යටත්. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරලා තිබෙනවා නම් එතුමිය ගැන පරීක්ෂා කළ යුතුයි කියලා යම් වංචනික ගනු දෙනුවක් සම්බන්ධයෙන්, එතුමිය ගැන ඒ පරීක්ෂණය කළ යුතුයි. එසේ නොකර එය මහ හරිනවා නම්, එයින් පෙන්නුම් කරන්නේ මේ රටේ නීතියේ ආධිපත්‍ය පිළිබඳව ලොකු ගැටලුවක් තිබෙන බවයි කියන එකත් මා මතක් කරන්නට කැමැතියි.

ගරු සභාපතිතුමනි, ඊළඟට, අපි උසාවිවල ගොඩ ගැසී ඇති නඩු ගැනත් බලන්නට ඕනෑ. ලෝක බැංකු පරීක්ෂණයකදී කියලා තිබෙනවා, නඩු අට ලක්ෂයක් පමණ ගොඩ ගැහිලා තිබෙනවා

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

කියලා. ඒක හරි ඉලක්කමක්ද කියන්න මම දන්නේ නැහැ, මේක මගේ මිත්‍රයෙක් ලබා දුන්නු තොරතුරක්. ලෝක බැංකුව මේ පරීක්ෂණය කරලා, ඒ අයගේ මුදලුත් වැය කළා මේ ගොඩ ගැහෙන නඩු ප්‍රමාණය අවම කිරීමට පියවර ගන්නට. අධිකරණ ඇමතිතුමිය මේ ගැන උනන්දුයි.

"Equipping the Judiciary with the well-proven e-court services,…." ඒ අය දීලා තිබෙන නිර්දේශය ඒකයි. ඉලෙක්ට්‍රොනික ක්‍රමවේදයකට අධිකරණයේ කටයුතුවලින් යම් කොටසක් ඉටු කරන්න කියන එක. එතකොට අනවශ්‍ය කාලයක් ගත වෙන්නේ නැහැ. ඒ ගැන අපි සියලුදෙනාම දන්නවා. අඩුම තරමින් තවම උසාවිවලට e-mail ලිපිනයක්වත් නැහැ. එවැනි තත්ත්වයක් තමයි පෙන්නුම් කරන්නේ. ලෝක බැංකුව අධ්‍යයනයක් කරලායි මේ නිර්දේශය දුන්නේ. ඒ නිර්දේශය තවමත් පමා වෙමින් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේක මේ රටේ මිනිසුන්ගේ මූලික අයිතිවාසිකමක්. මොකක්ද මූලික අයිතිවාසිකම? නඩුවක් දාලා අධිකරණය මඟින් ඒ නඩුවට යුක්තියක් ඉටු කරවා ගැනීමේ - යුක්තිය පසිඳලීම- අයිතියක් ජනතාවට තිබෙනවා. කාලයාගේ ඇවෑමෙන් එවැනි නඩු ගොඩ ගැසෙමින් තිබෙනවා. මේ නඩු ගොඩගැසීම අඩු වෙන්නේ නැහැ; වැඩි වෙනවා. මේ සඳහා ගත හැකි පියවර තිබෙනවා. දැන් e-commerce වාගේ දේවල් තිබෙනවා. ඒ වාගේ හැම ආකාරයකම ඉලෙක්ට්‍රොනික් තාක්ෂණ ක්‍රම භාවිත කරමින් කටයුතු සිදුවෙනවා; ගනු දෙනු සිදු වෙනවා. අධිකරණයටත් මේ තාක්ෂණය භාවිත කරන්නට බැරි ඇයි කියන එක මේ ලියුම අපට භාර දුන්නු කේ.කේ. ගුණවර්ධන මහතා අපෙන් අහනවා. ඔහු ඉලෙක්ට්‍රානික සංනිවේදනය පිළිබඳව අප රටේ ඉන්නා වූ ඉතාමත්ම ඉහළ ප්‍රවීණයෙක්.

අනෙක් අතට, අධිකරණයෙන් යුක්තිය ඉටු වීමට නම්, විනිශ්චයකාරවරුන්ට සමාජයේ විවිධ අංශ පිළිබඳව දැනුමක් තිබිය යුතුයි. අපි දන්නවා, විනිශ්චයකාරතුමෙකුට නීතිය පිළිබඳ කරුණු හදාරන්නට හැකියාව කොච්චර තිබුණත්, එතුමාට සමාජයේ විවිධ අංශ පිළිබඳව දැනුම, තොරතුරු, සියල්ලක්ම එකතු කර ගන්න බැරි බව. එතුමාට ඒ අවස්ථාවන්හිදී යම් ආකාරයකට උපකාර වන අන්දමට සමාජයේ විවිධ අංශ පිළිබඳව දැනුම තිබෙන යම් උපදේශයන් ලබා දිය හැකි පුද්ගලයන් පත් කර තැබුවොත් අපේ අධිකරණයෙන් දෙන තීන්දු මීටත් වඩා සාරගර්භ විය හැකියි කියලා මගේ මිත්‍රයා කල්පනා කරනවා. ඊළඟට, reforming the Judiciary to be representative of a multidisciplinary platform. ආණ්ඩුව අවසාන වශයෙන් මේ ගැන ගන්නා ප්‍රතිපත්තිමය තීන්දුව මොකක්ද කියලාත් බලාපොරොත්තු වනවා.

ඊළඟට, නීතියේ ආධිපත්‍යය. එය අපි කවුරුත් අගය කරන දෙයක්. අපි නඩුවක් දැම්මා. පළාත් පාලන ඡන්දය ප්‍රමාදය පිළිබඳව අපේ ගරු මන්ත්‍රීවරු නඩුවක් දැම්මා. සීමා නිර්ණය කිරීමේ කමිටුවේ සමාලෝචනය සඳහා වැඩි කාලයක් ගත වුණා. අපි කවුරුත් දන්නා විධියට අවුරුදු දෙකකට වැඩි කාලයක් ගත වුණා. එම ප්‍රමාදය මේ රටේ සර්වජන ඡන්ද බලයට පටහැනි වූ ක්‍රියාදාමයක්ය, එය මේ රටේ ජනතා පරමාධිපත්‍යය අහිමි කිරීමක්ය කියලා පැමිණිලි කරමින් නඩුවක් අරගෙන උසාවියට ගියා. ඒ නඩුවේ තීන්දුව මේ වන තුරු ලැබී නැහැ. දැන් මේ මට ලැබෙන සමහර තොරතුරු අනුව මූලික අයිතිවාසිකම් නඩුවක මූලික අවස්ථාව, ඒ නඩුව ඉදිරියට ගෙන යන්න අවසර දෙනවාද, නැද්ද කියන අවධිය පවා පසු කරන්න දීර්ඝ කාලයක් ගත වනවා. දැන් මේ මම කියපු පළාත් පාලන සීමා නිර්ණය කිරීමේ සමාලෝචන කමිටුවේ ඒ ක්‍රියාදාමය නීතියට පටහැනිය කියමින් මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩුවක් ගියා. ඒ නඩුවේ තීන්දුව මම දන්නා හැටියට නම්, මේ වන තුරුත් ලැබිලා නැහැ. දැන් ඒ නඩු තීන්දුවේ අවශ්‍යතාවක් හෝ වළංගුභාවයක් නැති වනවා මේ පළාත් පාලන ඡන්දය පැවැත්වීමේ කටයුතු ආරම්භ වනවාත් සමඟම.

ඊළඟට, බලවතුන් හා දුබලයන් අතර සිදු වන නඩු කටයුතු. බොහෝ විට කුඩා ඉඩම් කට්ටියක් භුක්ති විඳින මනුස්සයකුගේ ඉඩම් කට්ටිය අල්ලපු වැටේ ඉන්න බලවතා විසින් යම් ආකාරයකට ඒකේ යම් තීරුවක් අල්ලා ගැනීම නිසා ආරවුල් ඇති වන අවස්ථා තිබෙනවා. මේක ඉතින්, ස්වාභාවිකව වන දෙයක් නේ. බලවත් ඉඩම් හිමියෝ දුබල ඉඩම් කට්ටිකරුවන්ගේ ඉඩම්වලින් කුඩා, කුඩා ප්‍රමාණයන් තමන්ගේ භූමියට එකතු කරගෙන ක්‍රමානුකූලව එයා ලොකු ඉඩම් හිමියකු බවට පත් වනවා. එසේ නොවන අවස්ථාවලට වඩා, එහෙම වන අවස්ථා වැඩියි. දැන් එවැනි අවස්ථාවකදී උසාවි ගියාම නීති ආධාර සංගමය ඒකට උදවු කරාවිද, නැද්ද කියන එක තිබෙන්නේ ඒ නීති ආධාර සංගමය ඒ නඩුවේ කරුණු පිළිබඳව ඇති කර ගන්නා වූ නිගමන අනුව.

බොහෝ විට ඉඩම් නඩුවලට නීති ආධාර සංගමය මැදිහත් වෙන්නේ නැහැ. බොහෝ වෙලාවට මැදිහත් වෙන්නේ කාන්තාවන්ට සිදු වන හිංසනයන් පිළිබඳව. එහෙම නැත්නම් කාන්තාවන්ගේ, දරුවන්ගේ නඩත්තු පිළිබඳ නඩු කටයුතුවලට. ඒවාට බොහෝසෙයින් මැදිහත් වන බව මම දන්නවා. ඒ අතරම, කවුරු හෝ කෙනෙකුගේ කුඩා බිම් කට්ටිය ඉතාම අසාධාරණ ලෙස පැහැර ගන්න බලවත් ඉඩම් හිමියෙක් ක්‍රියා කරන වෙලාවක වුණත්, නීති ආධාර සංගමය මැදිහත් විය යුතුයි කියලා ප්‍රතිපත්තිමය තීරණයක් තිබුණත්, ඒක නිරන්තරයෙන් වෙන්නේ නැහැ. දැන් බලවතුන් හා දුබලයන් අතර ඇති වන නඩු කටයුතුවලදී බොහෝ විට දුබලයන්ට අවාසිදායක වනවා. හේතුව, ඊට හැකියාව ඇති, දක්ෂතාව ඇති නීතිඥවරු තියා ගන්නට ඔවුන්ට මිල මුදල් නැතිකම නිසයි. ඉතින් අපට නීතියේ ආධිපත්‍ය ගැන, නීතියේ සාධාරණත්වය ගැන කථා කරන්න පුළුවන්කමක් නැහැ.

සමාජයේ බලවතුන් හා දුබලයන් අතර ඇති වන නඩු කටයුතුවලදී ඒ බලවතුන්ට වඩාත් වාසිදායක ලෙස අධිකරණයේ ක්‍රියාදාමයන් - අධිකරණය බලවතුන්ට පක්ෂපාතී වනවාය කියන එක නොවෙයි මා කියන්නේ - වාගේම ස්වභාවිකවම නීතිඥවරු අතර ඇති වන තර්කය, ඒ දෙගොල්ලන් අතර ඇති වන විතර්කය, නීති කරුණු පෙන්වා දීම වැනි කරුණුවලදී බලවතුන්ට ගෙන ආ හැකි නීතිඥයන්ගේ ප්‍රමාණයේ මට්ටමට දුබලයන්ට අරගෙන එන්නට බැහැ. මෙන්න මේකට විසඳුමක් හොයන්නේ කොහොමද? මේකට විසඳුමක් නැත්නම් අපට නීතියේ ආධිපත්‍ය ගැන, නීතියේ සාධාරණත්වය ගැන කථා කිරීමෙන් තේරුමක් නැහැ. යුක්තියේ කන්‍යාව ඇස් බැඳගෙන ඉන්නේ මේවා නොපෙනෙන්නද කියාත් සමහරු කාටූන් මඟින් අහනවා.

රාජීව විජේසිංහ මන්ත්‍රීතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හැටියට හිටපු ටී.බී. වීරසූරිය මහතාට - හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුතුමාට - ලියුමක් ලිව්වා. ඒ ලියුම මා මීට කලින් වතාවකත් කියෙව්වා. ඒ ලියුමේ ඔහු කියන්නේ, නහිල් විජේසූරිය කියන මහත්මයා 2001, - I quote:

> ".... he had as requested by Mr. Ravi Karunanayake given Mr. Ranil Wickremesinghe Rs. 60 million. He had given this, in the form of two cheques he said, to Mr. Karunanayake who had said he should hand them over direct to the then Leader of the Opposition."

2017 සැප්තැම්බර් 20 වැනිදා තමයි ලියුම ලියලා තිබෙන්නේ. හැබැයි, මේ සිද්ධිය ඊට කලින් - 2015ට කිට්ටුව - සිද්ධියක්. ඒ ලියුමේ, "He" කියලා කියන්නේ නිහාල් විජේසූරියටයි. එතුමා කවුරුත් දන්නා ව්‍යාපාරිකයෙක්. It further states, I quote:

> "He then went to the 5th Lane Residence of Mr. Wickremesinghe and gave him the cheques. I believe this money was used to bribe Members of Parliament to cross over so as to bring down the government which President Kumaratunga had constituted following the 2000 election."

ඒ, රාජීව විජේසිංහ මහතාගේ මතය. It further states, I quote:

> "This is a very serious matter and I would urge you to investigate it promptly, ...."

- මෙහෙම කියන්නේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන්. -

> "..... since it is obviously improper for a politician to continue in office if his practice is to bribe Members of Parliament to ensure support. Given too the extraordinary behavior of Mr. Wickremesinghe to cover up the criminal activities with regard to Central Bank bonds, you will be placing the country in ...."

ඊට පස්සේ අදාළ නොවන කොටසක් තිබෙන්නේ. එතුමා නැවත වරක් මෙහෙම කියනවා: I quote:

> "I wrote to you previously about Mr. Wickremesinghe's own admission that he was going to see Mr. Rauff Hakeem on Christmas Day 2014 to ensure his support for the candidacy of Maithripala Sirisena for the Presidency. A statement from me was recorded, but I was not told about any follow up. In this case there are clear lines of investigation open, since Mr. Wijesuriya said I could quote him, and his statement was in front of witnesses who would also I believe be happy to testify."

මේ ලියුමේ සඳහන් කාරණාවලටත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් ඊට පස්සේ කිසිම පිළිතුරක් ලැබිලා නැහැ. මේ කාරණය ගැන අපට කියන්න වෙන තැනක් නැහැ. අද දින කාරක සභා අවස්ථාවේ අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව ඇති වන විවාදය තුළින් පමණයි අපට මේවාට නිසි අවධානයක් යොමු කර ගන්න පුළුවන් වන්නේ.

ගරු සභාපතිතුමනි, මහජන යහපත සඳහා අපි ඉදිරිපත් කරපු නඩු කටයුතු මඟින් මේ රටේ විශාල ආයතන දෙකක් අපට බේරා ගන්න පුළුවන් වුණු බව ඔබතුමා දන්නවා. ඉන් එක් ආයතනයක් තමයි, රක්ෂණ සංස්ථාව හා රක්ෂණ සංස්ථාවට අයිති තවත් ව්‍යාපාර. අනික, ලංකා මැරයින් සර්විසස් සමාගම. වරාය භූමියේ අක්කර අටක් නොමිලේ දීලා තිබුණා. ඒක තමයි අයථා ගනුදෙනුවේ එක් සාක්ෂියක් වුණේ. අනික් පැත්තෙන් එතැන තිබුණු තෙල් ටැංකි ටික. නැව් තෙල් සැපයීමේ සේවාව තිබුණේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට. ඒක තමයි, ලංකා මැරයින් සර්විසස් සමාගම නමින් පසුව සංස්ථාපනය වෙලා තිබුණේ. ඒක තමයි මේ ගනුදෙනුවට භාජනය වෙච්ච, වරාය භූමියේ අක්කර අටක් සහිත මේ රටේ ඉතා වටිනා සම්පත.

උසාවිය මේ නඩු දෙකටම තීන්දුව ලෙස දුන්නේ, "මේවා වංචනික ගනුදෙනු. මේවායින් මේ රටේ මහජනයාට විශාල අලාභයක් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගනුදෙනු දෙකම අවලංගු කරන්න ඕනෑ." කියලායි. මේ ගනුදෙනු දෙක සම්බන්ධයෙන් තොරතුරු සොයා ගෙන මේ කරුණු ඉදිරිපත් කළේ, අපේ නිහාල් අමරසේකර මහතා බව මම ගෞරවයෙන් කියන්නට ඕනෑ. ඒ වන විට පසුගිය රජයේ කැබිනට් මණ්ඩලය හම්බන්තොට වරාය ගැන යම් යම් තීරණ අරගෙන තිබුණා. මම නැවතත් මහජන පෙත්සම්කරුවෙක් හැටියට හම්බන්තොට වරායේ මෙවර තිබෙන ගනුදෙනුවේ ස්වභාවය ගැන අභියෝග කරමින් අධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඉදිරිපත් කළා.

මේ සභාවේදී යම් ප්‍රශ්නයකට පිළිතුරක් හුවමාරු වන වෙලාවේදී ගරු අගමැතිතුමා මට කිව්වා, "හම්බන්තොට වරාය ගැන හිටපු කැබිනට් මණ්ඩලය ගනු ලැබූ තීන්දු ඔබතුමා උසාවියට කියලා නැහැ. ඒ නිසා ඔබතුමා වුවමනාවෙන් කරුණු වසන් කරපු පුද්ගලයෙක් හැටියට වරදක් කළ පුද්ගලයෙක් බවට පත් වෙනවා." කියලා. මගේ පිළිතුර මට ඒ වෙලාවේ ලබා දීමට අවකාශයක් තිබුණේ නැහැ. ගරු සභාපතිතුමනි, මේ සභාවේ අගමැතිතුමාට විශේෂ වරප්‍රසාද තිබෙන බව ඔබතුමා දන්නවා. එතුමාට ඕනෑම වෙලාවක නැඟිටලා ඕනෑම එකක් කියන්න පුළුවන්. නමුත්, ඒකට උත්තර දෙන්න අනෙක් මන්ත්‍රීවරයාට ඉඩක් ලැබෙන්නේ නැහැ. මේ කාරණාව මම මෙසේ මතු කළේ, අධිකරණයට ගියාම අධිකරණයෙන් මට කිව්වෙත් ඒකමයි. අධිකරණයෙන් කිව්වා, "ඔබ දන්නා වූ කරුණු උසාවියට ඉදිරිපත් කරලා නැහැ." කියලා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ වෙලාවෙන් තවත් විනාඩි දෙකක වාගේ කාලයක් තමයි තිබෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නීතිපතිතුමා මූලික විරෝධයක් නැඟුවා, මම දන්නා වූ කරුණු තොරතුරු ඉදිරිපත් කරන්නේ නැතිව වසන් කර තිබෙනවා කියලා. මොකද, පෙත්සම්කරුවෙක් මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩුවක් කියන්න යන කොට තමන් දන්නාවූ කරුණු සද්භාවයෙන් යුතුව සියල්ල කියන්න ඕනෑ. නමුත්, එදා කැබිනට් මණ්ඩලය ගෙන තිබුණු තීරණ මේ රටේ හැමෝම දන්නාවූ කරුණු. කැබිනට් මණ්ඩලය එදා අරගෙන තිබුණු තීරණ මේ රටේ ජන මාධ්‍යයේ පළ වුණා. ඒක මට වසන් කරන්න දෙයක් නැහැ. ඒක මට හෙළිදරව් කරන්න දේකුත් නැහැ. නමුත්, අධිකරණය නීතිපතිතුමාගේ මූලික විරෝධය බාර ගත්තා. "පසුගිය ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයේ මම හිටියාය. ඒ කැබිනට් මණ්ඩලයේදී මේ ගැන ගත්ත තීරණ පිළිබඳ තොරතුරු මම මේ නඩුවට ඉදිරිපත් කළේ නැත." කියන චෝදනාව තමයි මට ඉදිරිපත් කළේ. ඇත්තටම ඒක මගේ පෙත්සමේ හෝ මගේ දිවුරුම් පෙත්සමේ ඉදිරිපත් කිරීමට මට බැඳීමක් තිබෙන දෙයක් වෙන්නේ, ඒක යම් ආකාරයකට වෙනත් කවුරුවත් නොදන්නා තොරතුරක් නම් පමණයි. දැන් මේ කවුරුත් දන්නා තොරතුරු මම ඉදිරිපත් නොකළාය කියන හේතුව මත පෙත්සමේ හරි වැරැදි නොසලකා පෙත්සම නිෂ්ප්‍රභ වුණා. මම අධිකරණයට දොස් කියන්නේ නැහැ. අධිකරණය තීරණ ගන්නේ තමන්ගේ හෘදය සාක්ෂියට එකඟවයි. මම එහෙම විශ්වාස කරනවා. නමුත්, අධිකරණය ගත්තේ වැරැදි තීරණයක්. මෙන්න මේ වැරැදි තීරණයක් ගැනීම තුළින් මගේ නඩුවේ හරි වැරැදි කුමක් ද කියා විමසා බලා තීරණයක් ලබාදීමට අධිකරණට නුපුළුවන් වුණා. මෙන්න මෙවැනි අවස්ථා නීතියේ සාධාරණත්වය ගැඹුරු ප්‍රශ්නයකට ලක් වෙන බවත් කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Malik Samarawickrama, you have 20 minutes.

**[11.55a.m.]**

**ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)

Hon. Chairman, first of all we must thank the Minister of Finance, the Hon. Mangala Samaraweera, for presenting a very progressive forward-looking Budget which has given a clear message. An outward-oriented economy is the path towards prosperity of our people.

Sri Lanka from the times of the ancient kings has always benefited from an open and liberal global trading regime. So, any reversal of that will definitely hurt us as we have seen during the previous periods from 1970 to 77 and during the last regime. Our Government is now firmly focused on making the country more open to the world and become an attractive place to do business.

I remember as a young professional in 1977 when I heard about the kind of new economic reforms and the opening up of the economy I was excited and encouraged to become an entrepreneur. That is the kind of spirit that would be kindled in many young people having heard the direction announced in the Budget 2018 Speech.

The focus of our Government has shifted from a growth model that was heavily dependent on public infrastructure spending to a growth driven more by private enterprises, exports and Foreign Direct Investment. Yes, some jobs do get created by Government infrastructure projects, but that is neither sustainable nor sufficient mainly for two reasons.

Firstly, our debt burden is too high to keep trying to drive the economy with Government spending. We need the private sector to grow in this economy. When I mean the private sector, I am talking about every single entrepreneur and enterprise and not just the larger companies. According to the economic census, 99 per cent of establishments in this country are micro, small and medium enterprises. Our economy is full of enterprising people, enterprising Sri Lankans and we must ensure that we create the best possible environment for them to have, for them to thrive, not only for those who are entrepreneurs today but those who are aspiring to become entrepreneurs tomorrow and in the future.

Secondly, our domestic market is too small to keep trying to drive the economy with inward-looking policies. We have to trade with the world; we have to export to the world and we have to welcome the world to our shores. That is why our Ministry has taken concrete steps to strengthen this aspect of the economy through a series of initiatives and programmes focusing on exports, FDIs, ease of doing business, trade agreements and bilateral economic cooperation.

A new trade policy was approved by the Cabinet in July 2017 to stimulate growth and job creation by improving the ability of firms to export and to compete for the domestic market through a modern, liberal, simple, transparent and creditable trade regime.

The NTP that we launched addresses four key elements: competitiveness through domestic policy reforms; market access and trade facilitation; macro-economic balance, policy and institutional coherence and helping the adjustment of enterprises and workers.

Hon. Chairman, the most significant trade policy measures we are undertaking is the negotiation of bilateral partnership agreements. The FTA in goods with India is being deepened and it is being broadened to include services, investment, technology and training. We have to recognize that India is expected to be the fastest-growing economy in the world in the coming years with a middle-class consumer base that will be 10 to 15 times our own domestic market. Currently, six-rounds of negotiations of ETCA have been successfully concluded and the seventh round is scheduled to be held in December. Our key objective of the Economic and Technology Cooperation Agreement with India is to resolve the implementation issues of the existing FTA. During the ETCA negotiations, India has agreed to implement an early harvest the day ETCA comes into force to address outstanding non-tariff barriers in the Indian market as well as many of the existing procedural barriers and delays in Indian ports of entry. This will particularly benefit exports of perishable goods such as fruits, vegetables, fish and so on. Moreover, Sri Lanka is negotiating the removal of quotas on apparel, pepper and *vanaspati.* An important new measure will be the establishment of the structural grievance redressal mechanism to resolve problems faced by Sri Lankan exporters in a firm and time-bound manner.

A very clear decision has been made not to include solely the Mode 4 base movement of independent professionals under this Agreement. It will not be opened up.

Meanwhile, the China-Sri Lanka FTA will generate nearly 700 million dollars of trade. The apparel sector alone is set to gain US Dollars 400 million in new trade. To date 6 rounds of negotiations have concluded and the agreement contains nine chapters. During these six rounds, a substantial progress has been made. We are also nearing completion of negotiations on the FTA with Singapore, having completed seven rounds of negotiations. We have particularly focused on encouraging Singaporean investments into Sri Lanka. The agreement is expected to be signed in January, 2018.

Hon. Chairman, in addition, GSP Plus had been restored providing preferential market access for 6,000 plus items. If things proceed according to plan it is

possible the narrative will be, “Sri Lanka has preferential access to a market of over 3 billion, China, EU, India, Pakistan, and Singapore". In a world where over 190 countries are competing for FDI this preferential market access can be a unique differentiator.

Hon. Chairman, as you know Sri Lanka ratified the WTO Trade Facilitation Agreement earlier this year. As a key component of this effective national coordination a National Trade Facilitation Committee has been established to drive the implementation of Sri Lanka’s TFA commitments. On trade facilitation, a single electronic window is established to be in operation in the Customs Department shortly. These measures are intended to reduce the transaction cost of the cross-border movement of goods thereby enhancing the trade competitiveness of the economy. All these measures are intended to improve the investment climate and trading environment for both domestic and foreign investors.

We are aware of the possible trade disruptions that can occur during the transition period. An Anti-dumping and Countervailing Measures Bill and a Safeguard Measures Bill are being presented to Parliament soon. The Bills are ready and I think this can be debated and approved in December or January. This will protect domestic business from unfair competition. A trade adjustment package is developed to improve the resilience of the local businesses exposed to increased competition as a result of trade liberalization. Support for local industries is to upgrade machinery and introduce new technology and to provide retraining for workers. Foreign Direct Investments into Sri Lanka has been performing poorly but with efforts that our Ministry is taking this has begun to turn round.

At the Board of Investment, we now have leading private sector personalities, specialists leading investment promotion and appraisals to ensure we get the best of investors to our country that we facilitate them well and tell the other investors about the opportunities here. The approvals and facilitation process for foreign investors is being completely streamlined with decisions being taken quicker more transparently than ever before. The one-stop shop mechanism is being set up to address regulatory inefficiencies and inter-agency coordination.

An organization structure of the OSS and a web solution for OSS approval process has been developed. The BOI has revised its goals and targets in its new Corporate Plan 2017 to 2020 with a view to playing a key role in contributing to the sustainable development of the country driven by FDI. This new Corporate Plan presents a bold and a new strategic approach to targeting and securing significantly higher values of high quality FDI. To complement this, a Single Window Investment Appraisal Committee was established to facilitate granting of approvals within the shortest possible time. An investment facilitation committee is also in place to fast- track approvals of other line agencies. The flagship investment that we brought in 2017 is the new Logistic and Industrial Zone at Hambantota with an initial FDI flow of US Dollars 1.12 billion. A further UD Dollars 500 million is expected within the next two to three years. The Zone is being developed with Chinese investment and we expect a lot of investors, not only from Chinese companies but from many other Asian countries, would be interested in this.

The next will be the Industrial Zones in Milleniya, Mawathagama, Bingiriya and Weligama. The Industrial Park at Milleniya will be an investment from the Rojana Industries of Thailand who is operating seven industrial zones in Thailand mainly with the Japanese investors.

The new Inland Revenue Act, No. 24 of 2017 provides a predictability of incentives for new investment and introduces a new incentive regime with effect from 01st April, 2018 which is based on enhanced capital or investment allowances.

Mr. Chairman, our Ministry is committed to leading the effort in improving the ease of doing business for Sri Lankan entrepreneurs and foreign investors. With technical assistance from the World Bank, we developed a roadmap for Investment Climate Reforms which was launched in July, this year. In the last three months alone, eight teams of Government officials representing public service delivery agencies have been working on eight high priority ease of doing business sub-indicators: starting a business, dealing with construction permits, registering a property, getting credit, trading across borders, enforcing contracts, resolving insolvency and protecting minority interests. Under the eight priority sub-indicators, 15 specific measures to be taken and the timeframes, responsible agencies and outcomes have been identified and the work is progressing accordingly.

Outcomes for mid-2018 include providing a one-day service for company registration to reduce the time taken to register a company from the current nine days to one day, introducing a streamlined online system to reduce the number of days for construction permit issuance from current 115 days to 60 days and introducing a searchable e-Land Registry to enable property registration in five days with two steps rather than the current 51 days with nine steps. The Blueprint of the long-awaited National Single Window will be completed by June, 2018 paving the way to establish a system that integrates more than 20 agencies dealing with various clearances and approvals in trading across borders. Our Ministry is continuously monitoring the reform process towards achieving the objective set out by the Hon. Prime Minister in moving up in the DBI ranking to be within the top twenty economies by 2020.

[ගරු මලික් සමරවික්‍රම මහතා]

These are some of the examples or just some of many outgoing measures the Government is taking to improve the business climate in Sri Lanka for domestic enterprises as well as for foreign investors through legal regulatory and procedural improvements. While this is an ongoing process and benefits will take time to materialize, the positive results are already being seen. An internal report suggests FDI this year will be about 80 per cent more than the last year. We expect FDIs over US Dollars 1 billion - about US Dollars 1.2 billion - this year and in the next year, I believe, it will go up to about US Dollars 2.5 billion.

With regard to innovation and diversification, Mr. Chairman, we have identified that Sri Lanka needs to diversify its economy and produce as well as export a range of new and innovative products and services. With technical input from the Harvard University's Centre for International Development, the teams comprising officials from the BOI, the EDB and the Sri Lanka Tourism Development Authority have been working over the last year to improve our economic diversification targeting foreign investors and identifying new export and investment sectors. This is being directly handled by the State Minister of International Trade, Hon. Sujeewa Senasinghe.

We are also close to finalizing a new National Exports Strategy - NES - with a focus on competitiveness and innovation. The aim is to grow exports from the current US Dollars 10 billion or 11 billion to 20 billion over the next five years in sectors ranging from high value and high quality food and beverages to leisure boats, IT services and electronic components. The NES will be presented to Cabinet within the next two months. What was unique and valuable about this exercise is the close collaboration of the private sector. Every single section of the NES was developed through a participatory approach with over 450 industry leaders, SMEs and public sector officials being consulted.

Another valuable part of this is the strong focus on actions. Actions Plans have been developed for each sector and each trade support functions. We want to make sure that the implementation begins from January itself. I am happy to announce that several proposals made through the NES process haven been included in the Budget by the Hon. Minister of Finance. We also recognize the need to create an eco-system that promotes innovative thinking and creates new products and services. We have embarked on producing a new framework for this including innovation and entrepreneurship strategy with the technical input of the World Bank and co-leadership of the private sector. This will be implemented jointly with the Ministry of the Science, Technology and Research and Ministry of Industry and Commerce. The strategy focuses on upgrading quality and technology of export-oriented SMEs, create the conditions for start-ups to emerge and reorient and upgrade R & D institutions that matter for export growth.

Mr. Chairman, with Sri Lanka gaining the respect and recognition of international community once more, we have been able to forge several Economic Cooperation Agreements with key countries. These will help improve our trade performance, attract more and better FDIs and create good job opportunities for our people. We entered into a Roadmap for further investment promotions between Japan and Sri Lanka and it is a result of the Sri Lanka-Japan Economic Cooperation Policy Dialogue following the visit of the Hon. Prime Minister to Japan in October, 2015. A joint working group has been established to take this work forward and two high-level meetings were held this year.

We are embarking on a similar programme with Korea for both investment promotion as well as transfer of technology and know-how. The Economic Cooperation Agreement is due to be signed at the end of this month during the visit of His Excellency the President to Korea. During the recent visit of the Australian Prime Minister, we entered into a Cooperation Programme with Australia focused on trade and investment promotion.

We have relaunched the EU-Sri Lanka Investor Dialogue in 2017 and up to now three rounds of dialogues have been held this year to resolve trade and investment related problems and grow the bilateral economic cooperation. These leverages nicely on the regaining GSP Plus in May was a great achievement of the Government and it was only possible because of the respect of the international community that the President and the Prime Minister have regained for Sri Lanka.

Mr. Chairman, the people of this country have already seen the benefits of regaining GSP Plus. Apparel exports to EU in the first nine months of this year have increased US Dollars 1.67 billion. In the pre-GSP Plus period, apparels were growing at just 2 per cent, but in the few months of regaining GSP Plus, it has surged by 11.3 per cent.

Fisheries exports are up by 40 per cent compared to the same period last year. The GSP Plus scheme is giving our exporters a renewed opportunity to succeed in the EU market in sectors like fresh and processed vegetables and fruits, coconut products, seafood, ceramics, footwear and of course, apparels.

It is also promoting backward integration resulting in the setting up of new industries creating new employment opportunities for the youth of our country.

With regard to the year ahead, Sir, our Ministry will focus on expanding our trade and investments even further by bringing in good investors to Sri Lanka, who will create good, high-value job opportunities and help Sri Lanka plug into global value chains. We will focus very strongly on operationalizing new investment zones in Hambantota, Milleniya, Weligama, Bingiriya and so on and attracting investors into them.

We will also focus strongly on implementing the National Export Strategy, which will diversify the export base to boost competitiveness among our exporters and win new consumers in new markets. Specifically, our Ministry welcomes the Budget Proposal to launch an Export Market Access Programme that will be implemented through the Export Development Board and the new IT initiative to take this imaging sector to new heights. Through strategic economic cooperation agreements with new countries, we will invite more partners to help Sri Lanka achieve its goals of prosperity and economic transformation. Through improvements in ease of doing business as well as new initiatives to encourage innovation and entrepreneurship, we will create a new culture of enterprise in Sri Lanka. To that end, the proposals on "Enterprise Sri Lanka" announced by the Hon. Minister of Finance and Mass Media are extremely valuable and I look forward to working together to support these efforts and achieve the "Vision 2025" of this Government.

May I also invite, Sir, the Hon. Members of the Opposition to work together with us, leaving aside petty political differences to ensure that our young people have a great future.

Thank you very much.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි, ගරු මලික් සමරවික්‍රම අමාත්‍යතුමාගේ කථාවට අදාළ පැහැදිලි කිරීමකට පමණයි අවස්ථාව ලබා දෙන්න පුළුවන්. I can give you only a minute.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු සභාපතිතුමනි, අද, "රිවිර" පුවත් පතේ තිබුණු ප්‍රවෘත්තියක් ගැනයි මම මේ කියන්නේ. හොරණ වතුයායකින් කොටසක් කාර්මික සංවර්ධන කලාපයක් සඳහා අත් පත් කර ගැනීමට යාම නිසා පවුල් එකසිය හැත්තෑවකට ඒ අය පදිංචිව සිටි නේවාසික ස්ථාන අහිමි වෙන බවත්, ඔවුන්ගේ රැකියා අහිමි වෙන බවත් පත්‍රයේ පළවී තිබුණා. මෙයට ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. සංවර්ධන කලාප ඇති වීමත්, මිනිසුන්ගේ උන්හිටි තැන් හා රැකියා නැති වීමත් අතර තිබෙන්නා වූ ප්‍රශ්නය ගැන ඔබතුමන්ලාගේ අවධානය යොමු වීම අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන ස්ථානය develop කරන්න තවම තීරණයක් අරගෙන නැහැ. දැනට අපි වැඩ කර ගෙන යන්නේ මිල්ලෑව කියන ප්‍රදේශයේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මිල්ලනිය නොවෙයි. මිල්ලෑව වත්ත. මිල්ලෑව තිබෙන්නේ අපේ හිටපු අගමැතිතුමාගේ මුල් ගම තිබෙන පළාතේ.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම් අපි ඒ ගොල්ලන්ට ගෙවල් හදලා දීලා,-[බාධා කිරීමක්]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
වන්දියකුත්-

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
වන්දියකුත් දීලා, දැන් ඒ අය එකඟ වෙලා තිබෙනවා කියලා මට අපේ රාජ්‍ය ඇමතිතුමා කියලා තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ පිළිබඳව අද "රිවිර" පත්තරේ පළවී තිබෙන ප්‍රවෘත්තියට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
බොහොම ස්තුතියි. අපි ඒවා ගැන සොයා බලා ඒ විධියට වැඩ කරන්නම්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
හොඳයි. The next speaker is, the Hon. (Mrs.) Vijayakala Maheswaran. You have ten minutes.

[பி.ப. 12.20]

**ගරු විජයකලා මහේස්වරන් මහත්මිය (ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன் - சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran - State Minister of Child Affairs)

கௌரவ தவிசாளர் அவர்களே, நீதி அமைச்சு மீதான வரவு செலவுத் திட்டக் குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு எனக்கும் சந்தர்ப்பம் அளித்தமைக்காக நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

கடந்த ஆட்சிக்காலத்தில் நீதித்துறை மீது மக்கள் நம்பிக்கை இழக்கும் நிலைமை ஏற்பட்டிருந்தது. ஆனால், அந்த நிலையினைத் தற்போது நல்லாட்சி அரசாங்கம் மாற்றிவருகின்றது. புதிய நீதி அமைச்சராகப் பதவியேற்றுள்ள கௌரவ (திருமதி) தலதா அத்துகோரல அவர்கள் நீதித்துறையின் சுயாதீனம் தொடர்பில் உரிய நடவடிக் கைகளை எடுத்து வருகின்றமை பாராட்டத்தக்கது. சட்டம் சகலருக்கும் சமம் என்றவகையில் தமிழ் அரசியல் கைதிகள் விடயத்தில் நீதியமைச்சானது உரிய நடவடிக்கைகளை எடுக்கவேண்டும்.

தமிழ் அரசியல் கைதிகள் தமது விடுதலை கோரிக் கடந்த பல வருடங்களாகப் போராட்டங்களை நடத்தி வருகின்றனர். நல்லாட்சி அரசாங்கம் பதவியேற்றதையடுத்து, தமிழ் அரசியல் கைதிகளின் விடுதலையைத் துரிதப்படுத்தும் வகையில் பல நடவடிக்கைகளை எடுத்திருந்தது. இதற்கிணங்க, பெருமளவான அரசியல் கைதிகள் விடுவிக்கப்பட்டுள்ளனர். அரசியல் கைதிகளின் வழக்குகளை விசாரிப்பதற்கெனத் தனியான மேல் நீதிமன்றமும் அமைக்கப்பட்டிருந்தது. இந்த நீதிமன்றத்தின்மூலம் வழக்குகள் விசாரிக்கப்பட்டு வருகின்றன. ஆனாலும் பல வருடங்களாகத் தடுத்து வைக்கப்பட்டுள்ள தமிழ் அரசியல் கைதிகள் தம்மை விடுவிக்குமாறு கோரிவருகின்றனர். இந்த விடயத்தில் நீதி அமைச்சு உரிய கவனம் செலுத்த வேண்டும். கடந்த ஆட்சிக்காலத்தில் யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்டதன் பின்னர் 12,600 முன்னாள் போராளிகள் புனர்வாழ்வு அளிக்கப்பட்டு விடுவிக்கப்பட்டனர். அதேபோன்றே தம்மையும் விடுவிக்கவேண்டுமென்று அரசியல் கைதிகள் கோரிவருகின்றனர். அரசியல் கைதிகளின் வழக்கு விசாரணைகள் இழுத்தடிக்கப்படுவதாகவும் குற்றச்சாட்டுக்கள் எழுந்துள்ளன. எனவே, இவர்களது வழக்கு விசாரணையைத் துரிதப்படுத்த நடவடிக்கை எடுக்கப்படவேண்டும்.

அநுராதபுரம் சிறைச்சாலையில் தடுத்துவைக்கப்பட்டுள்ள தமிழ் அரசியல் கைதிகள் மூவர் 40 நாட்களுக்கும் மேலாக உண்ணாவிரதப் போராட்டத்தில் ஈடுபட்டிருந்தனர். வவுனியா மேல் நீதிமன்றத்தில் அவர்களுக்கு எதிராகத் தாக்கல் செய்யப்பட்ட வழக்கானது சட்ட மாஅதிபர் திணைக்களத்தினால் அநுராதபுரம் மேல் நீதிமன்றத்திற்கு மாற்றப்பட்டமைக்கு எதிர்ப்புத் தெரிவித்தும் தமது வழக்கை மீண்டும் வவுனியா மேல் நீதிமன்றத்திற்கு மாற்றுமாறு கோரியுமே இந்தப் போராட்டம் நடத்தப்பட்டது. இந்த வழக்கில் சாட்சியமளிக்கவுள்ள மூன்று பேரது பாதுகாப்புக் கருதியே வவுனியா மேல் நீதிமன்றத்திலிருந்து அநுராதபுரம் மேல் நீதிமன்றத்திற்கு வழக்கு மாற்றப்பட்டதாகக் காரணம் கூறப்படுகின்றது. ஆனால், இந்தக் காரணத்தை ஏற்றுக்கொள்ள முடியாது. ஏனெனில், வடக்கில் நீதிமன்றங்களின் பணிகள் சுயாதீனமாக இடம்பெற்று வருகின்றன. இந்த நிலையில் வவுனியா மேல் நீதிமன்றத்தில் சாட்சியமளிப்பதில் எந்தவித அச்சுறுத்தலும் ஏற்படப் போவதில்லை. ஆனாலும், சட்ட மாஅதிபர் திணைக்களம் வழக்கினை அநுராதபுரம் நீதிமன்றத்திற்கு மாற்றியுள்ளமை யினாலேயே இந்தக் கைதிகள் போராடவேண்டிய நிலைமை ஏற்பட்டிருந்தது. இந்தப் போராட்டமானது வடக்கிலும் வியாபித்திருந்தது. யாழ். பல்கலைக்கழக மாணவர்களும் இந்தக் கைதிகளின் கோரிக்கைக்கு ஆதரவாகப் போராட்டத்தில் ஈடுபட்டிருந்தனர். தொடர்ந்தும் போராடி வருகின்றனர். ஆனாலும், இந்த விவகாரமானது தற்போது மேன்முறையீட்டு நீதிமன்றத்தில் உள்ளமையினால் இவ்விடயத்திற்கு நீதிமன்றமே தீர்வுகாண வேண்டியுள்ளது. தமிழ் அரசியல் கைதிகளின் விவகாரத்தில் சட்ட மாஅதிபர் திணைக்களமானது பக்கச்சார்பற்ற முடிவுகளை எடுக்கவேண்டியது இன்றியமையாததாகும். இந்த விடயம் குறித்து நீதி அமைச்சர் கவனம் செலுத்தவேண்டும். தமிழ் அரசியல் கைதிகளின் வழக்குகளைத் துரிதப்படுத்துவதற்கான செயற்றிட்டங்கள் முன்னெடுக்கப்பட வேண்டும்.

வடக்கு, கிழக்கு மாகாணங்களில் பொலிஸ் நிலையங்களில் தமிழில் முறைப்பாடுகளைப் பதிவுசெய்ய முடியாத நிலைமை நீடித்து வருகின்றது. இதன் காரணமாக நீதிமன்றங்களில் வழக்கு விசாரணைகளும் காலதாமதம் அடைகின்றன. ஏனெனில், பொலிசார் அங்குள்ள நீதிமன்றங்களில் சிங்கள மொழியிலேயே வழக்குகளைத் தாக்கல் செய்கின்றனர். அதேபோன்று அவர்கள் சிங்கள மொழியிலேயே சாட்சியமளிக்கின்றனர். இவற்றையெல்லாம் மொழிபெயர்க்க வேண்டிய நிலைமை காணப்படுகின்றது. இதனால் வடக்கு, கிழக்கில் உள்ள நீதிமன்றங்களில் தாக்கல் செய்யப்படும் வழக்குகளின் விசாரணையில் காலதாமதம் ஏற்படுகின்றது. இதேபோன்றே தமிழ் மக்கள் குற்றப்புலனாய்வுப் பிரிவுக்கோ அல்லது பயங்கரவாதப் புலனாய்வுப் பிரிவுக்கோ முறைப்பாடுகளைச் செய்வதற்குச் சென்றால் அங்கும் தமிழ் தெரிந்த உத்தியோகத்தர்கள் இல்லாத நிலைமை காணப்படுகின்றது. சிங்களத்தில் எழுதப்படும் முறைப்பாடு களுக்குக் கையெழுத்திட வேண்டிய நிலைமையுள்ளது. வடக்கு, கிழக்கில் நீதிமன்றங்களில் வழக்கு விசாரணைகளைத் துரிதப்படுத்த வேண்டுமானால் தமிழ் பேசும் பொலிஸ் உத்தியோகத்தர்களை ஒவ்வொரு பொலிஸ் நிலையங்களிலும் நியமிக்க வேண்டும். தமிழ்ப் பொலிசாரை நியமிப்பதற்கு விசேட நடவடிக்கைகள் எடுப்பதன்மூலமே அங்கு நீதிமன்ற நடவடிக்கைகளைத் துரிதப்படுத்தக்கூடிய நிலைமை ஏற்படும்.

அண்மைக்காலமாக வடக்கில் வாள்வெட்டுச் சம்பவங்கள் அதிகரித்து வருகின்றன. இதனால் மக்கள் மத்தியில் அச்சமான நிலைமை ஏற்பட்டுள்ளது. இத்தகைய வன்முறைகளைத் தடுக்கவேண்டுமானால் நீதித்துறையும் பொலிஸ் திணைக்களமும் ஒன்றிணைந்து செயற்படவேண்டும். வடக்கில் பொலிசார் தமது கடமைகளைச் செய்யத் தவறுவதனாலேயே நீதித்துறையானது உரிய முறையில் செயற்பட முடியாத நிலைமை உருவாகின்றது. எனவே, இந்த விடயம் தொடர்பில் சட்டம் ஒழுங்கு அமைச்சும் நீதி அமைச்சும் விசேட கவனம் செலுத்த வேண்டும்.

கடந்த வெள்ளிக்கிழமை காலி கிந்தோட்டைப் பகுதியில் முஸ்லிம் மக்களை இலக்குவைத்துத் தாக்குதல் இடம்பெற்றுள்ளது. இந்த வன்முறைச் சம்பவத்தினால் முஸ்லிம் மக்களது 66 வீடுகள், 26 கடைகள், 2 பள்ளிவாசல்கள் மற்றும் வாகனங்களுக்குப் பெரும் சேதம்

ஏற்படுத்தப்பட்டுள்ளது. முன்னைய அரசாங்க காலத்தில் முஸ்லிம் மக்கள்மீது வன்முறைகள் திட்டமிட்டவகையில் இடம்பெற்று வந்தன. ஆனால், நல்லாட்சி அரசாங்கமானது அத்தகைய வன்முறைகளைக் கட்டுப்பாட்டுக்குள் கொண்டு வந்திருந்தது. ஆனாலும், காலியில் நடைபெற்ற இந்த வன்முறைச் சம்பவமானது எமது அரசாங்கத்திற்கு அவப்பெயரை ஏற்படுத்தியுள்ளது. எனவே, இத்தகைய வன்முறைச் சம்பவங்களில் ஈடுபட்டவர்கள்மீது நீதித் துறையானது உரிய நடவடிக்கைகளை எடுக்கவேண்டும். இத்தகைய வன்முறைகள் எதிர்காலத்தில் இடம்பெறாமல் தடுக்கவேண்டுமானால், உரிய முறையில் நீதி நிலைநாட்டப்பட வேண்டும்.

வடக்கு, கிழக்கில் நீதிமன்றங்களில் நிலவும் வளப்பற்றாக்குறை நிவர்த்தி செய்யப்பட வேண்டும்; நீதிமன்றங்களுக்கு உரிய கட்டிட வசதிகள், ஆளணி வசதிகள் செய்து கொடுக்கப்பட வேண்டும். இந்த வரவு செலவுத் திட்டத்தில் கிளிநொச்சி நீதிமன்றக் கட்டிடத் தொகுதியை இடமாற்றம் செய்து விரிவாக்கம் செய்வதற்கு நிதி ஒதுக்கப்பட்டுள்ளமை வரவேற்கத்தக்க செயற்பாடாகும். இதேபோன்று யுத்தத்தால் பாதிக்கப்பட்ட வடக்கு, கிழக்குப் பகுதிகளிலுள்ள நீதிமன்றங்கள் அனைத்தும் அபிவிருத்தி செய்யப்பட வேண்டும்.

நிதிக்குற்றங்கள், ஊழல்கள் மற்றும் திட்டமிடப்பட்ட குற்றங்களை விசாரிப்பதற்கு தனியான ஒரு மேல் நீதிமன்றத்தைத் தாபிப்பதற்கு 25 மில்லியன் ரூபாய் இந்த வரவு செலவுத் திட்டத்தில் ஒதுக்கப்பட்டுள்ளது. அத்துடன், தானியங்கி வழக்கு முகாமைப் பொறிமுறையொன்றை அறிமுகம் செய்வதற்கும் 50 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. இத்தகைய குற்றச்செயல்கள் தொடர்பான விசாரணைகள் துரிதப்படுத்தப்பட வேண்டியது அவசியமானதாகும்.

நாட்டில் சிறுவர் துஷ்பிரயோகம் மற்றும் பெண்கள் மீதான வன்முறைகளும் தொடர்ச்சியாக இடம்பெற்று வருவதைக் காணக்கூடியதாக உள்ளது. இத்தகைய துஷ்பிரயோகங்களைக் கட்டுப்படுத்துவதற்கு எமது மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சும் நீதி அமைச்சும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு அமைச்சும் ஒன்றிணைந்து செயற்பட வேண்டியது அவசியமாகவுள்ளது. இத்தகைய செயற்பாடுகளை விரிவுபடுத்த நீதி அமைச்சு நடவடிக்கைகளை எடுக்க வேண்டும். எமது நல்லாட்சி அரசாங்கத்தின்கீழ் இத்தகைய சிறுவர் துஷ்பிரயோகங்களுக்கு இடமளிக்க முடியாது. எனவே, இவ்விடயம் குறித்தும் நீதி அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டும்.

இறுதி யுத்தத்தின்போது இடம்பெற்ற மனித உரிமை மீறல்கள் மற்றும் யுத்தக் குற்றச்சாட்டுகள் குறித்து உரிய விசாரணைப் பொறிமுறை உருவாக்கப்பட வேண்டுமென்று தொடர்ந்தும் வலியுறுத்தப்பட்டு வருகின்றது. ஜெனீவாவில் நடைபெற்ற ஐக்கிய நாடுகள் மனித உரிமைகள் பேரவையின் பூகோள காலக்கிரம மீளாய்வுக் கூட்டத் தொடரில் இலங்கை குறித்து கடந்த வெள்ளிக்கிழமை சமர்ப்பிக்கப்பட்ட பிரேரணையிலும் இந்த விடயம் வலியுறுத்தப்பட்டுள்ளது. எனவே, பொறுப்புக்கூறும் விடயம் தொடர்பிலும் பாதிக்கப்பட்ட மக்களுக்கு நீதியை வழங்கும் விடயத்திலும் அரசாங்கம் அக்கறையுடன் செயற்பட வேண்டும்.

காணாமற்போனோருக்கான அலுவலகத்தை அமைப் பதற்கு இந்த வரவு செலவுத் திட்டத்தில் 1400 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளமை வரவேற்கத்தக்கது. காணாமல்போனோரது உறவினர்கள் தமது உறவுகளை மீட்டுத் தருமாறு கோரி தொடர்ச்சியான போராட்டங்களில் ஈடுபட்டு வருகின்றனர். கடந்த 6 மாதங்களுக்கு மேலாக அவர்களது போராட்டம் தொடர்ந்து வருகின்றது. காணாமல்போன உறவுகளுக்கு நேர்ந்த கதி குறித்து அவர்கள் அறிய விரும்புகின்றனர். எனவே, இந்தப் பிரச்சினைக்குத் தீர்வு காணப்பட வேண்டும். தொடர்ந்தும் அந்த மக்கள் அவலப்பட முடியாது. எனவே, இந்த மக்களுக்கும் நீதியைப் பெற்றுக்கொடுக்க நடவடிக்கையெடுக்க வேண்டும்.

பயங்கரவாதத் தடைச்சட்டத்தை நீக்குமாறு சர்வதேச ரீதியில் அழுத்தம் கொடுக்கப்படுகின்றது. அரசாங்கம் இந்தச் சட்டத்தினை நீக்குவதற்கு நடவடிக்கையெடுப்பதாக உறுதியளித்துள்ளபோதிலும் இன்னமும் அந்த நடவடிக்கை பூர்த்தியாகவில்லை. இவ்விடயம் தொடர்பிலும் ஐக்கிய நாடுகள் மனித உரிமைகள் ஆணைக்குழுவில் வலியுறுத்தப்பட்டுள்ளது. பயங்கரவாதத் தடைச் சட்டத்தின் கீழேயே தமிழ் அரசியல் கைதிகளுக்கு எதிராக வழக்குகள் தாக்கல் செய்யப்பட்டுள்ளன. எனவே இந்த விடயம் தொடர்பிலும் அவதானம் செலுத்தப்பட வேண்டும்.

நல்லாட்சி அரசாங்கத்தில் நீதித்துறையானது சுயாதீனமாக செயற்படுவதற்கு அனுமதிக்கப்பட்டுள்ளது. மத்திய வங்கியின் பிணைமுறி விவகாரம் தொடர்பான விசாரணையானது இதற்கு நல்லதோர் உதாரணமாக அமைந்திருக்கின்றது. தற்போதைய நிலையில் அரசியல் கைதிகள் விடயத்திலும் சிறுபான்மையின மக்கள் மீதான வன்முறைச் சம்பவங்கள் தொடர்பிலும் உரிய வகையில் நீதி நிலைநாட்டப்பட வேண்டும். இதன்மூலம்தான் நல்லாட்சி அரசாங்கத்தின்மீது சிறுபான்மையின மக்கள் மேலும் நம்பிக்கைகொள்ளும் நிலை ஏற்படும். எனவே, இந்த விடயங்கள் குறித்தும் நாம் அனைவரும் ஒன்றிணைந்து செயற்பட வேண்டியது அவசியமாகும். நன்றி.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

දිවා ආහාරය සඳහා පස් වරු 1.00 දක්වා සභාවේ කටයුතු අත් හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**සහකාර මහ ලේකම්තුමිය**
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)

කරුණාකර, මූලාසනය සඳහා ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

"ගරු ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்படி, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මලිත් ජයතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහළොවක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡාවට ගැනෙන අද දවසේ මට ඒ සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම, මුදල් ඇමතිතුමා පසුගිය දින ඉදිරිපත් කළ 2018 වසර සඳහා වන අය වැය යෝජනාවලියේ, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයට අදාළව, 148වන අංකය යටතේ මෙන්න මෙහෙම වාක්‍ය ඛණ්ඩයක් සඳහන් වෙනවා.

> "තායිලන්තයේ රොජානා ඉන්ඩස්ට්‍රීස් විසින් මිල්ලනියෙහි එ.ජ. ඩොලර් මිලියන 500ක ආයෝජනයකින් කර්මාන්ත පුරයක් ස්ථාපිත කරනු ඇත. රජය දැනටමත් මේ සඳහා ඉඩම ලබා දී ඇති අතර, අවශ්‍ය යටිතල පහසුකම්-විදුලිය, ජලය හා ප්‍රවේශ මාර්ග සකස් කර දෙනු ඇත."

මම හිතන විධියට, වෙනත් රටක සමාගමක නමක් ශ්‍රී ලංකාවේ නිල අය වැය ලේඛනයක මේ විධියට ඇතුළත් වීම තුළින් ඒ සමාගමට විශාල වෙළඳ දැන්වීමක් ලබා දීලා තිබෙනවා. මෙවැනි රටක නිල අය වැය වාර්තාවට එවැනි සමාගමක නමක් යොදා තිබීම තුළ, අනාගතයේදී ඒ අයගේ සමාගමේ ප්‍රවර්ධන කටයුතු සඳහා ඒක මහත් රුකුලක් වෙයි කියා මම බලාපොරොත්තු වෙනවා.

කොහොම වුණත්, මේ රොජානා සමාගම එන්නේ බණ්ඩාරගම මිල්ලනිය ප්‍රදේශයට. මමත් ඒ ප්‍රදේශයේ කෙනෙක්. විශේෂයෙන්ම මිල්ලනිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සමසභාපතිවරයා හැටියට මටත් ඒ සම්බන්ධයෙන් වග කීමක් තිබෙනවා. අපේ ප්‍රදේශයේ ජනතාව තමයි විශේෂයෙන්ම මේ ප්‍රශ්නයට මුහුණ දීලා සිටින්නේ. රොජානා සමාගමේ මේ ආයෝජන ව්‍යාපෘති පිළිබඳව බොහොම රහසිගත වැඩ පිළිවෙළකින් තමයි ඒ කටයුතු සිදු වන්නේ. මමත් ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. බොහොම රහසිගත වැඩ පිළිවෙළකින් තමයි රොජානා සමාගමේ ඒ ව්‍යාපෘතිය සිදු වන්නේ.

විශේෂයෙන්ම මෙවැනි විශාල පරිමාණයේ ආයෝජනයක් එනවා නම්, අඩුම තරමේ ඒ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ඒ පිළිබඳව තිබෙන මූලික ප්‍රශ්න ටික හරි සාකච්ඡා කරන්න ඕනෑ. නමුත් එය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ විෂය පථයට ඇතුළත් වෙන්නේත් නැහැ. බොහොම රහසිගතව සිදුවෙන මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විශේෂයෙන්ම මිල්ලනිය ප්‍රදේශයේ ජනතාවට විශාල කනස්සල්ලක්, කුතුහලයක් සහ එහි වෙන්නේ මොකද කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රදේශය නියෝජනය කරන, සම්බන්ධීකරණ කමිටුවේ සමසභාපතිවරයා හැටියට ඉන්න මමත් මොකුත් දන්නේ නැහැ, රොජානා සමාගම කොහොමද එන්නේ, මොකක්ද කරන්නේ කියලා.

අපේ වග කිව යුතු ඇමතිතුමන්ලා මේ අවස්ථාවේ ගරු සභාවේ නැති වුණත් ආයෝජන මණ්ඩලයේ අදාළ නිලධාරින් මේ කථාව අහගෙන ඇති. රොජානා සමාගම මොන ආකාරයෙන්ද අපි තෝරා ගත්තේ? අපේ රටට ආයෝජනයක් හැටියට - investment එකක් හැටියට - එන කොට රොජානා සමාගම මොන ආකාරයෙන්ද, මොන ප්‍රමිතීන්ට යටත්වද අපි තෝරා ගත්තේ? තායිලන්ත රජය සහ ශ්‍රී ලංකා රජය අතර ඇති වූ එකඟතාවක් මතද තෝරා ගත්තේ? එහෙම නැත්නම් කවුරු හෝ තනි පුද්ගලයෙකුගේ හෝ පුද්ගලයන් දෙන්නෙකුගේ අවශ්‍යතාවටද මේ රොජානා සමාගම තෝරා ගත්තේ? එවැනි ප්‍රශ්න අපි ඉදිරියේ තිබෙනවා. විශේෂයෙන්ම මම ඒ ප්‍රදේශය නියෝජනය කරන වග කිව යුතු ජනතා නියෝජිතයෙක් වශයෙන් ඒ ප්‍රශ්න අහන්න ඕනෑ.

මීට මාසයකට, එකහමාරකට කලින් මේ ප්‍රදේශයේම හෙලිකොප්ටර් යානයකින් අධිතාක්ෂණික scanning යන්ත්‍රයක් යොදා ගෙන මේ ප්‍රදේශය scan කළා. මේ ව්‍යාපෘතිවලට අදාළව යම් කිසි ආකාරයක තවත් ව්‍යාපෘතියක් තමයි ඒකේ තිබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කරුණු හොයලා බැලුවාම අපට දැන ගන්න ලැබුණේ, භූගත ඛනිජ නිධි තිබෙනවාද කියන එක ගැන යම් කිසි කොම්පැනියක් සොයා බැලීමක් කරලා තිබුණා කියන එකයි. ඒ ප්‍රදේශයේ ජනතාව විශාල වශයෙන් කලබලයට පත් වුණා. අපට ඒ පිළිබඳවත් තොරතුරු ලැබුණේ නැහැ. තොරතුරු හෙව්වාම ඒ වාගේ ආකාරයක තොරතුරු තමයි අපට දැන ගන්න ලැබුණේ.

සාමාන්‍යයෙන් විදේශ ආයෝජන රටට ලබා ගැනීමේදී; කැඳවීමේදී; ආරාධනා කිරීමේදී යම් කිසි ප්‍රතිපත්තියක්, ක්‍රමවේදයක් ආයෝජන මණ්ඩලය සතුව තිබෙනවා. නමුත් මේ රොජානා සමාගම සම්බන්ධයෙන් ලංකාවේ පළමුවැනි වතාවට ආයෝජන මණ්ඩලයේ කාර්යභාරය අවිනිශ්චිතයි. ආයෝජනය මණ්ඩලය දන්නේත් නැහැ, ඔවුන්ට තිබෙන කාර්යභාරය; ඔවුන්ට තිබෙන වග කීම. අපි ඒ පිළිබඳවත් අවධානය යොමු කළ යුතුයි. විශේෂයෙන්ම ආයෝජන කලාපයක පරිපාලනය, ඒ regulatory mechanism එක ආයෝජන මණ්ඩලයේ වග කීමක්; කාර්යභාරයක්. අපට දැනට ලැබිලා තිබෙන තොරතුරු අනුව, රොජානා සමාගමට ලබා දීලා තිබෙන ඒ සහතිකය වෙන්නේ, "ලංකාවේ නීතියකට යටත් වෙන්නේ නැහැ. ආයෝජන මණ්ඩලයට තිබෙන්නේ අත්සන් කරලා අවුරුදු 50කට බදු දෙන්න විතරයි" කියන එකයි. එච්චරයි, ආයෝජන මණ්ඩලයේ කාර්යභාරය.

විශේෂයෙන්ම දැනට අක්කර 840ක් රොජානා සමාගමට ලබා දෙනවා කියලා මෙයට මූලික වන ඇමතිවරු දෙදෙනෙක් පොරොන්දු වෙලා තිබෙනවා. නමුත් විෂය භාර ඇමතිතුමා වන මලික් සමරවික්‍රම මැතිතුමාගේ අදහස නම්, උපරිම දෙන්න පුළුවන් අක්කර 300ක් පමණයි කියලා. නමුත් රොජානා සමාගමට අක්කර 840ක් දෙනවා කියන එක වෙනත් පාර්ශ්වයකින් පොරොන්දු වෙලා තිබෙනවා. කොහොම වුණත්, මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරින් කිසිවෙකුට මේ ස්ථානයට යන්න බැහැ. යන්නත් තහනම්. අපි කරුණු සොයා බැලීමේ දී දැන

ගන්න ලැබුණා, මධ්‍යම පරිසර අධිකාරිය ඔවුන්ගේ කිසිම මැදිහත් වීමක් මේ සම්බන්ධයෙන් නැහැ කියලා. ඒ සම්බන්ධයෙන් මම පසුවට කරුණු කියන්නම්. අපට ආයෝජන මණ්ඩලයෙන් -BOI එකෙන්- අහන්න වෙනවා, රොජානා සමාගම මිල්ලනියට එන එක සම්බන්ධයෙන් ඔයගොල්ලන්ගේ මැදිහත්වීම, වග කීම, කාර්ය භාරය මොකක්ද කියලා. අපි ඒ පිළිබඳව ඉදිරියේ දී ප්‍රශ්න කරන්න බලාපොරොත්තු වෙනවා.

මෙතැන විශාල පාරිසරික ප්‍රශ්නයක්, ගැටලුවක් මතු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැනට මේ අක්කර 850 හෝ කොපමණ ප්‍රමාණයක් දෙන්න යෝජනා වෙලා තිබෙනවාද කියලා කිසිම කෙනෙක් දන්නේ නැහැ. ලංකාවේ දෙවැනි ප්‍රධාන ගංගාව වන කළු ගඟට මායිම්ව තමයි දැනට යෝජනා වෙලා තිබෙන නිව් වැටල් වත්ත කියන රාජ්‍ය වැවිලි සමාගමකට අයත් -

**ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමනි, මම හිතන්නේ ඔබතුමා කිසිම කාරණාවක් අවබෝධ කර ගන්නේ නැතුවයි මේ කථා කරන්නේ. විශේෂයෙන්ම අපි එම ජනතාව දැනුවත් කිරීම සඳහා පැවැත් වූ රැස්වීමේදී ඔබතුමා කථාවක් කළා. ආණ්ඩුවේ මන්ත්‍රීවරයකු වන, ජනාධිපතිතුමා පත් කළ මන්ත්‍රීවරයකු වන ඔබතුමාට එහිදී මම ඉතා පැහැදිලිව ඒ සියල්ල විස්තර කළා. කැබිනට්ටුවේ අනුමැතිය අපට ලැබී තිබෙන්නේ කොහොමද, නැවත ලබන සුමානයේදී කැබිනට්ටුවෙන් අනුමැතිය ලබා ගන්නේ කොහොමද, විශේෂයෙන්ම ආර්ථික මණ්ඩලයට අපි මෙය යොමු කළා කියන කාරණය පිළිබඳව පැහැදිලි කළා. ඒ වාගේම අක්කර ප්‍රමාණය කොපමණද කියන මේ කාරණා සම්බන්ධයෙන් දැනුවත් නොවී ඔබතුමා අදහස් ප්‍රකාශ කරන්න එපා. එකක, අක්කර 250යි, අනෙක් එකේ අක්කර 150යි, අක්කර 400යි. ඔබතුමා ඔය සඳහන් කරපු සියල්ලක්ම රටේ ඉදිරි අනාගතය කඩාකප්පල් කරන; දියුණුව නැති කරන; දුප්පත් ජනතාව එසේම දුප්පත්කමින් තබන්න කරන ප්‍රයත්නයක්. ඒ නිසා ඔබතුමා කරුණු දන්නේ නැත්නම් අපෙන් කරුණු අහගන්න. ඔබතුමා ඉන්නා තැනම මම එදා කරුණු කියලා දුන්නා. ඔබතුමා ඒ ටිකවත් ගණන් ගන්නේ නැතුව හිතුමතයටයි මෙවැනි ප්‍රකාශ කරන්නේ. මම හිතන විධියට ඔබතුමාට ප්‍රශ්නය තිබෙන්නේ අජිත් මන්ත්‍රීතුමා එක්කයි. එතුමා ඔබතුමාගේ නෑයෙක් නේද? මම හිතන්නේ එතුමා ඔබතුමාගේ පළමුවැනි ඥාති සහෝදරයා. ඉතින් එම ප්‍රශ්නය මේ රටේ ඉදිරි අනාගතය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් බවට පත් කර ගන්න එපා. ඒක පවුලේ ප්‍රශ්නයක්. එම නිසා මා ඔබතුමාගෙන් ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමා ඒ සම්බන්ධයෙන් කාරණා දන්නේ නැත්නම්, ඔබතුමාට ඒ සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් නැත්නම්, එළියේදී අප හමුවන්න කියලා. ඔබතුමාට අවශ්‍ය ඒ සියලුම කරුණු අපි ලබා දෙන්නම්. ඔබතුමා මේ අසාධාරණයක් කරන්නේ. මම එකින් එකට කියන්නම්. රොජානා සමාගම අපි හඳුනා ගත්තේ කොහොමද, තායිලන්තයේ -

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලබා දී තිබෙන කාලය අවසන් වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේ දී කරුණු පැහැදිලි කරන්න. දැන් මෙතුමාට අවස්ථාව ලබා දෙන්න.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට කරුණු පැහැදිලි කිරීමට අවස්ථාව ලැබෙන නිසා -

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Being an MP of the Government side, he is misrepresenting the facts, Sir.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. State Minister, 15 minutes have been allocated to you. During your speech you can give that explanation.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට කථා කිරීමට පැය කාලයි හිමි වෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්] ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට විනාඩි පහළොවයි ලැබී තිබෙන්නේ. ඒ නිසා ඔබතුමා පසුව කරුණු පැහැදිලි කරන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා කථා කරන්න.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. දැනට මේ යෝජනා වී තිබෙන ඉඩම කළු ගඟට මායිම් වෙන ඉඩමක්. නිව් වැටල් වත්ත කළු ගඟට මායිම් වෙන්නේ. කළු ගඟ කියන්නේ ලංකාවේ දෙවැනි ප්‍රධාන ගංගාව.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා කියන්නේ, මිල්ලනිය ගැනද, මිල්ලෑව ගැනද?

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මම කියන්නේ මිල්ලනිය ගැන. මිල්ලනිය ගැන නේ, මම කථා කරන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අක්කර 850ක් නැහැ. අක්කර 850ක් එහි තිබෙන්නේ කොහේද?

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
ඔබතුමන්ලා දැනට පොරොන්දු වෙලා තිබෙන්නේ, අක්කර 840ක් -

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ, නැහැ. ඔබතුමා වැරදියි.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට මගේ වේලාව දෙන්න. ඔබතුමා පසුව කරුණු පැහැදිලි කරන්න. [බාධා කිරීමක්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
තත්ත්පර පහෙන් මම කියලා අවසන් කරන්නම්. අක්කර 850ක් යෝජනා වෙලා නැහැ. අක්කර 250ක් තිබෙනවා, මිල්ලනිය. අක්කර 150ක් තිබෙනවා, මිල්ලෑව. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්නේ මොන එක ගැනද? ඔබතුමා කියන විධියට මිල්ලනියේ අක්කර 850ක් තිබෙනවා නම්, එම කාරණය වැරදියි.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සම-සභාපතිත්වය දරන මිල්ලනිය ප්‍රශ්නය ගැනයි මම කථා කරන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එතැන අක්කර කීයද?

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
එතැන දැනට ඔබතුමන්ලා පොරොන්දු වෙලා තිබෙන්නේ අක්කර 840ක් -

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමාට මම කියන්නේ ඒකයි. ඔබතුමා වැරැදි -

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පසුව කරුණු පැහැදිලි කරන්න. දැන් මට අවස්ථාව ලබා දෙන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
As a Member of Parliament appointed by the President, you must speak responsibly. I am only asking you about the place where those 840 acres are. අක්කර අටසිය ගණනක් තිබෙනවා කියලා, -

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
Right now, I do not have any document relevant to that. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට කථා කිරීමට ලැබී තිබෙන වේලාව මට ලබා දෙන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මම ඔබතුමාට බාධා කරන්නේ නැහැ. ඔබතුමා කියන්නේ වැරැදි කරුණු.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
ඔබතුමා, purposely දැන් මට මෙතැන කථා කරන්න දෙන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මගේ වේලාව ලබා දෙන එක තමයි ඔබතුමාගේ කාර්ය භාරය වෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට අධි තාක්ෂණික කර්මාන්තශාලා ප්‍රමාණයක් තමයි දැනට යෝජනා වෙලා තිබෙන්නේ. මෙතැන තිබෙන විශාලම ප්‍රශ්නය තමයි දැනටත් මේ නිව් වැටල් වත්තේ අක්කර 300ක පමණ තිබුණු රබර් ගස් ගලවා තිබීම. මේ වන විටත් මධ්‍යම පරිසර අධිකාරියේ කිසිම නිලධාරියෙකුට මෙම ස්ථානයට යෑම තහනම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මෙතැන යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා. හෙක්ටෙයාර 10කට වඩා වැඩි ඉඩමක් යම් කිසි කර්මාන්තයක් හෝ වෙනත් කටයුත්තක් සඳහා එළි වෙනවා නම්, එහි තිබෙන වගාවක් ඉවත් වෙනවා නම් අනිවාර්යයෙන්ම මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ ලබා ගත යුතු බව අපි දන්නවා.

නමුත් දැනට අක්කර 300ක් පමණ එළි කරලා තිබෙනවා. රබර් ගස් ගලවා තිබෙනවා. පරිසර අමාත්‍යාංශයේ වගකිවයුතු කිසිම නිලධාරියෙකුට ඒ ස්ථානයට යන්න බැහැ. ඒ ගොල්ලන් බොහොම බියට පත් වෙලා ඉන්නේ. ඒ ගොල්ලන්ගේ විෂය

නොවන තැනට එතැන පත් වෙලා තිබෙනවා. මෙතැන තිබෙන වැදගත්ම දේ තමයි කළු ගඟ; ලංකාවේ දෙවන දිගම ගංගාව. මේ එන්නේ අධි තාක්ෂණික මෙවලම් හදන කර්මාන්ත කියලායි අපේ රාජ්‍ය ඇමතිතුමා සහ අපි සහභාගි වෙච්ච ඒ ස්ථානයේ පැවැති රැස්වීමකදී කිව්වේ. මම ඒකත් පිළිගන්නවා. වෙන්න පුළුවන්. නැගෙනහිර ආසියාවේ රටවල්වලට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මීට අවුරුදු දහයකට, පහළොවකට ඉස්සෙල්ලා ආරම්භ කරපු - විශේෂයෙන් තායිලන්තය සහ වෙනත් නැගෙනහිර ආසියානු රටවල්වල - computer motherboards, microprocessors, computer chips වාගේ ඒවා හදන කර්මාන්ත නිසා ඒවායින් නිපදවෙන ධූලක අපද්‍රව්‍ය නැත්නම් electronic අපද්‍රව්‍ය පිළිබඳව ගැටලු මතු වී තිබෙනවා. ඇමෙරිකාවේ සහ යුරෝපයේ අවශ්‍යතාවන් වෙනුවෙන් මේවා හැදුවත් ඒවායින් නිපදවෙන ධූලක අපද්‍රව්‍ය නිසා මම හිතන්නේ ඒ රටවලට, -

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට බාධා කරන්නේ නැහැ. තත්පරයයි ගන්නේ. Computer chips හදන්නේ නැහැ. විදුලි උපකරණ වාගේ දේවල් තමයි හදන්නේ.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහොම වුණත් මේ සම්බන්ධයෙන් එක එක අවස්ථාවලදී එක එක අදහස් තමයි ප්‍රකාශ වෙන්නේ. දැන් මම, "electronic items" කිව්වාම "නැහැ, විදුලි උපකරණ" කියනවා. කොහොම වුණත් ප්‍රදේශවාසීන් හැටියට අපට ප්‍රශ්නයක් තිබෙනවා. ලෝකයේ කොහෙත් ප්‍රධාන ගංගා නිම්නයක, ඒ ගංගාවට මායිම් වෙන්න මහා කර්මාන්තශාලා, කර්මාන්තපුර ඇති කරන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ගරු රාජ්‍ය ඇමතිතුමාගේ වේලාවෙන් ඔබතුමාට කාලය දෙන්නම් කියලා කියනවා. ඔබතුමා එකඟ ද?

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
නැහැ. එතකොට මගේ කථාව සම්පූර්ණයෙන් අවුල් වෙනවා. [බාධා කිරීමක්] ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ මගේ අයිතිය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මම හිතනවා, මේ කාරණය ඔබතුමන්ලා වෙනම සාකච්ඡා කරනවා නම් හොඳයි කියලා. [බාධා කිරීමක්] Since you have 15 minutes allotted to you, you can - [*Interruption.*]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
I am giving him my time. I am the Minister in charge.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පොඩ්ඩක් සවන්දෙන්න ඉගෙන ගන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
සවන් දෙන්න පුළුවන්. ඔබතුමා අසත්‍ය කියන්නේ.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
අසත්‍ය නොවෙයි. මේක අහගන්න. අසත්‍ය හරි පාර්ලිමේන්තුවේනෙ කියන්නේ. ඔබතුමා එකින් එක උත්තර දෙන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමා මම නැවත බාධා කරන්නේ නැහැ. ජනතාව කැඳවා තිබූ රැස්වීමට ඔබතුමා ආවා. රැස්වීම් දෙකක් තිබුණා. ඒ කිසිම රැස්වීමකදී කිසිම පුරවැසියෙක් අපට විරුද්ධත්වයක් ප්‍රකාශ කළේ නැහැ. ඒ නිසා ඔබතුමා කියන්නේ කොහොමද, ඒ පැත්තේ ජනතාව මෙහෙම විරුද්ධයි කියලා.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
ජනතාව හොඳටම විරුද්ධයි. ඔබතුමන්ලා එතැනට ගෙන්වලා වාඩි කෙරෙව්වේ අත්පුඩි ගහන්න පිරිසක් විතරයි. එතැනට ගෙන්වා වාඩිකරවා තිබුණේ අත්පුඩි ගහන්න ඕනෑ පිරිසක් විතරයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා තනියම ආවේ ඇයි? ඒ කට්ටිය ගෙන්නුවේ නැත්තේ ඇයි?

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් කථා කරන්න මට අවස්ථාව ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කථා කරන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක දැන් කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රශ්නයක්. ඔබතුමන්ලා සංවර්ධන ව්‍යාපෘති

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ක්‍රියාත්මක කරනවා. මෙතුමා මිල්ලනිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපති. ජනාධිපතිතුමාගේ නියෝජිතයා. එතකොට සංවර්ධන ව්‍යාපෘති යනවා, ආණ්ඩුවේ එක පැත්තක් දන්නවා; අනික් පැත්ත දන්නේ නැහැ. මේක හතර බීරි කථාවක් නේ. එතකොට ජනතාව කොහොමද තේරුම් ගන්නේ මේකේ ඇත්ත තත්ත්වය මොකක්ද කියලා. තමුන්නාන්සේලා හවුල් ආණ්ඩුවක් නම් කථා කරලා ජනතාවට හරි දෙයක් කියන්න. ජනතාව නිකම් වික්ෂිප්තභාවයට පත් කරන්නේ නැතුව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. ඔබතුමා කථා කරන්න. [බාධා කිරීමක්] ගරු රාජ්‍ය ඇමතිතුමනි, එතුමාට එතුමාගේ කථාව කරගෙන යන්න ඉඩ දෙන්න. ඊටපසුව ඔබතුමා උත්තර දෙන්න.

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයෙන් මට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තෝරාගෙන තිබෙන බිම කන්දක්. අපි දන්නා විධියට ලෝකයේ කර්මාන්තපුර හරි, industrial parks හරි දාන්නේ තැනිතලා බිමක. නිව් වැටල් වත්ත කියන්නේ රබර් වත්තක්. එය සමතලා බිමක් නොවෙයි. පසුගිය, - [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම බැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාගේ කාලය අවසානයි. නමුත් මේ සිද්ධිය නිසා ඔබතුමාට මම තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්නම්. කරුණාකර කථාව ඉවර කරන්න.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඒ විනාඩි දෙකත් අවශ්‍ය නැහැ. රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාම කථා කර ගන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අසත්‍ය කියන්නේ.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
අසත්‍ය නොවෙයි කියන්නේ. නිව් වැටල් වත්ත කියන්නේ සමතලා බිමක් නොවෙයි. ඔබතුමා මේ වත්ත දැකලත් නැහැ. 2017 වසරේ ආපු ගංවතුරට කඳු මුදුන් ටික ඉතුරු වෙන්න අඩි විස්සක් විතර යට වුණා. ඔබතුමා මේ තැන ගැන දන්නෙත් නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මම දන්නවා. ඒ ගැන ඔක්කෝම දන්නවා. ඔබතුමා පව කියන්නේ.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
පව නොවෙයි, නිව් වැටල් වත්තේ විශාල බිම් ප්‍රමාණයක් යට වුණා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා, අජිත් පී. පෙරේරා මැතිතුමා එක්ක ඔය ප්‍රශ්නය බේරා ගන්න.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
අජිත් පී. පෙරේරා මහත්තයා මෙතැනට සම්බන්ධ නැහැ. මම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිවරයා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එහෙම නම් ජනාධිපතිතුමා ඒ ගැන අපට කියන්න ඕනෑ නේ.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
ජනාධිපතිතුමා බිමේ ස්වභාවය දන්නේ නැහැ නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අයිතිය තියෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කථාව අවසාන කරනවා ද? කථා කරනවා ද?

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය කොහොමත් අවසානයි නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මට විනාඩියක් දෙකක් දෙන්න පුළුවන්. ඔබතුමා කථා කරන්න ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාට අහිමිවෙච්ච කාලයට විනාඩි දෙකක් දෙන්න පුළුවන්. කරුණාකර කථා කරන්න.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි දෙකක් දීලා වැඩක් නැහැ නේ. මගේ වේලාව පැය කාලක් නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි. ඒකට අවස්ථාව දුන්නා. ඒ නිසා තමයි ඒ වෙනුවෙන් ඔබතුමාට විනාඩි දෙකක් දුන්නේ.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමා.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා නම්, අපි සාකච්ඡා කරලා විසඳුමක් සොයන්නම්. ඒ ගැන මම මේ මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

**ගරු මලිත් ජයතිලක මහතා**
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මට කාලය අහිමි වුණා. කමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 35ක කාලයක් තිබෙනවා.

**[අ.භා. 1.17]**

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටිකක් බරපතළ සාකච්ඡාවකින් පසුව තමයි මට කථා කරන්න අවස්ථාව ලැබුණේ. කොහොම වුණත් මේ කථා කරන්නේ මහා විශාල, මහා පරිමාණ ව්‍යාපෘතියක් ගැන නොවෙයි. මීල්ලනියේ හෝ මීල්ලැවේ හෝ ක්‍රියාත්මක කරන්න යන මේ ව්‍යාපෘතිය පම්පෝරි ගහලා, ගහලා මේ ආණ්ඩුවට ලැබුණු එකම ව්‍යාපෘතියද දන්නේ නැහැ. ඒකත් හරියට ක්‍රියාත්මක කර ගන්න ආණ්ඩුවේ දෙපාර්ශ්වය අතර එකඟතාවක් නැත්නම්, ආයෝජකයෙක් ලංකාවට ඇවිත් හරි හමන් විධියට ව්‍යාපෘතියක් ආරම්භ කරන්නේ කොහොමද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ වැදගත් අමාත්‍යාංශ දෙකක් වන අධිකරණ අමාත්‍යාංශය සහ සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යන අමාත්‍යාංශ දෙක පිළිබඳ විවාද කරන මේ අවස්ථාවේ ඉස්සෙල්ලාම අපේ මලික් සමරවික්‍රම අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය දිහාට අවධානය යොමු කරන්න මම කැමැතියි. ඇත්තටම ඔබතුමා යටතේ තිබෙන ආයෝජන මණ්ඩලය 1978 වසරේ ආරම්භ කළේ, විවෘත ආර්ථිකයත් සමඟ අපේ රටට විශාල ප්‍රමාණයෙන්, මහා පරිමාණයෙන් විදේශ ආයෝජන ගෙන්වා ගැනීම සඳහායි. අපේ රටට ඩොලර් ලැබෙන ප්‍රධාන ක්‍රම හතරයි තිබෙන්නේ. එකක් අපනයනවලින්. අනෙක අපේ විදේශගත ශ්‍රමිකයන්ගෙන්. ඊළඟට, ණයවලින් සහ සෘජු විදේශ ආයෝජන මඟින්. අපනයන මඟින් අපට දැනට ඩොලර් බිලියන 10කට ආසන්න ප්‍රමාණයක් ලැබෙනවා. විදේශගත ශ්‍රමිකයන්ගෙන් ඩොලර් බිලියන හතකට ආසන්න ප්‍රමාණයක් ලැබෙනවා. සෘජු විදේශ ආයෝජනවලින් අපට ලැබෙමින් තිබෙන්නේ ඩොලර් බිලියන එකකට අඩු ප්‍රමාණයක්. ඉතිරි ප්‍රමාණය අපි පියවා ගන්නේ ණයවලින්. කොහොම වුණත් 1978 සිට 2016 දක්වා ගත වුණු වසර 38කට ආසන්න කාලය තුළ අපේ රටට ලැබිලා තිබෙන සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයේ එකතුව ඩොලර් බිලියන 13.2ක් වෙනවා. ආර්ථිකය විවෘත කරලා විදේශ ආයෝජන ලැබෙයි කියලා, අපනයන හරහා අපේ රට සංවර්ධනය වෙයි කියලා මහා බලාපොරොත්තු ගොන්නක් තබාගෙන හිටියාට, ලැබිලා තිබෙන ආයෝජන ප්‍රමාණය සීමා සහිතයි කියලා මෙකෙන් පෙනෙනවා. මම මේ සංඛ්‍යා ලේඛන ගන්නේ ආයෝජන මණ්ඩලය ඉදිරිපත් කළ වාර්තාවලින්මයි. මුලින් ආයෝජන අඩු වීමට හේතුවක් වශයෙන් දිගින් දිගටම යුද්ධය සඳහන් කළා. නමුත්, යුද්ධයෙන් පසුව ගතවූ වසර කිහිපය තුළවත් එහෙම ආයෝජන වැඩි වෙලා නැහැ. උදාහරණයක් විධියට යුද්ධයෙන් පසුව අපේ සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය වන්නේ දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 1.5යි. ඒ කාලය තුළ මහා පරිමාණයේ වර්ධනයක් අත්පත් කරගෙනත් නැහැ කියලා ආයෝජන මණ්ඩලයේ වාර්තා අනුව පෙන්නුම් කරනවා.

විශේෂයෙන් ඒ කාලය තුළ ගිවිසුම් අත්සන් කරපු ව්‍යාපෘතිවලටට වඩා, ගිවිසුම් අත්සන් කරපු වේගයට වඩා, අවලංගු කළ හා වසා දැමුණු, අත්හිටවූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව වැඩියි. උදාහරණයක් හැටියට කිව්වොත් 2011 වසරේ ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව 165යි. එය 2016 වසර වන විට වැඩි වෙලා තිබෙන්නේ 182 දක්වා පමණයි. නමුත්, 2011 වසරේදී අත්හිටවූ හෝ අවලංගු කළ ව්‍යාපෘති 58ක් තිබෙනකොට, 2016 වසරේදී ඒක 133 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වන ආකාරයෙන් ආයෝජන ඇවිත් නැහැ. හැම අය වැය වාර්තාවකම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මේසයට ගහන්න පුළුවන් වෙන ආකාරයට මහා ඉලක්ක ඉදිරිපත් කරලා තිබෙනවා. 2016 වසරේ කිව්වා, ආයෝජන වශයෙන් ඩොලර් බිලියන 4ක් බලාපොරොත්තු වෙනවා කියලා. නමුත්, ඒ අවුරුද්දේ අපට ලැබිලා තිබෙන්නේ ඩොලර් මිලියන 620යි. අපට ලැබී තිබෙන විදේශ ආයෝජන ප්‍රමාණයත් ලෝකයේ විවිධ රටවලින්, විවිධ ආයෝජකයන්ගෙන් ලැබිලා නැහැ. මේ බොහොමයක් තිබෙන්නේ චීනයෙන් කරන ලද ආයෝජන. පසු ගිය කාලය තුළ අපි ආයෝජන බලාපොරොත්තු වුණාට, විවිධ ආකාරයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කළාට, ඒ සඳහා ලෝකයේ විවිධ ආයතනවලින් උපදේශන සේවා ලබා ගත්තාට ආයෝජන ඉහළ ගිහින් නැහැ කියන එකත් අපි කල්පනා කරන්න ඕනෑ. ආයෝජකයෝ පැමිණිලා නැහැ.

ලෝකයේ ව්‍යාපාර කිරීම සඳහා සුදුසු රටවල් අතරින් අපේ රට දිනපතා පියවරෙන් පියවර ඉදිරියට යනවා නොව, ආපස්සට යනවා. මට ඉදිරිපත් කරන්න පුළුවන්, Ease of Doing Business Index එකේ සංඛ්‍යා ලේඛන. ඒ අනුව පෙන්නුම් කරන්නේ මොකක්ද? යුද්ධය තිබුණු කාලයේදී කුමක් හෝ පසුබෑමක් තිබුණා නම් යුද්ධයට මුවා වෙලා හිත හදාගන්න පුළුවන්, යුද්ධය තමයි හේතුව කියා. නමුත් ගතවූ වසර කීපයේදී අපේ රට -Ease of Doing Business Index එකේ සංඛ්‍යා ලේඛන අනුව- එන්න එන්න පල්ලම් බැහැලා තිබෙනවා. වියට්නාමය 2009 වර්ෂයේ සිටියේ

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

92වන තැනයි. 2017 වර්ෂය වනකොට ඔවුන් 82 දක්වා ඉදිරියට ඇවිත් තිබෙනවා. භූතානය 2009 වර්ෂයේ සිටියේ 124වන තැනයි. ඔවුන් 2017 වර්ෂය වනකොට 73 දක්වා ඉස්සරහට ඇවිත් තිබෙනවා. නේපාලය ගනිමු. භූමිකම්පා, දේශපාලන අස්ථාවරභාවය, අගමැති මාස තුනෙන් තුනට මාරුවීම ආදී විවිධාකාරයේ ප්‍රශ්න තිබිලාත් නේපාලය 2009 වර්ෂයේ 121වන තැන ඉඳලා 2017 වර්ෂයේදී 99 දක්වා ඉදිරියට ඇවිත් තිබෙනවා. කනගාටුවට කරුණ මේකයි. අපේ රට 2009 වර්ෂයේ සිටියේ 102වන ස්ථානයේයි. නමුත් දැන් අප ඉන්නේ 110වන ස්ථානයේයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක් හැටියට අපට ආයෝජන නොලැබෙන්න හේතු පිළිබඳව මීට වඩා ගැඹුරින් අධ්‍යයනය කරන්න ඕනෑ කියා මම හිතනවා. තමුන්නාන්සේලා උත්සාහ නොකරනවා නොවෙයි. මේ ඇමතිවරු, අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විවිධාකාර උත්සාහයන් දරනවා. නමුත් ඒවා අසාර්ථක වෙලා තිබෙනවා. යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණාට පසුව 2015, 2016 වර්ෂවලදී ඉදිරිපත් කරපු අය වැය යෝජනාවලින් වැඩි ප්‍රමාණයක් ආයෝජන ගෙන්වා ගැනීම සඳහා වෙන් කර තිබෙනවා. හැබැයි මා අහන්නේ, ඒ අය වැය යෝජනාවලින් පසුගිය අවුරුදු දෙකේ ක්‍රියාත්මක කරගන්න පුළුවන් වුණේ මොනවාද කියායි; ක්‍රියාත්මක කළේ මොනවාද කියායි. ඉන් එක යෝජනාවක් මා කියන්නම්. 2017 අය වැය ලේඛනයේ 174වන යෝජනාවේ තමුන්නාන්සේලා සඳහන් කළා, ඇමෙරිකන් ඩොලර් මිලියන 3ට වඩා වැඩි මුදලක් ආයෝජනය කරමින්, නව රැකියා අවස්ථා 250කට වඩා වැඩි ප්‍රමාණයක් උත්පාදනය කරනු ලබන උතුරු පළාතේ ව්‍යාපාරවල කරන ආයෝජන සඳහා සියයට 200ක ප්‍රාග්ධන දීමනාවක් ලබා දීමට යෝජනා කරනවා කියා. ඒ උතුරට. එහි වැඩිදුරටත් සඳහන් කරනවා, ඌව සහ නැගෙනහිර පළාත්වල කරන ආයෝජන සඳහා සියයට 100ක ප්‍රාග්ධන දීමනාවක් ලබා දෙනවා කියා. ඒ වාගේම සඳහන් කරනවා, රැකියා අවස්ථා 500 සිට 800 දක්වා ප්‍රමාණයක් ජනනය කරන ව්‍යාපාරවලට අවුරුදු 3 සිට 5 දක්වා අර්ධ වාර්ෂික බදු විරාම ලබා දෙනවා කියා. මා අහන්නේ, 2017 වර්ෂයේ අය වැයේ එම යෝජනාව අනුව උතුරේ හෝ නැගෙනහිර ව්‍යාපාර සඳහා අලුතින් ආයෝජකයකු ඇවිල්ලා මේ ආකාරයේ බදු සහන ගත් ව්‍යාපෘති මොනවාද කියායි. මා දන්නා හැටියට ආරම්භ කරපු එකම ව්‍යාපෘතිය තමයි, මේ රටේ ප්‍රවෘත්ති පත්‍රවල දැන් වැඩිපුරම නම කියැවෙන්නා බවට පත් වෙලා සිටින අර්ජුන් ඇලෝසියස්ගේ ඉස්කාගාරයක් -ස්ප්‍රීතු ඉස්කාගාරයක්- මඩකලපුවේ කල්කුඩාවල හදපු එක. ඒ දවස්වල ප්‍රවෘත්ති පත්‍ර වාර්තා කළා, රවි කරුණානායක ඇමතිවරයා ඒ බදු සහනය ලබා දුන්නේම ඇලෝසියස්ගේ අරක්කු ස්ප්‍රීතු ඉස්කාගාරයටමයි කියා. ඒ හැර වෙනත් මොන ව්‍යාපෘති ද ගෙනාවේ? ඒ හැර, ඩොලර් මිලියන 3කට වඩා ආයෝජනයක් තිබෙන, නව රැකියා 250කට වඩා උත්පාදනය කරන වෙනත් මොන ව්‍යාපෘතිය ද නැගෙනහිර පළාතට ලැබුණේ. මේ ඉදිරිපත් කරපු යෝජනා පවා විවිධ වෙනස් අරමුණුවලින් ඉදිරිපත් කර තිබෙනවා. ඇත්තටම මේ සම්බන්ධයෙන් සාර්ථකත්වයක් අත් පත් කර ගන්න තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සඳහන් කරන්න කැමැතියි, මේ සම්බන්ධයෙන් බලපාන ලද හේතු සාකච්ඡා කිරීම වැදගත් කියා. මට නැවත වතාවක් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්, පසු ගිය වසර කීපය තුළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ආයෝජන සඳහා ලැබුණු -ව්‍යාපෘති ආරම්භ කරන්න ලැබුණු- අයදුම් පත් ප්‍රමාණය, අනුමත කරපු ප්‍රමාණය, ගිවිසුම් අත්සන් කරපු ප්‍රමාණය, වැඩ කටයුතු ආරම්භ කරපු ප්‍රමාණය, ඒවා යටතේ දැන් වාණිජ මෙහෙයුම් ආරම්භ කර තිබෙන ප්‍රමාණය ආදිය. ඒවා සම්බන්ධයෙන් තිබෙන්නේ සැලකිය යුතු මට්ටමක වර්ධනයක් නොව, අවගමනයක්. 2012 වර්ෂයේ අපට ලැබී තිබෙන අයදුම් පත් ප්‍රමාණය 267යි. 2016 වර්ෂය වනකොට 172යි. ආයෝජනවල මුදල්මය වටිනාකම ගත්තොත්, ඒ වසර දෙක තුළ ඇමෙරිකානු ඩොලර් බිලියන 17 ඉඳන් ඇමෙරිකානු ඩොලර් බිලියන 8 දක්වා අඩු වෙලා තිබෙනවා. ගිවිසුම් අත්සන් කරපු ව්‍යාපෘති ප්‍රමාණය ලෙස 2012 වර්ෂයේ පැවති 128 ප්‍රමාණය 2016 වර්ෂයේ 144 දක්වා වැඩි කර ගත්තත්, මුදල්මය වශයෙන් වැඩි කරගෙන නැහැ. රුපියල් බිලියන 3 සිට රුපියල් බිලියන 1.8 දක්වා අඩු ප්‍රමාණයක් තමයි මුදල්මය වශයෙන් තිබෙන්නේ.

එසේ නම් ඇයි අපට ආයෝජකයන් එන්නේ නැත්තේ? තමුන්නාන්සේලා හිතනවා, අපේ රට දියුණු කරන්නට පුළුවන් හොඳම, ප්‍රශස්ත ආර්ථික ක්‍රමය මෙයයි කියා. ඒ ඔස්සේ අවුරුදු හතළිහක් ගමන් කර තිබෙනවා. ඒ සඳහා ආයෝජන ගෙන ඒමට ආයෝජන මණ්ඩලයක් හැදුවා. ඒකටත් අවුරුදු හතළිහකට ආසන්න කාලයක් ගිහින් තිබෙනවා. එහෙම වෙලත් ඇයි අපට ආයෝජනයන් එන්නේ නැත්තේ? ඒක තමයි මෙතැන තිබෙන මූලික ප්‍රශ්නය. මා හිතනවා, හේතු විධියට අපි යුද්ධය ඉදිරිපත් කරලා වැඩක් නැහැ කියා. ලෝකයේ යුද්ධවලට මුහුණ දුන් එකම රට අපේ රට නොවෙයි. අපට වසර තිහක යුද්ධයක් තිබුණා. අපි සටන් කළේ අපේ රටේම සන්නද්ධ කණ්ඩායමක් එක්ක. වියට්නාමයේත් 1945 වර්ෂයේ සිට 1975 වන තුරු අවුරුදු තිහක යුද්ධයක් තිබුණා. වියට්නාමය සටන් කළේ තමන්ගේ රටේ කණ්ඩායමක් එක්ක නොවෙයි, ප්‍රංශය සහ ඇමෙරිකා එක්සත් ජනපදයත් එක්ක. මීට වඩා අධිබලැති බෝම්බ පාවිච්චි කළා. "Agent Orange" වාගේ මහා රසායනික අවි පාවිච්චි කළා. අදත් වියට්නාම ආර්ථිකයේ සැලකිය යුතු පංගුවක් ඒ යුද්ධයේදී ආබාධිතවූවන් සහ අංගවිකල වූවන් සඳහා වෙන් වෙනවා. වියට්නාම යුද්ධයේදී රසායනික අවි ප්‍රහාරයට ලක් වෙලා අදත් උපදින පරම්පරාව අංග විකල භාවයට පත් වෙලා තිබෙනවා. ඔවුන්ගේ ආර්ථිකයෙන් විශාල ප්‍රමාණයක් ඒ යුද අනාථයන් වෙනුවෙන් වියදම් කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. එහෙම තිබිලත් වියට්නාමය 2001 සිට 2017 අවුරුදු දහසය තුළ ඔවුන්ගේ සෘජු විදේශ ආයෝජන පැමිණීමේ සාමාන්‍යය ඩොලර් මිලියන 3741යි. මම කියන්නේ "xinhuanet" website එකෙන්. 2017 පළමුවන කාර්තුවේ පමණක් ඔවුන්ගේ ආයෝජන ප්‍රමාණය බිලියන 19.2 යි; මිලියන 19220 යි. ජූනි මාසයේ පමණක් ඔවුන් බිලියන 7ක් ආයෝජන හැටියට ගෙන්වාගෙන තිබෙනවා. ඒ ආයෝජන ගෙන්වාගෙන තිබෙන්නේ මොන රටවලින්ද? වියට්නාමය සමාජවාදී රටක්. වියට්නාමය සමාජවාදී රටක් කියා චීනයෙන් පමණක් ආයෝජන ගෙනාවේ නැහැ. ඔවුන්ට ආයෝජන එන්නේ ලෝකයේ විවිධ රටවලින්. වියට්නාමයට ලැබෙන ආයෝජනයෙන් සියයට 26.5 ක් ලැබෙන්නේ ජපානයෙන්. ඊළඟට, සියයට 25.8ක් ආයෝජන ලැබෙන්නේ දකුණු කොරියාවෙන්. සියයට 18.1ක් ආයෝජන ලැබෙන්නේ සිංගප්පූරුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වියට්නාමය සමාජවාදී රටක් වුණත්, තමන්ගේ කලාපයේ තිබෙන සංවර්ධිත කාර්මික රටවල් එක්ක ආයෝජනයන් කරනවා. තමුන්නාන්සේලා කියනවා නේ මේ සමාජවාදී රටවල් කියන්නේ, වැහුණු, සංවෘත ආර්ථිකයක් තිබෙන රටවල් කියා. නැහැ. ඒක වැරදියි. ගරු මංගල සමරවීර ඇමතිතුමා අපෙන් අහනවා, "ඔයගොල්ලෝ ආදර්ශයට ගන්නා රට කියන්න." කියා. තමුන්නාන්සේලා ආදර්ශයට ගන්න රට කියන්නකෝ බලන්න. මොකක්ද ආදර්ශයට ගන්නේ?

**ගරු සුජීව සේනසිංහ මහතා**
( மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe )
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඇමෙරිකාව, ජර්මනිය ඇතුළු බටහිර රටවල් ඔක්කොම දියුණු රටවල්. චීනය දැන් විවෘත ආර්ථිකයක් ගෙන යන්නේ. මට ගරු වසන්ත සමරසිංහ මන්ත්‍රීතුමා කිව්වා, එතුමන්ලා පිළිපදින්නේ කියුබාව කියා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
නැහැ. කවදාවත් නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඉස්සෙල්ලාම රුසියාවේ එල්ලුණා. ඊට පස්සේ චීනයේ එල්ලුණා. ඒකත් නැති වුණා. ඊට පස්සේ ඉන්දියාවේ හිටියා. ඒකත් නැති වුණා. ඊට පස්සේ කිව්වා, "කියුබාව තමයි ලෝකයේ හොඳම රට." කියා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
අපි කිසිසේත් එහෙම කියා නැහැ. ජනතා විමුක්ති පෙරමුණේ මතය ඒක නොවෙයි. අපි ලෝකයේ ආර්ථිකය විවෘත කරන්නට ඕනෑ. ආර්ථිකයක් වහලා හදන්නේ කොහොමද? කොහේද ලෝකයේ වැහුණු ආර්ථිකයක් තිබෙන්නේ? වැහිච්ච ආර්ථික ලෝකයේ නැහැ. ලෝකයේ ආර්ථික විවෘත කරනවා. එම නිසා කියුබාවේ මොඩල් එක හෝ චීනයේ මොඩල් එක හෝ ඇමෙරිකාවේ මොඩල් එක හෝ ලෝකයේ කොයි රටක හෝ එහෙම බස්සන්න බැහැ. අපි එහෙම අන්ධ විශ්වාසයක නැහැ. [බාධා කිරීමක්] මොකක්ද ගරු ඇමතිතුමා?

**ගරු මලික් සමරවික්‍රම මහතා**
( மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
අපිත් හදන්නේ ආර්ථිකය විවෘත කර ඒ පරිසරය හදා ගන්න. පසුගිය ආණ්ඩුවෙන් ඒක කෙරුණේ නැති නිසා තමයි මෙච්චර කල් ගියේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
තව කොච්චර කල් ඕනෑද?

**ගරු මලික් සමරවික්‍රම මහතා**
( மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
එන අවුරුද්දේ අපට ඒක හදා ගන්න පුළුවන්. දැන් කර ගෙන යනවානේ. ඒක කරගෙන යනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
දැන් තුන තුන දුන්නානේ හුඟක් කල්.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
නැහැ. නැහැ. එච්චරකල් අපිට හම්බු වෙලා නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මොකද නැත්තේ? තමුන්නාන්සේලාට දහහතක් බලය තිබුණා. තුනක් දුන්නා තව සැරයක්.[බාධා කිරීමක්]

**ගරු මලික් සමරවික්‍රම මහතා**
( மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
එන අවුරුද්දේ ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
බලමුකො. අර මොකාටද කැරට් අලය පෙන්වන්නා වාගේ ඔහොම අපි යනවා. අර එළුවාගේ මොකක්ද වැටෙන තුරු පස්සෙන් ගියා වාගේ අවුරුදු 40ක් තිස්සේ තමුන්නාන්සේලා කියනවා, අපිත් යනවා. [බාධා කිරීමක්] මගේ වෙලාව හැමෝටම ගන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම කරන්න බැහැ නේ. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා ඉඩ දෙනවාද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමාට විතරයි. ඔබතුමා කියන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා, ඔබතුමා කිව්වා අපි අවුරුදු 17ක් බලයේ හිටියා කියා. ඒ කාලයේ තමයි අපි මහවැලිය, ඇඟලුම් කර්මාන්ත, ගම් උදාව, ජන සවිය කියන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළේ. අපි අවුරුදු 20ක් බලයේ හිටියේ නැහැ. අගමැතිතුමාට බලය ලැබුණාම 2001 වර්ෂයේදී ඍණ 1.5 තිබුණු ආර්ථිකය ධන 6.2ට ගෙනාවා. ඒ ගැනත් ඔබතුමා කථා කරන්න ඕනෑ. මම දන්නවා. ඔබතුමා ඉතා ධනාත්මකව බොහොම හොඳට විවේචනය කරන මන්ත්‍රීවරයෙක්. අපට අවුරුදු තුනක් දෙන්න. අපි වැඩ පෙන්වන්නම්. ගත්තා විතරනේ. ඇද වැටෙන ආර්ථිකයක්. ට්‍රිලියන 10ක ණය මුදලක් එක්ක අපට ලැබුණේ. පොඩ්ඩක් දෙන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
එක්සත් ජාතික පක්ෂය හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අනුගමනය කරන ආර්ථික ප්‍රතිපත්තියේ මහා බරපතළ වෙනස්කම් නැහැ.

ඒ වෙනස්කම් තිබුණා නම්, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ මුදල් නියෝජ්‍ය ඇමති ලෙස සිටි බන්දුල ගුණවර්ධන මහත්තයාට මහින්ද රාජපක්ෂ මහත්තයාත් එක්ක ගිහිල්ලා හොඳට වැඩ කර

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ගන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ නේ. ඒ පැත්තේ හිටපු මුදල් ඇමතිවරු මෙහෙට එනවා, මේ පැත්තේ මුදල් ඇමතිවරු එහෙට යනවා. බොහොම හොඳට පාලනය අරගෙන යනවා. ලොකු ප්‍රතිපත්තිමය වෙනස්කම් නැහැ. ඒ නිසා මේ අවුරුදු 40ම ගියේ ඒ පාරේම තමයි. නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ බලාපොරොත්තු වෙච්ච ආයෝජන නොලැබීම. ඒක මම කියන එකක් නොවෙයි. තමුන්නාන්සේලාගේ ආයෝජන මණ්ඩලයම සඳහන් කරනවා; තමුන්නාන්සේලාගේ මේ පොත් බැලුවාට පසුව පෙනෙනවා, තමුන්නාන්සේලාම මෙසේ කියන බව: "විදේශ සෘජු ආයෝජන පිළිබඳ කැපී පෙනෙන කාර්ය සාධනයක් සාක්ෂාත් කර ගැනීම ශ්‍රී ලංකාවේ අපේක්ෂාව වුවද, විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම තුළින් ශීඝ්‍ර ආර්ථික සංවර්ධනයක් පෙන්වන දකුණු ආසියාතික රටවල් සමඟ සංසන්දනය කිරීමේදී අප දේශය සම්බන්ධයෙන් මෙම අරමුණ සාර්ථක වී නොමැති බව පෙනී යයි" කියලා. මේ ලෝකයේ වෙන කොහේවත් රටවල් සමඟ නොවෙයි, දකුණු ආසියාතික රටවල් සමඟයි සංසන්දනය කර බැලුවාමත් සාර්ථක වෙලා නැහැ. ඉතින්, අඩුම ගණනේ ඒක පිළිගන්න එපායැ.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මම මේ චෝදනා එල්ල කරනවාට වඩා මේකට හේතු පිළිබඳව යම් කිසි ආකාරයක විශ්ලේෂණයක් කරන්න කැමතියි. විදේශ ආයෝජන නොලැබෙන්නට ප්‍රධාන හේතුව, අපේ රටේ දේශපාලන අස්ථාවරභාවය කියා මම හිතනවා. දේශපාලන අස්ථාවරභාවය කියලා කියන්නේ, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් තිබෙන එක හෝ විධායක බලයක් තිබෙන එක හෝ පළාත් සභාවක බලය තිබෙන එකක් හෝ නොවෙයි. මොකද, තමුන්නාන්සේලාට ඒවා තිබුණා.

2010-2015 කාලයේ විධායකයේ මහා බලයක් තිබුණා. ඒ අවුරුදු 5 අවසන් වන විට ගෙදර යන්නත් නොවෙයි නේ හිටියේ. ඒත් බලය තිබුණා. පවුලේ බලය තිබුණා, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලය තිබුණා, පළාත් සභා නවයෙන් අටක බලයක් තිබුණා. එහෙම බලය තිබිලත් ආයෝජන ආවේ නැහැ. උඩින් හිටියේ නැහැ, ගොඩාක් අය යටින් හිටියා. එතකොට දැන් මේ මොකක්ද තිබෙන්නේ? මේ දේශපාලන අස්ථාවරභාවය කියලා කියන්නේ මේවායි. ආණ්ඩුවෙන් ආණ්ඩුවට මාරුවෙන, ඇමතිගෙන් ඇමතිට මාරුවෙන, පළාතෙන් පළාතට මාරු වෙන ප්‍රතිපත්තියක් තමයි අපට තිබෙන්නේ. ඉතින්, කවුද එන්නේ? එක කාලයක් දුවන ආයෝජකයන්ට විශ්වාසය සැලසෙන ක්‍රමයක් තිබෙන්නේ කොහේද? මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225ම අනුරාධපුරයේ ගියාට වඩා, නුවර ගියාට වඩා චීනයේ සංචාරය කරලා ඇති. ඇයි, මාස තුන-හතරකට සැරයක් චීනයට එක්ක ගෙන යනවා නේ. චීනයය ගියාට පසුව ප්‍රාන්තයක්, community එකක නගරයක් පෙන්වන්නේ නැද්ද, ඒ නගරය, ගම හෝ ප්‍රාන්තය සංවර්ධනය කරන ආකාරය කොහොමද කියලා. අවුරුදු 5කින් මෙච්චරයි, 10කින් මෙච්චරයි, 15කින් මෙච්චරයි කියලා සැලැස්මක් තිබෙනවා. දේශපාලන ස්ථාවරභාවය කියලා කියන්නේ, ඔළුගෙඩි ගණනකින් ආණ්ඩුවේ තුනෙන් දෙකේ බලය හදා ගන්නා එක නොවෙයි. ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ; ප්‍රතිපත්තිමය ස්ථාවරභාවයක් තිබෙන්න ඕනෑ. ඊළඟට, ඒකත් එක්ක ගැටගැහිච්ච සැලසුමක් තිබෙන්න ඕනෑ.

කෙටි කාලීන, මැදි කාලීන සහ දිගු කාලීන සැලැස්මක් අනුවයි රට දුවන්නේ කියලා ඕනෑම ආයෝජකයෙකුට පෙනෙන්න ඕනෑ. මොන ඇමති මාරු වුණත්, මොන ආණ්ඩුව මාරු වුණත් තමන්ගේ ආයෝජන සඳහා ස්ථාවරභාවයක් තිබෙනවා කියලා ඕනෑ කෙනෙකුට විශ්වාස තියන්න පුළුවන්.

දැන් බලන්න, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ එක දවසක එක අය වැයක් ගෙනැල්ලා කියනවා, "electric cars සඳහා බද්ද වැඩි කරනවා" කියලා. කථා කරන හැමෝම -ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එක්සත් ජාතික පක්ෂයේ හැමෝම- ඒකට විහිළු කරනවා; හිනා වෙනවා. තව අවුරුදු දෙකකින් ඒ ආණ්ඩුවේම තවත් මුදල් ඇමතිවරයෙක් අය වැය යෝජනාවක් ගෙනෙනවා, "electric carsවල බද්ද අඩු කරනවා" කියලා. ඉතින් මෙහෙම බැලුවාට පසුව, මේ රට යන ප්‍රතිපත්තිය මොකක්ද කියලා හිතා ගන්න පුළුවන්ද? හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමා ඉදිරිපත් කළ පළමුවෙනි අය වැයේ අවසානයේ ඉතිරි වුණේ මොකක්ද? බොහෝ අය වැය යෝජනා කිව්වා. අපට තේරුණේ නැති වුණත් ලොකු කථාවක් කළා. කවුද කියනවා වාගේ, අවසානයේදී සංශෝධනය වෙලා, සංශෝධනය වෙලා "ගරු කථානායකතුමනි" කියන කෑල්ල විතරක් ඉතිරි වුණා. ඉතින් ආයෝජකයෝ එයිද? මේ අලුත් මුදල් ඇමතිවරයා තව එකක් කියනවා. මේ "ස්ථාවරභාවය" කියලා කියන්නේ, දේශපාලන සහ ආර්ථික වශයෙන් තිබෙන සැලැස්ම සහ ප්‍රතිපත්තියටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට ආයෝජකයන් නො එන ප්‍රධාන කාරණය තමයි දූෂණය. දූෂණය ඉහ වහා ගිහිල්ලා තිබෙනවා. ලෝක බැංකුවම කියනවා නේ ආයෝජනයක් ආවොත්, ණයක් දුන්නොත් සියයට 40ක් ඒක නාස්ති වෙනවා; විනාශ වෙනවා කියලා. BOI එකේ ඉහළ ඉඳන් පහළට යනකොට ඕනෑ තරම් ව්‍යාපෘති රටට ඇතුළු වෙලා තිබෙනවා. ඒ ව්‍යාපෘති ගමට අරගෙන යනකොට ගමේ පොලිසියේ OIC දක්වා, ප්‍රාදේශීය ලේකම් දක්වා දූෂණයෙන් පිරිලා ඉතිරිලා නැද්ද? මට ඕනෑ තරම් දේවල් කියන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුවේ තමුන්නාන්සේලාගේම පක්ෂයේ මන්ත්‍රීවරයෙක් මට දවසක් කිව්වා, ඒ අය ඉන්දියාවෙන් ආයෝජකයන් දෙන්නෙක් ගෙනැත් තිබෙනවා. හැබැයි, ආයෝජන මණ්ඩලයට ගිහිල්ලා ඒක සාකච්ඡා කරනකොට, ඔවුන් රස්තියාදු කරලා, අලුත් වාර්තා හදවලා ඒ ආයෝජන මණ්ඩලයේ කලින් හිටපු ඇමතිවරයෙක් දාපු party එකක බිලක් ඒ ගොල්ලන්ට කියලා ගෙවා ගෙන තිබෙනවා කියලා.

ඊට පස්සේ අර ඉන්දියන්කාරයෝ දෙදෙනා හැරිලා ගියාලු, මේ ටික කර ගන්න මෙච්චර වියදම් කළා නම් ව්‍යාපෘතිය පටන් ගත්තොත් කොහොම වෙයිද කියලා. සාක්ෂි ඕනෑද? [බාධා කිරීමක්] නැහැ, නැහැ. ගරු සුජීව සේනසිංහ ඇමතිතුමනි, මම කිව්වේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් වෙච්ච වැඩක්. [බාධා කිරීමක්] අපි දෙන්නාගේ ඒවා පස්සේ ආරංචි වෙයි. හොඳයි, මම බලාපොරොත්තුවෙන් ඉන්නවා; අපේක්ෂා සහගතව ඉන්නවා, තමුන්නාන්සේලා එහෙම නොකරයි කියලා. බලමු, ඊළඟ අය වැයේදී මම මොකක්ද කියන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය තමයි අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ලබා ගැනීමේ ප්‍රශ්නය. විදුලිය සම්බන්ධතාවක් ලබා ගන්න කොච්චර කාලයක් යනවාද? විදුලි සම්බන්ධතාවක් ලබා ගන්න මාස 10කට ආසන්න කාලයක් ගත වෙනවාය කියලා තමුන්නාන්සේලාම කියනවා. ජල පහසුකම් ලබා ගන්න, මාර්ග පහසුකම් සම්බන්ධ ප්‍රශ්නයත් එහෙමයි. අධිවේගී මාර්ගම නොවෙයි. ඒ මාර්ග පහසුකම් සම්බන්ධ ප්‍රශ්නය. ඒ කියන්නේ අත්‍යවශ්‍ය යටිතල පහසුකම්වලට ප්‍රමුඛතාව දීමේදී ආණ්ඩු දක්වන සැලකිල්ලත් මේ ආයෝජන නොඑන්න බලපා තිබෙනවා. අනෙක් කාරණය තමයි, ආයෝජන කැඳවා ගැනීමේදී ඔවුන්ට මුහුණ දෙන්න සිද්ධ වන ක්‍රමවේදයේ තිබෙන දැඩි අවිශ්වාස සහගතභාවය. දැඩි අවිශ්වාසයක් තිබෙනවා. ඇයි, දේශපාලන බලය හෝ මුදල් බලය පාවිච්චි කරලා, බලපෑම් කරලා, මේ ඕනෑම ක්‍රමවේදයකින් ගැලවෙන්න පුළුවන්ය කියලා විශ්වාසයක් ආයෝජකයා තුළ හදලා තිබෙනවා. නැද්ද? මම එක උදාහරණයක් විතරක් කියන්නම්. සයිටම් ප්‍රශ්නය පසුගිය කාලයේ

රටේ මහත් ආන්දෝලනයකට තුඩු දීලා තිබුණා. සයිටම් එකත් ආවේ ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘතියක් විධියටයි. ගිවිසුමක් අත්සන් කළා. ඒ ගිවිසුමේ ප්‍රධාන කොන්දේසි දෙකක් තිබෙනවා. 2008 තමයි ගිවිසුම අත්සන් කළේ. ඒ කොන්දේසි තමයි, "මෙය විදේශීය විශ්වවිද්‍යාලයක් සමඟ අනුබද්ධ විය යුතුය", ඒ වාගේම "අපේ රටේ සෞඛ්‍ය සම්බන්ධ උපාධියක් ලබා දෙනවා නම්, එය සෞඛ්‍ය අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියට යටත් කළ යුතුය" කියන එක. නමුත් මේ කොන්දේසි දෙක කැඩුවා. කැඩුවේ දේශපාලන බලය පාවිච්චි කරලා. නමුත් ආයෝජන මණ්ඩලයට මොකක්ද කරන්න පුළුවන්කම ලැබුණ? ඒ අනුව මේ රටේ ව්‍යාපාරිකයකුට තමන්ගේ කුට අරමුණු වෙනුවෙන් මෙවැනි ගිවිසුම් කඩන්න පුළුවන් නම් ක්‍රමවේදය ගැන විශ්වාසයක් හදන්නේ කොහොමද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයෝජන ගෙන්වා ගැනීම සඳහා අපට කැපවීමක් නැහැ. අපි කැපවීමෙන් වැඩ කරන්නේ නැහැ. අමාත්‍ය මණ්ඩලය ඒ විධියට සාමූහිකව වැඩ කරන්නේ නැහැ. සමහරවිට ඒක ඇමතිවරයාගේ කාර්යයක් කියනවා. ඒක මේ BOI එක භාර ඇමතිවරයාගේ කාර්ය භාරයක් විතරක් නොවෙයි. ආයෝජන කැඳවා ගන්නවාය කියන්නේ, අපේ රටේ ආර්ථිකය ගොඩනැඟීමේ ප්‍රධාන සාධකයක් නම්, අනිවාර්යයෙන්ම කැබිනට් මණ්ඩලයටම ඒ සඳහා කැපවීමක් තියෙන්න ඕනෑ. ඒක නැහැ. ඒක කොහේද තිබෙන්නේ? ඒක නැහැ විතරක් නොවෙයි, ඒකට අපේ විදේශ සේවාවත් සම්බන්ධ කර ගන්න ඕනෑ. නමුත් අපි අපේ තානාපතිවරු, අපේ consular generalලා, අයෝජන ගෙන්වා ගැනීම සඳහා මෙහෙයවන්නේ කොහේද? මෙහෙයවන්න පුළුවන් අයද අපි දමන්නේ. තමුන්නාන්සේලා තානාපතිවරු හැටියට පත් කරන්නේ කවුද? ඒ, තමුන්නාන්සේලාගේ විශ්‍රාම ගිය දේශපාලනඥයෝ. ඡන්දයෙන් පැරදුණාට පස්සේ චීනයේ තානාපතිකම දෙනවා. ඒ අයට පුළුවන්ද, ආයෝජන ගෙන්වා ගන්න. එහෙම නැත්නම් පත් කරන්නේ තමුන්නාන්සේලාගේ business partnersලා. පසුගිය ආණ්ඩුව දුන්නා වාගේ උදයංග වීරතුංග වාගේ තමන්ගේ ව්‍යාපාරික සගයෙක් තමයි තානාපති හැටියට පත් කරන්නේ. ඒගොල්ලෝ ගිහිල්ලා කරන්නේ රටට ආයෝජන ගෙන එන නොවෙයි, තමන්ගේ ව්‍යාපාර නඩත්තු කර ගන්න එකයි.

අනෙක් කාරණය තමයි ආයෝජකයන් කැඳවා ගැනීම සඳහා ප්‍රමුඛතාව දෙන්න ඕනෑ රටවලට ප්‍රමුඛතාව නොදීම. මම අහන්නේ, චීනයට පුළුවන් නම්, ඉන්දියාවට පුළුවන් නම් යුරෝපා සංගමයේ තිබෙන බ්‍රසල්ස්වලට තමන්ගේ රටේ තානාපති සේවයේ ඉහළ නිලධාරීන් යවන්න අපට බැරි ඇයි? මට දැනගන්න ලැබුණ විධියට චීන ආණ්ඩුවෙන්, තානාපති සේවය සඳහා මට මතක විධියට 262ක කණ්ඩායමක් බ්‍රසල්ස්වල නතර කරලා තිබෙනවා. අපි කවුද නතර කරලා තිබෙන්නේ. අපි රියැදුරාත් එක්ක තුන් හතර දෙනෙක් නතර කරලා තිබෙනවා. ඉතින් කොහොමද ආයෝජකයෝ ගේන්නේ? අපි විදේශ සේවාවට පත් කරලා තිබෙන්නේ මෙහෙම අයයි. කෝ, ආයෝජන ගෙන්වා ගන්න තරම් කැපවීමක්. එහෙම එකක් නැහැ. චීනය ඩොලර් ට්‍රිලියන ගණනක දළ ජාතික නිෂ්පාදිතයක් තිබෙන රට. හැබැයි, අපේ රටේ චීන ආණ්ඩුවේ, චීන සමාගම්වලින් ක්‍රියාත්මක කරන හැම ව්‍යාපෘතියක් ගැනම චීන තානාපතිවරයා සොයලා බලන්නේ ඇයි? ඔහු පුද්ගලයෙක් හැටියට හැම තැනකම භෞතිකව ඉන්නේ ඇයි? ඔහු කල්පනා කරනවා, මේ රටේ ආර්ථිකය පුංචි වුණත් තමන්ට භාර දුන්න duty එක කරන්න ඕනෑ කියලා. දැන් ඉන්න වියට්නාම තානාපතිවරු; දැන් ඉන්න තානාපතිතුමිය වියට්නාමයට ආයෝජකයන් කැඳවා ගැනීම සඳහා අපේ රටේ ව්‍යාපාර ඒ රටට ගෙනයාම සඳහා මහා කාර්ය භාරයක් කරන බව මම හොඳටම දන්නවා. අපේ කවුද එහෙම කරන්නේ? කෝ මෙහෙයවීම්?

ඇත්තටම විදේශ ආයෝජන ගෙන්වා ගන්න අපි අවංකව කල්පනා කරනවාද කියලා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මලික් සමරවික්‍රම ඇමතිතුමනි, විදේශ ආයෝජන ගෙන්වා ගන්න අපි අවංකව කල්පනා කරනවා නම්, අපේ රටට ආයෝජන ආවේ නැත්තේ ඇයි කියන එක පිළිබඳව තමුන්නාන්සේලා කල්පනා කරන්න ඕනෑ කියලා මම හිතනවා. බලාපොරොත්තු තියා ගන්න පුළුවන්, අපේක්ෂා දල්වාගෙන ඉන්න පුළුවන්, අපට අවුරුදු තුනක් දෙන්න කියලා කියන්න පුළුවන්. නමුත් පසු ගිය අවුරුදු 40 තුළ මේ වෙච්ච වැඩේ පිළිබඳව මේ පාර්ලිමේන්තුව දැන ගන්න ඕනෑ. එහෙම නාවේ ඇයි කියන එක පිළිබඳව විධිමත්, විද්‍යාත්මක සමාලෝචනයක් කරලා, එය මේ පාර්ලිමේන්තුවට වාර්තා කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොන ආණ්ඩුවක් බලයට පත් වුණත් රට ඉස්සරහට අරගෙන යන්න නම්, එවැනි ආකාරයේ පසු විපරමක්, සොයා බැලීමක්, සමාලෝචනයක් අවශ්‍ය කරනවා; එය අනාගතය වෙනුවෙන් කරන ආයෝජනයක් වේවි.

ඊළඟට, මම අපේ අධිකරණ ඇමතිතුමිය දිහාවට පොඩ්ඩක් හැරෙන්න කැමැතියි. ඇත්තටම ගත්තොත් දැන් අපේ තලතා අතුකෝරල මැතිතුමියට ලොකු වගකීමක් ලැබී තිබෙන්නේ. මොකද, 2015 ජන වරමේ ප්‍රධාන කොටසක් තමයි නීතියේ ආධිපත්‍යය ප්‍රතිෂ්ඨාපනය කිරීම. ගරු ඇමතිතුමියනි, දැන් ඔබතුමියට ඒ කාර්යය පැවරිලා තිබෙනවා. පැවරුණේත් හොඳට ගියපු අධිකරණයක් නොවෙයි. කලින් හිටපු අග්‍රවිනිශ්චයකාරතුමන්ලා ඒ කාලයේ දීපු තීන්දු පිළිබඳව ජනතාවගෙන් සමාව ඉල්ලන කාලයක් මේක. සමාව ඉල්ලලා හරි විධියට හැසිරෙනවාත් නොවෙයි. ආයෙත් ගිහිල්ලා හොරාගේ ඔඩොක්කුවේම ඉඳ ගන්නවා. එහෙම එකක් තමයි ලැබී තිබෙන්නේ. එහෙම තැනකයි ඔබතුමියට වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු නඩු අහලා, ඒ ගොල්ලන් විනිශ්චයකාරවරු -නඩුකාරවරු- වෙලා, අපේ ශිරාණි බණ්ඩාරනායක මැතිනිය ගෙදර යවපු අධිකරණයක් තමයි ඔබතුමියට භාර වෙලා තිබෙන්නේ. ඒ වාගේම අලි හොරු ආරක්ෂා කරපු, අලි හොරු ලවා තමන්ට අලි ගෙන්වා ගත්ත විනිශ්චයකාරවරු ඉන්න අධිකරණයක් තමයි ඔබතුමියට ලැබී තිබෙන්නේ. ඒ නිසා වගකීම වැඩියි. මම හිතන විධියට ඒ වගකීම තවත් වැඩි වෙනවා, ඔබතුමිය අනුප්‍රාප්තිකයා බවට පත් වුණේ ජනාධිපති නීතිඥයෙකුගෙන් පස්සේ, මහා ප්‍රාඥයෙකුගෙන් පස්සේ නිසා. ඔබතුමියගේ ප්‍රඥාව, දැනුම, හැකියාව සහ දක්ෂතාව මේ වැඩේ කරගෙන යන්න ප්‍රමාණවත් කියලා මම පෞද්ගලිකව විශ්වාස කරනවා. මහා ප්‍රාඥයෙක් වෙන්නම ඕනෑ නැහැ, ආචාර්ය උපාධියක්ම ඕනෑ නැහැ, ජනාධිපති නීතිඥ කෙනෙක් වෙන්නම ඕනෑ නැහැ, duty එක හරියට කරනවා නම්. මම හිතන විධියට ඔබතුමියට පැවරිලා තිබෙන ප්‍රධාන වගකීම තමයි නීතිය පිළිබඳ ජනතාව තුළ විශ්වාසය ඇති කිරීම. දැන් අපේ රටේ නීතිය ගැන ජනතාවට විශ්වාසයක් නැහැ; අධිකරණය ගැන විශ්වාසයක් නැහැ. ප්‍රභූවරයෙක් සම්බන්ධයෙන් චෝදනාවක් ආවොත් මොකක්ද වෙන්නේ කියලා ඔබතුමිය දන්නවා. චෝදනාවක් ආවොත් එහෙම, චෝදනාව ආපු ගමන් ඔන්න එනවා, අත් අඩංගුවට ගන්න එපා කියලා අපේක්ෂිත ඇප ඉල්ලාගෙන. කොහොම හරි කරලා නඩුව ඉදිරිපත් වුණොත්, පිළිගන්න බැරි තාලෙට ඉස්සරහට දින දෙනවා. ඒක සාමාන්‍ය දෙයක් බවට පත් වෙලා තිබෙනවා. මොකක් හරි වෙලා අත් අඩංගුවට අරගෙන බන්ධනාගාරගත කළොත් මොකක්ද වෙන්නේ? දවල් ප්‍රවෘත්තිය බන්ධනාගාරගත කළා කියන එක නම්, හවස ප්‍රවෘත්තිය ඔහු බන්ධනාගාර රෝහලට ඇතුළත් කළා කියන එක. යස අගේට අත වනාගෙන, මාධ්‍යයට voice-cuts දීගෙන යන කෙනාට බන්ධනාගාරගත කරන්න කියලා තීන්දුව ලැබුණොත්, හවසට දියවැඩියාව, ප්‍රෙෂර් එක,-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නයා ගහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ඔව්, නයා ගහනවා. ඒක්කෝ අක්මාවේ ප්‍රශ්න; ගොඩක් ලෙඩ. හවසට බන්ධනාගාර රෝහලේ. ඊළඟට? ඒ මොකක් හරි වෙලා බන්ධනාගාරගත වුණොත් එහෙම, දින කිහිපයකින් ඇප ලැබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුව හා හූවක්වත් නැහැ. ඕක නේ සාමාන්‍යයෙන් වෙන්නේ. ප්‍රභූවරයෙක් අත් අඩංගුවට ගත්තාට පස්සේ වෙන වැඩේ ඕක නොවෙයිද? හැබැයි බලන්න, අර කන්න අඹ ගෙඩි තුනක් කඩා ගත්ත අනුරාධපුරේ අම්මාට මොකක්ද වුණේ කියලා. අඹ ගෙඩි තුනයි කඩා ගත්තේ. පොලීසියෙන් ගෙදරට ජීප් එකක් යවලා ඒ අම්මාව අරගෙන ඇවිල්ලා, රැයක් පුරා කූඩුවේ -එළියේ- තියාගෙන ඉඳලා, වැසිකිළි යන්න දෙන්නේත් නැතුව, වතුර බොන්න දෙන්නේත් නැතුව තියාගෙන ඉඳලා, පහුවෙනිදා උදේ උසාවියට ඉදිරිපත් කළා; රුපියල් ලක්ෂයක ශරීර ඇප නියම කළා. එහෙම නේ වෙන්නේ. මහියංගනයේ පදික වේදිකාවේ වෙළෙඳාම් කරන, දරුවෝ දෙන්නෙකුගේ අම්මා කෙනෙක් සුදු අඳින්නේ නැතුව උසාවියට ගියාම අධිකරණයට අපහාස කළා කියලා දවස් 14ක් කූඩුවේ දැම්මා. එහෙමයි කරන්නේ. හැබැයි මේ අයට? ඔබතුමියම කල්පනා කරලා බලන්න, සුදු රෙදි වංචා නඩුවේ -සුදු රෙදි. සිල් රෙදි නොවෙයි- රටට කරපු පාඩුව රුපියල් මිලියන 600යි. ඒ නඩු විභාගයේදී නීතිපති දෙපාර්තමේන්තුවේ හැසිරීම අපි ඉහළින්ම අගය කරනවා. ඒ නඩුව වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්තුමා අවසානයේ කියනවා, "ප්‍රධාන කාරණා දෙකක් නිසා ගරු විනිශ්චයකාරතුමනි, මේ සම්බන්ධයෙන් දඬුවම් ලබා දීම සඳහා අවධානය යොමු කරන්න ඕනෑ. එකක් තමයි, මෙම චෝදනාවට අදාළ මුදල රජය සතු ආයතනයක් වන විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මුදල් නම්, ඒවා මහජන මුදල් කියන කාරණය. දෙක, මෙම විත්තිකරුවන් දෙදෙනා රාජකාරිමය වශයෙන් තමන්ගේ තිබෙන හැකියාව සහ බලය භාවිත කර මේ මුදල් වියදම් කර ඇති බවත් සැලකිල්ලට ගන්නා ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා" කියලා.

ඒ විතරක් නොවෙයි. අවසානයේ ගිහාන් කුලතුංග විනිශ්චයකාරතුමා වන්දි ලබා ගැනීම සම්බන්ධයෙනුත් අහනවා. නීතිපති දෙපාර්තමේන්තුව කියන්නේ මේ රුපියල් මිලියන 600ම මේ දෙදෙනාගෙන් අය කර ගන්න ඕනෑය කියලායි. එහෙමයි නීතිපති දෙපාර්තමේන්තුව මේ නඩුවට පෙනී සිටියේ. හැබැයි, දවස් 10ක් ගියාට පස්සේ මේ දෙදෙනාට ඇප ලබා දෙන එක සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සද්දයක් නැතිව ඉන්නේ කොහොමද? මෙතරම් තදින් මේ නඩුවේදී පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුව; මුළු වන්දි මුදලම අය කර ගන්න ඕනෑය කියලා කියපු නීතිපති දෙපාර්තමේන්තුව; දින 10ක් ගතවන කොට මේ සම්බන්ධයෙන් සද්ද නැතිව ඉන්නේ කොහොමද? එහෙම නම්, එතැන දේශපාලන බලපෑමක් නැද්ද? එහෙම නැත්නම්, මෙහෙම වෙන්න පුළුවන්ද? පෙරේදා අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ නඩුව වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරියා නඩුවට ගියේ නැහැ, කනිෂ්ට නිලධාරියෙකු යැව්වා. ඒ, ඇයි? තමුන් මුහුණ දීපු, තමුන් මේ වෙනුවෙන් කරුණු දක්වපු නඩුවේදී ඊට පරස්පරව ලජ්ජාවක් ඇතුව අනික් පැත්තේ ඉන්න එම නිලධාරියාට පුළුවන්කමක් නැති නිසා. එම නිසා දැන් අධිකරණයේ තිබෙන ප්‍රශ්නයට හේතුව විධියට අප දකින ප්‍රධාන කාරණාව තමයි, දේශපාලන අතපෙවීම, දේශපාලන ඇඟිලි ගැසීම.

ඊ ළඟට, නඩු ප්‍රමාදයත් අද තිබෙන බරපතළ ප්‍රශ්නයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මම සම්පන්දන් මැතිතුමාගේ කාලයෙන් ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

විනාඩි කීයක්ද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මට විනාඩි 10ක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හරි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

නඩු ප්‍රමාදවීම සම්බන්ධයෙන් තමුන්නාන්සේලාම ඉදිරිපත් කරන වාර්තා තිබෙනවා. ඒ අනුව, 2016දී අවසන් නොකරන ලද නඩු උපරිමාධිකරණයේ සියයට 65ක් තිබෙනවා; අභියාචනාධිකරණයේ සියයට 81ක් තිබෙනවා; මහාධිකරණයේ සියයට 64ක් තිබෙනවා; සිවිල් අභියාචනා මහාධිකරණයේ සියයට 66ක් තිබෙනවා; දිස්ත්‍රික් අධිකරණවල අවසන් නොකළ නඩු සියයට 78ක් තිබෙනවා. දැන් අපි මේකට මොකක්ද කරන්නේ? මේ සඳහා අය වැය යෝජනාත් විවිධාකාරයෙන් ඉදිරිපත් වෙලා තිබුණා. ගරු අධිකරණ ඇමතිතුමියගෙන් මා අහන්න කැමැතියි, 2017 වර්ෂයේ අය වැයේ 406වන යෝජනාව සම්බන්ධයෙන්. ඒ අනුව වාණිජ අධිකරණ 4ක් පිහිටුවන්න රුපියල් මිලියන 100ක් වෙන් කර තිබෙනවා. ඉන් කීයක් හැදුවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! ගරු මන්ත්‍රීතුමනි, සම්පන්දන් මන්ත්‍රීතුමා විනාඩි 30ම කථා කරලා තිබෙනවා. එතුමාට හම්බ වෙලා තිබෙන්නේ විනාඩි 30යි. ඒ සම්පූර්ණ වෙලාවේම එතුමා කථා කරලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මට කිව්වා, වෙලාව ඉතිරි වුණා කියලා. අද කාගේද, වෙලාව ඉතිරි වුණේ? විජිත හේරත් මන්ත්‍රීතුමාගේ වෙලාව ඉතිරිද? [බාධා කිරීමක්] හරි, කමක් නැහැ, මගේ ඉතිරි විනාඩි 5 දෙන්න.

තමුන්නාන්සේලා දැක තිබෙනවා, මේ නඩු ප්‍රමාදය. 2016 අය වැයේ 443න් වන යෝජනාව අනුව දෙවරු ක්‍රමයකට නඩු අහමු කියලා යෝජනා කළා. මා අහන්නේ ඒවා ක්‍රියාත්මක කරන්න නොහැකි වන්නේ ඇයි කියලායි. නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයත් එහෙමම තිබෙනවා. මට ඒ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න පුළුවන්. තමුන්නාන්සේලාම නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ කෙටුම්පත්, අණපනත් ප්‍රමාද වන්නේ කොහොමද කියලා මා කියන්නම්.

ඊළඟට, ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ තත්ත්වයත් එහෙමයි. ආණ්ඩුවේ රස පරීක්ෂක

දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව 2010 වර්ෂය අවසානය වනකොට ඔවුන්ට ලැබුණු සාම්පල්වලින් පරීක්ෂා කරන්න පුළුවන් වුණේ සියයට 59යි. එහි යම් වර්ධනයක් තිබෙනවා. හැබැයි, ඒ වර්ධනය ඇතුළේ 2015 වර්ෂය අවසානයේ අපට ඉතිරි වෙලා තිබෙනවා, සාම්පල් 3,955ක්. 2016දී සාම්පල් 4,944ක්. මෙහි තිබෙන ප්‍රශ්නය තමයි, මේ ඉතිරි වෙලා තිබෙන නියැදි, ආදර්ශන කොපමණ කාලයක් පැරණි ඒවාද කියන එක. මා ළඟ තිබෙන වාර්තාවේ සඳහන් වනවා, අවුරුද්දයි, අවුරුදු 3යි අතර වන සාම්පල් සියයට 28ක් තිබෙන බව. ඒ වාගේම අවුරුදු 3යි, අවුරුදු 5යි අතර වන සාම්පල් සියයට 10ක් තිබෙනවා. ඇත්තටම ගත්තොත් එහෙම තරුණයෙකු කුඩු ටිකක් ළඟ තබා ගෙන සිටීම නිසා ඔහු අත් අඩංගුවට ගෙන රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට එම සාම්පලය යවා check කරලා report එක ලැබෙන්න යන කාලය, ඔහු ඒ කුඩු ප්‍රමාණය ළඟ තබා ගත්තා කියලා පිළිගත්තොත් ලැබෙන දඬුවම් කාලයට වඩා වැඩියි. එවැනි නඩු තිබෙනවා. එක නඩුවක මා අහගෙන සිටියා,-

**ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා (අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා හා බුද්ධ ශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த - நீதி பிரதி அமைச்சரும் புத்தசாசன பிரதி அமைச்சரும்)
(The Hon. H.R. Sarathie Dushmantha - Deputy Minister of Justice and Deputy Minister of Buddha Sasana)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වේ වසර කීපයකට කලින් වාර්තා. නමුත්, වර්තමානය වන විට ඒ තත්ත්වය වෙනස්. මම ඔබතුමාගේ දැනුවත් වීම සඳහායි මේ දත්ත කියන්නේ. 2017 ජනවාරි මාසයේ පළමුවෙනි දා සිට සැප්තැම්බර් මාසයේ 30වෙනි දා වන තෙක් අපට තිබෙන නඩු සංඛ්‍යාව ගත්තාම සියයට 90කට වඩා වැඩ අවසන් කර තිබෙනවා. ඒ අනුව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රගතියක් තිබෙනවා.එතැන තිබෙන ප්‍රශ්නය මේකයි. සමහර ඒවා පසු ගිය වසරවල එකතු වෙමින් ආවා නේ. ඒ සංඛ්‍යාව ඉහළට යන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. නමුත් අපට සියයට සියයේම ප්‍රගතිය දක්වා යන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ ප්‍රගතිය පිළිගන්නා අතරතුරේ තමයි, ඉතිරි වෙලා තිබෙන සාම්පල්වල අවුරුදු ගණන මම කිව්වේ. මම හිතනවා ඔබතුමන්ලා ඒවා ඉක්මනට අවසන් කරගනියි කියලා.

නීතිය පිළිබඳව විශ්වාසය හැදීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරු පසු ගිය කාලයේ කළ සේවාව පිළිබඳ අපට ඇගයීමක් තිබෙනවා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා (ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා)**
( பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா - பிரதேச அபிவிருத்தி அமைச்சர்)
(Field Marshal Hon. Sarath Fonseka - Minister of Regional Development)

නීතිය හදාගන්න තමයි හිටපු අධිකරණ ඇමතිතුමා එළෙව්වේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ඒක හොඳයි, ගරු ඇමතිතුමනි.

නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ වැටුප් සම්බන්ධවවත් ඊළඟට මම කියන්න ඕනෑ. ඔවුන් කරන සේවය අගය කරන අතරම, කාර්යක්ෂම සේවාවක් ලබාදීම සඳහා අවශ්‍ය කරන වැටුප් පරිමාණයක් ඔවුන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. ඒ වාගේම, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ විශාල හිඟයක් තිබෙනවා. සුළු නිලධාරින් ප්‍රමාණයක් එක්ක ඔවුන් මහා කාර්යභාරයක් කරනවා. සමස්ත නීතිපති දෙපාර්තමේන්තුවේම දැනට නිලධාරින් 204 දෙනයි ඉන්නේ. ඒ අයගෙනුත් අවුරුදු 10ට වැඩි අත්දැකීම් ඇති නිලධාරින් ඉන්නේ 100ට අඩු සංඛ්‍යාවක්. 2014 වසරේ සිට ගත්තොත්, අවුරුදු 10ට වැඩි නිලධාරින් 7දෙනෙක් ඉල්ලා අස්වෙලා තිබෙනවා. අවුරුදු 5ට වැඩි අත්දැකීම් තිබෙන නිලධාරින් පස්දෙනෙක් ඉල්ලා අස් වෙලා තිබෙනවා. මේ ආකාරයට කීප දෙනෙක් ඉල්ලා අස්වෙලා තිබෙනවා. තවත් තුන්දෙනෙක් විදේශගත වෙලා තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් 204 දෙනා අතර සිටින අත්දැකීම් සහිත නිලධාරින් ප්‍රමාණය දැන් අඩු වෙලා තිබෙන්නේ.

බල කරලා, බල කරලා, කෙසේ හෝ පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයක් හැදුවා. අවුරුදු දෙකහමාරක් ගත වුණාට පසුව දැන් ඇමතිතුමිය යෝජනා කර තිබෙනවා, විශේෂ අධිකරණයක් හදන්න. ඒක හොඳයි. හැබැයි තිබෙන ප්‍රශ්නය මේකයි. පරීක්ෂණ කරන්න පොලීසියේ වෙනම ඒකකයක් තිබුණාට, නඩු අහන්න වෙනම අධිකරණයක් තිබුණාට, නඩු ගොනු කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය අපරාධ ඒකකයක් හදන්නේ නැත්තේ ඇයි? දැන් සිවිල් නඩු ගොනු කරන්න පුළුවන්, අපරාධ නඩු ගොනු කරන්න පුළුවන්. හැබැයි, දැන් රටේ වේගයෙන් ව්‍යාප්ත වන සහ බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන මූල්‍ය අපරාධ සඳහාත් එවැනි වෙනම ඒකකයක් හදන්න කියලා මම යෝජනා කරනවා.

මම මේ අවස්ථාවේ මෙන්න මේ අයට විශේෂ ස්තුතියක් පිරිනමන්න කැමැතියි. අපේ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් නිසා තමයි ජනතාව තුළ යම් හෝ විශ්වාසයක් මේ මොහොතේ ගොඩනැඟෙමින් තිබෙන්නේ. ජනාධිපති නීතිඥ දප්පුල ද ලිවේරා, යසන්ත කෝදාගොඩ, තුසිත් මුදලිගේ, දිලීප පීරිස්, ජනක බණ්ඩාර, ජනාධිපති නීතිඥ සංජය රාජරත්නම්, විරාජ් දයාරත්න, මෙරීන් පුල්ලේ, ජනාධිපති නීතිඥ ඉන්දිකා දෙව්මිණි ද සිල්වා කියන කණ්ඩායම එක්නැලිගොඩ නඩුවේදී, බැඳුම්කර සිද්ධියේදී, සුදු රෙදි හොරකමේදී කරපු මැදිහත්වීම පිළිබඳව අපේ ඇගයීමක් තිබෙනවා. ඒ නිසා මේ අයගේ කණිෂ්ඨ කාර්ය මණ්ඩල තව ශක්තිමත් කරන්න නිලධාරින් බඳවාගෙන, ඔවුන්ගේ වැටුප් පරිමාණය ඉහළ දමලා, පුහුණුව ලබාදීලා, මේ ක්‍රියාවලිය ශක්තිමත් කරයි කියලා මා විශ්වාස කරනවා. ඇත්තටම ගරු ඇමතිතුමියනි, ඔබතුමියට දැන් වෙලි වෙලී ඉන්න වෙලාවක් නැහැ. ඔබතුමියට කරන්න හරියට වැඩ තිබෙනවා. මහා ප්‍රාඥයකුගෙන් පසුව අධිකරණය භාර ගත්තා නම්, ඒකට හරි යන විධියට වැඩ කරන්න ඕනෑ. ඒ නිසා, "තල නම් තෙලට වේලේ, තලතා නම් කුමට වේලේ ද" කියලා තමයි අපට අහන්න වන්නේ. ඒ නිසා ඔබතුමියට වෙලි වෙලී ඉන්න බැහැ. ඔබතුමියට ජනතාව වරමක්, බලයක් දීලා තිබෙන්නේ වැඩ කරන්නයි.

රටේ වේගයෙන් ව්‍යාප්ත වන ළමා අපචාර පිළිබඳවත් ඊළඟට මම ඔබතුමියගේ අවධානය යොමු කරවනවා. මෙහි යම්කිසි ආකාරයක ඉරණම් සහගත කාරණයක් තිබෙනවා, ගරු ඇමතිතුමියනි. නීතිය සම්බන්ධයෙන් ගත්තාම අපට පෙනෙනවා අද ළමා අපචාර වැඩි වී තිබෙන බව. ඒකට හේතුව තිබෙන්නේත් ඔබතුමියගේ අනෙක් අමාත්‍යාංශයේ. ඔබතුමියට විදේශ රැකියා අමාත්‍යාංශයත් තිබෙනවා, අධිකරණ අමාත්‍යාංශයත් තිබෙනවා. මව විදේශගත වුණු පවුල්වල තමයි මේ ළමා අපචාර වැඩිපුර වාර්තා වෙලා තිබෙන්නේ. ළමා අපචාර නඩුවක අධිචෝදනා පත්‍ර ගොනු කරන්න සාමාන්‍යයෙන් අවුරුදු දෙක තුනක් ගත වෙනවා. ඒ නඩුව අහලා අවසන් වෙන්න අවුරුදු පහක්, අටක් විතර යනවා. ඒ නිසා ඒ හරහා සමාජයට ලබාදෙන්න ඕනෑ පණිවුඩය -දඬුවම මඟින් ලබා දෙන පණිවුඩය- හරියට වාර්තා වන්නේ නැහැ.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මොකද අවුරුදු අටක් විතර ගියාට පසුව නඩුවත් අත ඇරෙනවා; වැඩකුත් නැහැ. ඒ නිසා මේ ළමා අපචාර කරන්නන්ට සමාජමය දණ්ඩනයක් ලබාදෙන්න මේ තිබෙන ප්‍රමාදයත් බලපා තිබෙනවා.

අනෙක් කාරණය මේකයි. ගරු ඇමතිතුමියනි, මේ අපරාධ වැඩිපුරම වාර්තා වන්නේත් ඔබතුමියගේ දිස්ත්‍රික්කයෙන්ම තමයි. ළමා බලාපරාධ වැඩිපුරම වාර්තා වෙලා තිබෙන්නේ අනුරාධපුරයෙන්. ඒ අපේ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය නියෝජනය කරන දිස්ත්‍රික්කය. දෙවැනි තැනට ළමා බලාපරාධ වාර්තා වන්නේ රත්නපුරයෙන්. ඒ අපේ අධිකරණ ඇමතිතුමිය නියෝජනය කරන දිස්ත්‍රික්කය. සුළු අපරාධ වැඩිපුර වාර්තා වන දිස්ත්‍රික්ක තුන අතර ඔබතුමිය නියෝජනය කරන දිස්ත්‍රික්කයත් තිබෙනවා. එම නිසා මේ ළමා අපරාධ සම්බන්ධව වැඩිපුර අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. නීතිය ක්‍රියාත්මක කරන්න දැන් ඔබතුමියට ජන වරම ලැබී තිබෙනවා.

තමුන්නාන්සේලා අධිකරණයට ඇඟිලි ගැසීම් නොකරනවා නම්, අවංකවම රටේ නීතියේ විධානය, ආධිපත්‍ය ප්‍රතිෂ්ඨාපනය කරන්න අධිෂ්ඨාන කරගෙන ඉන්නවා නම්, ඒ සඳහා මේ හොඳ අවස්ථාවක් කියලා අපි හිතනවා. ඒ සඳහා නීතිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කරන්න. ඔවුන්ගෙන් බහුතර නිලධාරින් ප්‍රමාණයක් ජ්‍යෙෂ්ඨ නිලධාරින්. ඔවුන් කැපවීමෙන් වැඩ කරනවා. ඔවුන්ට ධෛර්ය දෙන්න. ඒ වෙනුවට කළ යුත්තේ ඔවුන්ගේ කකුලෙන් ඇදීම නොවෙයි. ඒ නිලධාරියෙක් ඇමතිවරයෙකුගෙන් ප්‍රශ්න කළාම, ඒ ප්‍රශ්න කළ ලීලාව අරගෙන ඔහු පහතට ඇදලා දාන එක නොවෙයි කළ යුත්තේ. ඒ වෙනුවට නීතිය හරියට ක්‍රියාත්මක කරන අය දිරිගන්වන්න; ඔවුන් අගය කරන්න. එහෙම කරලා මේ රටේ මොන ආණ්ඩුවක් බලයට පත් වුණත් ජනතාව තුළ නීතිය පිළිබඳව තිබෙන විශ්වාසය තහවුරු වන ආකාරයට කටයුතු කරන්න කියමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

**[අ.භා. 1.58]**

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
බොහොම ස්තුතියි ඔබතුමාට.

ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය ගැන, ඒ වාගේම අපේ රටේ ආයෝජන ගැන කථා කරන කොට මෙවර අය වැය ගැන විශේෂයෙන් කථා කරන්න ඕනෑ. මෙවර අය වැය සුවිශේෂ අය වැයක්. ඒක රටට සුවිශේෂ වෙනවා වාගේම, මට ඉතාම විශේෂ අය වැයක් බවට පත් වෙනවා. මොකද, මෙවර අය වැයෙන් බිංගිරිය කර්මාන්ත නගරය සඳහා මුදල් වෙන්වෙලා තිබෙන නිසා. අපි මීට මාස හත අටක ඉඳලා මේ සඳහා කටයුතු කරමින් සිටියා. අද ඒ සඳහා ඉඩම් අක්කර 1,250ක මැනුම් කටයුතු අවසන් කරලා තිබෙනවා. මූලික වශයෙන්ම භූමියේ වැඩ පටන් ගැනීමට අවශ්‍ය කරන ජල සම්පත විධියට අපට දවසකට කියුබික් මීටර් දාහක් බිංගිරිය ජල යෝජනා ක්‍රමයෙන් ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ ඉඩම්වල කිසිදු පදිංචිකරුවෙක් නැහැ. ඒ සියලු ඉඩම් රජයේ ඉඩම්. ඒ නිසා කිසිම ගැටලුවකින් තොරව, ඉතාම කෙටි කාලයකින් එම ඉඩම් අත්පත් කර ගැනීම සහ අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු කරන්න පුළුවන්. අපි මීට දවස් හතරකට කලින් පසු ගිය සෙනසුරාදාත් අපේ නිලධාරින් සමඟ ඒ ගැන සාකච්ඡාවක් පැවැත්තුවා.

අද කලුතර කර්මාන්තපුරය ගැන කථා වෙනවා, වැලිගම කර්මාන්තපුරය ගැන කථා වෙනවා. ඒ වාගේම හම්බන්තොට කර්මාන්තපුරය ගැනත් කථා වෙනවා. හැබැයි, කොළඹින් මෙපිට යාපනය දක්වාම තිබෙන කර්මාන්තපුරය හැඳෙන්නේ මගේ බිංගිරිය ආසනයේ වීම ගැන මම ඉතාම සතුටු වෙනවා. ඒ සම්බන්ධයෙන් අගමැතිතුමාට, ඒ වාගේම මලික් සමරවික්‍රම ඇමතිතුමාට සහ ගරු රාජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම බිංගිරිය ආසනයත් එක්ක සම්බන්ධ වෙලා කටයුතු කරන අපේ ඒ නිලධාරින් ඇතුළු සියලුදෙනාටත් මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

මේ ආර්ථික මොඩලය අපේ අගමැතිතුමාගේ "බලගතු රටක්" වැඩසටහන ඔස්සේ තමයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. එතුමා බිංගිරිය කර්මාන්ත කලාපයක් විධියට සංවර්ධනය කරනකොට, එතැනින් මෙපිට ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමාගේ දිස්ත්‍රික්කයේ ඉරණවිල ප්‍රදේශය සංචාරක කලාපයක් විධියට සංවර්ධනය කරන්න කටයුතු කරමින් යනවා. "Voice of America" භූමිය පිහිටි එම ප්‍රදේශයේ අක්කර 5,500කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. අද මුළු රටටම ගැලපෙන, රටත් එක්ක බද්ධ වුණු කර්මාන්ත නගර වැඩසටහනක් රටේ ක්‍රියාත්මක වෙමින් යනවා. නමුත් සමහරු මේවා දිහා වැරදි කෝණයකින් බලනවා වෙන්න පුළුවන්.

1978 මහ කොළඹ ආර්ථික ක්‍රමය යටතේ -ඒ පනත යටතේ- ගෙනාපු ආයෝජන මණ්ඩලය තමයි අද මේ කටයුතු කරමින් යන්නේ. අද ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා නිලධාරින්ට නොයෙකුත් චෝදනා එල්ල කරමින් සිටියා. හැබැයි, නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමන්ලා එහෙම කථා කළාට, BOI එක තවදුරටත් ශක්තිමත් කරන්න, දැනට වඩා බලගතු ආයතනයක් බවට පත් කරන්න කටයුතු කරමින් යද්දී ඒවාටත් විරුද්ධ වූ අවස්ථා තිබුණා. විශේෂයෙන්ම පසු ගිය කාලයේ Agency for Development නමින් ආයතනයක් හදලා, ආයෝජකයන්ට අවශ්‍ය සියලු කටයුතු එක වහලක් යටදී, එක මේසයක ඉඳලා කරගන්න පුළුවන් බලගතු ආයතනයක් පිහිටුවන්න කටයුතු කරද්දී, ඇමති කෙනෙක් "සුපර් මෑන්" කෙනෙක් කරන්න යනවා කියලා චෝදනා කරලා තිබුණා. එහෙම චෝදනා කරන අය අනෙක් පැත්තෙන් BOI එකේ තිබෙන අඩු පාඩු ගැන කථා කරනවා. BOI එකේ යම් කිසි අඩු පාඩුවක් තිබෙනවා නම්, ඒ අඩු පාඩු හඳුනාගෙන ආයෝජකයන්ට භූමියේ වැඩ කටයුතු ඉක්මනින් පටන් ගන්න පුළුවන් තත්ත්වයට පත් කිරීම සඳහා BOI එකට නෛතික ගැටලු තිබෙනවා නම්, ඒ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා තමයි අපි එවැනි ආයතනයක් හදන්න ඕනෑය කියන ස්ථාවරයේ සිටියේ. එක පැත්තකින් අපි ප්‍රමාදයි, අපේ ආයතන මන්දගාමීයි කියලා අපට චෝදනා කරන ගමන්, අපි ඊට වඩා ශීඝ්‍රගාමී වැඩසටහනක් ක්‍රියාත්මක කරද්දී ඒකටත් අකුල් හෙළනවා. ඒක තමයි මේ දේශපාලනයේ අපි මෙච්චර කාලයක් දැකපු නරක පැත්ත. ඒ නිසා ඒ ගැන මතක් කරන්නට ඕනෑ. ඇත්තටම අද අපි BOI එක ඉතාම ශුභදායී විධියට දකිනවා.

විශේෂයෙන් අපේ මලික් සමරවික්‍රම ඇමතිතුමා, රාජ්‍ය ඇමතිතුමා, අපේ සභාපතිතුමා, ඒ වාගේම අනෙකුත් නිලධාරින් වෙනදාට වඩා ඉතාම උනන්දුවකින් කටයුතු කරනවා. තවත් අඩු පාඩු ඇති. සමහර නිලධාරින් දෙදෙනකුගේ, තුන්දෙනකුගේ ගැටලු ඇති. හැබැයි එක් කෙනකු, දෙදෙනකු පිට තබා සමස්ත නිලධාරි පද්ධතියටම තළන්න උත්සාහ කරනවා නම් අපි එය අනුමත කරන්නේ නැහැ. අපි දන්නවා, බහුතරයක් ඉතා හොඳ කැප

විමසිමකින් වැඩ කරනවාය කියලා. ඒ අයට අපේ සහයෝගය දෙන්න ඕනෑ, අපි ඒ අයට උදවු කරන්න ඕනෑ, අපි ඒ අය අගයන්න ඕනෑය කියන එකයි මගේ මතය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ආර්ථික වැඩසටහන ක්‍රියාත්මක කරන මහ මොළකරු වෙනත් කවුරුත් නොවෙයි, අපේ අගමැතිතුමායි. අපේ අගමැතිතුමාට අද උදේ පාන්දර ශ්‍රී ලංකා මහ බැංකු බැඳුම්කර සම්බන්ධයෙන් වූ ජනාධිපති කොමිසමට යන්න සිද්ධ වුණා. එතැනට අපේ සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා ගියා, ආශු මාරසිංහ මන්ත්‍රීතුමා ගියා, අපි සියලුදෙනාම ගියා. අගමැතිතුමා උත්තර දෙන්න ඒ කූඩුවට නැග්ගාම එහි සභාපතිවරයා මුලින්ම ඇහුවා, "ඔබතුමාට පුටුවක් ඕනෑද?" කියලා. අගමැතිතුමා කිව්වා, පුටුවක් ඕනෑ නැහැයි කියලා. එතුමා අගමැතිවරයෙක් හැටියට නොවෙයි, ඕනෑ දෙයකට මුහුණ දෙන්න පුළුවන් පුරවැසියකු විධියට හිටගෙන ඒ ප්‍රශ්නවලට උත්තර දුන්නා. එතුමා ඒ ප්‍රශ්නවලට උත්තර ලබා දුන් විධියට මට තවත් කාරණයක් මතක් වුණා. හිටපු ජනාධිපතිතුමා වැනි කෙනෙක් මේ කූඩුවේ සිටියා නම්, එතුමා මොකක් කරයිද කියන එක මට සිහි වුණා. මට හිතුණේ වෙන මොකක්වත් නොවෙයි, "අපේ හාමුදුරුවනේ, මම තමයි මේ රට බේරා ගත්ත නායකයා. මොනවාද මේ මගෙන් අහන ප්‍රශ්න?" කියා ඒ විධියට ප්‍රශ්න කරයි කියලා. ඒ ප්‍රශ්නවලට උත්තර දෙනවා වෙනුවට, මේ වාගේ හැම දාම කියන රට බේරා ගත්ත නායකයා කියලා, එහෙම නැත්නම් බුද්ධාගම මෙතැනට සම්බන්ධ කරලා, සිංහල ජාතිය සම්බන්ධ කරලා, සාටකය පටලවාගෙන එතැනින් බේරෙන්න උත්සාහ කරයි. නමුත් එතැනදී අගමැතිතුමා බොහොම පැහැදිලිව තමන්ගේ මතය ඉදිරිපත් කළා.

ඒ විතරක් නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශයක් සම්බන්ධව පැහැදිලි කර ගැනීමක් සඳහා එහිදී නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් එතුමාගෙන් ප්‍රශ්න කළා. එතුමා බොහොම පැහැදිලි උත්තරයක් දෙන ගමන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඇහුවා, "ඔබතුමන්ලා මේ කාරණයට මේ වාගේ මැදිහත් වනවා වාගේම මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් දැනට නීතිපති දෙපාර්තමේන්තුවේ තිබෙන ලිපි ගොනුවේ තත්ත්වය මොකක්ද? ඒකට මොකක්ද කරන්නේ?" කියන එකත්. එතුමා ඒ විධියට බොහොම එඩිතරව අද ඉදිරිපත් වෙලා තමන්ගේ නිර්දෝෂීභාවය පෙන්නුවා.

අනෙක් කාරණය මෙයයි. පසුගිය කාලයේ අධිකරණය ඉදිරියට සමහරු කැඳෙව්වාම නොයෙකුත් හේතු දක්වමින් අධිකරණය මඟහැරියා අපි දැක්කා. එක මහත්මයෙක් පොළඟා කෑවාය කියලා අධිකරණයට ගියේ නැහැ. තවත් කෙනෙක්, මට මතක විධියට මොකක් හෝ ලෙඩක් හැදුණාය කියලා, බඩේ අමාරුවක්ද කොහේද හැදුණාය කියලා අධිකරණය මඟ හැරියා. තවත් අය තමන්ගේ වැරැදි වහගන්න තමන්ගේ ආච්චි අම්මලාව ඉස්සරහට දැම්මා. ආච්චිගේ මැණික් මල්ල; ඩේසි ආච්චිගේ මැණික් මල්ල කියලා වළ පයයි, ගොඩ පයයි තබාගෙන ඉන්න ආච්චි අම්මාවත් ඉදිරියට දැම්මා, නීතියෙන් ගැලවෙන්න. අපේ අගමැතිතුමා ඒ විධියට කවුරුවත් ඉදිරියට දැම්මේ නැහැ. තමන් ඉදිරියට ගිහින් මේ සම්බන්ධයෙන් දෙන්න තිබෙන කට උත්තර දුන්නා. අපි හදපු රටේ යහ පාලන ආණ්ඩුවේ අපේ අගමැතිතුමා අද කොමිසම ඉදිරියට ගිහින් මේ විධියට උත්තර දෙද්දී අපට විශාල ආඩම්බරයක් ඇති වුණා. මේ මන්ත්‍රීවරු, ඇමතිවරු සියලුදෙනාම එතැනට ගියා. අපට සතුටක් ඇති වුණා, අපි මෙහෙම රටක් නේ හැදුවේ කියලා. අපට මතකයි, එදා තංගල්ලේදී විදේශීය කාන්තාවක් දූෂණය කරලා, ඝාතනය කිරීම සම්බන්ධයෙන් අඩුම ගණනේ එම ප්‍රාදේශීය සභාවේ සභාපතිටවත් නීතිය ක්‍රියාත්මක වුණේ නැහැයි කියලා. එම ප්‍රාදේශීය සභාවේ සභාපතිව රකින්න රටේ විධායකය කටයුතු කළා. ඒ විධියට නීතිය වල්වැදුණු සමයක් පසු කර ගෙන ඇවිත් තමයි අපි 2015 ජනවාරි 08වන දා අලුත් රටක් බිහි කළේ. අද මේ රටේ අගමැතිවරයා, වෙනත් ඕනෑම කෙනකු නීතිය ඉදිරියට ගෙනෙන්න පුළුවන් ඉඩකඩ තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මේ ප්‍රයත්නය ගැනත් අපි කියන්න ඕනෑ. කොපමණ මඩ ගහන්න හැදුවත්, අවුරුදු 40ක පිරිසිදු දේශපාලනයක් කරපු "Mr. Clean" කියලා මුළු රටේම, දකුණු ආසියාවේම හඳුන්වන රනිල් වික්‍රමසිංහ මහත්මයාට මඩ ගහන්න යම්කිසි කෙනෙක් උත්සාහ කරනවා නම්, නිව්ටන්ගේ නියමයට අනුව එයට ප්‍රතිවිරුද්ධ ප්‍රතික්‍රියාව සිද්ධ වෙලා ඒ මඩ ගහන්න යන අයටම තමයි අනෙක් පැත්තට වදින්නේ. මොකද, ඔය මඩ ගහන්න යන අයගේ බොහෝ දේවල් අපි දන්නවා. මඩ ගහන්න උත්සාහ කරන අයගේ දේවල් ඉදිරියේදී හෙළිවෙන්න පුළුවන්. මේ මඩ ගහන අයගේ පිටි පස්සේ පසුගිය කාලයේ හොරකම් කරපු අයත් ඉන්නවා. ඒ නිසා මා පැහැදිලිවම කියනවා, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මඩ ගහන්න උත්සාහ කරනවා නම්, ඒවා අනෙක් පැත්තට මේ ආත්මයේදීම පඩිසන් දීලා, මේ යුගයේදීම, මේ සභාව ඇතුළේදීම ඒවා හෙළිදරවු වන තත්ත්වයක් උදා වනවාය කියලා. එතුමා අද කරපු ඒ ප්‍රකාශ, එතුමා දුන්නු උත්තර දිහා බැලුවාම, හැම ක්ෂේත්‍රයක් පිළිබඳවම එතුමාට තිබෙන දැනුම, බුද්ධිය පිළිබඳව එතැන හිටපු නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් පවා කල්පනා කරන්න ඇති. එහෙම නායකයන් තමයි රටට අවශ්‍ය වෙලා තිබෙන්නේ.

එහෙම නැතිව තමන්ගේ පපුවට තට්ටුව දාගෙන, ජාතිවාදය, ආගම්වාදය පතුරුවාගෙන රට කරන නායකයෝ නොවෙයි අපිට ඕනෑ. දැනුමෙන්, බුද්ධියෙන් වැඩ කරන නායකයෝ තමයි අපට ඕනෑ. එහෙම නායකයෙක් තමයි අපි බිහි කරලා තිබෙන්නේ; එහෙම නායකයෙක් තමයි අපි අගමැතිවරයා විධියට පත් කරගෙන තිබෙන්නේ. එම නිසා අපට සතුටු වෙන්නට පුළුවන් අද දිනයේ විශේෂ ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියට ගිහින් ගරු අගමැතිතුමා කළ ඒ පැහැදිලි කිරීම ගැන. එතුමා එතැනට ගියේ ඉල්ලලා. එතුමා කිව්වා, "මට අවස්ථාව දෙන්න, මම ගිහිල්ලා මගේ ස්ථාවරය පැහැදිලි කරන්නම්, මගෙන් ප්‍රශ්න අහන්නට අවස්ථාව උදා කරලා දෙන්නම්" කියලා. එම නිසා අද දිනයේ අපේ රටේ ජනතාවගේ ඇස් නැවත වතාවක් ඇරුණා කියන එක මට කියන්නට පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
( மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ යහ පාලන ආණ්ඩුවට පයින් ගහලා ඉක්මනට බලය ගන්න හදන අයට අද හොඳ උත්තරක් ලැබුණා. මේ ආණ්ඩුව මේ රටේ ජනතාව වෙනුවෙන් වැඩ කරන පිරිසක් මිසක් අවුරුදු 10ක් මේ රට ආපස්සට ඇදලා දාපු හොරුන්ට නැවත බලයට එන්නට කටයුතු සලස්වන ආණ්ඩුවක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ සිදු වුණු දේවල් තවම පස්සෙන් තිබෙන්නේ. පසුගිය ටිකේ වැඩියෙන්ම කථා වුණේ දුරකථන සංවාද ගැන. ඒ දුරකථන සංවාදවල තොරතුරු ඉතාම ඉක්මනින් එළියට ආවා. හැබැයි, තාජුඩීන් ඝාතනය සම්බන්ධව අරලියගහ මන්දිරයෙන් ආපු දුරකථන ඇමතුම් 80කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා, ඒවායේ තොරතුරු තවම ලබා දීලා නැහැ. ඒවා පස්සේ කවුද ඉන්නේ, ඒවා රකින්නේ කවුද කියන බරපතළ ගැටලුව අපට තිබෙනවා. ඒ වාගේ තවත් කාරණා තිබෙනවා; තවත් නඩු තිබෙනවා; තවත්

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ප්‍රශ්න තිබෙනවා. ඒවාත් මේ වාගේම ඉක්මන් වෙන්නට ඕනෑ. මේ රටේ මීට වඩා හොරකම්, දූෂණ සිදු වෙලා තිබෙනවා. ඒවාට විරුද්ධවත් කොමිෂන් සභා පත් වෙන්නට ඕනෑ. වැඩි දෙයක් නොවෙයි, මහ බැංකුව තුළම තිබෙනවා. කඩා වැටුණු යුරෝපා රට වන ග්‍රීසියේ bonds ගත්තා. ඒවාට මොකද වුණේ කියන එක සොයලා බලන්නට ඕනෑ.

අද රට තුළ සමාජගත කරන්නට උත්සාහ කරනවා, මේක තමයි ලොකුම හොරකම කියලා. නමුත් තවම හොරකමක් ඔප්පු වෙලාත් නැහැ. ඒක තමයි මේ රටේම, ආසියාවේම තිබුණු ලොකුම හොරකම කියලා කියන්න හදනවා. රුපියල් බිලියන 10ක bonds මිලදී ගැනීමකින් රුපියල් බිලියන 1,000ක්, එහෙම නැත්නම් රුපියල් ට්‍රිලියනයක් පාඩු වුණා කියලා සමහරු කියනවා. එහෙම වෙන්න පුළුවන්ද? රුපියල් ට්‍රිලියනයක් පාඩු වෙන්න නම් එක අවුරුද්දක පොලිය සියයට 333ක් වෙන්නට ඕනෑ. බින්දු දන්නේ නැද්ද, ගණන් දන්නේ නැද්ද කියන එක ගැන ප්‍රශ්නයක්. සියයට 333ක අමතර පොලියක් ගෙව්වොත් තමයි රුපියල් ට්‍රිලියනයක පාඩුවක් වෙන්නේ. අපේ රටේ ජනතාවට bonds ගැන තේරෙන්නේ නැහැ. ඒ නිසා මේක තමයි ලොකුම හොරකම කියලා පෙන්වන්නට හදනවා. හැබැයි හොරකමක් වුණා නම් රුපියල් 10ත් හොරකමක්, රුපියල් ට්‍රිලියනයත් හොරකමක්. ඒක අපි එක්සත් ජාතික පක්ෂය විධියට පිළිගන්නවා. ඒ නිසා හොරකමක් වුණා නම් ඒ වැරදිකරුවන්ට දඬුවම් දෙන්නට ඕනෑ. හැබැයි මේක ලොකුම හොරකම යැයි කියන අය මීට වඩා ලොකු හොරකම් කරලා තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
( மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
හැබැයි මේක ලොකුම හොරකම යැයි කියන අය මීට වඩා හොරකම් කළ අය. ඉදිරියේ දී අපට කියන්නට තව කාරණා තිබෙනවා. ලොකුම හොරකම කියලා කියපු අයට හොරකම්වල සයිස් අපි කියලා දෙන්නම්. අපේ ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමාට සහ ගරු සුජීව සේනසිංහ රාජ්‍ය අමාත්‍යතුමාට මාගේ බිංගිරිය ආසනයට දැවැන්ත සංවර්ධන යෝජනා ක්‍රමයක් ගෙන ඒම සඳහා උදවු කිරීම සම්බන්ධයෙන් නැවත වතාවක් ස්තුති කරනවා. ගොඩක් වෙලාවට අපි ලබන මාසයේ මේ කර්මාන්ත පුරය ඉදි කිරීම සම්බන්ධ භූමියේ මූලික කටයුතු පටන් ගන්නවා. ඒ පිළිබඳව අපේ නිලධාරින්ගේ කාර්යක්ෂමතාව ගැනත් ස්තුතිය පළ කරමින් මගේ කථාව අවසන් කරනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

**[අ.භා. 2.11]**

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ අමාත්‍යාංශය ඇතුළු ඉතාම වැදගත් අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂයන් සම්බන්ධයෙන් විවාදයට ගන්නා මේ අවස්ථාවේ දී එයට එකතු වීමට ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම අපේ රටේ අධිකරණය දේශපාලනයෙන් ව්‍යුක්තව, දේශපාලනයෙන් ඈත්ව ස්වාධීනව පවත්වා ගැනීම පිළිබඳව ජනතා අභිලාෂයන් රාශියක් තිබුණා. 2015 ජනවාරි 08වෙනි දා මේ පිළිබඳ දීර්ඝ සාකච්ඡාවක් සිවිල් සමාජය තුළ ඇති වුණා. නමුත් අද ඒ සියල්ල විහිළුවක් බවට පත් කරමින් පාර්ලිමේන්තුව තුළ, අධිකරණ අමාත්‍යාංශය තුළ, නීතිපති දෙපාර්තමේන්තුව තුළ, විනිශ්චයකාරවරු සමඟ සාකච්ඡා කළ යුතු ප්‍රශ්න, දේශපාලන පක්ෂ කාර්යාලවල සාකච්ඡා කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 නොවැම්බර් 16වැනි දා "ලංකාදීප" පුවත් පතේ සඳහන් වෙනවා, "දූෂණ - වංචා දඬුවම් පමාවට එජාපයෙන් දැඩි කනස්සල්ල" කියලා. ඒ යටතේ සඳහන් වෙනවා, විමර්ශනවල ප්‍රගතිය සොයන්න කමිටුවක් පත් කරන්න තීරණය කළා කියලා. කොහේද? සිරිකොත පක්ෂ මූලස්ථානයේදී. එහිදී යෝජනා කිහිපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. එකක් තමයි, "සෑම දූෂණ විරෝධී මහාධිකරණයක් සඳහාම විනිශ්චයකාරවරුන් තිදෙනක් පත් කිරීම." මේක විශේෂඥ කමිටුවක්ද? කවුද මේකේ ඉන්නේ? අග්‍ර විනිශ්චයකාරතුමාද? විනිශ්චයකාරවරුන්ද? නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ද? ප්‍රතිපත්ති සම්පාදකයෝද? නැහැ. දේශපාලන පක්ෂයක පක්ෂ කාර්යාලයට නීතිපතිතුමාව ගෙනැල්ලා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් අවවාද, අනුශාසනා කරනවා නඩු කටයුතු ඉක්මන් කිරීම පිළිබඳව. මා හිතන්නේ නීතිපතිවරයා එහි නොයා යුතුයි කියලයි. ඔහු වාගේ තැනැත්තකු පක්ෂ කාර්යාලයක එවැනි සාකච්ඡාවකට නොයා යුතුයි. දැන් ඔවුන්ගේ අවවාද, අනුශාසනා අහන්නයි අධිකරණ ක්ෂේත්‍රයේ නිලධාරින්ට සිද්ධ වෙලා තිබෙන්නේ. පසු ගිය දවස්වල අපි දැක්කා-

**ගරු තලතා අතුකෝරල මහත්මිය (විදේශ රැකියා අමාත්‍යතුමිය සහ අධිකරණ අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - வெளிநாட்டுத் தொழில்வாய்ப்பு அமைச்சரும் நீதி அமைச்சரும்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Foreign Employment and Minister of Justice)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තලතා අතුකෝරල ඇමතිතුමිය.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා කියාපු කාරණය සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් කරන්න මට විනාඩියක් දෙන්න.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මට ඒ විනාඩිය දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට බොහොම කෙටි වෙලාවක් තිබෙන්නේ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
හොඳයි. මා ඔබතුමාට මගේ වෙලාවෙන් ඒ විනාඩිය දෙන්නම්. ඔබතුමා කළ ප්‍රකාශය මා සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. කවුරුන් හෝ අනවශ්‍ය ප්‍රසිද්ධියක් තකා, අසත්‍ය ප්‍රකාශයක් පුවත් පතට කර තිබෙනවායි කියා මා කියනවා.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මා සභාගත කරනවා, ලංකාදීප පුවත් පතේ-

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගිය මාසයේ 07 වැනිදා තමයි විශේෂ අධිකරණ 3 පිහිටුවන්න අවශ්‍ය කැබිනට් පත්‍රිකාව මා කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළේ. 09 වැනිදා අය වැයෙන් ගරු මංගල සමරවීර ඇමතිතුමා ඒ සඳහා රුපියල් මිලියන 25ක් වෙන් කර තිබෙනවා. අනික, ඔය කවුරු කොයි විධියට කිව්වත් කිසිම දවසක නීතිපති තනතුර හැල්ලු කරන්න අපි කටයුතු කර නැහැ. අපි එතුමාව මොනම හේතුවකටවත් පක්ෂ කාර්යාලයකට හෝ කිසිම තැනකට ගෙන්වා නැහැ. අඩුම තරමින් විෂයභාර ඇමතිවරිය හැටියට කිසිදු කාරණයකට මගේ නිවසට හෝ එතුමා ගෙන්වා නැහැ. අපි කොහේදිවත් එහෙම හමු වෙලා සාකච්ඡා කරලා නැහැයි කියන එක මා බොහොම පැහැදිලිව කියනවා. මෙවැනි ප්‍රකාශ කවුරුන් විසින්, මොන ප්‍රසිද්ධිය තකා පත්තරවලට කිව්වාද කියන්න මා දන්නේ නැහැ. කියාපු කෙනා ආණ්ඩු පක්ෂයේ වුණත්, විරුද්ධ පක්ෂයේ වුණත් සම්පූර්ණයෙන් මා ඒ කථාව හෙළා දකිනවා. ඒක අසත්‍ය ප්‍රකාශයක්.

**ගරු සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර කියන්න වෙලාවක් නැති නිසා 2017 නොවැම්බර් 16 වැනිදා "ලංකාදීප" පුවත් පතේ එම ප්‍රවෘත්තිය ඇතුළත් කොටසෙහි ඡායා පිටපතක් මා **සභාගත*** කරනවා, ගරු ඇමතිතුමියගේ දැන ගැනීම සඳහා. ඒ සාකච්ඡා කළ අය ගැන සියලු විස්තර මේකේ තිබෙනවා.

අපි දන්නවා, නඩු කටයුතු සම්බන්ධයෙනුත්, චූදියන් නිදහස් කිරීම සම්බන්ධයෙනුත් පසුගිය දවස් කිහිපය තුළ ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු මැති ඇමතිවරුනුත්, නිර්දය ලෙස අපේ විනිශ්වයකාරවරුනුත්, නීතිපති දෙපාර්තමේන්තුවත්, නීතිඥවරුනුත් බරපතළ ලෙස හැල්ලුවට ලක් කළා. මා දැන් ඒවාට උත්තර දෙන්න යන්නේ නැහැ. නමුත්, ඒ අවස්ථාවේ උත්තර දුන්නා. අපි දන්නවා, යම්කිසි නිවැරදිකරුවකු, නිර්දෝෂී තැනැත්තෙකු වැරදිකරුවකු බවට පත් වුණොත් ඒ පුද්ගලයාට බරපතළ අගතියක් සිද්ධ වෙන්නේ. ඒ හේතුවෙන් වැරදිකරුවන් නිදහස් වන අවස්ථා තිබෙනවා. නිවැරදිකරුවන් වැරදිකරුවකු බවට පත් වුණොත් ඇති වන තත්ත්වය මොකක්ද? එයින් සිදු වන අගතිය මොකක්ද? විනිශ්වයකාරවරු නිතරම පූර්ව නිගමනවල සිට කටයුතු කරන්නේ ඒ පදනම මතයි. තම තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් විනිශ්වයකාරවරුන්, අධිකරණය හැල්ලුවට ලක් කරන, අපහාසයට ලක් කරන යුගයක් බවට මේ යුගය පත් වෙලා තිබෙනවා. මා දන්නේ නැහැ, මේ අය ඒවාට අනුගත වෙලාද ඉන්නේ කියලා. ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ මේ වන විට මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩු දෙකක් විභාග වෙමින් පවතිනවා, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය -FCID- පිළිබඳව. දැනට අවුරුදු දෙකක් වෙනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් මූලික අයිතිවාසිකම් පිළිබඳ නඩුවක් ඉදිරිපත් කර තිබෙනවා. තීන්දුව තවම නැහැ. ඒ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ නීතිමය වලංගුභාවය පිළිබඳව පූජ්‍ය ඇල්ලේ ගුණවංශ නායක ස්වාමීන් වහන්සේත්, මහාචාර්ය කාලෝ ෆොන්සේකාත් අභියාචනාධිකරණයේ නඩු පවරා තිබෙනවා. ඒවාට උත්තර නැහැ. හැබැයි, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් අත්අඩංගුවට ගැනීම්, රඳවා තබා ගැනීම්, සිර භාරයට ගැනීම්, පළි ගැනීම් - ගැළපෙන වචනය ඒකයි- එලෙසින්ම ක්‍රියාත්මක කරගෙන යනවා. අපේ රටේ ඇප පිළිබඳ නීතිය ගැන අපි දන්නවා. අද ඇප නොදී සිරභාරයේ තබාගෙන සිටින්නේ දඬුවමක් වශයෙනුයි. ඒකයි තිබෙන කනගාටුව. දඬුවමක් වශයෙන් ඇප නොදී තියාගෙන ඉන්නවා. බුද්ධි අංශ නිලධාරින් වසරක් වැනි දීර්ඝ කාලයක් තිස්සේ සිරභාරයේ තබාගෙන ඉන්නවා. ඇතැම් නිලධාරින් වසර එකහමාරක් වැනි දීර්ඝ කාලයක් තිස්සේ සිරභාරයේ තබාගෙන සිටිනවා. දීර්ඝ කාලයක් තිස්සේ මේ කරුණ මේ ගරු සභාවේ අවධානයට ලක් කර තිබෙනවා. අදටත් සුමිත් රණසිංහ නමැති බුද්ධි අංශ නිලධාරියාව මාස අටක් තිස්සේ සිරභාරයේ තබාගෙන සිටිනවා. එතුමාගේ නැන්දණිය දිවි නසාගෙන තිබෙනවා. ඒ නිසා දඬුවමක් වශයෙන්, ඇප නොදී සිර භාරයේ රඳවා ගන්න අද උත්සාහ කරනවා. අධිකරණ ක්‍රියාවලියේදී ඒක බරපතළ ප්‍රශ්නයක් බවට පත් වනවා.

දැන් බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් සාකච්ඡාවට ලක් වුණා. බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් "කෝප්" කමිටු පළමු වාර්තාව නිකුත් කරන එක නවත්වන්න තමයි, වග උත්තරකරුවෝ හෙළි වන එක නවත්වන්න තමයි, අපේ පාර්ලිමේන්තුව 2015 වර්ෂයේ විසුරුවා හැරියේ කියනවා. ඒ කටයුතුවලට අවශ්‍ය නීතිමය මැදිහත් වීම කවරාකාරයෙන්ද සිද්ධ වෙන්නේ කියන එක පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මුදල් අවභාවිත කළා යැයි පවසමින් නඩු පවරනවා. කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබලා, අය වැය විවාදයේදී දේශපාලන මතයක් වශයෙන් රටේ පරිපාලනය හා ආදාළ ව්‍යවස්ථාදායකයේ ප්‍රධානින් විසින් ප්‍රතිපත්තිමය වශයෙන් කරුණු ඉදිරිපත් කරපු ඒවා, අද මුදල් අවභාවිත කළාය කියලා දඬුවම් වශයෙන් නඩු දමනවා. දැන් ප්‍රශ්නය වෙන්නේ හෙට අනිද්දා වන කොට, නැත්නම් තව අවුරුදු 15ක් ගිහිල්ලා හෝ මේ මුදල් අවභාවිත කළාය කියලා බොරුවට නඩු දමන නිලධාරින්ට, නීතිය අවභාවිත කළා කියලා නඩු පැවරුවොත් ඒ ගැන පුදුම වෙන්න දෙයක් නැහැ. කැබිනට් මණ්ඩලය ඒ තීන්දුව ගන්නවා. රජය ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දු ගන්නවා. ඒ ප්‍රතිපත්තිමය තීන්දුවට විරුද්ධව පළිගැනීම, වෛරය පදනම් කරගෙන යාන්ත්‍රණයක් විසින් මේ කටයුතු සිද්ධ කරනවා. අද මේ අමාත්‍යාංශයත් එක්ක සම්බන්ධයි විදේශ ආයෝජන සහ ප්‍රවර්ධනය. අපේ රටේ මේක සම්බන්ධ වෙලා ඇත්තේ, අධිකරණ අමාත්‍යාංශයත් එක්ක. අපේ රටේ විදේශ ආයෝජන නැති කරන්න අධිකරණ අමාත්‍යාංශයේ, නීතිපති දෙපාර්තමේන්තුවේ, පොලිස් දෙපාර්තමේන්තුවේ කට්ටිය සම්බන්ධයි. මේ රටේ ආයෝජනය කරපු දේශීය ව්‍යාපාරිකයෝ කීදෙනෙක් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට ගෙනැල්ලා ප්‍රශ්න කළාද? මේ රටේ ප්‍රධාන රාජ්‍ය නිලධාරින් ඇතුළු රාජ්‍ය නිලධාරින් 350කට වැඩි පිරිසක් මෙවැනි වධ බන්ධනයන්ට හා ප්‍රශ්න කිරීම්වලට ලක් වනවා. ඉතින්, ව්‍යාපාරිකයෝ එයිද, අයෝජනය කරයිද?

පරිපාලන නිලධාරින් නිශ්චිත තීන්දු ගනීවිද, ප්‍රතිපත්තිමය තීන්දුවක් ගනීවිද, කොන්ද පණ තියාගෙන වැඩ කරයිද? වැඩ කරන්නේ නැහැ; අත්වන ඉරණම ඒක නම්. අවංකව වැඩ කරපු ජනාධිපති ලේකම්වරයාගේ සිට රාජ්‍ය නිලධාරින්ට අත්වන ඉරණම මෙය නම්, මේ වාගේ රටක වැඩ කරනවාට වඩා හොඳයි තමුන්ගේ පාඩුවේ "ෂෝක්" එකේ ඉන්නවා කියා හිතන එක.

ආණ්ඩුව විදේශීය ආයෝජකයෝ මේ රටට ගෙන්වා ගන්න උත්සාහ කරනවා ලු. හැබැයි, මෙවර අය වැයෙන් සාප්පු හා කාර්යාල සේවක පනත හා කම්කරු අයිතිවාසිකම්, කම්කරු ප්‍රඥප්ති ඇතුළු මේ රටේ ජනතාව මෙතෙක් කලක් භුක්ති වින්ද

---

***  පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*  *Placed in the Library.*

[ගරු සිසිර ජයකොඩි මහතා]

අණපනත් ගණනාවක් අහෝසි කරන්න මේ ආණ්ඩුව යෝජනා කර තිබෙනවා. අපේ ප්‍රතිපත්ති සම්පාදකයෝ මේවා ගැන මීට වඩා ගැඹුරින් දකින්න ඕනෑ. ඔය සුන්දර කාරණාවලින් අපට විදේශ ආයෝජන ගෙන්වන්න පුළුවන්කමක් ඇත්තේ නැහැ. අද වැඩ කරන ජනතාව සතු අයිතිය කියන්නේ, මූලික අයිතිවාසිකමක්. එය මානව අයිතිවාසිකමක් තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා ඒවා බිඳ හෙළන්න, ඒවා බිඳ හෙළා නීති පනවන්න කිසිම කෙනෙකුට හැකියාවක් ඇත්තේ නැහැ. එම නිසා අපි විශ්වාස කරනවා, ඒවා තුළින් විදේශ ආයෝජකයෝ ගෙන්වා ගත නොහැකි බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා වැදගත් කාරණයක් මා කිව යුතුයි. මෑත කාලයේ අපේ රටේ මහේස්ත්‍රාත් අධිකරණවලට, මහාධිකරණවලට වැඩි වශයෙන්ම යොමු වන්නේ මත් කුඩු භාවිතය සම්බන්ධ වැරදි. තරුණ පිරිස වැඩි වශයෙන් මත් කුඩුවලට ගොදුරුව එය අපේ සමාජයේ මහා ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙනවා. අධිකරණය අද කරන්නේ, දඩ ගහන එක සහ දඩ ගෙවා ගන්න බැරි මනුස්සයාව හිරේ දාන එක. ඒක නිසා මත් ද්‍රව්‍ය ජාවාරම් කිරීමේ පදනම මත ඇප නොලබමින් දීර්ඝ කාලීනව පොලීසිය තරුණයින්ව බරපතළ ලෙස රඳවා තබා ගැනීම් කරනවා. අධිකරණ, උසාවිවල නඩු සහ හිර කුඩු අද පිරිලා තිබෙන්නේ මේ තරුණයන්ගෙන්. හැබැයි, අධිකරණ අමාත්‍යාංශ විධියට මේ තරුණයන්ව පුනරුත්ථාපනය කරන නිශ්චිත වැඩසටහනකට යොමු වී තිබෙන අවස්ථා අඩුයි. මේ අහිංසක තරුණයෝ. ඔවුන්ට ඕනෑ මේ වැරැද්දෙන් ගැලවෙන්න. එම නිසා රජයක් විධියට අපි මාර්ගෝපදේශකත්වය සලසන්න ඕනෑ. ඔවුන් පුනරුත්ථාපනය කරන වැඩ පිළිවෙළකට අපි රටක් වශයෙන් එකතු වෙමු, කියමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 18ක් තිබෙනවා.

**[අ.භා. 2.22]**

**ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)
මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ මලිත් ජයතිලක මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශයක් සම්බන්ධයෙන් මා ප්‍රථමයෙන් කියන්න කැමතියි. මිල්ලනිය සහ මිල්ලෑව ප්‍රදේශයේ කාර්මික වෙළෙඳ කලාප ඇති කිරීම සම්බන්ධයෙන් එතුමා අභූත චෝදනා වගයක් ඉදිරිපත් කළා. ආර්ථික කමිටුවට වාගේම කැබිනට්ටුවට එක් වරක් ඉදිරිපත් කරලා මේ වනකොට එහි සියලු කටයුතු නීත්‍යානුකූලව කරලා තිබෙනවා. මෙය, මේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් කරන්න තිබෙන විශාල පිම්මක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මීට අවුරුදු විස්සකට කලින් කරන්න තිබූ දේ අපි මේ වනකොට කරන්න තීන්දු කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ගෙදරට අවශ්‍ය විදුලි උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා වෙළෙඳ කලාපයක් ආරම්භ කරන්න ජපානය අක්කර 1,000ක් අපෙන් ඉල්ලලා තිබෙනවා. පළමුවැනි අදියර වශයෙන් අක්කර 400ක් -මිල්ලනිය ප්‍රදේශයෙන් අක්කර 250කුත්, මිල්ලෑව ප්‍රදේශයෙන් 150කුත් වශයෙන් - අපි හඳුනාගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ තෝරා ගත් ප්‍රදේශය කන්දක් කියලා එතුමා කිව්වා. ඒක අමූලික බොරුවක්. ඒ ප්‍රදේශය තැනිතලා ප්‍රදේශයක්. අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමාත් ඉන්නේ ඒ ආසනයේ. එතැන මා හිතන හැටියට පෞද්ගලික ආරාවුලක් තමයි තිබෙන්නේ. ඒ කාරණය සම්බන්ධයෙන් අපි එතුමාත් එක්ක වෙනම සාකච්ඡා කළ යුතුයි. පන්සලේ එක් රැස්වීමක්, ප්‍රාදේශීය ලේකම්තුමියගේ කාර්යාලයේ තවත් රැස්වීමක් පවත්වන්නේ නැතිව, ප්‍රදේශයේ සියලුම ජනතාව ගෙන්වලා කරුණු පැහැදිලි කරලා, ගෙවල් අහිමි වන පිරිසට ඉන්නවාට වඩා හොඳ ගෙදරක් ලබා දෙන බවටත් අපි පොරොන්දු වුණා. රබර් වත්තෙන් කපන හැම ගහකටම අපි ගස් 10ක් හිටවනවා කියාත් පොරොන්දු වනවා. එම ප්‍රදේශයේ අක්කර හතර, පහක විශේෂ කලාපයක් තිබෙනවා. එය පරීක්ෂණය සඳහා තිබෙන රබර් වගාවක්. ඒ විශේෂ කලාපය ඉතුරු කරලා, පරිසරය සුරක්ෂිත කරලා -මේ සියලු දේවල් කරලා- රැකියා දස දහසක් ඉදිරි අනාගතයේදී බිහි කරන්න අපි බලාපොරොත්තු වනවා.

අපි ඇඟලුම් කර්මාන්තය පටන් ගන්නකොටත් ඔහොමයි කිව්වේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි; අපි මහවැලිය පටන් ගන්නකොටත් ඔහොමයි කිව්වේ; කණ්ඩලම ගොඩ නහනකොටත් මෙහෙමයි කිව්වේ. අපි ambulance ගෙනෙනකොටත් කිව්වා, "මේ රට විනාශ වනවා. අපේ සියලුම ව්‍යාපාර නැති වනවා. Driversලා එන්නේ ඉන්දියාවෙන්." කියලා. අද ambulance එකක් ඕනෑ වුණාම ගමේ මිනිස්සු අපි ගෙන්වපු ambulance එකට තමයි කථා කරන්නේ. නොමිලේ ambulance සේවාව දුප්පත් ජනතාවටත් ලබා ගන්න අද අපි අවස්ථාව ලබා දීලා තිබෙනවා. මේ වාගේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් අපි කටයුතු කරලා තිබෙනවා. ලෝකයම ගෝලීයකරණය වන අවස්ථාවේ අපේ රටේ බඩු ඔක්කොම යන්නේ පිට රටට. ඇඟලුම් කර්මාන්තයේ, විදේශ රැකියාවල නිරත වීම තුළින් අපට ආදායම ලැබෙන්නේ පිට රටින්. මේවා වහගෙන, කුහකකමින් අපි දේශපාලනය කළොත් අපට කවදාවත් මේ රට ගොඩ ගන්න බැහැ.

පළමුවෙන්ම කර්මාන්ත සියයක්, ඊළඟට කර්මාන්ත දෙසීයක් ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වනවා. අපට අක්කර 800ක් විතර ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. පළමුවැනි අදියර වශයෙන් එන දෙසැම්බර් මාසයේ අපි මේ කටයුත්ත ආරම්භ කරන්න බලාපොරොත්තු වනවා. සාමාන්‍යයෙන් ඉඩම් ටික ගන්න, යටිතල පහසුකම් ටික ලබා දෙන්න, පාර හදන්න, විදුලිය දෙන්න, ජලය දෙන්න -මේ කටයුතු පටන් ගන්න -අවුරුදු පහක විතර කාලයක් ගත වනවා. හැබැයි, මගේ මැදිහත් වීම යටතේ වාගේම BOI නිලධාරින්ගේ මැදිහත් වීම යටතේ එන දෙසැම්බර් මාසය වනකොට මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න අපි බලාපොරොත්තු වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආදායමින් කොටසක් අපේ ආණ්ඩුවට ලැබෙනවා. රොජානා සමාගම තායිලන්තයේ ඉතාම සුප්‍රකට සමාගමක්. මේ වාගේ කාර්මික වෙළෙඳ කලාප 6ක් තිබෙනවා. ඒවායින් දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 10ක් ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. තායිලන්තය අපේ රටට ඒ අවස්ථාව ලබා දුන්නේ ලංකාව සම්බන්ධයෙන් තිබෙන පැහැදීම නිසා සහ ලංකාවේ තිබෙන දේශපාලන ස්ථාවර භාවය නිසයි. මොකද, තායිලන්තයේ දේශපාලන අස්ථාවර භාවයක් තිබෙනවා. එහි තිබෙන්නේ හමුදා පාලනයක්. ඉදිරි අනාගතය වෙනුවෙන් ලංකාවට හොඳ අවස්ථාවක් ලැබිලා තිබෙනවා.

විශේෂයෙන්ම මා Human Development Index එක ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, මූලාසනාරූඪ ගරු

මන්ත්‍රීතුමනි. Human Development Index එකේ දත්ත අනුව 2003දී අපේ රට හිටියේ 99 වැනි ස්ථානයේයි. 2006දී 93 වන ස්ථානයේ හිටපු අපේ රට 2016දී 73 වන ස්ථානයට පත්වෙලා තිබෙනවා. 2012 වර්ෂයේ අපි හිටියේ 92 වැනි ස්ථානයේයි. ඔබතුමන්ලා සහ අපි මේ කරපු විපර්යාසය තුළින් -යහ පාලන ආණ්ඩුවෙන්- 2016 වනකොට අපි 73 වැනි ස්ථානයට මේ රට ගෙනැල්ලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජාත්‍යන්තර මිනුම් දඬු අනුව ගත්තොත් S & P Ratingsවල negativeවෙලා තිබුණු ප්‍රමාණය මේ වනකොට stableවෙලා තිබෙනවා. විශාල ණය කන්දරාවක්; ට්‍රිලියන 10ක් -බිලියන 10,000ක්. 2005දී ණය බර බිලියන 2,000යි. බිලියන 10,000ක ණය කන්දරාවක් එක්ක තමයි අපට මේ රට බාර දුන්නේ. මේවා පියවන්න නම් මේ රටේ නිෂ්පාදන පටන් ගන්න ඕනෑ. නිකම්ම මේ කටයුතු වෙන්නේ නැහැ. 2005දී අපනයනය දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් වශයෙන් ගත්තොත් සියයට 37ක්.

නැවත 2015දී අපට මේ රට බාර දෙනකොට ඒක සියයට 14ට බැහැලා. අපේ රටේ අපනයනයක් නැත්නම්, අපේ රටේ භාණ්ඩ නිෂ්පාදනය වෙන්නේ නැත්නම්, භාණ්ඩ නිර්මාණය වෙන්නේ නැත්නම් අපට ආදායම් එන්නේ කොහෙන්ද? අපට තෙල් නැහැ, අපට රත්රන් නැහැ, අපට පොළොව යට වෙනත් නිධි නැහැ. නමුත්, අපට මානව සම්පත තිබෙනවා. අපට අපේ රටේ පිහිටීම තිබෙනවා. මේ පිහිටීම අනුව ඇමතිතුමා සඳහන් කළ ආකාරයට ගිවිසුම් පහක් අත්සන් කරනවා. අපට බිලියන හතරහමාරකට බදු රහිතව ලංකාව අවට වෙළෙඳ පොළක් ලැබෙනවා. ඉන්දියාව, චීනය, මැලේසියාව, තායිලන්තය, සිංගප්පූරුව මේ ආදී වශයෙන් විශාල සංවර්ධනයක් කරා,- මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, GSP සහනය ලැබිලා පළමුවැනි මාස හය තුළ ඇඟලුම් කර්මාන්තයෙන් පමණක් සියයට පහළොවක වර්ධනයක් තිබෙන බව මම කියන්න සන්තෝෂයි. එහෙම නම්, ඔබතුමන්ට හිතා ගන්න පුළුවන් කෙතරම් වර්ධනයක් ඉදිරි අනාගතයේදී ලැබෙයිද කියලා. ඒක අපි අනිවාර්යයෙන්ම අත් කර ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා FDI සම්බන්ධයෙන් සඳහන් කළා. ඔබතුමාට මම මේ ලේඛනය ඉදිරිපත් කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මෙහි තොරතුරු ඉදිරිපත් කරන්න වෙලාව නැති නිසා මම මේ ලේඛනය **සභාගත*** කරනවා.

මේ ලේඛනයට අනුව ඉන්දියාවෙන් ඇමෙරිකන් ඩොලර් බිලියන එකහමාරක ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා. එතුමා සඳහන් කළා, අවුරුදු ගණනක් තිස්සේ කිසිම දෙයක් ලැබිලා නැහැ කියලා. ඒ වාගේම, තවත් බිලියන ගණනක ප්‍රමාණයක් අපේ රටට ලැබිලා තිබෙනවා. අපට බිලියන 11ක අපනයන ආදායමක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2020 වර්ෂය වෙනකොට බිලියන 20 දක්වා අපේ ආදායම නංවාගන්න අපි බලාපොරොත්තු වෙනවා. මේක අපට කරන්න පුළුවන්. එතුමා කියපු විධියට අවුරුදු 20ක් අපි ආණ්ඩු කළේ නැහැ. එහෙම ආණ්ඩු කරන්න අපට අවස්ථාව ලැබුණේ නැහැ. අපට ලැබුණ අවස්ථාවේදී අපි අත්තිවාරම හරියට දාලා තිබෙනවා. මේ වෙනකොට අපි බලාපොරොත්තු වෙනවා, කාර්මික වෙළෙඳ කලාප රට පුරාම ආරම්භ කරන්න. ඒ සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ අක්කර 3,000ක්, 4,000ක් වාගේ ප්‍රමාණයකුත්; මොණරාගල දිස්ත්‍රික්කයේ අක්කර 7,000කුත්; ගාල්ල දිස්ත්‍රික්කයේ අක්කර 2,000කුත්; මාතර දිස්ත්‍රික්කයේ අක්කර 2,000කුත්; කළුතර දිස්ත්‍රික්කයේ අක්කර 2,000කුත්; මහනුවර දිස්ත්‍රික්කයේ තවත් අක්කර 2,000ක්, 3,000කුත්; නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ කුරුණෑගල දිස්ත්‍රික්කයට තවත් අක්කර 2,000ක්, 3,000කුත් වෙන්කොට තිබෙනවා.

---

***** *ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*

*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*

*Document not tendered.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් අවුරුදු හතරක්-පහක් යනකොට විශාල සංවර්ධනයක් කරා අපට එළඹෙන්න පුළුවන් අවස්ථාව ලැබෙනවා. ඒ වාගේම, 2020 වර්ෂය වෙද්දී LNG terminals දෙකක්, ගෑස් පිරිපහදු දෙකක්, සීනි පිරිපහදුවක්, තෙල් පිරිපහදුවක්, සිමෙන්ති කර්මාන්තශාලා දෙකක් මේ ආදී වශයෙන් ඩොලර් බිලියන තුනහමාරක-හතරක වාගේ විශාල මුදල් ප්‍රමාණයක් අපට ළඟා කරගන්න පුළුවන්. ඒ හින්දා හෙමින් අපි ගමන ආරම්භ කරන්නේ. මොකද, වැටෙන රටක් අපි අල්ලා ගත්තේ. ට්‍රිලියන දහයක ණයක් තිබෙන රටක් අපි බාර ගත්තේ. ඒ ණය එන්න එන්න වැඩි වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ අවුරුද්දේ අපේ ණය පොලී වාරිකය විතරක් බිලියන 2,000යි. හම්බන්තොට වරායෙන් අපට ආදායමක් නැහැ. මත්තල ගුවන් තොටුපොළෙන් ආදායමක් නැහැ. එයාර් ලංකා එකේ පාඩුව බිලියන 450යි. සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයෙන් තවම කිසිම ආදායමක් නැහැ. නෙළුම් පොකුණෙන් ආදායමක් නැහැ, නෙළුම් පහනෙන් ආදායමක් නැහැ. කිසිම එකකින් ආදායමක් නැහැ. නමුත්, ඒවා වෙනුවෙන් විශාල මුදල් කන්දරාවක් යට කරලා තිබෙනවා. මහවැලි යෝජනා ක්‍රමය, ඇඟලුම් කර්මාන්තය වැනි ව්‍යාපෘති නොවෙයි පසුගිය ආණ්ඩුව කරලා තිබෙන්නේ. කොමිස් මුදලට යටවෙලා විශාල ගොඩනැඟිලි, විශාල කොන්ක්‍රීට් කඳු ගැහුවා මිසක් රටේ ආර්ථිකය ගැන ඔවුන් හිතුවේ නැහැ. ඒ සම්බන්ධයෙන් විශාල කාර්ය භාරයක් අපේ අමාත්‍යාංශය කරගෙන යනවා. අපි කරපු කාර්ය භාරය නිසා අපේ ආණ්ඩුවට ලැබුණු ඒ ගරුත්වය නිසා අපිව හැඳින්වූයේ "Champions of Democracy" කියලායි. ඒ ගැන අපි කියන්න සතුටුයි. ඒ නිසා තමයි යහ පාලනය වෙනුවෙන් අද අගමැතිතුමා ජනාධිපති කොමිසමට ගිහිල්ලා සාක්ෂි දීලා ආවේ. එම කොමිසමට යන්න එතුමාට වුවමනාවක් තිබුණේ නැහැ. හැබැයි, එතුමාගේ කැමැත්තෙන් ගිහිල්ලා සාක්ෂි දුන්නා. අපේ යහ පාලන රජය ආණ්ඩුවේ ආයතනවලින් දේශපාලනය අයින් කළා. අපි ස්වාධීන කොමිෂන් සභා 9ක් ඇති කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ඇති කරලා මේ කාර්ය භාරය අපි පළමුවැනි අවුරුද්දේ කළා. දේශපාලනික වශයෙන් විශාල විපර්යාසයක් අපි මේ රටේ ඇති කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකේ ප්‍රතිඵලය විධියට තමයි ඔබතුමන්ගේ ප්‍රදේශයටත් විශාල සංවර්ධන ව්‍යාපෘති අරගෙන එන්න අවස්ථාව ලැබිලා තිබෙන්නේ. දේශපාලනික වශයෙන් ඇති වූ විපර්යාසයේ ප්‍රතිඵලයක් ලෙස තමයි හාර්වඩ් විශ්වවිද්‍යාලයෙන් ලක්ෂ දෙදහසක් තැගි වශයෙන් ලැබුණේ, අපේ රටේ ආර්ථික ප්‍රතිපත්ති හදන්න. අපේ ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් සාක්ෂි දරනවා. අපි ඒ මුදල් පාවිච්චි කරලා, ලංකාවේ මහාචාර්යවරුත්, අනෙකුත් අපේ නිලධාරින් සියලු දෙනාමත් එකතුවෙලා මේ වෙනකොට අපි රටේ ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් ඇති කළා. ඒක පක්ෂවලට වෙනස් කරන්න බැහැ, ආණ්ඩුවට වෙනස් කරන්න බැහැ. අපි ඒ කාර්ය භාරය ඉතා සුළු කාලයක් තුළ කළා. ඒ විතරක් නොවෙයි, අපේ අපනයන ප්‍රතිපත්තිය නිසා දෙසැම්බර් මාසය වෙනකොට, නැත්නම් ජනවාරි මාසය වෙනකොට ලෝක වෙළෙඳ හවුලෙන් ලක්ෂ දෙදාහක මුදලක් තැගි විධියට ලැබෙනවා.

පසුගිය කාලයේ මේවා මෙහෙම නොවෙයි සිදු වුණේ. අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ඇමතිතුමාගෙයි, මගෙයි වැය ශීර්ෂය අරගෙන බලන්න. ඒ මුදල්වලින් භාගයක් අපි වියදම් කරලා නැහැ. අපි අපේ කාර්යාලවලට බඩු අරගෙන නැහැ. අපි ආණ්ඩුවේ මුදල් වියදම් කරලා රට යන්නේ නැහැ. ඉතා සීමිත අවස්ථා ගණනක් පමණයි අපි රට ගිහිල්ලා තිබෙන්නේ. රට යන්න කියලා අපට කිව්වාම අපි අහන්නේ, "ආණ්ඩුවෙන් ගෙවන්න ඕනෑද, අමාත්‍යාංශයෙන් ගෙවන්න ඕනෑද?" කියලයි. අමාත්‍යාංශයෙන් ගෙවන්න ඕනෑ කිව්වොත් අපි කියනවා, "එහෙම නම් ඒක අයින් කරන්න." කියලා. පිට රටින් ගෙවනවා නම් අපි ඒකට ඉදිරිපත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ ආකාරයෙන්

[ගරු සුජීව සේනසිංහ මහතා]

තමයි කටයුතු කරන්නේ. ඒ වාගේම ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කලින් හිටපු ඇමතිවරුන්ට චෝදනා කළා. පුළුවන් නම්, අපට එක චෝදනාවක් කරන්න කියන්න. අපේ අමාත්‍යාංශය යටතේ මට කථා කරන්න පුළුවන් මම ගැනයි, අපේ ඇමතිතුමා ගැනයි විතරයි. මම ගැන මම කියන්නම්. පුළුවන් නම් එක ආයෝජකයෙක් කියන්න, අපි සල්ලි හෝ මොනවා හෝ ඉල්ලා තිබෙනවා කියලා.

අපි අහන්නේ මෙච්චරයි. ලංකාවට ලැබෙන ආදායම කොච්චරද, රැකියා ප්‍රමාණය කොච්චරද, දියුණු තාක්ෂණය ගෙනෙන්න පුළුවන්ද කියන මෙන්න මේ කාරණා විතරයි අපි ආයෝජකයන්ගෙන් අහන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, අපි දේශපාලනයට ආවේ මේ රටේ ඉදිරි ගමන සම්බන්ධයෙන් යමක් කරන්න; අපට කර ගන්න නොවෙයි. අපට ඒවා තිබෙනවා. අපේ දෙමව්පියන් අපට ඒවා ලබලා දීලා තිබෙනවා. ඒ නිසා ඕනෑම තැනක අභියෝගයක් ඉදිරිපත් කරනවා. අපට ගහන ඕනෑම මඩක් අපි කාලා, අර වතුර යට තිබෙන බැලුම් බෝලයක් වාගේ උඩට එනවා. ඒ නිසා අපි කිසිම දෙයක් මිල මුදල් සඳහා කරන්නේ නැහැ. හැබැයි, පක්ෂය වෙනුවෙන් -එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන්- බැඳුම්කර නොවෙයි ඕනෑම දෙයකට අපි මුහුණ දෙනවා; ඒ හයිය අපට තිබෙනවා. පක්ෂය වෙනුවෙනුයි අපි එහෙම කරන්නේ. ඒ කාරණයේදී අර්ජුන් මහේන්ද්‍රන් හෝ ඇලෝසියස් සම්බන්ධයෙන් මම අනුමත කරන්නේ නැහැ. මම හිටියා නම් පත් කරන්න එපා කියනවා. පත් කරන අවස්ථාවේත් මම කිව්වා, a conflict of interest එකක් මෙතැන තිබෙනවාය කියලා. හැබැයි, පත් කළාට පස්සේ ඇති වන ඕනෑම ප්‍රතිවිපාකයක් සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂය වැනි කොන්ද කෙළින් තියා ගෙන මේ රටේ විශාල කාර්ය භාරයක් කරපු පක්ෂයක් වෙනුවෙන් පෙනී සිටින්න මම සූදානම්. ඒ නිසා අපට මඩ ගහයි. මේ කාරණයේදී සමහර වෙලාවට වෙනත් angle එකක් තිබෙන්නේ. පෞද්ගලික ආයතන, නාලිකා, සමහරවිට බිස්නස්වලට මේ කාර්ය භාරය කරන්නේ; දේශපාලන වශයෙන් අප විනාශ කරන්නයි මේ කාර්ය භාරය කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි අනාගතය වෙනුවෙන්, සංවර්ධනය වෙනුවෙන් 2020 වෙන කොට අඩුම ගණනේ සියයට 6 ඉක්මවන ආර්ථික වර්ධන වේගයක් විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශය හරහා අත්කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මේක කුඩා රටක්. අපට මේ කාර්යය කරන්න පුළුවන්. මැලේසියාව, තායිලන්තය වැනි රටවල් මට්ටමට තව අවුරුදු හතක්, අටක් යන කොට අපට යන්න පුළුවන්. ඒ වෙනුවෙන් අපි පළමුවෙනි අවුරුදු තුනයි ඉල්ලන්නේ. මේ අවුරුදු තුන සම්පූර්ණ වෙන කොට විශාල සංවර්ධනයක් මේ රටේ ජනතාවට අපි පෙන්වනවා.

වොක්ස්වැගන් ආයතනය ගැන අපට කියනවා. වොක්ස්වැගන් ආයතනයට ලෝකයේ විශාල අකරතැබ්බයක් සිදු වුණා. ඒ නිසා ඒ ආයතනය ඇති කිරීමේ අවස්ථාව අපෙන් ගිලිහුනා. ඒ නිසා ජනතාව අප දෙස බලා ගෙන ඉන්නවා. අපේ කාර්මික වෙළෙඳ කලාපය අපි කළුතරින් පටන් ගන්නවා. ලබන දෙසැම්බර් මාසය වන විට අපි කෙසේ හෝ එය විවෘත කරනවා. ඒක අමාරු කාර්ය භාරයක්. නමුත්, අපි ඒක කරනවා; ඒක අපේ පළමුවැනි වෙඩි මුරය බවට පත් කරනවා. ඊට පස්සේ මොණරාගලට -ඔබතුමාගේ දිස්ත්‍රික්කය- හම්බන්තොටට, නලින් බණ්ඩාර ජයමහ මැතිතුමාගේ ප්‍රදේශය වන කුරුණෑගලට මේවා ගෙනෙන්න අපට කාලය අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ගහෙන් ගෙඩි එනවා වාගේ මේ රටේ එකපාරට මේ දේවල් වෙනස් කරන්න බැහැ. මැලේසියාව, ජපානය, තායිලන්තය මේ රටවල් එක දවසෙන් වෙනස් වුණේ නැහැ. ඒ කාලයේ අපේ නායකවරු පටන් ගත්තා. ප්‍රේමදාස මහත්මයා, ගාමිණී දිසානායක මහත්මයා, ලලිත් ඇතුලත්මුදලි මහත්මයා හිටියා නම්, අද මේ රට මැලේසියාවක්. උපාලි විජේවර්ධන මහත්මයා Fiat car එක, Mazda car එක, UNIC radio එක පටන් ගත්තේ ඒ කාලයේ. එතකොට මැලේසියාව ඒ ගැන හිතලාවත් නැහැ; තායිලන්තය හිතලාවත් නැහැ. අවුරුදු විස්සක් අපිට ආණ්ඩු කරන්න ප්‍රභාකරන් කියන ඒ නරුමයා ඉඩ දුන්නේ නැහැ. අපේ නායකයන් නවදෙනෙක් මැරුවා. 1994 ඉඳලා හැම ඡන්දයක්ම තීන්දු කළේ ඒ පුද්ගලයා. ඒ නිසා අපට සහ රටට අවස්ථාව ගිලිහුණා; අපේ පක්ෂයට ඒ අවස්ථාව ගිලිහුණා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ කාර්ය භාරය අපි හරියට ඉටු කරනවා.

විශේෂයෙන්ම අපේ අධිකරණ අමාත්‍යාංශය සම්බන්ධයෙන් වචනයක් කියන්නට ඕනෑ. මට කථා කරන්නට තව කොපමණ කාලයක් තිබෙනවාද දන්නේ නැහැ. එහෙත්, අධිකරණ අමාත්‍යාංශය සම්බන්ධයෙන් කථා කළ නිසා මේ කාරණා ටික කියන්නට ඕනෑ. මට මේ අවස්ථාව ලැබුණේ නීතිඥ වෘත්තිය නිසායි. මම කොළඹට ඇවිල්ලා නීතිඥ වෘත්තියට පිවිසුණා. එහිදී මට විශාල සහයෝගයක් අපේ ජනාධිපති නීතිඥවරුන්ගෙන් වාගේම මගේ සගයන්ගෙනුත් ලැබුණා. ඒ වාගේම මේ වෘත්තියෙන් මට විශාල ගැම්මක් වාගේම හොඳ පරිණතභාවයක් ලැබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මගේ මේ වෘත්තියට මම ගරු කරනවා. එම වෘත්තියේම ඉන්න අපේ ඇමතිතුමිය, ඒ වාගේම නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලය, නඩුකාරවරු, නීතිපති දෙපාර්තමේන්තුව ගැනත් කියන්නට ඕනෑ. අපට අඩු පාඩු හොයන්න පුළුවන්. ඒ වුණත්, සාපේක්ෂ වශයෙන් ගත්තොත් අපේ අධිකරණය සහ නීතිපති දෙපාර්තමේන්තුව ඉතා අනර්ඝ සේවයක් කරනවා. ආසියාවේ අනෙකුත් රටවල් එක්ක ගත්තොත් මේ ක්ෂේත්‍රය අංගසම්පූර්ණ නැහැ කියලා මමත් පිළිගන්නවා. මේ ක්ෂේත්‍රය අංගසම්පූර්ණ කරන්න පුළුවන්. ඒ සමඟ නීතිපති දෙපාර්තමේන්තුවට, නඩුකාරවරුන්ට අනිවාර්යයෙන්ම පඩි වැඩි කරලා හොඳ සේවාවක් ඒ අයගෙන් ලබා ගන්න අපි ඒ අයට යම් කිසි ආකාරයකට අගයක් දෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම දන්නවා, අපේ රට දියුණු වෙමින් පවතින රටක් කියලා. මේ වෙනුවෙන් විශාල වශයෙන් මුදල් වෙන් කිරීම් කරන්න අපහසු ඇති. නමුත්, අපිට හොඳ සේවාවක් ලබා ගන්න නම් මේ ආයතන දෙකට, විශේෂයෙන්ම නීතිපති දෙපාර්තමේන්තුවටත්, ඒ වාගේම විනිසුරුවරුන්ටත්, ඒ වාගේම ඊට අදාළ අනෙකුත් නිලධාරින්ට අපි අනිවාර්යයෙන්ම හොඳ වැටුපක් ගෙවිය යුතුයි.

සමහරවිට දේශපාලන වශයෙන් අපටත් පහර වදිනවා ඇති. අපේ නම් ප්‍රසිද්ධ කරලා තිබෙනවා මම දැක්කා. නමුත් අප කොමිසමට කැඳවලාත් නැහැ. කෝප් කමිටුවේ ඉඳගත්තාට පස්සේ "බැඳුම්කරය" කියන එක අපට German වාගේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ප්‍රසන්න ජයවර්ධන මහත්මයා කියනවා, මේ ගැන තේරුම් ගන්න එතුමාට මාස පහක් ගියා කියලා. එතුමා මගේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයා. එතුමා අවුරුදු විස්සක් විතර ජ්‍යෙෂ්ඨ කළමණාකාරවරයෙක් වශයෙන් HSBC බැංකුවේයි සේවය කළේ. එතුමා නීතිඥ වෘත්තියේත් අවුරුදු ගණනක් හිටියා. එතුමා කියනවා, එතුමාටත් මේක තේරුම් ගන්න මාස පහක් ගියා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සඳහා අපට තිබුණේ සුළු කාලයක් නිසා, අප දන්නා කෙනෙකුට කථා කරලා මේ ගැන අවබෝධය ලබා ගන්න අපට සිදු වුණා. එහෙම නැතුව, අපට මේ තුට්ටු දෙකේ 'ඩීල්' දාන්න කාටවත් කථා කරන්න අවශ්‍ය නැහැ. අපට හම්බ කරන්න අවශ්‍ය නම්, බැඳුම්කර මඟුලක් අවශ්‍යද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කළා නම්, අපි කථා කළේ ඒ සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්න; තොරතුරු ලබා ගන්න. අපට ඒ තොරතුරු තිබුණේ නැහැ. අර්ජුන මහේන්ද්‍රන්ද, ඇලෝසියස්ද කියන එක නොවෙයි, අපට වැදගත් වුණේ. කොමිසම පත් කරනවා කියලා ඒ තීන්දුව දුන්නාට පස්සේ

එක දවසක් අපි මේ සම්බන්ධයෙන් දුරකථන ඇමතුමක් කාටවත් දීලාත් නැහැ; අපට එහෙම දෙන්න අවශ්‍යතාවකුත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මහජන නියෝජිතයෝ. අපට යම් කිසි හැඳුනුම්කමක් තිබෙනවා නම්, අපට කථා කරන්න අයිතිය තිබෙනවා.

මම දැක්කා, හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කෝප් කමිටුවේ සභාපතිවරයා වශයෙන් ඒ සම්බන්ධයෙන් අවබෝධයක් නැතුව කථා කරනවා. එතුමා අර්ජුන ඇලෝසියස් චූදිතයෙක් කියලා කිව්වා. බැඳුම්කර කොමිසම කියනවා, අර්ජුන ඇලෝසියස් චූදිතයෙක් නොවෙයි කියලා. එතුමාට සාක්ෂි දෙන්න බල කරන්න බැහැ කියලා විරෝධතා ඉදිරිපත් කරපුවාම, දප්පුල මහත්තයා කියනවා, "එතුමා චූදිතයෙක් නොවෙයි, ඒක නිසා සාක්ෂි ගන්න පුළුවන්" කියලා. එතුමා එතැන චූදිතයෙක් නොවෙයි. කෝප් කමිටුවට අපට පෞද්ගලිකව පුරවැසියන් ගෙනැල්ලා ප්‍රශ්න කිරීමේ අයිතියක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට අයිතිය තිබෙන්නේ රාජ්‍ය නිලධාරින් සම්බන්ධයෙන් ප්‍රශ්න කරන්නයි. එ හින්දා කාවවත් චූදිතයෝ කරන්න කෝප් කමිටුවට අයිතිවාසිකමකුත් නැහැ. අපට එහෙම බලතල බැහැ. කෝප් කමිටුවට එහෙම mandate එකක් නැහැ. ඒක හින්දා අඩුම ගණනේ අපි කෝප් කමිටුවට තිබෙන නීත්‍යානුකූලභාවය මොකක්ද කියලා දැන ගන්න ඕනෑ. රාජ්‍ය නිලධාරින් කැඳවන්න පුළුවන්. රාජ්‍ය නිලධාරින්ගෙන් ප්‍රශ්න කරන්න පුළුවන්. අපට යම් කිසි ආකාරය මතයක් - declaration එකක්- දෙන්න පුළුවන්. Fact- finding process එකක්, කෝප් කමිටුවේ සිදු වන්නේ. එහි අපට නඩු අහන්න බැහැ. අපට එහෙම නඩු අහන්න සම්පත් නැහැ, අපට එහෙම වපසරියක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කාරණය ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මම දන්නේ නැහැ, මොකට අපේ නම් ප්‍රසිද්ධ කරලා, අපට මඩ ගහන්න හැදුවාද කියලා. ඒකෙන් මොකක් හරි විනෝදයක් ලැබුවාද කියලා මම දන්නේ නැහැ. එහෙම නම්, අපි කොමිසමට අඬගහන්න ඕනෑ. අපෙන් අහන්න ඕනෑ, මොනවාද කථා කළේ, මොනවාද කළේ කියලා. එහෙම කථා කරන්න තිබෙන අයිතිවාසිකම් මොනවාද, නීත්‍යානුකූලව අපට එහෙම බාධාවක් තිබෙනවාද, නැද්ද කියලා අහන්න තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධව කිසිවක් නොකර කොමිසමේ කටයුතු අවසන් කරලා අපට මඩ පහරක් ගහගෙන යනවා. අපි නීතිපති දෙපර්තමේන්තුවෙන් ඉල්ලා සිටිනවා, "වැඩක් තිබෙන දෙයක් කරන්න. කාටවත් මඩ ගහන්න දේශපාලන ගුණ්ඩුවලට අහුවෙන්න එපා." කියලා. ඕවා ඔක්කෝම දේශපාලන ගුණ්ඩු. මේක එනකොටම මාසයකට කලින් මම කිව්වා, මේ වාගේ damage එකක් කරන්න තමයි මේ මැතිවරණයක් ළඟදී එන්නේ කියලා. මම මේ කාරණය ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ හොඳ මහත්වරු ඉන්නේ. නඩුකාරතුමන්ලා හොඳ මහත්වරු ඉන්නේ. දේශපාලන ගුණ්ඩුවලට අහුවෙන්න එපා කියලා අපි ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ඇමතිතුමාටත්, අපේ ලේකම්තුමියටත්, BOI එකේ සියලුම නිලධාරින්ටත්, EDB එකේ සියලුම නිලධාරින්ටත්, අපේ අමාත්‍යාංශයේ නිලධාරින්ටත් මා ස්තුතිවන්ත වෙනවා. අපට පෙනුණේ නැති වුණත් විශාල කාර්යභාරයක් අපේ අමාත්‍යාංශයෙන් කෙරෙනවා. එහි ප්‍රතිඵල අපට බලන්න පුළුවන්, 2020දී. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

ඊට ප්‍රථම ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා මූලාසනය සඳහා පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. J.M. ANANDA KUMARASIRI *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

**[අ.භා. 2.40]**

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුක්තිය පසිඳලීමේ ඉතාම වැදගත් මූලධර්මයක් තමයි, "යුක්තිය ඉටු කිරීම පමණක් ප්‍රමාණවත් නැහැ. යුක්තිය ඉටු වුණු බව පෙනෙන්නට තිබිය යුතුයි." කියන එක. මේ නිසා අධිකරණයේ විනිසුරුවරුන් පත් කිරීම, නීතිපතිවරයා පත් කිරීම, නීතිපතිවරයාගේ සහ ඒ විනිශ්චයකාරවරුන්ගේ හැසිරීම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට බලපානවා. අධිකරණ පද්ධතිය පිළිබඳ මහජන විශ්වාසය සුරැකීමේදී බලපානවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හිතමු, පාපතරයෙක් දියණියක් දූෂණය කරනවා කියලා. තාත්තා මොකද කරන්නේ? ගිහිල්ලා පොලීසියට පැමිණිලි කරලා යුක්තිය ඉටුවේවි කියලා බලාපොරොත්තු වෙනවා. හැබැයි, අධිකරණ ක්‍රියාවලිය පිළිබඳව විශ්වාසයක් නැතිනම් ඒ තාත්තා පිහියක් අරගෙන ගිහිල්ලා අර දූෂකයාට මැරිලා වැටෙන තුරු ඇනගෙන, ඇනගෙන, ඇනගෙන යනවා. තමන්ට ඒ වැඩේ කරගන්න බැරි නම්, මැරයෙකුට ඒ වැඩේ භාර දෙනවා. ඒක නිසා අධිකරණ පද්ධතිය පිළිබඳ විශ්වාසය බිඳ වැටුණාම තමයි, මහජනතාව නීතිය අතට අරගෙන, රට අරාජික වන්නේ.

අපට මිනීමරුම් පිළිබඳව වැඩි වැඩියෙන් තොරතුරු ලැබෙනවා නම්, වෙඩි තැබීම් පිළිබඳව වැඩි වැඩියෙන් තොරතුරු ලැබෙනවා නම්, කලකෝලාහලවලට ජනතාව පෙලඹෙනවා නම්, නීතිය අතට ගන්න ජනතාව පෙලඹෙනවා නම් අපට ලැබෙන පණිවුඩය තමයි, නීතිය පිළිබඳව, අධිකරණ ක්‍රියාවලිය පිළිබඳව ජනතාවගේ විශ්වාසය තුරන් වෙමින් පවතිනවා කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිපති තනතුර සුවිශේෂී වැදගත් තනතුරක්. මේ රටේ අධිකරණ බලයත්, විධායක බලයත් කියන දෙකම පාවිච්චි කළ හැකි එකම තනතුර නීතිපති තනතුරයි. අධිකරණ ක්ෂේත්‍රයේ, නීති ක්ෂේත්‍රයේ නීතිපති තනතුර දෙවැනි වන්නේ අගවිනිසුරු තනතුරට පමණයි. එවැනි තනතුරකට පත් කරද්දී, අපට තිබෙන ක්‍රමවේදය මොකක්ද? ව්‍යවස්ථා සභාව පත් කරලා මේ වෙනකොට වසර තුනකට ආසන්න වෙනවා. නීතිපතිවරයා පත් කිරීම පිළිබඳව, විනිසුරුවරුන් පත් කිරීම පිළිබඳව නිශ්චිත ක්‍රමවේදයක් නැහැ; නිර්ණායක නැහැ. නිර්ණායක හැදුවා නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41උ. අනු ව්‍යවස්ථාව යටතේ ගැසට් මඟින් ප්‍රසිද්ධ කරලා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. ගැසට් මඟින් ප්‍රසිද්ධ කරලාත් නැහැ; පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලාත් නැහැ. වත්මන් නීතිපතිතුමා පත් වුණේ කොහොමද? නිර්ණායක නැතුව පත් වුණේ. නිර්ණායක නැතිනම්, ජ්‍යෙෂ්ඨතම නිලධාරියාට එම අවස්ථාව ලබා දිය යුතුයි. ජ්‍යෙෂ්ඨතම නිලධාරියාගේ පැවැත්මේ හෝ, චෝදනාවලට ලක් වීමේ හෝ කාර්යක්ෂමභාවය පිළිබඳව

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

හෝ මොකක් හරි අඩුපාඩුවක්, ප්‍රශ්නයක් තිබෙනවා නම්, අන්න එම කාරණය උඩ ජ්‍යෙෂ්ඨතම නිලධාරියාට එම තනතුර ලබා නොදීමට හේතු දක්වලා, ඊළඟ නිලධාරියාට ලබා දිය යුතුයි. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී නීතිපතිවරයා පත් වෙන්නේ එහෙම නොවෙයි. ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වන සුහද ගම්ලත් මහතාට එම තනතුර ලැබෙන්නේ නැහැ. එම තනතුරට ජයන්ත ජයසූරිය මහතා පත් වෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් හැමෝම ආසයි, නීතිපති තනතුරට පත් වෙලා විශ්‍රාම යන්න. ඕනෑම ආයතනයක ආයතන ප්‍රධානියා වීම ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ සිහිනයක්. දෙන දෙයියෝ ගෙට ගෙනැවිත් දුන්නා වාගේ හදිසියේම බලාපොරොත්තු නොවී මෙම තනතුර ලැබුණාම, සතුටින් පිනාගිහින් ඊට පස්සේ කළගුණ සලකන්න පටන් ගන්නවා.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
( மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මොහාන් පීරිස් අග්‍රවිනිශ්චයකාරතුමා පත්වනකොට, ඔබතුමා ඔය ප්‍රශ්න ඇසුවේ නැද්ද කියලා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
( மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නේ නැති වුණාට, 41උ. කියන අනු ව්‍යවස්ථාව එන්නේ, තමුන්නාන්සේලා ගෙනා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුවයි. ඒ නිසා ඔබතුමා ව්‍යවස්ථාව අධ්‍යයනය කරලා මේ ප්‍රශ්නය ඇසුවා නම්, මගේ කාලය ඉතුරු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට, මේ අය "විධායක සභාව" කියලා එකක් පත් කරනවා. අපේ ගරු මලික් සමරවික්‍රම මැතිතුමා ඒකට ගත්තාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. සාමාන්‍යයෙන් හංස සන්ධානයේ හිටපු පක්ෂ නායකයින් ඔක්කෝම මේ විධායක සභාවට පත් කළා. මේකට ගෙන්වනවා, නීතිපති. නීතිපතිගෙන් අහනවා, "අභවල් නඩුව තවම දැම්මේ නැත්තේ ඇයි?" කියලා. ඒ වාගේම, "අර නඩුවට වඩා මේ නඩුව ඉක්මන් කරන්න." කියනවා. "මේ සිද්ධියේදී ගෝඨාව කොහොම හරි කොටු කරන්න, මේ නඩුව මඟ හැරුණොත් ගෝඨාව කොටු කරන්න අපට වෙනත් අවස්ථාවක් ලැබෙන්නේ නැහැ" කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා මම කියන ඒවා නොවෙයි. මේවා, හිටපු අධිකරණ අමාත්‍යතුමා මාධ්‍ය ඉදිරියේ ප්‍රසිද්ධියේ සඳහන් කරපු කාරණා. ඒ විතරක් නොවෙයි, හිටපු අධිකරණ ඇමතිතුමා තවත් අපූරු කථාවක් කිව්වා. මේ නීතිපතිතුමාව අරලිය ගහ මන්දිරයට ගෙන්වා, අගමැතිතුමායි, කුප්‍රකට footnote කල්ලියේ සාමාජිකයෝයි, එකට වාඩිවෙලා නීතිපතිතුමාගෙන් ප්‍රශ්න කළාලු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනවිට, බැඳුම්කර විමර්ශන කොමිසමට විමර්ශනයට සහාය දෙන එක් රජයේ නිලධාරියෙක් තමයි, නීතිපතිතුමා. නීතිපතිතුමා තමයි මෙම සාක්ෂි මෙහෙයවන්නේ; හරස් ප්‍රශ්න අසන්නේ. එතකොට මේ නීතිපතිතුමා වෙනුවෙන් තමයි පහළ නිලධාරින් එතැන පෙනී සිටින්නේ. බැඳුම්කර කොමිසමේ කාරණා සම්බන්ධයෙන් අගමැතිතුමාට චෝදනා එල්ල වුණා. බැඳුම්කර සම්බන්ධයෙන් පාදසටහන් යෙදීම පිළිබඳව බරපතළ විවේචනයක් පාර්ලිමේන්තුව තුළත්, සමාජයේත් මතු වුණා. එවන් පසුබිමක බැඳුම්කර කොමිසමට සහාය වෙමින් සිටින නීතිපතිවරයා අගමැතිවරයා සහ පාදසටහන් කල්ලියත් සමඟ කරන සාකච්ඡාව කුමක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිපති තනතුරේ ගෞරවය කෙලෙසීමේ උච්චතම අවස්ථාව තමයි අද තිබෙන්නේ. අද මාධ්‍ය වාර්තා කර තිබුණු විධියට අගමැතිතුමා බැඳුම්කර කොමිසමට සාක්ෂි දීමට යන අවස්ථාවේ, වෙන දා එතැන නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් සාක්ෂි විමසන, හරස් ප්‍රශ්න අහන දප්පුල ද ලිවේරා මහතා වෙනුවට නීතිපතිතුමා ගියාලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12. (1) -

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු ඇමතිතුමා දිගින් දිගටම බාධා කරනවා. ඔබතුමාට මාත් එක්ක පරණ තරහක් තිබෙනවාද දන්නේ නැහැ.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඇත්ත කියන්න ඕනෑ. මෙතුමා කියන දෙය සම්පූර්ණ අසත්‍යයක්. නීතිපතිතුමා කැඳවා තිබෙන්නේ, කොමිසමෙන්.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
( மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විධියට දිගින් දිගටම මෙතුමාට බාධා කරන්න ඉඩ දෙන්න බැහැ. රීති ප්‍රශ්නයක් තිබෙනවා නම්, අහන්න පුළුවන්. මම කථා කරන්නේ මේ ක්‍රියාදාමය ගැනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12. (1) අනු ව්‍යවස්ථාව අනුව නීතිය ඉදිරියේ සියලු දෙනාම සමානයි. රටේ ජනාධිපතිවරයා වේවා, අගමැතිවරයා වේවා සාක්ෂි කූඩුවේ නැඟ ඉන්නවා නම්, ඔහු තවත් එක් සාක්ෂිකරුවෙක් පමණමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් තමන් විසින් පත් කර ගත්, තමන්ට හිතවත් නීතිපතිතුමාව දප්පුල ද ලිවේරා මැතිතුමා වෙනුවට ගෙන්වා ගන්නේ ඇයි?

අපි දන්නවා ලිවේරා මැතිතුමා,-[බාධා කිරීමක්] ඔබතුමා කථා කරද්දී, මම ඔබතුමාට බාධා කළේ නැහැ. කරුණාකර මගේ අවස්ථාව දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවට ඇවිල්ලා උත්තර දෙන්න බැරි නිලධාරියෙක් ගැන, රටේ උත්තරීතර තනතුරක් ගැන. ගරු මන්ත්‍රීතුමා එතුමාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී වරප්‍රසාදවලට මුවා වෙලා ඉතා පහත් පෙළේ ප්‍රකාශයක් මේ කරන්නේ. මෙතුමන්ලා අගවිනිසුරුවරිය එළවපු කට්ටිය. අද මේ නීතිපතිවරයා,- [බාධා කිරීමක්]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම රීතිවලට අනුකූලවයි කථා කරන්නේ. නීතිපතිවරයා පිළිබඳව මා කඩ කළ රීතිය මොකක්ද කියලා එතුමාට පෙන්වන්න කියන්න. විනිසුරුවරුන්ගේ පැවැත්ම ගැන කථා කරන්න බැහැ. ඔවුන්ව පත් කළ ආකාරය ගැන කථා කරන්න පුළුවන්. ජනාධිපතිවරයාගේ පැවැත්ම ගැන කථා කරන්න බැහැ. මේ ගරු සභාවේ මන්ත්‍රීවරයෙක් ගැන කථා කරන්න බැහැ. "නීතිපතිවරයා" කියන තනතුර ගැන කථා කරන්න මට අයිතිය තිබෙනවා. ඒ අයිතියයි මම භාවිත කරන්නේ. තමුන්නාන්සේ ඇයි, මේ භූමිතෙල් කාපු ගැරඬියා වාගේ කලබල වෙන්නේ? ඔබතුමාගේ නඩුවක් තිබෙනවාද? [බාධා කිරීමක්] මේ දවස්වල අර්ජුන් ඇලෝසියස්ගෙන් කාපුබීපු මිනිසුන්ට කොන්ත්‍රාත් එකක් භාරදීලා තිබෙනවා, මම කථා කරද්දී, බාධා කරන්න කියලා. දැන් මුළු රටටම බලා ගන්න පුළුවන්, අර්ජුන් ඇලෝසියස්ගෙන් කාපුබීපු මිනිස්සු කවුද කියලා. [බාධා කිරීමක්] ඔන්න එක්කෙනෙක් කෑ ගහනවා ඇහෙනවා. ඔන්න බලාගන්න. තව එක්කෙනෙක් ඉන්නවා. ඔබතුමාගේ නම පොඩ්ඩක් කිව්වොත් රටටම දැනගන්න පුළුවන්. මූහුණ විතරයි පෙනෙන්නේ. කෑ ගහපු ගරු ඇමතිතුමා, පොඩ්ඩක් නමත් කියන්න කෝ රටට දැනගන්න. හැන්සාඩ් වාර්තාවට යන්න ඕනෑ ඇලෝසියස්ගෙන් කාපු කට්ටියගේ නම් ලැයිස්තුව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සඳහන් කරමින් සිටියේ,-

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Presiding Member -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Member, give me one minute please.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීති අංශයේ සම්ප්‍රදායක් තිබෙනවා, අගමැතිතුමා සාක්ෂි දෙන්න යනකොට නීතිපතිතුමා තමයි හරස් ප්‍රශ්න අහන්නේ. ඒක සම්ප්‍රදායක්. මෙතුමා ඒ ගැන දන්නේ නැහැ. [බාධා කිරීම්] රටේ අගමැතිතුමා සිය කැමැත්තෙන් සාක්ෂි දෙන්න යනකොට සම්ප්‍රදායක් තිබෙනවා; there is a tradition: නීතිපතිතුමා තමයි ප්‍රශ්න අහන්නේ. ගරු මන්ත්‍රීතුමා, මේවා පිළිබඳව දැනගන්න. මෙතුමා උසාවි ගිහිල්ලා නැහැ නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු සභානායකතුමා, ඔබතුමාගෙන් මට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මම අහන්න කැමැතියි, සම්ප්‍රදායක් කියන්නේ මීට පෙර ඇති වුණු පූර්වාදර්ශයක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මෙතුමා pass වෙච්ච දා ඉඳලා පළාත් සභාවට සහ පාර්ලිමේන්තුවට ආවේ. මෙතුමා උසාවි ගිහිල්ලා නැහැ. Sir, there is a tradition: when the Hon. Prime Minister goes to give evidence, the Attorney-General must be there to question him.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

Do not tell an untruth to this House. Hon. Leader of the House, you are telling an untruth and misleading this House. There is no such tradition. In order to establish a tradition, there must be precedents. Please name which Prime Minister in which year went before a commission of inquiry and which Attorney-General came to cross-examine him. Do not tell an untruth to this House. Hon. Leader of the House, you are telling an untruth.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සභානායකතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා, මෙතුමා අහනවා, කොයි අගමැතිතුමා ද සාක්ෂි දෙන්න ගියේ කියලා. ඒක තමයි මම කියන්නේ. අගමැතිතුමා ගත්ත මේ පියවර ශ්‍රේෂ්ඨ පියවරක්. ඒකයි මම කිව්වේ එය රටටම ආදර්ශයක් කියලා. මෙතුමාට නම් කරන්න බැහැ එකම අගමැතිවරයෙක් මෙහෙම ගිහිල්ලා සාක්ෂි දුන්නා කියලා. මෙතුමා මගෙන් අහනවා, කොයි අගමැතිවරයා ද එහෙම ගිහිල්ලා සාක්ෂි දුන්නේ කියලා. ඒ නිසායි මම කියන්නේ මේක අපේ රටටත්, අගමැතිතුමාටත් විශාල ගෞරවයක් කියලා. [බාධා කිරීම්]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වා, මම කථා කරද්දී, භූමිතෙල් කාපු ගැරඬි වාගේ ඇලෝසියස්ගේ ගෝලයෝ ටික කලබල වෙනවා කියලා. මෙතුමා කියනවා සම්ප්‍රදායක් කියලා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තලතා අතුකෝරල අමාත්‍යතුමිය.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා දිගින් දිගටම නීතිපතිතුමා සහ ඒ තනතුර ගැන කථා කරනවා. ඒ නිසා මම ඒ ගැන පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ඒ පත් කරලා තිබෙන විශේෂ ජනාධිපති කොමිසමේ සභාපති චිත්‍රසිරි මැතිතුමාගේ ලිඛිත ආරාධනයෙන් තමයි නීතිපතිතුමා අද ඒ කොමිසම හමුවට ගිහිල්ලා තිබෙන්නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ,- [බාධා කිරීම්]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මගේ කථාවට කරන අටවෙනි බාධා කිරීම.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මෙතුමාගේ කථාවත් එක්ක දැන් මෙතුමාට අමතක වෙලා මෙහෙම කථා කරන්නේ. හිටපු ජනාධිපතිතුමාට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට එන්න කිව්වාම මෙතුමා එතැනට පෙළපාළි ගිහිල්ලා උද්ඝෝෂණය කළා, එතුමා ගෙන්නනවාට විරුද්ධව. දැන් එතුමාට මතක නැහැ. [බාධා කිරීම්]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ කාලය දෙන්න. මම කථා කරමින් සිටින කාරණය වැදගත්.[බාධා කිරීම්]

මේක හරියට හොරාගේ අම්මාගෙන් නොවෙයි, හොරාගේ ගෝලයාගෙන් පේන අහනවා වාගෙයි. ගරු සභානායකතුමා පූර්වාදර්ශයක් තිබෙනවා කියමින් සභාව ඉදිරියේ තමන්ගේ නොදන්නාකම පෙන්නුවා. ඊළඟට කිව්වා, මේ පළමුවැනි අගමැතිවරයා කියලා. මේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වැඩක් කරපු අගමැතිවරයෙක් ලංකා ඉතිහාසයේ ඉඳලා නැහැ, ගරු සභානායකතුමා. ඒකයි සම්ප්‍රදායයක් නැත්තේ; ඒකයි පූර්වාදර්ශ නැත්තේ. අන්න ඒක තේරුම් ගන්න. මගේ කථාවට බාධා කරලා වැඩි දේවල් අහගන්න එපා. ඔබතුමාට මම අනතුරු ඇඟවීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්] මැතිවරණ කොමිසම මගේ නඩුව පිළිබඳ -[බාධා කිරීම්] එන්න අධිකරණයට. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ගොතපු බොරුව අද අධිකරණය ඉදිරියේ එකින් එක හෙළි වෙලා තිබෙනවා. සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමනි, මේ නඩුව ඉවර වුණාට පස්සේ මේ නඩුව හැදුණේ කොහොමද කියලා මමත් ලියනවා පොතක්. ඔබතුමන්ලා ඕනෑ කෙනෙකුට අධිකරණයට ඇවිත් නඩු විභාගය බලන්න පුළුවන්. මේ නඩුව විභාග වූ පළමුවැනි දවස් දෙකේ මේ නඩුව පිළිබඳ මාධ්‍යවල වාර්තා කළා.

**ගරු ජේ. සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
අන්න, සුද්දා එළියේ බලාගෙන ඉන්නවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
( மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
සුද්දා කියන්නේ අසත්‍ය කියලා අධිකරණය ඉදිරියේ ඔප්පු වුණා විතරයි, මගේ නඩුව අද මාධ්‍යවල වාර්තා කරන්නේ නැහැ. එන්න, වාර්තා කරන්න, රටට ඇත්ත දැන ගන්න ඉඩ දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. එක සත පහක් හොරකම් කළා නම් අපි නඩුව ඉක්මන් කරන්නේ නැහැ. මගේ නඩුව තමයි අද අධිකරණයේ වේගයෙන්ම අහන නඩුව. මොකද, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පෙරළෙන්න කලින් මේ නඩුව අවසන් කරගෙන මගේ නම පිරිසිදු කර ගන්න මට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සඳහන් කරමින් හිටියේ බැඳුම්කර කොමිසම පිළිබඳවයි. මෙතෙක් එහි ප්‍රශ්න ඇහුවේ දප්පුල ද ලිවේරා මැතුමායි. අපි පුංචි කාලයේ හිටියා, ජී.ටී. ලිවේරා කියලා කරාතෙ කළු පටි ශූරයෙක්. එයාට හැමෝම හරි බයයි. දප්පුල ද ලිවේරාත් අන්න ඒ වාගේ. එතුමාගේ තියුණු ප්‍රශ්න කිරීම් හමුවේ සාක්ෂිකරුවන් නිරුවත් වුණු නිසා හැමෝම එතුමාට හරි බයයි. ඒ නිසා දප්පුල ද ලිවේරා මැතිතුමා පැත්තකින් තියලා අද දිනයේ නීතිපතිතුමා ජනාධිපති කොමිසමට ගියාම මට රසවත් කථාවක් මතක් වුණා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණාකරලා මේ ප්‍රකාශය ඉල්ලා අස්කර ගන්න කියන්න. මම එක පාරක් බොහොම පැහැදිලිව කිව්වා. ඔබතුමාට ඕනෑ නම් ගිහින් කොමිසම ඉදිරියේ පෙනී හිටලා හරි මේ පිළිබඳ දැන ගන්න පුළුවන්. අද නීතිපතිතුමා කොමිසම ඉදිරියට ගියේ කොමිසමේ ගරු සභාපතිතුමා ලිඛිතව කරන ලද දැනුම් දීමකට අනුව. මේ වාගේ වැදගත් තනතුරක් දරන කෙනෙකුට මෙතුමා දිගින් දිගටම මේ විධියට මඩ ප්‍රහාර එල්ල කරනවා. මොහාන් පීරිස් මහත්මයලා ගැන එහෙම අපි දන්නවා. ඔබතුමා තව ටිකක් ඉන්න. එතකොට අපි කියන්නම් ඒ ගොල්ල ආවේ කොහොමද කියලා. ඒ අය නිසා තනතුරු අහිමි වුණු අය කවුද කියලා අපි ඒ ඔක්කොම කියන්නම්. මන්ත්‍රීතුමා, අපි ඒ තත්ත්වයට දමන්න එපා. මේ ආණ්ඩුව ඒ තත්ත්වයට දමන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්ථාවර නියෝගවලට පටහැනි දේවල් ඉවත් කරනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පුතාලා දෙදෙනා පුංචි කාලයේ අපේ ගේ ඉස්සරහා ක්‍රිකට් ගහනවා. පුංචි පුතාට බැට් කරන්න එන්න කිව්වාම, පුංචි පුතා කියන්නේ, "අයියා බෝල් කරනවා නම් මට බැට් කරන්න බැහැ" කියලා. පුංචි පුතා ලවා බැට් කරවන්න ඕනෑ නිසා මම කියනවා, "බය වෙන්න එපා පුතේ. අයියා නොවෙයි බෝල් කරන්නේ. තාත්තා බෝල් කරන්නේ. ඔයා බය නැතිව ඇවිත් බැට් කරන්න" කියලා. මට මේ සිද්ධිය සිහිපත් වුණේ අද නීතිපතිතුමා කොමිසමට ගිය එක සිහිපත් වුණාම.

මෙතුමන්ලාට මේවා දරා ගන්න ටිකක් අමාරු නිසා මම වෙන මාතෘකාවකට එනවා. අපි කථා කළේ නීතිපතිතුමා පත් කිරීම ගැන.

දැන් අපි අධිකරණයට විනිශ්චයකාරවරුන් පත් කිරීම ගැන බලමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිපතිතුමා පත් කිරීම වාගේම, විනිශ්චයකාරවරුන් පත්කිරීම පිළිබඳවත් ව්‍යවස්ථාදායක සභාවට, අධිකරණ සේවා කොමිසමට තවමත් නිසි ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා මොකද වුණේ? රාමනාදන් කන්නන් 2017 පෙබරවාරි මාසයේ මඩකළපුවේ හිටිය නීතිඥයෙක්. එයා මහෙස්ත්‍රාත් විභාගයට වාඩි වෙලා - [බාධා කිරීම්] මේ සිද්ධිය පරණ නැහැ; අදාළයි; 2017 වසරේ පෙබරවාරි. මහෙස්ත්‍රාත් විභාගයට වාඩි වෙලා විභාගය අසමත් වුණා. විභාගය සමත් වූ අය මහෙස්ත්‍රාත්වරුන්, දිසා විනිසුරුවන් වශයෙන් සේවය කරද්දී, අධිකරණ සේවා කොමිසමේ නිර්දේශයෙන්, රාමනාදන් කන්නන් මහත්මයා මහාධිකරණ විනිශ්චයකාරවරයෙක් විධියට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

විසින් පත් කරනවා. එම සිද්ධියෙන් අධිකරණ සේවය කැලඹුණා. මේ පත්වීම වුණේ කොහොමද කියලා අධිකරණ සේවා සංගමය අගවිනිසුරුවරයාගෙන් ප්‍රශ්න කළා. අගවිනිසුරුතුමා දුන්න උත්තරය මොකක්ද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඉල්ලීමකටයි මම මේ නම නිර්දේශ කළේ කියලා කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යහ පාලනය බිහි කරන්න 19වන සංශෝධනයෙන් ගෙන ආ ස්වාධීන කොමිෂන් සභා පිළිබඳ මේ ගරු සභාවේ ඉතාම වර්ණනාවෙන්, ආඩම්බරයෙන් කථා කරපු මේ ආණ්ඩුවේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අගවිනිසුරුතුමාට කථා කරලා කියනවා, "මෙන්න මෙයා මට නිර්දේශ කරලා එවන්න, මේ පත්වීම කරන්න" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට මාස දෙකකට කලින්, 2017 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ මහාධිකරණයේ විනිශ්චයකාරවරුන් තිදෙනෙකුට අභියාචනාධිකරණයට උසස්වීම ලබා දුන්නා. හැබැයි, ඒ උසස් වීම ලබා දෙන අවස්ථාවේ මහාධිකරණයේ සිටි ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරුන් දෙදෙනා නොසලකා හැරියා. එක්කෝ ඒ සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. ක්‍රමවේදයක් නැත්නම් ජ්‍යෙෂ්ඨතාව පදනම් කර ගන්න ඕනෑ. ජ්‍යෙෂ්ඨයා වූ පමණින් ලබා දිය යුතුත් නැහැ. [බාධා කිරීම්]

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

මේ මන්ත්‍රීතුමා කියන මේ කරුණු අපි ප්‍රතික්ෂේප කරනවා. මෙතුමා කතා කරන්නේ අග්‍රවිනිශ්චයකාරතුමා විසින් කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන්. ඒ සම්බන්ධයෙන් කිසිම කෙනකුට වෙනත් අයිතියක් නැති විත්තිය අපි දන්නවා. එතුමා දැන් කිව්වා, යම්කිසි පත්වීමක් සම්බන්ධයෙන් ජනාධිපතිතුමා අග්‍රවිනිශ්චයකාරතුමාගෙන් ඉල්ලීමක් කළා කියලා. දැන් මේ අය හිතාගෙන ඉන්නේ ඒ ගොල්ලෝ කරපු දේවල් ඔක්කෝම තමයි අපිත් කරන්නේ කියලා. මේ උත්තරීතර සභාවේ මේ වාගේ සාවද්‍ය කරුණු කීමෙන් වැළකී සිටින්න කියලා කරුණාකර අවවාද කරන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණ ඇමතිතුමියට පිළිතුරු- [බාධා කිරීමක්] මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අපේ සභානායකතුමාගෙන්- [බාධා කිරීමක්] මම දැක්කා අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් මේ අහළ පහළ ඉන්නවා. අනේ පින් අත් වෙයි, මෙතුමියටත් පොඩි කාලයක් දෙන්න, උත්තර දෙන්න. එහෙම කළේ නැත්නම්, එක් එක් මන්ත්‍රීතුමා කතා කරද්දී, ඒකට බාධා කරමින් නැඟිටිනවා. මම ඇමතිතුමිය දැක්කේත් නැහැ. සමා වෙන්න ඕනෑ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

බාධාවක් කළේ නැහැ. නමුත් ඔබතුමා කියන්නේ පට්ටපල් බොරු.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

බොරුවක් නොවෙයි. [බාධා කිරීමක්] හරි, මගේ කතාවේදී මගේ බොරු ටික කියන්න ඉඩ දෙන්න. ඔබතුමියගේ කතාවේදී ඒවා බොරු කියලා පෙන්වන්න. [බාධා කිරීමක්] මා නොවෙයි බොරුව කරන්නේ. මේක බොරුවක් නම්- [බාධා කිරීමක්] අගවිනිසුරුතුමායි මේක කියන්නේ. ඒකට මාව අල්ලාගන්න එපා. ඒක සියලු මාධ්‍ය වාර්තා කළා. විශේෂයෙන්ම ඉංග්‍රීසි මාධ්‍ය. ශ්‍රී ලංකාවේ සියලු ඉංග්‍රීසි මාධ්‍ය ප්‍රධාන පුවතක් ලෙස වාර්තා කළා, 2017 පෙබරවාරි මාසයේ දෙවන සති අන්තයේ ඉංග්‍රීසි පුවත් පත් බැලුවොත් මේ පිළිබඳව විශේෂයෙන් සඳහන්ව තිබෙනවා. ඔබතුමිය ගූගල් එකට ගිහින් කන්නන් රාමනාදන් කියා ටයිප් කරන්න. එහි මේ කාරණය තිබෙනවා. [බාධා කිරීමක්] මෙතුමිය මට බාධා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට මගේ කාලය ලබා දිය යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමියට එතුමියගේ අවස්ථාවේදී උත්තරය දෙන්න ඉඩ දෙන්න.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා අගවිනිසුරුතුමාගේ තනතුර ගැන මෙතැන කිව්වා. කරුණාකර එය ඔය වාර්තා වන තැන්වලින් ඉවත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්ථාවර නියෝගවලට පටහැනි දේ ඉවත් කරනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
( மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
පටහැනි කිසි දෙයක් නැහැ. අගවිනිසුරුතුමාගේ කටයුතු ගැන නොවෙයි, අගවිනිසුරුතුමාගේ ක්‍රියාකාරිත්වය ගැන නොවෙයි මා ප්‍රශ්න කරන්නේ. අගවිනිසුරුතුමා කරපු ප්‍රකාශයක්-

**ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த )
(The Hon. H.R. Sarathie Dushmantha )
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මෙතුමාම කියනවා, ජනාධිපතිතුමාගේ ඉල්ලීමකට තමයි ඒ පත්වීම කළේ කියලා. ඒ එක්කම මෙතුමාම කියනවා, අගවිනිසුරුතුමාගේ නිර්දේශය මත තමයි ඒ පත්වීම කළේ කියලා. මෙතුමා මෙතැන දෙබිඩි කතාවක් කියන්නේ ඒ විනිශ්චයකාරතුමාගේ පත්කිරීම ගැන. තමුන්නාන්සේ ඒ ගැන මත දෙකක් කිව්වා, මෙතැනදී. මත දෙකක් කිව්වා තමුන්නාන්සේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමා හරියාකාරව අහගෙන හිටියේ නැහැ. ඔබතුමාට කන් දෙකකුයි එක කටකුයි ලැබිලා තිබෙන්නේ හරියට අහගෙන ඊට පස්සේ කතා කරන්නයි. ඔබතුමා දන්නේ නැහැ, මා කිව්වේ මොකක්ද කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව- [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, අවාසනාවට ඔබතුමාට කන් දෙකක් දීලා තිබෙන්නේ.

**ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த)
(The Hon. H.R. Sarathie Dushmantha)
මෙතුමාට කටවල් සෑහෙන ප්‍රමාණයක් තිබෙනවා. හැරෙන හැරෙන පැත්තට කතා කරනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, කන් දෙකක් දීලා තිබෙන්නේ, වැඩියෙන් අහලා අඩුවෙන් කතා කරන්නයි. ඔබතුමා අහගෙන ඉන්නේ නැතිව කතා කරනවා. ඒකයි ඔබතුමාට තිබෙන ප්‍රශ්නය. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. අගවිනිසුරුතුමා තමයි නිර්දේශ කළ යුත්තේ, අධිකරණ සේවා කොමිසමේ - Judicial Service Commission එකේ- සභාපතිවරයා විධියට. ඒ නිර්දේශය අනුව තමයි ජනාධිපති ඒ පත්වීම කළ යුත්තේ. අගවිනිසුරුගෙන් අහනවා, ඇයි මේ නම නිර්දේශ කළේ කියලා. එතකොට අගවිනිසුරුතුමා අධිකරණ නිලධාරින්ගේ සංගමයේ සභාපතිට දෙන උත්තරය තමයි, ජනාධිපතිතුමාගේ ඉල්ලීමක් මතයි මා මේක කළේ කියන එක. ඔබතුමා ඒක සොයා බලන්න. ඔබතුමා අධිකරණ නියෝජ්‍ය ඇමති තනතුරේ ඉන්න එකත් ලජ්ජයි. රටේ මෙච්චර දෙයක් වෙලාත් ඒක දන්නේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த)
(The Hon. H.R. Sarathie Dushmantha)
ඔබතුමා හැරෙන හැරෙන පැත්තට කතා කරනවා. කටුස්සා වාගේ පාට මාරු කරනවා හැම වෙලාවේම.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ලජ්ජයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා. දැන් වාඩි වෙන්න. කතාවක් ඉල්ලාගන්න සභානායකතුමාට කතා කරලා. දැන් වාඩි වෙන්න. කන් දෙකෙන් ටිකක් වැඩිපුර අහන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියමින් සිටියේ මෙයයි. ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරුන් පත් කිරීමේ නිශ්චිත නිර්ණායක නැති නිසා අද මොකද වෙලා තිබෙන්නේ? ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරු දෙන්නා දන්නේ නැහැ, තමන්ට උසස්වීම නොලැබුණේ ඇයි කියලා. උසස් වීම ලැබුණු විනිසුරුවරුන් තිදෙනා පිළිබඳව මගේ කිසිම විවේචනයක් නැහැ. හැබැයි අර විනිසුරුවරුන් දෙදෙනා දැනගත යුතුයි, මට උසස්වීම නොලැබුණේ ඇයි, මම ආණ්ඩුවට පන්දම් අල්ලන්නේ නැති නිසාද, මා ආණ්ඩුවට පක්ෂව තීන්දුව ලියන්නේ නැති නිසාද එසේ වුණේ කියලා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඒ ඉස්සර.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ඒ නිසා විනිසුරුවරුන් උසස් කිරීම සම්බන්ධයෙන් නිශ්චිත ක්‍රමවේදයක් තිබිය යුතුය කියන කාරණයයි මා මතු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතීතයේ අපි අහලා තිබෙනවා, කළු ලකීලා ගැන; ගෝනවල සුනිල්ලා ගැන. අපරාදේ කියන්න බැහැ, දැන් නම් මැරයන් භාවිත කරන්නේ නැහැ, විපක්ෂය මර්දනය කරන්න. ඒ වෙනුවට යොදා ගන්නේ, [බාධා කිරීමක්]

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
නැහැ, නැහැ. අපි ළඟ චම්බොට්ටලා නැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
( மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ඔබතුමිය ඔබතුමියගේ තනතුරට ලජ්ජා කරන්න එපා. ඉහළ තනතුරක්, ඔය. සහෝදර නීතිඥවරියක වන ඔබතුමියට ඔය තනතුර දුන්නාම අපි අගය කළා. ඒත් ලජ්ජයි නේ ඇමතිතුමියනි. ඔබතුමිය අර දෙකේ පන්තියේ ඉන්න චූටි කෙල්ලක වාගේ නේ කෑ ගහන්නේ. [බාධා කිරීමක්] ඔබතුමිය පෙනෙන්නේත් නැහැ. ඒත් සද්දයක් එනවා ඒ පැත්තෙන්. ආණ්ඩුව පැත්තේ දෙවන පේළියේ දෙවන පුටුවෙන් පොඩි සද්දයක් එනවා විතරයි. මූණක්වත් පෙනෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අධිකරණ අමාත්‍යතුමිය ගැනයි දැන් මේ කියන්න යන්නේ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මම පෙන්වන්නම් මූණ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
( மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
විරුද්ධවාදින් අද බොහොම දියුණුයි. මැරයන් භාවිත කරන්නේ නැහැ. අද නීතිපති, පොලිස්පති වාගේ තනතුරු භාවිත කරලා තමයි විපක්ෂය මර්දනය කරන්නේ.

ගරු සභාපතිතුමනි, අපි ළඟ නඩු පිළිබඳ විස්තර තිබෙනවා. නීතිපතිවරයා ලසු නොවන නඩු විභාගයක් පවත්වා, ඉන් අනතුරුව මහාධිකරණයේ චෝදනා ගොනු කළ යුතු නඩුවලදී තමන්ගේ අභිමතය අනිසි ලෙස භාවිත කරමින් දේශපාලන වුවමනාව මත ඒ ක්‍රියාදාමයෙන් බැහැර වෙලා මහාධිකරණයේ නඩු ගොනු කරලා තිබෙනවා. එක නඩුවක් තිබෙනවා, එම නඩුව සඳහා එක්තරා සාක්ෂිකාරයෙකුගේ සාක්ෂිය ලබා ගත්තා නම්, නඩුව සම්පූර්ණයෙන්ම බිඳ වැටෙනවා. එම නිසා පොලීසිය ඒ සාක්ෂිකාරයාගේ සාක්ෂිය ලබා ගන්නේ නැහැ. නීතිපතිවරයා ඒ බව දැක දැකම පොලීසිය විමර්ශනය කර ගෙන ගොස් මහාධිකරණයේ චෝදනා ගොනු කරන්නට කටයුතු කරනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තලතා අතුකෝරල ඇමතිතුමිය Point of Order එකක් ඉදිරිපත් කරනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මන්ත්‍රීවරයා දිගින් දිගටම නීතිපතිතුමාගේ නම මෙතැන සාවද්‍ය කරුණු සඳහා පාවිච්චි කරනවා. එතුමා මන්ත්‍රී වරප්‍රසාදවලට මුවා වෙලායි මේ වාගේ කරුණු කියන්නේ. එම නිසා කරුණාකර මේ කියන සියලුම කරුණු හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්නය කියා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
කිසිම රීතියක් කඩ වෙලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම රීති පොත අනුවයි කථා කරන්නේ. නීතිපතිවරයාගේ පැවැත්ම පිළිබඳ කථා කිරීමෙන් කුමන රීතියක් කඩ වෙනවාදැයි ගරු අධිකරණය ඇමතිතුමිය සභාවේ නැඟිට කියන්න. මොන රීතියද කඩ වුණේ? රීති පොතේ රීතිය උපුටා දක්වන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු ඇමතිතුමියනි, දන්නාකම ප්‍රදර්ශනය කරන්නට ගොස් නොදන්නාකම ප්‍රදර්ශනය කරන්න එපා. කලින් මේ අධිකරණ ඇමති ධුරයේ සිටියා, පක්ෂ භේදයෙන් තොරව කටයුතු කරන, කවුරුත් ගරු කරන ජනාධිපති නීතිඥ විජයදාස රාජපක්ෂ මැතිතුමා. එතුමා අධිකරණ ඇමති ධුරයේ කටයුතු කරද්දී, විපක්ෂයේ අයගෙන් පළිගන්න විවිධ නඩු කටයුතු ආරම්භ කරන්න, අධිකරණයට ඇඟිලි ගහන්න කියා එතුමාට බලපෑමක් එල්ල වුණා. එතුමා මොකක්ද කිව්වේ? එතුමා දන්නවා, අධිකරණ ඇමතිකම තාවකාලික බව. ඔබතුමියටත් එය අදාළයි, ගරු ඇමතිතුමියනි. නීතිඥකම සදාකාලිකයි. මැරෙනතුරු ඔබ නීතිඥයෙක්. හැබැයි, මැරෙනතුරු ඔය පුටුවේ ඉන්න බැහැ; අධිකරණ ඇමති ධුරයේ ඉන්න බැහැ. ඒක අපේ හිටපු ඇමතිතුමා දැනගෙන සිටිය නිසා අධිකරණ ක්ෂේත්‍රයේ තමන්ට තිබෙන ගෞරවය කෙළෙසාගෙන අධිකරණයට මැදිහත් වෙන්න කැමැති වුණේ නැහැ. එතුමාට මේ තනතුර දාලා යන්න සිද්ධ වුණා. ඊට පස්සේ අපේ තලතා අතුකෝරළ ඇමතිතුමිය මේ තනතුරට පත් වුණා. එතුමාව ඉවත් කරලා එතුමියව පත් කළාම අපටත් සාධාරණ සැකයක් ඇති වුණා, මෙතුමිය පත් කළේ අධිකරණයට බලපෑම් කරන්නටදෝ කියලා.

Madam Minister, you are so far so good. ඔබතුමිය පිළිබඳ මෙතෙක් අපට චෝදනාවක් එල්ල වී නැත. හැබැයි, අපි ඔබතුමිය ගැන සැලකිල්ලෙන් බලාගෙන ඉන්නවා. මාධ්‍යවල කිසිම දවසක "තලතා නීතිය තලයි" කියා පළවෙනවා දකින්න නොලැබේවායි අපි ප්‍රාර්ථනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට වෙන් කළ කාලය අවසානයි. කථාව අවසාන කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්නට බොහෝ දේවල් තිබුණත්, ගරු අධිකරණ ඇමතිතුමියට ආණ්ඩුවෙන් කාලය වෙන් කර නැති නිසා මගේ කාලය එතුමියත් එක්ක බෙදා හදා ගන්න සිදු වුණා. ඒ නිසා අවශ්‍ය කරුණු කියන්න බැරි වුණත්, අධිකරණ ඇමතිතුමියට ස්වාධීනව කටයුතු කරගෙන යාමට අවශ්‍ය ශක්තිය, ධෛර්ය, වාසනාව සහ අවස්ථාව උදාවේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු ආචාර්ය සරත් අමුණුගම අමාත්‍යතුමා.

ඊට කලින් ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා මූලාසනය ගන්නවා ඇති.

***අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) සරත් අමුණුගම අමාත්‍යතුමා.

**[අ.භා. 3.05]**

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (විශේෂ කාර්යභාර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம- விசேட பணிப்பொறுப்புகளுக்கான அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of Special Assignment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට මම බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම, අද ලෝකයේ සෑම රටක්ම තමන්ගේ ආර්ථිකය ශීඝ්‍රයෙන් දියුණු කරගන්න මහන්සි ගන්නවා. මොකද, හැම රටේම ජනගහනය වැඩි වෙනවා. ඒ ජනගහනයේ අපේක්ෂාවන් වැඩි වෙනවා. පරණ පරම්පරාවලට නොතිබුණු සම්පත් මේ පරම්පරාවට ලබා දෙන්නය කියා ඉල්ලීමක් තිබෙනවා. එම නිසා මොන දේශපාලන දර්ශනය පිළිගත්තත්, මොන විධියේ ඉතිහාසයක් තිබුණත් අද සියලුම රටවල් තමන්ගේ ආර්ථිකය දියුණු කරගන්න මහන්සි ගන්නවා.

ඒ මහන්සිය තුළ, ඒ සෑම රටකටම මුහුණ පාන්න සිදු වී තිබෙන ප්‍රශ්නයක් තමයි ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය ධනය, එයට යට කළ යුතු මුදල්-හදල් ලබා ගන්නේ කෙසේද කියන එක. මොකද, සවුදි අරාබිය වගේ ලෝකයේ තව රටවල් කිහිපයක් තිබෙනවා, ඒගොල්ලන්ගේ අභ්‍යන්තරයේම ධනවත් වෙන්න පුළුවන්. නමුත් දැන් අලුතින් ඒගොල්ලොත් විදේශ බැංකුවලට ගිහිල්ලා; ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිහිල්ලා සල්ලි ඉල්ලනවා. නමුත් සෙසු රටවල් ඔක්කොම තමන්ගේ දේශීය ධනයට අමතරව විදේශ ආයෝජන ලබා ගන්න බලාපොරොත්තු වෙනවා. අපි චීනය, වියට්නාමය වාගේ රටවල් ගත්තොත්, ඉස්සර ධනපති ක්‍රමයට විරුද්ධව දාර්ශනිකව සහ ප්‍රායෝගිකව කටයුතු කළ රටවල්. දශක කිහිපයක්ම ඒගොල්ලෝ විශාල යුද්ධයක - සටනක - යෙදී සිටියා, "ධනපති ක්‍රමය නැති කරන්න ඕනෑ, සමාජවාදී ක්‍රමය ඇති කරන්න ඕනෑ" කියලා.

මේ ආදී වශයෙන් එක එක ආර්ථික ක්‍රම අතර විශාල ගැටුමක් තිබෙනවාය කියලා හිතාගෙන වෙනස් වූ ආර්ථික ක්‍රියා මාර්ග පසු පස පන්නා ගෙන ගියා. නමුත් අද ඒක නැහැ. අද ඒ සෑම රටක්ම එක්තරා සමාන ආර්ථික ක්‍රමයකට ගිහිල්ලා තිබෙනවා. චීනය සහ වියට්නාමය ගත්තොත් ඒගොල්ලෝ විදේශ ආයෝජන සඳහා සම්පූර්ණයෙන්ම තමන්ගේ ආර්ථිකය විවෘත කර තිබෙනවා. අපේ රටේ අපටත් දැන් ඒ විධියට කල්පනා කරන්න සිද්ධ වෙනවා. මොන රජය ආවත්, අපට අවශ්‍ය සංවර්ධන වේගය ගන්න, මේ රටේ දුප්පත් මිනිස්සුන්ට වටිනා ජීවිතයක් ලබා දෙන්න අපේ රට තුළින්ම ධනය සොයා ගන්න බැහැ. ඒ නිසා විදේශ ආයෝජන ලබා ගන්න අවශ්‍යයි.

අපි දන්නවා, පසු ගිය රජයත් ඒ සංකල්පය අනුව තමයි කටයුතු කළේ කියලා. ණය ගත්තත්, ඒක විදේශ ආයෝජනයක්. අපි ලෝකයේ නොයෙක් රටවලින් ණය අරගෙන මේ රටේ සංවර්ධනය සඳහා යට කළා. නමුත් රජයකින්, රජයකට දෙන මුදල්වලට අමතරව පෞද්ගලික අංශයෙන්, ඒ අයගේ තිබෙන ධනය, දැනුම පාවිච්චි කරලා රට දියුණු කරන්න පුළුවන්. පසු ගිය රජයත් ඒ උපාය මාර්ගය යොදා ගත්තා. ඒක රජයෙන්, රජයකට කරන ආයෝජනයක් විතරක් නොවෙයි.

අපි දන්නවා, ෂැන්ග්‍රි - ලා ව්‍යාපාරය ගැන. මම නම් ඒකට විරුද්ධ වන්නේ නැහැ. ඒක ලංකාවට ඉතාම වටිනා දෙයක්. ඒක සම්පූර්ණයෙන්ම පෞද්ගලික ආයෝජනයක්. ඒ වාගේම අපේ වරාය දියුණුව ගත්තොත්, විශේෂයෙන්ම SAGT, CICT කියන වරාය සංවර්ධනයට පසුගිය රජය කාලයේ විදේශ ධනය ගෙනාවා. එහෙම නේද, ඇමතිතුමනි? ඉතාම සාර්ථකව එම ආයෝජන කළා. ඒ නිසා අද අපි කල්පනා කරන්නේ මේ අමාත්‍යාංශය යටතේ කොයි විධියටද මේ රටට අවශ්‍ය විදේශ ආයෝජන ගෙන එන්නේ කියලායි. මොකද, විදේශ ආයෝජනවලින් විතරයි අපට ශීඝ්‍ර සංවර්ධනයකට යන්න පුළුවන්. ඒ තුළින් රැකියා උත්පාදනය කරන්න, නව තාක්ෂණය, අලුත් උපක්‍රම, අලුත් යන්ත්‍ර සූත්‍ර, අලුත් තාක්ෂණික දැනුම මේ රටට ගෙනැල්ලා නූතන රටක් හැටියට, ආර්ථිකයක් හැටියට ඉදිරියට යන්න නම් අපට විදේශ ආයෝජන අත්‍යවශ්‍යයි. අපිව සම කරන්න පුළුවන් කොයි වාගේ රටවලටද? රුසියාව වාගේ විශාල රටකට අපිව සම කරන්න බැහැ නේ. චීනය වාගේ විශාල රටකට, ඇමෙරිකාව වාගේ විශාල රටකට අපිව සම කරන්න බැහැ. අපි දූපත් රාජ්‍යයක්. අනෙක් දූපත් රාජ්‍යයන් දෙසයි අපි බලන්න ඕනෑ.

සිංගප්පූරුව දෙස බලන්න පුළුවන්; චීනයේ කොටසක් වන හොංකොං රාජ්‍යය දෙස බලන්න පුළුවන්; ඒ වාගේම කුඩා රාජ්‍යයක් නමුත් ඉතාම වේගයෙන් සංවර්ධනය වුණු රාජ්‍යයක් වන, the United Arab Emiratesවල කොටසක් වන ඩුබායි දෙස බලන්න පුළුවන්; මැලේසියාව දෙස බලන්න පුළුවන්. මේ වාගේ රටවල් කුඩා වුණත් විදේශ ආයෝජන පාවිච්චි කරලා තමන්ගේ ආර්ථිකය ඉහළ මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා. ඒ සඳහා හොඳම නිදසුන තමයි වියට්නාමය.

ඇත්ත වශයෙන්ම චීනය, රුසියාව වාගේ රටවල ධනවාදයට විරුද්ධව විවේචන ඉදිරිපත් කළත්, වියට්නාමය ලේවලින් ඒ වන්දිය ගෙව්වා. තමන්ගේ ජනගහනයෙන් විශාල සංඛ්‍යාවක්-කිව්වොත් කවුරුවත් විශ්වාස කරන්නේ නැහැ, දෙවන මහා ලෝක යුද්ධය කාලය පුරාම දමපු බෝම්බවලට වඩා වියට්නාමයට බෝම්බ දමලා තිබෙනවා. ඒ තරම් විශාල විනාශයක් කළා. නමුත් ආර්ථික සංවර්ධනය සඳහා ඒ ගොල්ලන් ඒ අතීතය අමතක කරලා අලුත් මාවතකට යන්න ලැහැස්තියි. ලංකාව කුඩා දූපතක්. අපට ලංකාව සංසන්දනය කරන්න පුළුවන්, අර මම ඉස්සර වෙලා කියපු රටවල් සමඟ. බලන්න, අපේ සම්පූර්ණ බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර 65,610යි. ඒ තුළ අපට ස්වාභාවික සම්පත් තිබෙනවා. අපට ස්වාභාවික සම්පත් තිබුණත් අපට ඕනෑ විධියට ඒ ජවය ගන්න, ඒ සංවර්ධන ජවය ගන්න ස්වාභාවික සම්පත් මදි. එහෙම නම් මොනවාද, මේ වෙලාවේ අපට කරන්න තිබෙන්නේ? අපට කරන්න තිබෙන්නේ, අපේ භූගෝලීය පිහිටීම, hub status එක හරියට පාවිච්චි කරලා, ඒකෙන් ධනය ඉපයීමට මහන්සි ගැනීමයි. සිංගප්පූරුව කළේත් ඒකයි; වියට්නාමය දැන් කරන්නේත් ඒකයි; හොංකොං කරන්නේත් ඒකයි. මම කියපු ඒ හැම රටක් පසුපසම විශාල වෙළෙඳ පොළක් තිබෙනවා. සිංගප්පූරුව ගත්තොත්, ඒ රට දියුණු වේගෙන එනකොට මැලේසියාවත් එක්ක වෙළෙඳාම් කළා. ඉන්දුනීසියාවත් එක්ක වෙළෙඳාම් කළා. තායිලන්තයත් එක්ක වෙළෙඳාම් කළා. ඒ ගොල්ලන් ලොකු වෙළෙඳ පොළවල් හදා ගත්තා. හොංකොං වෙළෙඳ මධ්‍යස්ථානයක් වුණේ, ඔවුන් පසුපස චීනය තිබුණු නිසයි. විශාල අභ්‍යන්තර වෙළෙඳ පොළක් තිබෙනවා.

ලංකාව විධියට අපි ඉතාම වාසනාවන්තයි. මොකද, අපේ රටට කිලෝමීටර කිහිපයක් එහායින් උතුරට වෙන්න ලෝකයේ වඩා ඉක්මනින් දියුණු වන වෙළෙඳ පොළ තිබෙනවා. අද ඉන්දියාවේ දළ දේශීය නිෂ්පාදිතය -GDP එක - ශීඝ්‍රයෙන් වැඩි වෙනවා. ඉන්දියාවේ විශාල ජනගහනයක් තිබුණත් ලංකාවට වඩා ඉක්මනින් ඒ ගොල්ලන් සංවර්ධනයට යනවා. ඉන්දියාව විතරක් නොවෙයි, බංග්ලාදේශයත් එහෙමයි. ලංකාවයි, ඉන්දියාවයි දෙකටම වඩා ඉක්මනින් ඒ ගොල්ලන් සංවර්ධනයට යනවා. ඒ

රටේ තිබුණු ප්‍රශ්න දෙස බැලුවාම, දුප්පත්කම දෙස බැලුවාම, ස්වාභාවික ආපදා දෙස බැලුවාම කවුරුවත් හිතුවේ නැහැ, මේ වගේ රටක් මෙච්චර ඉක්මනට දියුණු වෙයි කියලා. නමුත් අද ඒ ගොල්ලන් දියුණු වෙනවා, සම්පූර්ණයෙන්ම විදේශ ආයෝජන මුල් කරගෙන. ඒ ගොල්ලන්ට චීනයෙන් විශාල වශයෙන් ආධාර ලැබෙනවා. ලෝක බැංකුවෙන් ආධාර ලැබෙනවා. ඉන්දියාවෙන් ආධාර ලැබෙනවා. ඒ අනුව ඒ ගොල්ලන්ගේ ආර්ථිකය අද ක්‍රම ක්‍රමයෙන් සංවර්ධනය වෙන මධ්‍යම ගණයේ ආර්ථිකයක් බවට පත් වෙමින් තිබෙනවා. එතකොට අප විසින් කළ යුත්තේ කුමක්ද කියන ප්‍රශ්නයට අපි මුහුණ දෙන්න ඕනෑ. අපේ ගම්මන්පිල මැතිතුමා පාසල් සමය ගැන කිව්වා. පුත්තුත් එක්ක ක්‍රිකට් ගහන්නේ කොහොමද කියලා කිව්වා. ඒවා ගැන කථා කළා. නමුත් ඒ සමයේ එක ලකුණක් තිබුණා.

ඉස්කෝලෙට ගියාම කියන්නේ, අපේ ආර්ථික භෝග මොනවාද, තේ, රබර්, පොල් කියලායි. රචනයක් ලියන්න කිව්වත් ලියන්නේ, තේ, රබර්, පොල් ගැන. නමුත් අද තේ, රබර්, පොල්වලින් රටක් දියුණු කරන්න බැහැ.

අද අපේ තේ කර්මාන්තය අර්බුදයකට මුහුණ දෙනවා. මට හිතෙන විධියට යන්තම් දේශීය නිෂ්පාදනවලට පමණක් දැන් අපේ රබර් නිෂ්පාදනය ප්‍රමාණවත්. පොල් පිට රටින් ගේන තත්ත්වයකට අද අපි පත් වෙලා තිබෙනවා. ඒවා ගැනම කථා කර කර හිටියොත් අපේ තේ ටික දියුණු කරන්නේ කොහොමද? අපේ පොල් ටික දියුණු කරන්නේ කොහොමද? අපේ රබර් ටික දියුණු කරන්නේ කොහොමද? තේ, පොල්, රබර් සම්බන්ධයෙන් අපට හොඳ ඉතිහාසයක් තිබුණා. ඉස්සර අපි චීනය එක්කත් ගනුදෙනු කළා. නමුත්, අද ඒ ආර්ථිකයෙන් අපට ඉදිරියට යන්න බැහැ. ඒක කවුරුත් දන්නවා. අපි ඒ දේවල් මතම යැපිලා හිටියොත්, ඉදිරියේදී අපට ප්‍රශ්න රාශියකට මුහුණපාන්න වනවා. මීට අදාළ වාර්තා අරගෙන බැලුවොත් අපට පෙනෙනවා, පසුගිය අවුරුද්දේ තේ කර්මාන්තය යන්තම් ටිකක් ඉදිරියට ගිහිල්ලා තිබෙන බව. ඒ වාගේම රබර් කර්මාන්තයත් ටිකක් ඉදිරියට ගිහිල්ලා තිබෙනවා. පොල් කර්මාන්තය නම්, පහත වැටිලා තිබෙනවා. ඒ ක්ෂේත්‍රය තුළින් අපට ඉදිරියට යන්න බැහැ.

අපි දැන් අපේ භූගෝලීය පිහිටීම මුල් කර ගෙන නව ක්ෂේත්‍රයකට යන්න ඕනෑ. ඒ අනුව කාර්මීකරණයට සහ නිපැයුම් ආර්ථිකයකට අපි යන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමාත්, මලික් සමරවික්‍රම ඇමතිතුමාත්, මාත් චීනයේ ජනාධිපතිතුමායි, අගමැතිතුමායි හම්බ වන්න ගියා. එතුමන්ලා අපට මොකක්ද කිව්වේ? එතුමන්ලා කිව්වේ "ඔයගොල්ලන්ට තේ, රබර්, පොල් ආර්ථිකයෙන් ඉදිරියට යන්න බැහැ. ඒ වාගේම සේවා ක්ෂේත්‍රයෙන් පමණක් ඉදිරියට යන්නත් බැහැ. මොකද, ඒක අවදානම් සහිත දියුණුවක්" කියලා. අපි සංචාරක ව්‍යාපාරය ගත්තත්, මූල්‍යමය වෙළෙහෙළඳාම් දිහා බැලුවත්, බැංකු ක්‍රමය දිහා බැලුවත් ඒවා ගොඩක්ම බැඳී තිබෙන්නේ ජාත්‍යන්තර තත්ත්වය අනුවයි. ජාත්‍යන්තර තත්ත්වය වෙනස් වන්න, වෙනස් වන්න ඒ සේවා ක්ෂේත්‍රයත් ඉක්මනින් වෙනස් වුණේ නැත්නම් ඒ ගොල්ලන් කඩා වැටෙනවා. නමුත්, කාර්මික භාණ්ඩවලට - කර්මාන්ත නිපැයුම්වලට- ලෝකයේ හැම දාම ඉල්ලුමක් තිබෙනවා. බලන්න, කොරියාව දියුණු වුණේ කොහොමද, ජපානය දියුණු වුණේ කොහොමද කියලා. යුද්ධයට පස්සේ ජපානය කාන්තාරයක් වුණා. අපි අමතක කරන්න හොඳ නැහැ, ලෝකය පරමාණු බෝම්බ දමා තිබෙන්නේ දෙසැරයයි කියලා. ඒ දෙවතාවේම දැම්මේ ජපානයටයි. එතකොට ජපානය එකම මිනී කනත්තක් බවට පත් වුණා. නමුත්, අද ලෝකයේම ඉහළම කර්මාන්ත තිබෙන රටක් වශයෙන් කර්මාන්තකරණයේ ඉහළම තත්ත්වයට ජපානය ඇවිල්ලා තිබෙනවා. අපේ මන්ත්‍රීවරු මේ කථාව අහලා පුදුම වෙයි. අපට නිදහස ලැබෙන කොට ආසියාවේ දියුණු වන්න හැකියාව තිබුණු රටවල් දෙකයි තිබුණේ. ඒ, ශ්‍රී ලංකාව සහ ජපානය. හැම දෙනාම කිව්වේ එහෙමයි. ඒ කාලයේ ලියන ලද පොත්පත්වල සඳහන් වන්නේත් එහෙමයි. අර්ථ ශාස්ත්‍රඥයෝ කිව්වේත් එහෙමයි. මාධ්‍යවේදීන් කිව්වේත් ඒකමයි. ඔක්කෝම කිව්වේ ඒක.

අද තත්ත්වය බලන්න. අද අපි කොහේද ඉන්නේ, ජපානය කොහේද ඉන්නේ? ජපානයේ සාර්ථකත්වයට බොහෝ දුරට හේතු වුණේ Meiji Restoration. මෙජී රජවරුන්ගේ කාලයේ ජපානය ඇමෙරිකාවත් එක්ක සම්බන්ධකම් ඇති කර ගෙන නව කර්මාන්ත ගෙනැල්ලා, නවීන විද්‍යා දැනුම ගෙනැල්ලා ලෝකයේ උසස්ම ජාතියක් බවට පත් වුණේ. ජපානය අන්තිමට යුද්ධයකින් රුසියාවත් පරාජය කළා. ඒ, ආසියානු රටක් බටහිර රටක් යටපත් කළ පළමුවෙනි වතාවයි. ඒ විධියට වෙනස් වන ලෝකයකට අපත් අනුගත වන්න ඕනෑ. එහෙම කරන්න අපට අවශ්‍ය ආයතන අපේ රටේ තිබෙනවා.

මලික් සමරවික්‍රම ඇමතිතුමා යටතේ BOI එක, EDB එක තිබෙනවා. ඓතිහාසික වශයෙන් ගත්තොත් ඒ ආයතන හුඟක් අසාර්ථකයි. ඉතිහාසය දිහා බැලුවාම -විශේෂයෙන් පසුගිය අවුරුදු 15, නැත්නම් 20 තුළ- අපේ රටට විදේශ විනිමය ගෙන ඒම පැත්තෙන් ඔවුන් බොහෝ අසාර්ථකයි. එක කාලයක - විශේෂයෙන්ම ඇඟලුම් කර්මාන්තය ගොඩ නැඟුණු යුගයේ - BOI එක හරහා හොඳ සාර්ථකත්වයක් අපට ලැබුණා.

ඇඟලුම් කර්මාන්තය සම්බන්ධයෙන් මේ රටේ ආයෝජනය කරන්න BOI එක ඒ කාලයේ කාර්යක්ෂම විධියට සම්බන්ධීකරණ කටයුතු කළා. බොහෝ අය මේ සම්බන්ධයෙන් විවේචන ඉදිරිපත් කළා. විරුද්ධ පක්ෂයෙන් විවේචනය කළා, "ජංගි මහනවා" කියලා. වෙන අය තියා ලලිත් ඇතුලත්මුදලි මහත්තයා තමයි ඔය කථාව පටන් ගත්තේ. ඒ, ප්‍රේමදාස මහත්තයාත් එක්ක තිබුණු තරහටයි. කොහොම නමුත්, අපේ ආර්ථිකයට විශාල ජවයක් දෙන්න එම ඇඟලුම් ක්ෂේත්‍රයට පුළුවන් වුණා. එක පැත්තකින් තාක්ෂණය ගෙනාවා; අනික් පැත්තෙන් විදේශ විනිමය ගෙනාවා; රැකියා සැපයුවා. ඒ වාගේම කර්මාන්ත කරන හොඳ රටක් හැටියට ලංකාවට නමක් ආවා.

ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති ඒ කාලයේ BOI එක ඉතා හොඳට ක්‍රියාත්මක කළ ආකාරය. BOI was a “one- stop shop”. ආයෝජකයෙක් ඇවිත්, "මම මෙතැන කර්මාන්තශාලාවක් දමනවා." කියලා BOI එකට කිව්වොත්, විදුලිබල මණ්ඩලයෙන් සතියක් ඇතුළත එතැනට විදුලිය අරගෙන දෙන්න BOI එකට පුළුවන් වුණා. ඒ ගොල්ලන්ට පාරවල් හදා දෙන්න පුළුවන් වුණා; දුරකථන පහසුකම් සලසා දෙන්න පුළුවන් වුණා. ඉස්සර සමහර තැන්වල තිබුණු රජයේ ගොඩනැඟිලි පැය 24ක් ඇතුළත භාර දෙන්න ඒ ගොල්ලන්ට පුළුවන් වුණා. දැන් පැය 24ක් නොවෙයි, අඩු ගණනේ මාස 24කින්වත් ඒ ගොල්ලන්ට ඒ කාර්යය කරන්න බැහැ. ඇයි ඒ? බොහොම දක්ෂ, හැකියාවන් තිබෙන, කාර්යශූර උදවිය 100ක්, 200ක් විතර එදා එම ආයතනයේ වැඩ කළා. අද ඒක නිකම් රැකියා පොළක් පමණයි. දක්ෂද කියලා බලන්නේ නැතිව නොදක්ෂ හැම එක්කෙනාම බඳවා ගැනීම නිසා අද එහි කාර්යක්ෂමතාව නැති වෙලා තිබෙනවා. ඒ සියල්ලටමත් වඩා අර අනික් දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය කරන්න තිබෙන ශක්තිය අද එම ආයතනයේ හීන වෙලා තිබෙනවා. "මේක කරන්න." කියලා විදුලිබල මණ්ඩලයට කිව්වාට අද ඒ ගොල්ලෝ ඒක අහන්නේ නැහැ. එහෙම නේද, ගරු ඇමතිතුමනි? අද කෙළින්ම ඒ ආයෝජකයා ගිහින් විදුලිබල මණ්ඩලයේ කැරකෙන්න ඕනෑ. නැත්නම් ජල සම්පාදන මණ්ඩලයට ගිහින් කැරකෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඉඩම ගන්න අවුරුදු ගණන් බලාගෙන ඉන්න ඕනෑ.

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

ගරු ඇමතිතුමනි, ඔබතුමා මගේ මිත්‍රයෙක් වුණත් මම මේ කාරණය අහන්න කැමැතියි. BOI එක අද ආයෝජකයකුට නිදහස් කර දීලා තිබෙන්නේ කොයි ඉඩමද? මම නම් ඒ කිසිම දෙයක් දන්නේ නැහැ. ඉස්සර අප එහෙම කර තිබෙනවා. මම BOI එක භාර ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ Kandy City Centre එක BOI zone එකක් කළා; එය ගැසට් කළා. දැන් ඔබතුමාත් බෝගම්බර ප්‍රදේශය zone එකක් කරන්න ගැසට් කර තිබෙනවා. එහෙම අලුත් විධියට; නිර්මාණශීලීව කල්පනා කරලා වැඩ කරන්න ඕනෑ. දැන් මොකද කර තිබෙන්නේ? ඇත්තම කියනවා නම්, ආයෝජකයකුට අද හරි අමාරුයි තමන්ගේ වැඩ කරගන්න. නීති රීති විශාල වශයෙන් දමා තිබෙනවා. හැම එක්කෙනා ළඟටම ගිහින් ඔළුව නමාගෙන බලපත්‍රය ඉල්ලන්න වෙලා තිබෙනවා. මේ ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න ඕනෑය කියන එකයි මගේ අදහස වන්නේ. ආයෝජනය ගෙනෙන්න ඕනෑ නම් ඒ ව්‍යුහය අප වෙනස් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වියට්නාමයේ "UNCTAD Compendium of Investment Laws" කියන ලේඛනය මට ලැබුණා. ඒ ගැන මම බොහොම සන්තෝෂ වෙනවා. මෙවන් තොරතුරු ඇත්ත වශයෙන්ම අප සභාගත කරන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. "අරක නැහැ. මේක නැහැ. ඇයි මෙච්චර දෙන්නේ. අර ගොල්ලන්ගෙන් එක එක වාසි අරගෙන මේවා දුන්නා." කියලා හුඟ දෙනෙක් මේ ගරු සභාවේදී නොයෙක් විධියේ චෝදනා කරනවා. මාසයකට එවැනි චෝදනා දෙක තුනක් මේ ගරු සභාවේදී ඉදිරිපත් කරනවා. නමුත් ඔබතුමන්ලා මේ ලේඛනය බලන්න. "නීති රීති බොහොම ලිහිල් වැඩියි. පිට රටියන්ට මේවා දෙනවා. සුද්දන්ට දුන්නා." කියා හුඟ දෙනෙක් චෝදනා කරනවා. මේ ළඟදිත් එහෙම කියනවා මට ඇහුණා. "අරක දුන්නා. මේක දුන්නා." කියා විශාල ලෙස විවේචනාත්මකව මෙතැන කථා කරනවා. හැම දාම දුටුගැමුණු-එළාර යුද්ධය කරනවා වාගෙයි මේ පාර්ලිමේන්තුවේ. නමුත් අද වියට්නාමය ආයෝජකයන්ට දීලා තිබෙන පහසුකම් මොනවාද කියා ඔබතුමන්ලා කියවලා බලන්න. මේවා ගැන උනන්දු වෙන අපේ හොඳ තරුණ මන්ත්‍රීවරු ඉන්නවා.

විශේෂයෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ඩී.වී. චානක මන්ත්‍රීතුමාට මම ප්‍රසිද්ධියේම මේ කාරණය කියන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා බොහොම හොඳයි. හම්බන්තොට වරාය ගැන එතුමා මගෙන් ඇහුවා. එතුමාගේත් හොඳ අදහස් තිබුණා. එතුමාගේ පියතුමාත් මගේ හොඳ යාළුවෙක්. ඔබතුමන්ලා මේවා බලන්න. කවුරු හෝ කිව්ව පළියටම අප ඒ දේවල්වලට එකඟ වෙන්න ඕනෑ නැහැ.

මෙම ලේඛනයට කියන්නේ, "Viet Nam Law on Investment (2014)" කියායි. මම හිතන විධියට දැන් නම් මීටත් වඩා පහසුකම් දීලා ඇති. මේ පහසුකම් දීලා තිබෙන්නේ 2014 කාලයේ නේ. මොකක්ද ඒ ගොල්ලෝ කියන්නේ? ඒ අය කියනවා, "Foreign investors shall buy shares or capital contributions of business organization in the following manners". කිසිම සීමාවක් නැහැ, විදේශිකයන්ට කොටස් ගන්න පුළුවන්. ඒ අනුව, "a. Buy shares of jointstock companies from the companies or their shareholders;…".

ඒ රටේ කොම්පැනියක් තිබෙනවා නම්, ඒකේ හිමිකාර කොටස්කාරයෝ ඉන්නවා නම්, ඒ ගොල්ලන්ට ගිහිල්ලා ගන්න පුළුවන්; විදේශීය කොම්පැනියකට ගිහිල්ලා ඒවා ගන්න පුළුවන්.

ඊළඟට බලන්න, " b. Buy capital contributions to limited liability companies by their members and become members of limited liability companies…". ඒ ගොල්ලන්ට පෞද්ගලික කොම්පැනිවලට විතරක් නොවෙයි, register කරපු limited liability companiesවලට ගිහිල්ලා කොටස් ගන්නත් පුළුවන්. අවශ්‍ය නම් කොම්පැනිය පිටින්ම ගන්නත් පුළුවන්. ඊළඟට බලන්න, "c. Buy capital contributions to partnerships by partners and become partners…". ඒ කියන්නේ, සහෝදර සමාගම් වාගේ සමාගම් තිබෙනවානේ. ඒවායිනුත් legal විධියට කොටස් ගන්න පුළුවන්. Partnersලා එකතුවෙලා පවත්වාගෙන යන නෛතික කොම්පැනි තිබෙනවා. දෙන්නෙක්, තුන්දෙනෙක් එකතුවෙලා, medical partnersලා වෙන්නත් පුළුවන්, ඒ ගොල්ලන්ට ගිහිල්ලා ඒවා ගන්න පුළුවන්. ලංකාවේ ඒ විධියට කරන්න තිබුණා නම්, මේ සභාවේ මැරෙන්න හදයි.

ඊළඟ එක බලමු, "d. Buy capital contributions to business organizations other than those mentioned in Points a, b, and c of this Clause ....". ඕනෑම business එකකින් ගන්න පුළුවන්. වියට්නාමයට වඩා කොමියුනිස්ට්වාදී මිනිස්සු, රතු මිනිස්සු මේ රටේ ඉන්නවාද? බෝම්බයක් තියා රතිඤ්ඤා කරලකටවත් අපේ කොමියුනිස්ට්කාරයෝ මුහුණ දීලා නැහැ. ළඟ රතිඤ්ඤා කරලක් පත්තු කළොත් දුවලා පැනලා යනවා. ඊට පස්සේ ඇවිල්ලා මෙතැන කෑ ගහනවා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා නම් වාඩිවෙලා ඉන්නවා.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
නැහැ, නැහැ, එතුමා නොවෙයි. එතුමා මගේ මිත්‍රයා. එතුමා ගැන මම එහෙම හිතන්නේ නැහැ. මම හිතන්නේ එතුමාගේ සහෝදරයෝ ගැනයි. හැබැයි, එක කාරණයක් තිබෙනවා. ලංකා සමසමාජ පක්ෂයේයි, කොමියුනිස්ට් පක්ෂයේයි ඉන්නේ මේවා ටිකක් කියවලා බලපු මිනිස්සු. මේවා ගැන ටිකක් දන්නවා. තව කට්ටියක් ඉන්නවා, මේවා ගැන කිසිම දෙයක් බලන්නේ නැහැ. අපි අහගෙන හිටියානේ ඉස්සෙල්ලා කරපු කථාව. ගම්මන්පිල මහත්මයා -එතුමා මගේ යාළුවෙක්- මොකක්ද ඒ කරපු කථාව? අපේ කාලයෙන් පැය භාගයක් අරගෙන මොනවාද කිව්වේ? එතුමා කියපු හැම වචනයම වැරැදියි. කලාතුරකින් තමයි මේ සභාව තුළ අපට එවැනි කථාවක් අහන්න වෙන්නේ. කියපු හැම වචනයක්ම බොරු වෙන්න කථා කරන්න පුළුවන්ද? සාමාන්‍යයෙන් ඒක අමාරුයි. ඒක දුෂ්කර දෙයක්. කට ඇරපු ගමන් ඔක්කෝම බොරු කියන්න විශාල ව්‍යායාමයක් කරන්න ඕනෑ. එතුමා ඒ ව්‍යායාමය ඉතාම දක්ෂ ලෙස කළා. එහෙම නොවෙයිනේ. මේවා ගැන සොයා බලන්න ඕනෑනේ. වෙන රටවල් කොහොමද කරන්නේ කියලා සොයා බලන්න ඕනෑනේ. අද බලන්න, වියට්නාමයට කොච්චර සල්ලි එනවාද? ඒ මිනිස්සු අද කොච්චර දියුණු වෙලාද? කරුණාකරලා ඒවා දිහා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා. ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමාට මම මේ පොතේ පිටපතක් දෙන්නම්. මෙතුමා පිට රට ගිහිල්ලා හොඳට ඉගෙන ගත්ත තරුණ මන්ත්‍රීවරයෙක්. ළඟ පාත ඉන්න අයටත් ටිකක් උගන්වන්න.

මේකේ තවදුරටත් තිබෙනවා, "Foreign investors may own an indefinite amount of charter capital invested in business organizations, ….". මොකක්ද ඒ කියන්නේ? ඒ කියන්නේ ඒ ගොල්ලන්ට සල්ලි ගෙනැල්ලා කොම්පැනි ගන්න පුළුවන්. අපි කොච්චර නීති දාලා තිබෙනවාද? ඒ නීති දිහා බලපුවාම එක අතකින් පුදුමයි. මොකද, අපේ රටට මෙච්චර මිනිස්සු ඇවිල්ලා මුදල් ආයෝජනය කරනවා.

අපි ඇත්ත කථා කරන්න ඕනෑ නේද මගේ හිතවත් ගරු විමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි. අද ලෝකය ගැන අපි ටිකක් සොයා බලන්න ඕනෑ. මේ ගරු සභාව අලුත් දැනුම ගෙනෙන සභාවක් වෙන්න ඕනෑනේ. විශේෂයෙන්ම අපේ තරුණ මන්ත්‍රීවරු ගැන අපි හරි ආඩම්බරයි. ඒ අය ඉගෙන ගන්න කැමැතියි. ඇවිල්ලා අපෙන් අහනවා. ඒ වාගේ තත්ත්වයක් අපි මේ රටේ ඇති කරන්න ඕනෑ. මේ සභාව ප්‍රබුද්ධ සභාවක් වෙන්න ඕනෑ. එතකොටනේ අපට මේ රට ඉදිරියට ගෙනයන්න පුළුවන් වෙන්නේ. මේ පාර්ලිමේන්තු ක්‍රමය හොඳ ලකුණක් තමයි. සමහර විට ඒක අපට ටිකක් අපහසු තත්ත්වයක් වුණත්, වරදක් තිබෙනවා නම් අපට ඒක පිළිඅරගෙන කටයුතු කරන්න තරම් මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායට අපේ පක්ෂපාතිකමක් තිබෙන්නට ඕනෑ.

දැන් මම තවත් කාරණයක් කියන්න ඕනෑ. මේ ලෝකයේ අද තිබෙන්නේ ඉතාම අමාරු තත්ත්වයක්. එක කාරණයක් අපි කියන්න ඕනෑ. අනෙක් මන්ත්‍රීවරුන්ගේ කථාවලිනුත් කියැවුණේ නැහැ, මේ රටේ රුපියලේ අගය රඳා පවතින්නේ අපේ තිබෙන විදේශ විනිමය සංචිතය මත බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සවුදි අරාබිය වාගේ මැද පෙරදිග රටවලට සල්ලි ගලා ගෙන එනකොට, ඒ ගොල්ලන්ගේ මුදලේ අගය -කාසියක් වෙන්න පුළුවන්, මුදල් නෝට්ටුවක් වෙන්න පුළුවන්, එහි අගය - අපේ වගේ උච්චාවචනය වෙන්නේ නැහැ. විදේශ විනිමය අඩු වෙන්න, අඩුවෙන්න අපේ රුපියලේ අගය පහළ යනවා. මොකද මිනිස්සු දන්නවා, අපේ රුපියල පසුපසින් විශාල මුදල් සංචිතයක් නැහැ කියලා. විශාල මුදල් සංචිතයක් තිබෙනවා නම්, මිනිසුන් භය නැතිව ණය දෙනවා; ඒ රුපියලත් එක්ක ගනුදෙනු කරනවා. ඒ ආයෝජනය කරන මිනිසුන්; ගනුදෙනු කරන මිනිසුන් දන්නවා, "මේ රටේ විශාල ධනස්කන්ධයක් තිබෙනවා. අපට භය නැතිව කටයුතු කරන්න පුළුවන්" කියලා. ඒකට හොඳම නිදසුන තමයි ඇමෙරිකාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, ඇමෙරිකාවෙත් ලොකු budgetary gap එකක් තිබෙනවා කියලා. ඒ ගොල්ලන් දේශීය වශයෙන් හම්බ කරන මුදලයි වියදම් කරන ප්‍රමාණයයි අතර ලොකු වෙනසක් තිබෙනවා. ඒ ගොල්ලන් හම්බ කරන ප්‍රමාණයට වඩා ඒ ගොල්ලන්ගේ ආර්ථිකයේ හැටියට දෙගුණයක් වියදම් කරනවා. ඒක තමයි ඇමෙරිකන්කාරයෝ "Never had it so good feel-good factor" කියලා කියන්නේ. හම්බ කරපු නැති සල්ලිවලින් ඒ ගොල්ලන් කාර් දෙකක් ගන්නවා; ගෙවල් දෙකක් ගන්නවා. ඔවුන් ඒ සංස්කෘතියට යනවා. ඒ යන්නේ කොහොමද? ඩොලර් එකෙන්, ජාත්‍යන්තර අරමුදලකින්. ඒකට කියන්නේ, reserve currency of the world කියලා.

ලෝකයේම මිනිසුන්ගේ -අපේ මුදල් පවා,- මුදල් ඇමෙරිකන් බැංකුවල තිබෙනවා කියලා තමුන්නාන්සේලා දන්නවාද? ඒ වාගේම චීන මුදල් ට්‍රිලියන ගණනක් American bondsවලට යට කරලා තිබෙනවා. ඉතින් ඒ වාගේ විශාල මුදල් සංචිතයක් තිබෙන කොට ඒ ගොල්ලන්ට ඕනෑ විධියට ඒ ගොල්ලන්ගේ ඩොලර් එකේ අගය වෙනස් කර ගන්න පුළුවන්.

දැන් වෙලා තිබෙන දේ බලන්න. ඇමෙරිකාවට කාලයක් අර්බුදයක් තිබුණා. සංවර්ධනය කරන්න බැරි වුණා; බැංකු කඩා ගෙන වැටුණා. ඒ කාලයේ ඔබාමා මොකක්ද කළේ? එතුමා ඇමෙරිකාව තුළ දෙන ණයට ගන්නා පොලී ප්‍රමාණය අඩු කළා. මොකද, එසේ අඩු කළාම American business කාරයන්ට, පොඩි මිනිසුන්ට බැංකුවලින් ණය අරගෙන ආර්ථිකයට ආයෝජනය - invest- කරන්න පුළුවන්. ඒක කළා. දැන් ඇමෙරිකන් ආර්ථිකය ඉහළට නැඟ ගෙන එනවා. වැඩිපුර රැකියා දෙනවා. ඒ වාගේම වෙළෙඳ ශේෂය ඒ ගොල්ලන්ගේ පැත්තට හැරිගෙන එනවා. දැන් ඒ ගොල්ලන් කරලා තිබෙන්නේ මොකක්ද? දැන් ඇමෙරිකාව හදන්නේ ඩොලර් එකට දෙන පොලිය වැඩි කරන්න. ඉස්සර ඒ ගොල්ලන්ගේ ඩොලර් එකට දෙන පොලිය අඩු වෙනකොට, ඒ රටවල් පිටරටවලට යනවා. මොකද, පසුගිය මහින්ද රාජපක්ෂ රජය කාලයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අපට ලැබුණු මුදල් ප්‍රමාණයට වඩා මුදල් ඇමෙරිකන් කොම්පැනියකින් අපට ලැබුණා. මෙතැන ඉඳන් "මේ ගොල්ලන් ඇමෙරිකන් පන්දම්කාරයන්" කියලා කෑ ගැහුවාට, බැන්නාට ඇත්ත කථාව මොකක්ද?

මහින්ද රාජපක්ෂ රජය සම්පූර්ණයෙන්ම වාර්ෂිකව Templeton Fund එකෙන් ඇමෙරිකන් ඩොලර් බිලියනයක් ණයට ගත්තා. අවුරුදු තුනකට වෙන්න ඇති. කොහොම හරි අවසානයේදී රුපියල් බිලියන 3ක් Templeton Fund එකෙන් ලංකාවට ගෙනැත් දැම්මා. මොකද, අපි ඩොලර් එකට ගෙවන පොලිය, ඇමෙරිකන් රටේ ඒ ගොල්ලන්ට ගන්න පුළුවන් පොලියට වැඩියි. ඒ නිසා ඔය pension funds, ඒ වාගේම තිබෙන මුදල් සංචිත රටින් රටට යනවා. ඒවා නිකම් පා වෙනවා. කොහේ හරි වැඩි පොලියක් දෙනවා නම් ඒ කියන්නේ, ආර්ථිකය ස්ථාවර වෙන්න ඕනෑ. - කඩා වැටෙන ආර්ථිකයක් නොවෙයි.- සාමාන්‍ය ස්ථාවර ආර්ථිකයක් නම්, ඒ ගොල්ලන් වැඩි පොලියක් දෙනවා නම් එතැනට ගිහිල්ලා සල්ලි park කරනවා. එතැන ගිහිල්ලා කාර් එක නවත්වනවා. ඇමෙරිකාව දැන් ආර්ථිකයේ හොඳ තැනකට ඇවිල්ලා තිබෙනවා. ඒ ගොල්ලන් දැන් ටිකෙන් ටික, ටිකෙන් ටික ඩොලර් එකට දෙන පොලිය වැඩි කරනවා. මම ඒ කාලයේ ලංකාව වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගියා. දැන්, මේ මහ බැංකු ලොක්කා ගැන සියල්ලෝම කථා කරනවා නේ.

එහේ මහ බැංකු ලොක්කා නම් ටික කාලයකින් ගියේ නැහැයි කියලා මා කියන්න ඕනෑ. එතුමා දිගටම සිටියා. මාස ගණනකින් ඒ ලොක්කා ගියේ නැහැ. නමුත් Mrs. Yellen මොනවාද කිව්වේ? "අපි එක විටම පොලිය ඉහළට දැම්මොත් ලංකාව වැනි පොඩි පොඩි රටවල තිබෙන සල්ලි ඔක්කොම ආපසු ගලාගෙන එනවා. ඒ නිසා අපි ඒ ගොල්ලන්ට කල් දීලා, හෙමින් හෙමින්, හෙමින් හෙමින් මේ පොලිය ඉහළට නග්ගමු"යි කියලායි කිව්වේ. එහෙම නේද, මලික් සමරවික්‍රම ඇමතිතුමනි? දැන් ඒ ගොල්ලෝ එක්තරා මට්ටමකට ඇවිත් ඉන්නවා. එතකොට ආයෝජනය කරන මිනිස්සු දැන් බලන්නේ, "මොකටද, මේ රටවලට යන්නේ? අපි ගිහින් ඇමෙරිකන් බැංකුවල සල්ලි park කරමු. අපි ගිහින් Federal Reserve එකේ සල්ලි park කරමු. එතකොට අපට ගෙදර ඉඳගෙන පොලියක් ගන්න පුළුවන්" කියලායි. අපේ රටේත් එක කාලයක එහෙම තිබුණු බව මට මතකයි.

මා හිතන හැටියට අපේ විමල් රාජපක්ෂ හිටපු කථානායකතුමාට මතක ඇති, අමාරු කාලයක සියයට 17ක, සියයට 18ක, සියයට 20ක පොලියක් දුන්නාය කියලා. ඒ කාලයේ එහෙම දුන්නාම මිනිස්සු කිසි වැඩක් කරන්නේ නැහැ, බැංකුවේ මුදල් තැන්පත් කරලා ඒ පොලිය ලබා ගන්නවා. මොකද, වෙළෙඳාමක් කරලා කවදාවත් හැම අවුරුද්දේම සියයට 20ක පොලියක් ගන්න බැහැ නේ. ඒ නිසා අර්ථ ශාස්ත්‍රය දන්නා මිනිස්සු බැංකුවක මුදල් තැන්පත් කරලා නිකම් සිටියා. එවැනි තත්ත්වයක් දැන් ඇමෙරිකාවේ ඇති වනවා. දැන් ඇමෙරිකාවට සල්ලි ගලාගෙන යනවා. Templeton Fund එක දැන් අපට නැහැ නේ. එහි මුදල් සියල්ලම අරගෙන ගියා. එතකොට අපට වෙන වෙන bondsවලට යන්න වෙනවා, IMF එකෙන් ණයට සල්ලි ගන්න වෙනවා. හැබැයි ඒවා සියල්ල තාවකාලික පැලැස්තර. ඊට වඩා ගොඩක් හොඳයි, අපේ භාණ්ඩ විකුණා අපට ආදායමක් ගන්න පුළුවන් නම්.

දැන් බලන්නකෝ, අපේ ඇඟලුම් කර්මාන්තය නොතිබෙන්න අද අපි කොහේද ඉන්නේ කියලා. අද මේ රටට වැඩිම විදේශ විනිමයක් ලැබෙන්නේ මේ රටේ කම්කරුවන් පිට රටවලට ගිහින්

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

වැඩ කිරීමෙන් ලැබෙන ආදායමෙනුයි. UAE එකේ විදේශ ඇමති සෙයිඩ් අල් අබ්දුල්ලා මහතා පෙරේදා අපේ රටට ආවා. එතුමා ගරු ජනාධිපතිතුමාත් හමු වුණා; ගරු අගමැතිතුමාත් හමු වුණා. එතුමා කියනවා, දැන් අපේ ලාංකිකයන් 1,25,000ක් UAE එකේ වැඩ කරනවාය; සවුදි අරාබියේ 2,50,000ක් රක්ෂාව කරනවාය කියලා. සමස්තයක් වශයෙන් අපේ ලාංකිකයන් ලක්ෂ 15ක් පිට රටවල සේවය කරනවා. ඒ ගොල්ලෝ එවන සල්ලි තමයි විදේශ විනිමය වශයෙන් අංක 1ට ලැබෙන්නේ. අංක 2ට, එහෙම නැත්නම් අංක 3ට විදේශ විනිමය වශයෙන් ලැබෙන්නේ ඇඟලුම් කර්මාන්තයෙන් ලැබෙන ආදායමයි. මා හිතන හැටියට තේ කර්මාන්තයෙන් ලැබෙන ආදායමට වඩා වැඩි ආදායමක් ඇඟලුම් කර්මාන්තයෙන් ලැබෙනවා. එහෙම නේද, මලික් සමරවික්‍රම ඇමතිතුමනි? ඇඟලුම් කර්මාන්තයෙන් ඩොලර් බිලියන 5ක් ලැබෙනවා. එහෙම නැත්නම් අද අපි ඉතා දුප්පත් රටක් බවට පත්වනවා. එතකොට අපේ රුපියල කඩා වැටෙනවා නේ.

දැන් මේ හැම දෙයම අපි කරන්නේ, රුපියලේ ස්ථාවරභාවය තබා ගන්නයි. රුපියලේ ස්ථාවරභාවය තබා ගන්නේ නැතුව, තරගකාරි රුපියලක් හදා ගන්නේ නැතුව, මිනිසුන්ට කොපමණ ආරාධනා කළත්, බුලත් දුන්නත් මේ රටේ ආයෝජනය කරන්න එන්නේ නැහැ. මොකද, ඒ ගොල්ලෝ යම්කිසි මුදලක් යොදවා, එහි වටිනාකම කඩාගෙන වැටුණොත්, එයින් ලැබෙන වාසිය වාෂ්පවෙලා යනවා. අපේ විදේශ විනිමය සංචිතය, අපි පිට රටවලින් හම්බ කරන සල්ලි අනුව තමයි ඒ රුපියලේ අගය අපට රැක ගන්න පුළුවන් වන්නේ. එහෙම කරන එක ඉතාම අවශ්‍යයි.

දැන් බලන්න, අපේ නිෂ්පාදන වියදම් ගැන. අපේ කර්මාන්ත තත්ත්වය අනුව අපට බොහෝ විට ඒ සඳහා අවශ්‍ය උපකරණ පිට රටවලින් ගෙනෙන්න වෙනවා. එතකොට අපේ රුපියල බාල්දුවෙලා තිබෙනවා නම්, අපේ කර්මාන්ත යන්ත්‍රණය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය භාණ්ඩ ගෙනෙන්නත් අපට බැරි තත්ත්වයක් ඇති වනවා.

අවසාන වශයෙන්, මේ ක්ෂේත්‍රය ගැන මා කියන්නම්. මෙය අපේ ජීවිතයත්, මරණයත් අතර සටනක්. ඒ කාලයේ යුරෝපය කිව්වේ, “Export or perish “ කියලායි. ඒ කියන්නේ, "එක්කෝ වෙළෙඳාම් කරපන්, නැත්නම් මැරිලා පලයන්" කියලායි. ඒක තමයි ඒ ගොල්ලන්ගේ තිබුණු සටන් පාඨය, -slogan එක- වන්නේ. අදත් ඒ ගොල්ලෝ කියන්නේ ඒකයි. අද චීනය මොකක්ද කියන්නේ? චීනයට කොපමණ අවනම්බු කළත් ඒ ගොල්ලෝ ගණන් ගන්නේ නැහැ. "අපි මේ වෙළෙඳාම කරන්න ඕනෑ"යි කියලායි ඒ ගොල්ලෝ කියන්නේ. ඒ වෙළෙඳාම අපට කරන්න පුළුවන්. එය අහසින් කඩාගෙන වැටෙන එකක් නොවෙයි. ඒකට අපේ රටේ පිහිටීම -location - ඉතාමත් වැදගත් වනවා. මම කවදාවත් මහින්ද රාජපක්ෂ රජයට වැරැදි කියන්නේ නැහැ, වරායක් හැදුවාට. මම කවදාවත් මහින්ද රාජපක්ෂ රජයට වරදක් කියන්නේ නැහැ, යටිතල පහසුකම්වලට ආයෝජනය කළාට. ඒවා කරන්න අවශ්‍යයි.

අපේ ලංකාව දුපත් රටක්. අපේ වරායන් අංක 01ට ගේන්න ඕනෑ. අපි නිෂ්පාදන ධාරිතාව වැඩි කරන්නට ඕනෑ. දැන් බලන්න අද මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. අපේ වරායට එන නැවක් CICT එකට ගියොත් ඒ භාණ්ඩ ගොඩ බෑම එක දවසින් කරනවා. නමුත් Jaya Container Terminal එකට ඇවොත් දවස් දෙක තුනක් යනවා. එතකොට මේක කරන්නේ කොහොමද? අපේ රාජ්‍ය ආයතන ඕනෑ විධියට නිවාඩු දාන්න, ඕනෑ විධියට strike කරන්න, ඕනෑ විධියට අඩුවෙන් වැඩ කරන්න පටන් ගත්තොත් අපට තරග කරන්න බැරි වෙනවා. ඒක නිසා තමයි හම්බන්තොට වරාය හැදුවේ. ඔබතුමන්ලා ඔහොම කිව්වාට තව අවුරුදු දෙකක් තුනක් යනකොට හම්බන්තොට වරාය ලෝකයේ දියුණුම නැව් තොටුපොළක් බවට පත්වෙනවා. මම බොරුවට නොවෙයි කියන්නේ. හෙට යන්න CICT එකට, මෙතැන ඉඳන් හැකැක්ම ගාණයි තිබෙන්නේ. අපේ CICT- Colombo International Container Terminals - එක කියන්නේ ලෝකයේ හොඳම නැව් තොටුපොළවල් 10 අතරට ඇවිල්ලා කප් ගහපු එකක්. ඉතින් තමුන්නාන්සේලා ගත්ත ඒ තීරණය වැරදිද? තමුන්නාන්සේලා මේක චීන්නුන්ට දෙන්න ගත්තේ හරි තීරණයක්. ඒක එවකට සිටි චමල් රාජපක්ෂ ඇමතිතුමා ගත්ත තීරණයක්. ඉතින් ඇයි මේ දෙබිඩි කථා? මම කියන්නේ මේක හොඳ වැඩක් කියලා. චීන්නු බැරි නම් ග්‍රහ ලෝකයකින් හරි ගෙනැල්ලා මේවා දීලා, ක්‍රියාශීලී කරලා රටට ධනය ගේන උල්පත් කරන්නට ඕනෑ. ඒ තුළින් කී දෙනෙකුට රක්ෂාවල් දෙන්නට පුළුවන්ද?

හම්බන්තොට වරාය දියුණු වෙනකොට, අපේ ගරු නවක මන්ත්‍රීවරුන් දෙවෙනි, තුන්වෙනි, හතරවෙනි වාරවල පාර්ලිමේන්තුවට එනවිට පෙනෙයි ඒ තුළින් ගමේ මිනිසුන්ට රක්ෂා දෙන හැටි. [බාධා කිරීමක්] ඔව්, ඒක තමයි. අපේ ගරු චමල් රාජපක්ෂ මැතිතුමා කියනවා වාගේ හම්බන්තොට වරායත් හොඳ නිෂ්පාදන ධාරිතාවකට ගේන්නට ඕනෑ. ඒක කරන්න පුළුවන්; හැකියාවත් තිබෙනවා. ඒක විතරක් නොවෙයි ත්‍රිකුණාමලය වරාය තිබෙනවා, කොළඹ Harbour එක තිබෙනවා. අද අපට තිබෙන්නේ කවුද මේකට සල්ලි ගේන්නේ, චීනයෙන් ආපු මිනිස්සුද, රුසියාවෙන් ආපු මිනිස්සුද, ඉන්දියාවෙන් ආපු මිනිස්සුද, ඇමෙරිකාවෙන් ආපු මිනිස්සුද, කොරියාවෙන් ආපු මිනිස්සුද කිය කියා මේ ගරු සභාවේ හෙට්ටු කර කර ඉන්න එක නොවෙයි. මේ කවුරු ආවත් සල්ලි ගේන්නට ඕනෑ; මේ කර්මාන්තය හරියට දියුණු කරන්නට ඕනෑ. එහෙම නේද ගරු ඇමතිතුමා? කර්මාන්ත දියුණු කරලා මේ රටට ආදායම ගේන්නට ඕනෑ. සමහර අය යාළුයි කියලා ආවාට වැඩක් කර ගන්න බැරි නම්, මේ වෙලාවේ අපට වැඩක් නැහැනේ.

මේ ආයෝජන පිළිබඳව අපි දෙගොල්ලන් කථා කරන්නට ඕනෑ. අපේ ගරු චමල් රාජපක්ෂ මැතිතුමා වාගේ හොඳ වැදගත්, රටට ආදරේ කරන මන්ත්‍රීවරුන් සමඟ අපි කථා කරන්නට ඕනෑ. මම දන්නවා එතුමා හම්බන්තොට නැව් තෙටුපොළ සහ කොළඹ නැව් තොටුපොළ සම්බන්ධව විශාල සේවයක් කළ බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයෙන් මෙගාවොට් 900ක විදුලියක් ලබා දෙනවා. කොයි තරම් අඩු පාඩුකම් තිබුණත් නොරොච්චෝලේ බලාගාරය නැත්නම් අද අපට මේ සභාවේත් විදුලිය නැහැ. එම නිසා අර ආණ්ඩුව කළාද, මේ ආණ්ඩුව කළාද කියන එක සොයා බලන්නේ නැතිව අපි සියලුදෙනාම එකතු වෙලා මේ ආයෝජන ව්‍යාපෘතිවලට උදවු කරන්නට ඕනෑ.

මම තවත් කාරණයක් කියන්නම්. බොහෝ දුරට මේ ආයෝජනවල මූලික සැලසුම් හැදුවේ පසු ගිය රජය කාලයේ. East Container Terminal එක සහ West Container Terminal එක සැලසුම් කළේ ඒ කාලයේනේ. නැව් තොටුපොළවල් හදන්නට කථා කළේ ඒ කාලයේනේ. අහස් යාත්‍රා තොටුපොළ හැදුවේ ඒ කාලයේනේ. දැන් වියට්නාමය ගත්තොත් චීනය ගත්තොත් විවිධ මත තිබෙනවා; දේශපාලන ප්‍රශ්න තිබෙන්නට පුළුවන්. නමුත් රටට ආයෝජනය ගෙන ඒමේදී අපි එක මහක යන්නට ඕනෑ. පුංචි පුංචි points - petty differences- අල්ලාගෙන මේවාට අකුල් හෙළීමෙන් කාටවත් හොඳක් නොවන බව ප්‍රකාශ කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට මාගේ ස්තුතිය ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**[අ.භා. 3.47]**

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
*(மாண்புமிகு சந்திரசிறி கஜதீர)*
(The Hon. Chandrasiri Gajadeera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආර්ථික ගමන් මග ගැන ඉතාම ශාස්ත්‍රීය විග්‍රහයක් කරපු අපේ ගරු සරත් අමුණුගම ඇමතිතුමාගේ කථාවෙන් පස්සේ වචන කිහිපයක් කථා කිරීමට ලැබීම ගැන මා සන්තෝෂ වනවා.

මා පළමුවෙන්ම කියන්න ඕනෑ, කොමියුනිස්ට්කාරයෝ කියන්නේ දුප්පත්කම සමව බෙදා ගන්න කොටසක් නොවෙයි, ලෝක තත්ත්වයන් එක්ක රටේ ගමන් මග ඉදිරියට ගෙන යන්න, රටේ ජාතික ආර්ථිකය වාගේම දේශීය ව්‍යාපාරිකයා සහ එහි ප්‍රතිලාභ ලබන සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය වර්ධනය කරමින්, සමෘද්ධිමත් රටක් වෙනුවෙන් කටයුතු කරන කොටසක් බව. මා මේවා කියන්න නොවෙයි හිටියේ. ඒ වුණත් ගරු සරත් අමුණුගම ඇමතිතුමාගේ කථාව තුළ මතු වුණු කාරණා එක්ක මේ කාරණා කියන්න කැමැතියි. මේක දේශපාලන කථාවක් වෙච්ච දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාර් අධිරාජ්‍යය පරාජය කරපු ශ්‍රේෂ්ඨ වී.අයි. ලෙනින් මැතිතුමා බලය ගත්තාට පස්සේ කල්පනා කළා, සෝවියට් දේශයේ ජනතාව පීඩනයෙන් සහ දරිද්‍රතාවෙන් මුදවා ගන්න නව ආර්ථික සැලැස්මක් රටට ඕනෑයි කියලා. ඒ ආර්ථික සැලැස්ම එතුමා කෙටුම්පත් කළා. එතුමා එය කෙටුම්පත් කරන කොට ඒකට විරුද්ධ මතවාද පක්ෂය ඇතුළෙන් ආවා, මේක ධනවාදයට යන්න හදන ගමනක් කියලා. ට්‍රොට්ස්කිලා වැනි කොටස්වලින් ඒ ගමන්මගට විරුද්ධතා මතු වුණා. නමුත්, වී.අයි. ලෙනින් අභියෝගාත්මකව මෙය භාරගෙන නව ආර්ථික සැලැස්ම ඉදිරිපත් කළා. මොකද, සාර්ගේ කාලයේ ආයෝජකයින් හිටියා; විදේශ ප්‍රාග්ධන කැඳවා ගත්ත අය හිටියා; දේශීය ධනවතුන් හිටියා. මේ සියලු අය සමඟ සමහර ආයතන පෞද්ගලීකරණය සඳහා යොමු කෙරුවා. මගේ මතකය හැටියට ආයතන 14ක් රාජ්‍ය මුදල්, පෞද්ගලික මුදල් සහ විදේශ ආයෝජන සම්බන්ධ කරගෙන ක්‍රමානුකූල සැලැස්මක් මත, නියාමනයන් මත ඒ ආර්ථිකය වර්ධනය කරන්න සැලසුම් කෙරුවා. එහෙම කටයුතු කරලා එතුමා පක්ෂයේ දෙවැනි සම්මේලනයේදී විවේචකයින්ගෙන් ඇහුවා "දැන් මොකද කියන්නේ? දැන් හොඳ නැද්ද? ධනපති ක්‍රමය ගෝලීය වශයෙන් ප්‍රාග්ධනය එකතු කර ගන්නා වෙලාවක, අපට ඒකට අභියෝග කළ හැකි වන විධියට අපේ රටේ ජාතික සම්පත් ශක්තිමත් කරලා, අපේ රටේ මූල්‍ය ප්‍රාග්ධනය ක්‍රමානුකූලව වර්ධනය කර නොගත්තොත් අපි ප්‍රාග්ධනයෙන් යටත් කරන යටත් ජාතියක් වනවා. රුසියානු අභිමානය අපට තිබුණාට ප්‍රාග්ධනයෙන් අපිව යටත් කරන්න පුළුවන්" කියලා.

හැබැයි, එදා වී.අයි. ලෙනින් මැතිතුමාගේ මරණයෙන් පස්සේ මේ සැලැස්ම ඉස්සරහට ගෙන යන්න බැරි වුණා. ඊට පස්සේ ඩෙන්ග් ෂියාඕපින් චීන නායකයා මේක ඉස්සරහට ගෙන යන්න හදන කොට ඔහුත් ද්‍රෝහියකු ලෙස හැඳින්වූවා. නමුත්, ඊට පස්සේ ඔහු මේ සැලැස්ම ඉස්සරහට ගෙන ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ හොඳට මතක තියාගත යුතු දෙයක් තිබෙනවා. එනම්, ජාතික ආර්ථිකයේ කිසිදු සම්පතක් -ආර්ථික මර්මස්ථාන- විදේශීය ප්‍රාග්ධන හිමියන්ට යටත් කර ගැනීමට බැරි වන විධියටත්, දේශීය ධනපති ක්‍රමය වර්ධනය කරමින්, තරගකාරී විධියට විදේශීය ප්‍රාග්ධනය සම්බන්ධ කරගෙන, එය තරගකාරී ලෙස වර්ධනය කිරීමයි ඒ රටවල් දෙකම කල්පනා කෙරුවේ. මගේ ළඟ තිබෙනවා, "ගෝලීයකරණය සහ එහි අසහනය" නමැති කෘතිය. මේ කෘතිය ලියා තිබෙන්නේ, ජෝශප් ස්ටිග්ලිට්ස්. චීනය ගැනයි මේ ලියා තිබෙන්නේ. දැන් මා ළඟ තිබෙනවා ඒ පොත. ඒ පොතට අනුව, ඇත්ත වශයෙන්ම විදේශ ප්‍රාග්ධනය ගෙනෙන කොට චීනය කලබලකාරී වුණේ නැහැ. ඒ ප්‍රාග්ධනය නියාමනය කරන්න පුළුවන් ක්‍රමවේදයක් ඔස්සේ පාලනයක් ඇතිව චීනය ඒ කටයුතු කළා. දැන් අපි රටට කොච්චර සල්ලි ගෙනාවත්, අපි ඒ සඳහා මොන තරම් දොරවල් විවෘත කළත් වැඩක් නැහැ, ඒවා කාලා බීලා විනාශ කරනවා නම්. ඒ ආයෝජනය යොදවන්නේ කුමකටද? ඒකට ජාතික සැලසුම්කරණයක් ඕනෑ. ආර්ථික මූලෝපායක් අනුව තමයි මුදල් රටට ගෙනෙන්න ඕනෑ. මේ කෘතියේ ඉතාම පැහැදිලිව කියනවා, ආයෝජකයන් ගෙන්වන කොට, ආයෝජනය කරන කොට ඒවා සාමාජීය ප්‍රාග්ධනයට ගලපනවා කියලා. සාමාජීය ප්‍රාග්ධනය කියන්නේ, චීනයේ තිබුණු විවිධ කර්මාන්ත. අපි හිතමු, යකඩ හා වානේ කර්මාන්තය කියලා. යකඩ හා වානේ කර්මාන්ත තිබෙන තැන්වලට තමයි ඒ ආයෝජන කළේ; ඒවා දියුණු කළා. ඒ සාමාජීය ප්‍රාග්ධනයට ගෙනාපු ආයෝජනය ගැළපුවා. එහෙම නැතුව, වෙනත් රටවල් එක්ක තරග කරන්න ශක්තියක් නැති, ඔරොත්තු දෙන්නේ නැති සැලසුමක් හිතුවක්කාර විධියට, වෙනත් තරගකාරී ක්‍රමවලට ආයෝජනය කළා නම් ඒවායේ ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. ඔහු කියනවා, "ඒ ක්‍රමෝපායන් ඔස්සේ, චීනය බැස ගත් ඒ ආර්ථික ක්‍රමවේදය ඔස්සේ තමයි චීනයට දියුණු වෙන්න පුළුවන් වුණේ" කියලා.

ගරු ඇමතිතුමනි, මම නව ආර්ථික වැඩ පිළිවෙළවලට විරුද්ධ කෙනෙක් නොවෙයි. වියට්නාමයේ ඇති වුණු අලුත් තත්ත්වය ගැන, ඊයේ - පෙරේදා මේ ලෝකයේ හුඟක් රටවල් මුහුණ දීපු තත්ත්වය ගැන මම ඔබතුමාත් එක්ක කථා කරලා තිබෙනවා. අද බොහෝ රටවල් නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය යටතේ නියාමනයක් නැතුව සහ පාලනයක් නැතුව අනවශ්‍ය විධියට වෙළෙඳ පොළ ලිහිල් කිරීම නිසා, විශාල වශයෙන් ආර්ථිකය බිඳ වැටිලා තිබෙනවා; දියුණු ආර්ථික බිඳ වැටිලා තිබෙනවා. දැන් මේක ලෝකය පුරා මහා ව්‍යසනයක් බවට පත් වෙලා තිබෙනවා. මේ නිසා රටවල් ඇතුළේ අලුත් ප්‍රශ්න මතු කරලා තිබෙනවා. දැන් අපි කොහොමද මේ සමඟ ඉස්සරහට යන්නේ කියන එක තමයි මුළු ලෝකය තුළ තිබෙන අලුත් සංවාදය. දැන් මේ නව ලිබරල්වාදය ප්‍රමාණයට වඩා අළෙවි වෙලා ඉවරයි. දැන් ඒ ක්‍රමයෙන් රටකට ඉදිරියට යන්න බැහැ. ඒ නිසා අපි අලුත් ක්‍රමවේද හොයන්න ඕනෑ. මේ රටේ ආර්ථිකය ඉස්සරහට ගෙන යන්න අපි හදා ගන්නා වූ ක්‍රමවේදය මොකක්ද? එයට දැන් චීනය කියනවා, "චීන ස්වභාවයේ ආර්ථිකයක්; සමාජවාදයක්" කියලා. දැන් අපට පුළුවන්, ලාංකීය ස්වභාවයේ ආර්ථික ගමනක් යන්න. ලේබල් ගහලා, මේක තමයි සමාජවාදය, මේක තමයි ධනවාදය කියලා අපට වෙන් කරන්න බැහැ. රට ඉස්සරහට ගෙන යන්න අවශ්‍ය ක්‍රමවේදය අපට ආවේණික විධියට හදා ගන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, මෙවර අය වැයේ තිබෙනවා, උපාය මාර්ගික නොවන ව්‍යාපාරවලට අපේ ඇති බැඳියාව ලිහිල් කරනු ඇත" කියලා. පසු ගිය අය වැයේත් මෙය තිබුණා. මොනවාද ඒ ව්‍යාපාර? අපි බැඳියාව ලිහිල් කරනවාය කියන්නේ, ආණ්ඩුව ඒ ව්‍යාපාර අතහැරලා, ඕනෑම කෙනෙකුට ආයෝජනය කරලා ඕනෑ දෙයක් කරගෙන යන්න පුළුවන් කියන එකනේ. මොකක්ද මෙහි තිබෙන නිශ්චිත ගතිය? මෙහෙම ඇඟ වහලා කියලා අප රවටන්න බැහැ නේ. ඒ ව්‍යාපාර මොනවාද? ඒ ව්‍යාපාර උපාය මාර්ගික නොවෙන්නේ ඇයි? ඒකට හේතු මොනවාද? "ඔව්, මේක කළාට වරදක් නැහැ" කියලා රටේ ජනතාවට පිළිගන්න, ඒවා සංඛ්‍යා ලේඛන හා දත්ත එක්ක තිබෙන්න ඕනෑ. නැත්නම් හිතෙන්නේ, අමු අමුවේ අපේ දේපළ විකුණනවා කියලානේ. ඒ සැකයනේ මේ ඇති වෙන්නේ. කවුද කැමැති තමන්ගේ භූමියෙන් එක අඟලක්වත් වෙන කෙනෙකුට දෙන්න? විදේශිකයන්ට දෙන්න කැමැති කවුද? ඒකට කවුරුවත් කැමැති වෙන්නේ නැහැ.

නාවික කටයුතු හා භාණ්ඩ මෙහෙයුම් සඳහා විදේශීය සමාගම්වලට දීපු ලිහිල්භාවය පිළිබඳව මා කරුණු ටිකක් මතු කළා. උදාහරණයක් හැටියට ගත්තොත්, අපේ රටේත් එවැනි

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා]

සමාගම් 500ක් විතර තිබෙනවානේ. මේ සමාගම්වල ලක්ෂයක් විතර වැඩ කරනවා. මේවායේ කිසියම් නියාමනයක් නැති වුණොත් ප්‍රශ්න ඇති වනවා.

ඇත්ත වශයෙන්ම, මේ කටයුත්තේ යෙදෙන විදේශීය සමාගම් එක්ක ආයෝජනය කරලා අපේ ව්‍යාපාරිකයන්ට සියයට 60ක ප්‍රමාණයක් ගත හැකි තත්ත්වයක් තිබුණානේ. දැන් විදේශ අයට සියයට 40කින් මැදිහත් වෙන්න පුළුවන්. නමුත් මින් පසුව වෙන්නේ මොකක්ද? අද නාවික ගමනාගමනය පුළුල් වන බව අපි දන්නවා. එවැනි hub එකක් තමයි හැදෙන්නේ. මේ ක්ෂේත්‍රය ලොකු වෙළෙඳ ක්‍රියාකාරිත්වයකට පරිවර්තනය වන නාවික ගමන් මාර්ගයක යන, -චීනයේ සේද මාවතත් එක්ක- ආර්ථිකයට විශාල ධනස්කන්ධයක් ලැබෙන මාර්ගයක්. මේ ධනස්කන්ධයට ජාතික වශයෙන් ඉන්න අපේ ව්‍යාපාරිකයන්ගේ මැදිහත් වීමක් තිබෙනවා නම්, ඇත්ත වශයෙන්ම ඒ ලබන ලාභයෙන් කොටසක් දේශීය ව්‍යාපාරිකයන්ටත් ලැබෙනවා. නමුත් ඒ කටයුතු ලිහිල් කළාට පස්සේ මොකද වෙන්නේ? එහෙම වුණාම මේ ලාභය ඔක්කොම විදේශ රටවල් අරගෙන යනවා. ලෝකයේ තිබෙන බහුජාතික සමාගම් හතරක් මේ ලාභය අතට ගත්තොත් මොකද වෙන්නේ? මුළු ලෝකයේම තිබෙන සමාගම් මේ ලාභය ගත්තොත් අපේ රටට ලාභ ලැබෙනවාද? ඒ නිසා මේ යෝජනාවෙන් ආණ්ඩුවට සත පහක ප්‍රතිලාභයක් ලැබෙන්නේ නැහැ. මේ ලාභය පිටරටවලට අරගෙන යන්න පුළුවන්. එතකොට අපට මොනවාද ලැබෙන්නේ?

වරාය කියන්නේ අපේ රටේ තිබෙන ස්වාභාවික සම්පතක්; ධන උල්පතක්. පාලනයකින් තොරව මේවා,-

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
මා පැහැදිලි කිරීමක් කරන්නම්.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
කමක් නැහැ. මා ඒක තමයි බලාපොරොත්තු වන්නේ.

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)
අපේ අය -ඒ ව්‍යාපාරිකයන්- හොඳ, දක්ෂ අය තමයි. නමුත් ඒගොල්ලන් ඒ ලොකු කොම්පැනිවල නියෝජිතයන්. ඒගොල්ලන් මේ රටේ වැඩ කරන්නේ ස්වතන්ත්‍ර කණ්ඩායමක් හැටියට නොවෙයි. ඔවුන් ඒ ලොකු කොම්පැනිවල නියෝජිතයන්. එතැනයි ඒ ප්‍රශ්නය තිබෙන්නේ. ඒගොල්ලන්ට shipping line එකක් නැහැනේ. මෙතැනදී අපට බලන්න තිබෙන්නේ එකම දෙයයි. මා හිතන හැටියට අද වනකොට අපේ harbour එකට ගන්න පුළුවන් උපරිම TEUs ගණන එනවා. අද බැලුවොත් නැව් වරායෙන් එළියේ නවත්වා තිබෙනවා. මොකද, අපේ capacity එකට අනුව ඒවා service කරන්න තිබෙන ශක්තිය අඩුවෙලා නිසා. ඒ නිසා මේ කටයුත්ත ඉක්මන් කරන්න ඕනෑ. ඔබතුමා කියන කාරණය එක්කත් මා එකඟ වනවා. මේ දෙගොල්ලන්ටම හරි යන ආකාරයේ විසඳුමක් පිළිබඳව අපි හොයා බලන්න ඕනෑ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අන්න ඒක තමයි මා කියන්නේ. විදේශ ආයෝජන ගන්න එපා කියලා මා කියන්නේ නැහැ. ඒ සම්බන්ධතාව තිබෙන්න ඕනෑ. ජාතික වශයෙන් රැකියා උත්පාදනය සහ එහි ප්‍රතිලාභ රට ඇතුළට එන්නත්, රට ඇතුළේ ධනපති පන්තියක් ගොඩ නැඟීමත් තමයි ගෝලීය ආර්ථිකයේදී අපට අවශ්‍ය වෙන්නේ.

ඇත්ත වශයෙන්ම ගෝලීය ආර්ථිකයේදී ඒ තරගකාරිත්වය අවශ්‍යයි. එහෙම තරගකාරිත්වයක් ඇති ආර්ථිකයක් බිහි වීම ගෝලීයකරණය නිසා ඇති වුණු වැරැද්දක් නොවෙයි. නමුත් ඒ හරහා අයිලාභ ලබන ධනවතුන් අතළොස්සක් රටක හැදුණාම, ඒක රටේ දිළිඳුභාවයට බලපානවා. ඒ තත්ත්වය අද ලෝකය පුරාම දකින්න පුළුවන්. ඇති-නැති පරතරය වර්ධනය වීම ගෝලීයකරණය නොවෙයි. ඒ අභියෝගයට අපට මුහුණ දෙන්න පුළුවන්. චීනය අද ඒ අභියෝගයට ලස්සනට මුහුණ දෙනවානේ. මා කියන්නේ මේකයි. අපේ සම්පත් ආරක්ෂා කර ගනිමින්, වෙළෙඳ උපාය මාර්ග ඉස්සරහට ගෙනයන්න අපි සැලකිල්ලක් දක්වන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම බැලුවාම, මූල්‍ය වෙළෙඳ පොළ තමයි විවෘත. උදාහරණයක් හැටියට කිව්වොත් ලංකා බැංකුවෙයි, මහජන බැංකුවෙයි කොටස් තිබෙනවා. තැන්පත්කරුවන්ටයි, ගනුදෙනුකරුවන්ටයි ඒ කොටස් මිලදී ගන්න පුළුවන්.

අපි තව කාරණයක් මතක තියා ගන්න ඕනෑ. අපේ රටේ ඇති වුණු හැම ජාතික ආපදාවකදීම අපේ පිහිටට හිටියේ අපේ ජාතික බැංකු. ETF එක, EPF එක සහ ජාතික බැංකුවල මූල්‍ය ශක්තිය තමයි අපට තිබුණේ. මේක තමයි අපට තිබුණේ. දැන් මේ බැංකුවල තිබෙන මූල්‍ය ක්‍රියාකාරිත්වයේ තරගකාරිත්වයක් තිබෙනවා. එහි වර්ධනයට රට ඇතුළේ දේශීය වශයෙන් ගනුදෙනුකරුවන් සිටීම අපේ රටේ ජාතික සම්පතක්. මේක අපි දිගු කාලයක් සටන් කරලා ලබා ගත්ත අයිතිවාසිකමක්. මම මේ දැනගන්නයි ඔබතුමන්ලාගෙන් අහන්නේ. මට අවබෝධයක් ලබා ගන්නයි මේ අහන්නේ. හොඳ විදේශීය තැන්පත්කරුවන් හතර පස්දෙනෙක් කොටස් ගන්න මේ බැංකුවල ආයෝජනය කළොත්, මේක තහනම් කරන්න බැහැ නේ. එතකොට පෞද්ගලීකරණයට මේ බැංකුවල දොර විවෘත වෙනවා නේ.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මම පැහැදිලි කිරීමක් කරන්න ද?

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
කමක් නැහැ, කියන්න ගරු ඇමතිතුමා.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
අපි බලාපොරොත්තු වෙන්නේ සුළු කොටසක් විතරක් ඒ විධියට දෙන්නයි. Control එක අපේ ආණ්ඩුවේ තියා ගෙන සුළු කොටසක් විතරක් දෙන්නයි, අපි බලාපොරොත්තු වන්නේ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
හැබැයි, එවැනි මොකක්වත් මේකේ සඳහන් වෙලා නැහැ.

**ගරු මලික් සමරවික්‍රම මහතා**
( மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
නමුත්, ඒක තමයි අපේ අදහස.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

මම කියන්නේ, සම්පූර්ණ මූල්‍ය පාලනය රජය සතු වෙන්න ඕනෑ කියලායි. ඒක එහෙම නොවුණොත් මොකද වෙන්නේ? කොහොම හරි මේවා ලිහලා දීලා, කාලා බීලා මේ රට ඒ විධියට ගිහිල්ලා ඊළඟ පරම්පරාව අපේ මූල්‍ය ශක්තියෙන් පිරිහුණොත්, අපි ඉදිරි කාලයේ දී මේ රට ඇතුළේ ගෙනයන ආර්ථික ප්‍රතිපත්තිය වඩාත් ශක්තිමත්ව ඉස්සරහට ගෙනයන්න තිබෙන ශක්තිමත්ම මූල්‍ය ආයතන අපි දිය කර හැරියොත්, ඒක ජාතියේ අපරාධයක් වෙනවා. ඒක නිසා අපි මේවා හරියට සමබරව බලන්න ඕනෑ. මම වියට්නාමයේ ගිය වෙලාවේ දී ඒ රටේ මිනිස්සු කිව්වේ, "අපි කිසි කෙනෙකුට භය නැහැ" කියලා. වී.අයි. ලෙනින් මැතිතුමා කියලා තිබෙනවා, "අපි මොකටද භය වෙන්නේ. බලය අපේ අතේ තියෙන්නේ. ඒක වැරදි විධියට හසුරුවනවා නම් විසුරුවා දාන්න ඕනෑ" කියලා. වියට්නාමයේත් එහෙමයි. ඒ විධියට කරන්න නම්, අපේ ළඟ control එක තියා ගන්න ඕනෑ. අද යුද්ධයෙන් රටවල් යටත් කරන්න බැහැ නේ. අද ප්‍රාග්ධනයෙන් තමයි රටවල් යටත් කරන්නේ. අපි වාගේ දිළිඳු රටවල්වලට ඇත්ත වශයෙන්ම මේ තරගකාරී සමාජය ඇතුළේ තිබෙන සම්පත්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින් අපි යම් විවෘතකරණයක් කිරීමේ වරදක් නැහැ. ආර්ථිකය ප්‍රකෘතිමත් කරන්න එහෙම කළාට වරදක් නැහැ. ඒ තුළින් අලුත් මං ඔස්සේ ක්‍රියා කරන්නත් පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට නියමිත වෙලාවෙන් තව විනාඩියක් පමණයි තිබෙන්නේ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ඒකේ කිසිම බාධාවක් නැහැ. ඒ වාගේම, මම නීතිය හා අධිකරණය ගැනත් කථා නොකළොත් ඒක වැරදියි. මම අපේ නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කියපු හුඟාක් කරුණුවලට එකඟයි. ඒක මම කියන්න ඕනෑ. එක දෙයක් ගැන මම ගියවරත් කිව්වා. විධායක ජනාධිපති ක්‍රමයක් තිබෙන කොට ඇත්ත වශයෙන්ම හුඟාක් ඒවා සුපිරිසිදුව තියාගන්න බැහැ. ඒක නිසා නේ අපේ පක්ෂය විධායක බලයට හැමදාම විරුද්ධ. විධායක ජනාධිපති ක්‍රමයේ ආනිසංස මොනවාද කියලා අපි දන්නවා. අපේ රටේ වාගේ මධ්‍යම පන්තියෙන් එන බුද්ධිමතුන්ව, මහා බලකාමී පාලකයන්ගේ ස්වභාවයන් අනුව යම් බලපෑම්වලට යට කරන්න පුළුවන්.

පි දන්නවා නේ, මේ රටේ හිටපු නඩුකාරවරුන්ටත් පාතාලය දමලා ගස්සපු හැටි. ඒවා ගැන කියන්න මම ඉතිහාසයට යන්නේ නැහැ. මොකද, කාගේ කාගේත් ඉතිහාසය හොඳ නැති නිසා. ඒ නිසා මම කියන්න කැමැතියි, ඇත්ත වශයෙන්ම රටක ගෞරවය රකින්න අන් සියල්ලටම වාගේ නීතියේ ආධිපත්‍ය හා ශක්තිය ඕනෑ කියලා. අපි වුණත් රටකට යනකොට බලනවා නේ, "මේ රටේ මංකොල්ලකාරයෝ ඉන්නවාද; පාරේ යන කොට උස්සගෙන යන අය ඉන්නවාද; හොර තක්කඩියෝ ඉන්නවාද" කියලා. එවැනි රටකට ආයෝජකයෙක් එනවාද? විනයක් නැති, නීතියක් නැති, පාලනයක් නැති, ඒ රටට ගියාම කොමිස් ඉල්ලන හෝ වෙනත් විධියේ බලපෑම් කරන සමාජයක් තුළට ආයෝජකයන් එන්නේ නැහැ.

නීතියේ ශක්තිය ඒකට බලපානවා. අද මෙහි වර්ධනයක් තිබීම ගැන මම සන්තෝෂ වනවා. එවැනි ගෞරවයක් රටට ලැබිලා තිබෙනවා. අපේ නීති ක්ෂේත්‍රයට ලෝකය පුරා ගෞරවයක් තිබෙනවා. එවැනි බලයක් තිබෙන මේ රටේ කොමිසමේ විමර්ශනය; අනෙක් පැත්තෙන් විනිශ්චයකාරවරුන්ගේ තීරණ, ඒවායින් රට පිළිබඳව ගෞරවයක් තිබෙනවා. ඒ ගෞරවයට අපේ පැත්තෙන් ප්‍රතිචාර දක්වන්න ඕනෑ කියලායි මම කියන්නේ. අපි ගත්ත ගමන් උසාවිය මෙහෙමයි; අධිකරණය මෙහෙමයි කියනවා. මම ඒකට එකඟ නැහැ. හේතුව, අපි මේක ඇතුළේ විතරක් තිබෙන ප්‍රශ්න කථා කරන එක නොවෙයි කරන්න ඕනෑ. අපි එහෙම කිව්වාම ලෝකය බලා ගෙන ඉන්නවා. හැම මිනිහාම එහෙම නැහැ නේ. එක මිනිහෙක්, දෙන්නෙක් කරන වරදට සමස්ත පද්ධතියටම දොස් කියන්න අපට බැහැ. ඒවායේ කොපමණ සෘජු මිනිස්සු ඉන්නවාද? නමුත්, සෘජු මිනිහා ගැන කථා කරන්නේ නැහැ. කුමක් හෝ කාරණයකට එකඟ වුණු මිනිස්සු ගැන විතරක් කථා කරනවා. අධිකරණ පද්ධතිය ගැනත් කථා කරන්න ඕනෑ. අධිකරණ පද්ධතියට තිබෙන ගෞරවය අපි ආරක්ෂා කරන්න ඕනෑ. ඒක රටක ආර්ථික ක්‍රියාවලියටත් අවශ්‍යයි. අපේ රටක විනය, නීතිය, ඒවායේ තහවුරුභාවය යන සියලු දේ ගැන ලෝකය බලා ගෙන ඉන්නවා. එහෙම නැති රටකට ආයෝජකයෙක් එන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ඒ නිසා මේ දෙක අතර සම්බන්ධකමක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රට රකිමින්, ආර්ථිකය පුළුල් කර ගෙන, මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීමට ක්‍රියා කරන්නය කියා මේ වැය ශීර්ෂ ගැන කථා කරන වෙලාවේ අපි ඉල්ලා සිටිනවා. මේවායින් මතු වන වෙනත් ප්‍රශ්න ගැන ඊළඟ වැය ශීර්ෂවලදී අපි වෙනම කථා කරමු.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි.

මීළඟට, ගරු සාරතී දුෂ්මන්ත නියෝජ්‍ය ඇමතිතුමා.

**[අ.භා. 4.09]**

**ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා (අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා හා බුද්ධ ශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த - நீதி பிரதி அமைச்சரும் புத்தசாசன பிரதி அமைச்சரும்)
(The Hon. H.R. Sarathie Dushmantha - Deputy Minister of Justice and Deputy Minister of Buddha Sasana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දින අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ කථා කරන කොට මේ ගරු සභාවේ මතු වුණු කරුණු-කාරණා කිහිපයක් පිළිබඳව මුලින්ම පිළිතුරක් ලබා දෙන්නට ඕනෑ. විශේෂයෙන්ම, අපේ ගරු වාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා සඳහන් කළා, වවුනියාව මහාධිකරණයේ තිබුණු නඩුවක් අනුරාධපුර මහාධිකරණයට මාරු කිරීම සම්බන්ධයෙන්. එම කාරණය ගැන පසුගිය කාලයේ මාධ්‍යවලිනුත් විශාල වශයෙන් කථා වුණා. විශේෂයෙන්ම, විපක්ෂ නායකතුමාත් මේ සම්බන්ධයෙන් අදහස් දැක්වුවා. මේ සියලු කරුණු-කාරණා සිදු කෙරෙන්නට සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව ඇතුළු බොහෝ කරුණු බලපෑවා. එම නඩුව නැවතත් වවුනියාව අධිකරණයට මාරු කළ හැකිද යන්න සොයා බැලීමට නීතිමය වශයෙන් අභියාචනාධිකරණය හමුවට යන්නට ඕනෑ. ඒ සඳහා

[ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා]

කටයුතු කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී තීන්දුවක් ලැබෙයි කියලා මා හිතනවා. එම කාරණය සම්බන්ධයෙන් මේ පිළිතුර තමයි ගරු මන්ත්‍රීතුමාට මුලින්ම ලබා දෙන්නට තිබෙන්නේ.

ඒ සමඟම, අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයේ දී වාගේම කල් තැබීමේ යෝජනා රාශියකදී, විශේෂයෙන්ම දේශපාලන සිරකරුවන් පිළිබඳ ප්‍රශ්නය බොහෝ වෙලාවට මතු කළ කාරණාවක් බවට පත් වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. EDWARD GUNASEKARA *left the Chair and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, කථා කරන්න.

**ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த)
(The Hon. H.R. Sarathie Dushmantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථා කරමින් සිටියේ, අද පැවැත්වෙන අධිකරණ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව විවාදයේ දීත්, ඒ වාගේම පනත් සංශෝධනවලදී කථා කරන දේශපාලන සිරකරුවන් පිළිබඳ ප්‍රශ්නය ගැනයි. මේ කාරණාව ගැන හැම දාම කතා බහ කරනවා. සමහර අවස්ථාවල මේ පිළිබඳ වැරදි සංඛ්‍යා ලේඛන සහ වැරදි මතිමතාන්තර මේ ගරු සභාවට ඉදිරිපත් වන බව මා විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ. දැනට නීතිපතිතුමාගේ උපදෙස් පතා මේ වන විට නඩු කටයුතු 17ක් යවලා තිබෙනවා. ඒ වාගේම, දැනට 19 දෙනෙක් remand custody එකේ ඉන්නවා. මේ 19 දෙනාගෙන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඉන්නේ 9 දෙනායි. ඉතුරු 10 දෙනා ඉන්නේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නොවෙයි. ඒ නිසා මේ කරුණු-කාරණා ගැන, මේ සංඛ්‍යා ලේඛන ගැන කියද්දී අපි බොහොම පරිස්සමින් කථාබහ කරන්නට ඕනෑ, නිවැරදි තොරතුරු දෙන්නට ඕනෑ. නැත්නම් වැරදි මතවාදයක් ඇති වෙනවා. ඒත් එක්කම මේ වැරදි පිළිබඳව කථාබහ කරන කොට, "දේශපාලන සිරකරුවන්" කියන අර්ථකථනය බොහෝ වේලාවට දෙන්නට උත්සාහ කරනවා කියන එකත් මම මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම ජානක පෙරේරා මැතිතුමාගේ ඝාතනය, විල්පත්තුව ජාතික උද්‍යානයේ 7 දෙනෙකු ඝාතනය, ඒ වාගේම සරත් ෆොන්සේකා මැතිතුමා ඝාතනය කිරීමට උත්සාහ කිරීම, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාව ඝාතනයට උත්සාහ කිරීම හා අනුරාධපුර ගුවන් හමුදා කඳවුරට ප්‍රහාර එල්ල කිරීම වැනි බොහොම බරපතළ ගණයේ අපරාධ ගණනාවකට සම්බන්ධ පිරිස් මෙම නඩු කටයුතු ඇතුළේ ඉන්නවා. මෙය හැම වේලාවේම විටින්-විට මතු කරන මාතෘකාවක් නිසාත්, අද දිනයේ මේ සම්බන්ධව කථා කරපු නිසාත් තමයි මම මේ සම්බන්ධයෙන් යම් අදහසක් දක්වන්නට උත්සාහ කළේ. අපේ රටේ නීතියේ ආධිපත්‍ය බිඳ වැටිලා නැහැ. අධිකරණයේ ස්වාධීනත්වයත් තිබෙනවා. ඒ නිසා අපි මේ සියලු කටයුතු අධිකරණය හරහා ඉදිරියට ගෙන යෑමේ අවශ්‍යතාව තිබෙනවා. අපෙන් කිසිම බාධා කිරීමක් හෝ බලපෑමක් නැහැ. ප්‍රතිපත්තිමය තීන්දු-තීරණ ගන්නා කාරණය රජය සතු දෙයක්. ඒ නිසා ඉදිරි කාලය තුළදී ඒ සම්බන්ධයෙන් අදාළ විධියට ඒ ඒ සියලු දෙනාගේ වගකීම් ඉෂ්ට-සිද්ධ කරනවා ඇති කියන කාරණාව තමයි විශේෂයෙන්ම මතක් කරන්නට තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදය පැවැත්වීම එක අතකට සතුටට කාරණයක්. අපේ ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාත් අදහස් ටිකක් ප්‍රකාශ කළා. එතුමාගේ කථාව අතරතුර එතුමා කිව්වා, අපේ නව ඇමතිතුමිය ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ, එතුමිය හොඳටම වැඩේ කරගෙන යනවා කියලා. ඒ වාගේම හිටපු ඇමතිතුමා සම්බන්ධවත් ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා හොඳ සහතිකයක් ලබා දුන්නා. ඒ ආකාරයට පසුගිය කාලයේදී කිසි ප්‍රශ්නයක් නැතුව මේ ආණ්ඩුව ඇතුළේ හොඳින්ම පවත්වාගෙන ගියපු අමාත්‍යාංශයක් හැටියට අධිකරණ අමාත්‍යාංශයට ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමාම දුන් සහතිකය පිළිබඳව මම බොහොම සතුටු වෙනවා. ඒ නිසා අධිකරණ අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳව, අනෙක් කරුණු-කාරණා පිළිබඳව හා පසුගිය වසර දෙකහමාරක කාලය තුළ කළ වැඩ කටයුතු පිළිබඳව අප යම්තාක් දුරකින් ජනතාව දැනුවත් කරන්නට ඕනෑ.

අද අධිකරණය කියූ පමණින් බොහෝ දෙනෙකුට මැවෙන රූපය තමයි මේ නඩු කටයුතුවල තිබෙන ප්‍රමාදය. නඩු කටයුතු ප්‍රමාද වීම කියන කාරණය, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව මේ වසර දෙකක-දෙකහමාරක කාලය ඇතුළත සිදුවුණු ප්‍රශ්නයක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නඩු කටයුත්තක ප්‍රමාදය සිදු වෙන්නට නොයෙක් කරුණු-කාරණා බලපානවා. සමහර වේලාවට නීතිපති දෙපාර්තමේන්තුවේ තිබෙන ප්‍රමාද වෙන්නට පුළුවන්. සමහර වේලාවට රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ තිබෙන ප්‍රමාද වෙන්නට පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර වේලාවට සමහර නීතිඥ මහත්වරු පවා කාලය වැඩිපුර ගන්නවා. අපි මෙය සැඟවීමට කාරණාවක් නොවෙයි. මේක, ඇත්ත කථාවක්. ඒ නිසා නඩු කටයුතු ප්‍රමාද වීම වළක්වා ගැනීම සඳහා අප කරන්නට ඕනෑ මොකක්ද, කියන කරුණු-කාරණා පිළිබඳව අප සැබෑවටම කථා බහ කිරීම තුළ පමණයි මෙම ප්‍රශ්නයට විසඳුමක් ලබා දීමට අපට පුළුවන්කම ලැබෙන්නේ. එහෙම නැතුව නීතිපති දෙපාර්තමේන්තුවට විතරක් ඇඟිල්ල දිගු කරලා, එහෙම නැත්නම් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට විතරක් ඇඟිල්ල දිගු කරලා මේ ප්‍රශ්නයෙන් පැන යන්නට අපට පුළුවන්කමක් නැහැ. මේ ඕනෑම ආයතනයකට නඩු ටික ඉස්සරහට අරගෙන යෑම සඳහා තමන්ට පුළුවන් වපසරියක්, capacity එකක් තිබෙනවා. රජයෙන් අවම පහසුකම් ලැබෙන තත්ත්වයක් තුළ, ඒ ඒ ආයතනවල පවතින ප්‍රායෝගික ප්‍රශ්න බොහොමයක් පසුගිය කාල සීමාව තුළ අප දැක්කා. ඉතින් අපි නීතිපති දෙපාර්තමේන්තුවට කොපමණ කෑ ගැසුවත්, රජයේ වෙනත් ආයතනවලට කෑ ගැසුවත් අවශ්‍ය පහසුකම් ටික දෙන්නේ නැත්නම්, නීතිඥ මහත්වරුන් ටික දෙන්නේ නැත්නම් අපි බලාපොරොත්තු වෙන ඉලක්ක කරා අපට යන්නට පුළුවන්කමක් නැහැ. අද අපේ රටේ තිබෙන සමහර අධිකරණ සංකීර්ණවල නඩු අහන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒවාට අවශ්‍ය කරන විසඳුම ලබා දෙන්නේ නැතුව, නඩු ප්‍රමාදවීම පිළිබඳව එක එක්කෙනාට ඇඟිල්ල දිගු කරන්නට අපට පුළුවන්කමක් නැහැ. පසුගිය කාල සීමාව ඇතුළත මේ සම්බන්ධයෙන් අපි උත්සාහයන් ගණනාවක්ම ගත්තා. ඒ සම්බන්ධව අපි සතුටු වෙනවා.

අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති නීතිපති දෙපාර්තමේන්තුව ගැන අද කථා කරනවා. පසුගිය කාල සීමාව තුළ නීතිපතිතුමා ඇතුළු සියලු දෙනාම වරින් වර රැස්වෙලා මේ තිබෙන ප්‍රමාදය පිළිබඳව සාකච්ඡා කරන්න පටන් ගත්තා. මුලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපරාධ නඩුවල ප්‍රගතිය ගත්තාම, සියයට 80ක විතර ප්‍රගතියක් අද වෙනකොට නීතිපති දෙපාර්තමේන්තුවේ තිබෙනවා. මූලිකම ප්‍රශ්නය වන්නේ නීතිඥ වෘත්තිය කරන පුද්ගලයාව අපට අවුරුද්දකින් දෙකකින් නිර්මාණය කරන්න බැහැ. ඒක අත්දැකීමත් එක්ක, ඒ පුහුණුවත් එක්ක ලැබෙන කාරණාවක්. සමහර නීතිඥවරුට සමහර අංශවලින් බොහොම දක්ෂ උසස් මට්ටමට යන්න අවුරුදු ගණනාවක් ගත වෙලා තිබෙනවා. වාණිජමය සමාජයක් තුළ අද රජයේ නීතිඥවරුන්ට, ඒ වාගේම විනිශ්චයකාරවරුන්ට ලැබෙන වැටුප පිළිබඳව බරපතළ ගැටලුවක් තිබෙනවා. ඒ නිසා නීතිඥ වෘත්තියට පිවිසෙන බොහෝ දෙනෙක් නීතිපති දෙපාර්තමේන්තුව ඇතුළු අනෙකුත් ආයතනවලට එන්නට මැළිකමක් දැක්වීම පුදුමයට කාරණයකුත් නොවෙයි. මොකද, වර්තමාන වාණිජමය සමාජය තුළ ඉස්සරහට ගමනක් යන්න, තමන්ගේ ජීවිතය ඉදිරියට ගෙන යන්න බැරි ප්‍රශ්න උද්ගත වෙනකොට මේ තනතුරුවලින්, මේ ආයතනවලින් ඈත්වෙන එක ගැන අපට අමුතුවෙන් කථා කරන්න දෙයක් නැහැ. ඒ නිසා සැබෑ ප්‍රශ්නය මොකක්ද කියා හඳුනාගෙන නීතිපති දෙපාර්තමේන්තුව ඇතුළු මේ අදාළ ආයතන කාර්යක්ෂම කරන්න පුළුවන් වපසරියක්, පරිසරයක් නිර්මාණය කිරීම අධිකරණ අමාත්‍යාංශය හැටියට අපේ වගකීමක් වනවා. අද බොහෝ වෙලාවට අපේ මහාධිකරණ විනිසුරුතුමෙක් ලබාගන්න වැටුපට වැඩි වැටුපක් හොඳ කොම්පැනියක වැඩ කරන සේවකයෙක් ලබා ගන්න තත්ත්වයක් තිබෙනවා. මේවා තමයි අපි සැබෑවටම කථා කළ යුතු කාරණා. මම ස්තුතිවන්ත වෙන්නට ඕනෑ, අපේ ඇමතිතුමිය වාගේම අපේ හිටපු ඇමතිතුමාත් මේ කරුණු කාරණා ගැන හැම වෙලාවේම කථා බහ කිරීම ගැන.

අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවෙත් නිර්දේශ තිබුණා. අපි නීතිපතිතුමාව මුණ ගැසුණා. ඒ සියලු දෙනාගේම අදහස් විමසා බැලුවා. ඒ නිසා නීතිපති දෙපාර්තමේන්තුව ඇතුළු මේ අනික් ආයතනවලට ගැළපෙන වැටුප් තලයක් නිර්මාණය කරන්න අවශ්‍ය කරන වටපිටාව අපි මේ වෙනකොට ගොඩ නඟාගෙන තිබෙනවා. ඒ වාගේම අද නීතිපති දෙපාර්තමේන්තුවට එන නඩු කන්දරාවත් එක්ක අපි කොහොමද, මේ නඩු ගොනු සම්බන්ධව ඉක්මනට අවසානයක් දකින්නේ කියන ප්‍රශ්නය අප සියලු දෙනාටම එනවා. අද රජයේ නිලධාරින්ගේ විශාල හිඟයක් තිබෙනවා. අපි දැන් සැලැස්මක් හදාගෙන යනවා. නීතිඥවරු බඳවා ගත්තාටම මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ඒ අයට අවශ්‍ය දැනුම, පුහුණුව ආදී සියලු දේ ලබා දෙන්නට ඕනෑ.

අපි විශ්වාස කරනවා, ලබන වසර වෙනකොට නීතිපති දෙපාර්තමේන්තුවට තවත් සිය දෙනෙකු පමණ බඳවා ගැනීමේ වැඩසටහන අවසානයක් කරන්න පුළුවන් වෙයි කියා. මේ වෙනකොට ඒ සඳහා අවශ්‍ය කරන ඒ සියලුම වැඩකටයුතු ඉෂ්ට සිද්ධ කෙරීගෙන යනවා කියන කාරණාව මතක් කරන්නට අවශ්‍යයි.

රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ගැනත් මේ අවස්ථාවේ මම මතක් කරන්නට ඕනෑ. රස පරීක්ෂක දෙපාර්තමේන්තුව ගැනත් අදහස් පළ වුණා. අද රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය සියයට සියයක මට්ටමකින් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. මීට වසර හත අටකට පෙර රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳව අපි කථා කළොත් අපට ඒ පිළිබඳව සුබවාදීව කථා කරන්නට පුළුවන්කමක් නැහැ. දැන් අපි ඒ අවශ්‍ය කරන නවීන තාක්ෂණ පහසුකම් ලබලා දීලා තිබෙනවා. ඒ තත්ත්වය තුළ නඩු කටයුතු තවත් ඉක්මනින් අවසාන කිරීමේ හැකියාව අද අපි සියලු දෙනාටම ලැබෙමින් යනවා. ඒ වාගේම මම මතක් කරන්නට ඕනෑ, මේ නඩු ප්‍රමාදය පිළිබඳව. ඉඩම් නඩුවක් ගත්තොත්, සමහර වෙලාවට පරම්පරා තුන හතරක් දක්වාම ඉඩම් නඩුව ඇදෙනවා. සිවිල් නඩු විධාන සංග්‍රහයට අපි පූර්ව නඩු විභාග පටිපාටියක් ගෙනැල්ලා, යම් අවසරයක් ලබා දුන්නා. ඒ තුළින් නඩු කටයුතු කරනකොට විනිශ්චයකාරවරුන්ට යම් යම් තීන්දු තීරණ ගැනීමේ බලතල අපි ලබලා දීලා තිබෙනවා.

සමහර වෙලාවට නඩුව පටන් ගන්න අවුරුද්දක් යනවා නම්, මේ නිසා අවුරුද්දක කෙරුණු වැඩ ටික අපට එක දවසෙන් අවසානයක් දකින්නට පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා මේ සංශෝධන, මේ ප්‍රතිසංස්කරණ ගැන කථා නොකර නඩු කටයුතු ප්‍රමාදය ගැන අපට උත්තරයක් තිබේවිය කියලා මම හිතන්නේ නැහැ. ඒ වාගේම මම මතක් කරන්නට ඕනෑ සමථ මණ්ඩලය ගත්තාම අද සියයට 50ක, 51ක පමණ ප්‍රගතියක් තිබෙනවා. ඒ වාගේම නීති ආධාර කොමිෂන් සභාව පිළිබඳව අපේ වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා උදෑසන මතක් කළා. මේ වෙනකොට කාර්යාල 82ක් තිබෙනවා. නැති බැරි පුද්ගලයන්ට නීතියට ප්‍රවේශවීමට ඇති අපහසුකම්, අපේ සමාජ මට්ටමේ තිබෙන දුර්වලතා අපි නැතිකර දිය යුතුයි.

අද බොහෝ දෙනෙක් නඩුවකට සම්බන්ධ වෙන්න මැළිකමක් දක්වනවා. නීතිඥ ගාස්තු එක්ක අද බොහෝ දෙනෙකුට නඩු කටයුත්තකට සම්බන්ධ වෙන්න බැහැ. නඩු කටයුත්තක් විභාග කර අවසන් වන විට සමහර පුද්ගලයන්ගේ, ගේ දොර පවා උකස් කරලා, සින්න වෙලා තිබෙන තත්ත්වයක් තමයි පසු ගිය කාල සීමාව තුළ අපි දැක්කේ. ඒක තමයි ඇත්ත කථාව. එම නිසා අපි නීති ආධාර අංශය ශක්තිමත් කරගෙන යනවා. එම අංශය දියුණු තත්ත්වයකට පත් වීමට අවශ්‍ය වටපිටාව ගොඩ නැඟෙන්නට අවශ්‍යයි කියන කාරණය අපි පිළිගන්නවා. අපි ඒ සම්බන්ධයෙන් වන විශාල වැඩ පිළිවෙළක් මේ වන විට නිර්මාණය කරගෙන යනවා. ඒ වාගේම පසුගිය වසර දෙකක, දෙකහමාරක පමණ කාලය තුළ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව සියලු දෙනා ප්‍රශංසනාත්මකව කථා කළා. උදය ගම්මන්පිල මන්ත්‍රීතුමාත් අද ඒ කාරණාව සනාථ කිරීමක් තමයි කළේ. වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අධිකාරිය පිහිටුවන්නට අපට පුළුවන්කම ලැබුණා කියන එකත් අපි මතක් කරන්නට ඕනෑ. අමාත්‍යාංශය හැටියට අපි මේ වන විට පොලිස් දෙපාර්තමේන්තුවත් සමඟ එකතු වෙලා වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළ යම් මට්ටමකට - සියයට සියයක් නොවෙන්නට පුළුවන්.- ඉදිරියට කරගෙන යනවා. ඒ වාගේම සමථ මණ්ඩල පනත සංශෝධනය කිරීමට පසු ගිය කාල සීමාව තුළ අපට පුළුවන්කම ලැබුණා.

කාලාවරෝධි පනත සංශෝධනය කිරීම තුළ 1983 සිට එල්ටීටීඊ ප්‍රශ්නය පැවැති ප්‍රදේශවල වාගේම, ලංකාවේ අනෙකුත් සෑම ප්‍රදේශයකම ඉඩම් පිළිබඳව තිබුණු විශාල ප්‍රශ්නයකට විසඳුම් ලැබුණා. අමාත්‍යාංශයේ තීන්දු, තීරණ මත භුක්තිය අහිමි වුණු විශාල පිරිසකට ඒ සඳහා ප්‍රවේශ වෙන්නට අවස්ථාව ලබා දෙන්නට අපට පුළුවන්කම ලැබුණා. රටේ ප්‍රගමනය උදෙසා අදාළ වන යෝජිත පනත් කෙටුම්පත් රාශියක් පිළිබඳව කටයුතු කිරීමට තිබෙන බව මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අපි මේ වන විට අධිකරණ සංවිධාන පනතට සංශෝධනයක් ගෙනැත් මහාධිකරණ විනිසුරුවරුන්ගේ සංඛ්‍යාව ඉහළ දමන්නට කටයුතු කරගෙන යනවා කියන එකත් මම මේ වේලාවේ මතක් කරන්නට ඕනෑ. මෙය විශාල වෙනසක්, පරිවර්තනයක් ඇති වීමට හේතුවක් වෙයි.

අපි පසු ගිය කාල සීමාව තුළ සිවිල් නඩු විධාන සංග්‍රහයට කරපු සංශෝධනය වාගේම මේ කටයුත්තත් නඩු කටයුතු ඉක්මන් කිරීම සඳහා විශාල පිටිවහලක් වේවි. ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තිවලට අනුකූලව ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ළමා ආරක්ෂාව පිළිබඳ පනත් කෙටුම්පතක් නිර්මාණය කරගෙන යනවා. ඒ වාගේම නොතාරිස් ආඥාපනතත්

[ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා]

අපි සංශෝධනය කරගෙන යනවා. වර්තමාන සංකීර්ණ සමාජය තුළ ඉඩම් පිළිබඳ විශාල ප්‍රශ්න තිබෙනවා. වංචනික ක්‍රියා විශාල වශයෙන් සිදු වෙනවා. අපි මේ වන විට ඒ සඳහා අවශ්‍ය කරන පනත් කෙටුම්පත් නිර්මාණය කරගෙන, හදාගෙන යනවා. ඒ වාගේම අපරාධයක වගකීම දැරීම සඳහා වූ අවම වයස පිළිබඳව අපි දැන් කථා බහ කරලා යම් යම් තීන්දු තීරණවලට එළඹිලා ඉදිරියට ගමන් කරනවා. නඩු විභාගයකට අවශ්‍ය වන සාක්ෂිකාරයෙක්, එහෙම නැත්නම් යම් පාර්ශ්වයක් වෙනත් රටක සිටිනවා නම්, ඒ තැනැත්තාගෙන් සාක්ෂි ලබා ගැනීමේ බරපතළ ගැටලුවට අපි සියලු දෙනා මුහුණ දෙනවා. මේ සංශෝධනය ගෙන ඒම තුළින් මෙරටට අදාළ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අපේ රටේ තානාපති කාර්යාලයක් හරහා නිරවද්‍යතාව තහවුරු කිරීමෙන් පසුව සාක්ෂි ලබා ගැනීමේ ක්‍රමවේදය මේ වන විට අපි නිර්මාණය කරගෙන යනවා. මේ තුළින් සුවිශේෂී වූ වෙනසක්කමක් නීතිමය පද්ධතිය තුළ, රාමුව තුළ ඉෂ්ට සිද්ධ වේවි.

අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව මම මේ කරුණාව විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතියේ ආධිපත්‍ය බිඳ වැටුණොත්, අපට කිසිම ක්ෂේත්‍රයක් ගැන කථා කරන්නට පුළුවන්කමක් නැහැ. ආර්ථිකයේ වේවා, සමාජ ක්ෂේත්‍රයේ වේවා අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ ජනතා විශ්වාසය බිඳ වැටුණු දවසට අපේ මේ ව්‍යාපාර විතරක් නොවෙයි, අනෙකුත් සියලු දේ බිඳ වැටෙන එක නවත්වන්න පුළුවන්කමක් නැහැ. අපේ රටේ පැවැති ආණ්ඩු අරගෙන බලනකොට, සමහර ආණ්ඩු පැවැති කාල වකවානු තුළ විනිසුරුතුමන්ලාට ගල් ගහපු අවස්ථා තිබුණු බව මට මතකයි. ඒ වාගේම මෑත කාලයේ සිටි අගවිනිසුරුතුමන්ලා, තමන්ගේ ධුරයෙන් විශ්‍රාම ගියාට පසුව කරන සමහර ප්‍රකාශ දිහා බැලුවාම අපේ රටේ නීතියේ ආධිපත්‍ය පිළිබඳ අපට යම් වැටහීමක් ලබා ගන්න පුළුවන්. ඒ වාගේම තමන්ට තනතුරේ තියා ගන්නවා නම් ඕනෑම තීන්දුවක් ලබා දෙන්නම් කියලා සමහර අය ජනාධිපතිතුමාට පවා ප්‍රකාශ කරලා තිබුණා. අපේ නීතිඥ සංගමයේ සභාපතිතුමා හැටියට සිටි, අපේ හිටපු ඇමැති විජයදාස රාජපක්ෂ මැතිතුමාගේ නිවසට වෙඩි තිබ්බා. සමහර ආණ්ඩු පැවති කාලවල නීති ක්ෂේත්‍රයට සම්බන්ධ අයට නොයෙකුත් ප්‍රශ්න ඇති වුණා.

එම නිසා අපි විශේෂයෙන් මතක් කරන්නට ඕනෑ, මොන ආණ්ඩුව බලයට පත් වුණත් ස්වාධීනත්වයකින් යුතුව මේ ගමන ඉදිරියට යන්නට ඒ ඒ අංශවලට අවශ්‍ය කරන පරිසරය -වටපිටාව- සකස් කර දීම අපේ යුතුකමක් බව. නව අධිකරණ කිහිපයක් නිර්මාණය කිරීමට අවශ්‍ය කරන කැබිනට් පත්‍රිකාව ගරු අමාත්‍යතුමිය කැබිනට් මණ්ඩලයට යොමු කළා. අපේ රටේ සුවිශේෂී වෙනසක්කමකට යන්නට නව අධිකරණ පිහිටුවීමත් එක්ක අපට පුළුවන්කම ලැබේවි. එම නිසා අපි කවුරුත් බිය වන්නට අවශ්‍ය නැහැ. අපට අවශ්‍ය කරන්නේ කාර්යක්ෂමතාවයෙන් යුතු ඵලදායිතාවයෙන් ඉහළ අධිකරණ පද්ධතියක් අධිකරණ ක්ෂේත්‍රය තුළ නිර්මාණය කිරීමයි. එයයි අපි සියලු දෙනාගේම බලාපොරොත්තුව විය යුත්තේ.

මා දීර්ඝ වශයෙන් අදහස් දක්වන්නට යන්නේ නැහැ. කෙසේ නමුත් මම ස්තුතිවන්ත වන්නට ඕනෑ. අධිකරණ අමාත්‍යාංශය පිළිබඳව පක්ෂ විපක්ෂ සියලු දෙනාගේම මතවාද සමඟ කල්පනා කර බලනවිට වසර දෙකහමාරක තුනක කාලයක් ඇතුළත සතුටුදායක ගමනක් ඇවිත් තිබීම ගැන අපට සතුටු වන්නට පුළුවන්. එම නිසා, මේ ප්‍රගතිය ලබා ගැනීමට දැක් වූ දායකත්වය පිළිබඳව අධිකරණ අමාත්‍යතුමිය, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රධාන සියලුම රාජ්‍ය නිලධාරින්, අධිකරණ අමාත්‍යාංශයට සම්බන්ධ සියලුම දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් ඇතුළු අදාළ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. එම නිසා නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත රටක් නිර්මාණය කිරීම පිණිස සියලු දෙනා කැප වීමෙන් සහයෝගය ලබා දෙන ලෙස මතක් කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට, ගරු ඩී. වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18 ක් තිබෙනවා.

**[අ.භා. 4.28]**

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ කාරක සභා අවස්ථාවේදී මගේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මට විනාඩි 5ක කාලයක් ලබා දුන් ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාටත් මම ස්තුති කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට වාගේ රටකට විදේශ ආයෝජන නැතිව ඉස්සරහට යන්න බැරි තරමට අපි අසරණ වෙලා තිබෙනවා. අපේ ආනයනය, අපනයනය අතර විශාල පරතරයක් තිබෙනවා. ඒ වගේම රටේ නිෂ්පාදනය එන්න එන්නම අඩු වෙනවා. රටේ ආර්ථික කළමනාකරණයේ දුර්වලතාවය නිසා රටේ ආර්ථිකය එන්න එන්නම කඩාගෙන වැටෙනවා.

මූලසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015ට කලින් රට තුළට විශාල ආයෝජන ආවා. විවිධාකාර ආයෝජන ආවා. හම්බන්තොට වරාය ආවා. මත්තල ගුවන් තොටුපළ ආවා. ගරු සරත් අමුණුගම අමාත්‍යතුමා එතුමාගේ කාලයෙන් වැඩි හරියක් කාලය ගත්තේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලය තුළ ආපු ආයෝජන පිළිබඳව සඳහන් කරන්න; ඒවාට ස්තුති කරන්න. මම එතුමාටත් ඒ නිසාම ස්තුති කරන්නට කැමතියි. ඒ වාගේම නොරොච්චෝලේ බලාගාරය ආවා. ඔබතුමන්ලා කැමැති වුණත් නැති වුණත් අද රටට විදුලිය ලැබෙන්නේ මේ විදුලි බලාගාරය නිසායි. ඒ වාගේම උමා ඔය ව්‍යාපෘතිය ආවා. ඒ වාගේම නෙළුම් කුලුන ව්‍යාපෘතිය ආවා. අප රට තුළට විශාල වශයෙන් සංවර්ධන ව්‍යාපෘති ආවා. ඒ ආයෝජන එනකොට එවකට විපක්ෂයේ හිටපු මේ ආණ්ඩුවේ ඇමතිවරු -එතුමන්ලා මෙතැනත් ඉන්නවා.- විශාල වශයෙන් චෝදනා එල්ල කළ බව මට මතකයි. චීනයට බැන්නා. එතුමන්ලා එතුමන්ලාගේම ජනාධිපති ඇවිල්ලා තියපු මුල් ගල ගැලෙව්වා. නෙළුම් කුලුන නැවැත්වුවා. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද වෙනකොට චීනය වෙතම වැඳගෙන යන්න වෙලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අගමැතිතුමා බලයට එනකොට එතුමා මුලින්ම කිව්වේ, "ලෝකයම ඉන්නේ එතුමාත් එක්ක." කියායි. චීනයෙන් විතරක් නොවෙයි. එතුමා යුරෝපයෙනුත් ආයෝජන ගේනවාය කිව්වා. අපි එතුමාගෙන් අහන්න කැමැතියි, යුරෝපයෙන් ආපු ආයෝජන මොනවාද කියා. ඒ වාගේම ඇමෙරිකාවෙන් ආපු ආයෝජන මොනවාද කියා. අන්තිමට මොකක්ද වුණේ? අන්තිමට චීනයටම වැඳගෙන යන්න වුණා, නැවතත් Colombo Port City Project එක පටන් ගන්න කියා, නැවතත් නෙළුම් කුලුන ව්‍යාපෘතිය පටන් ගන්න කියා. නැවතත් චීනය පස්සෙන්ම යන්න වුණා. ඊට පස්සේ මහින්ද රාජපක්ෂ මැතිතුමා හදපු ටිකත් කෑලි කෑලිවලට කඩලා අද චීනයට විකුණන්න පටන් ගෙන.

මට මතකයි, ගරු සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමන්ලා එදා කිව්වා, "මේ රට චීන කොලනියක් කරනවා." කියා. එතුමන්ලාගේ ආණ්ඩුව හරහාම අද හම්බන්තොට වරාය චීනයට දීලා ඉවරයි. ඒ වාගේම මත්තල ගුවන් තොටුපළ හෙට අනිද්දා ඉන්දියාවට දෙන්න යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වනකොට ආයෝජන නැහැ. නමුත් එතුමන්ලා කියපු ආයෝජන දෙකක් නම් ආවා. එකක් වොක්ස්වැගන් කාර් සමාගම. කුරුණෑගල ගිහින් ඉඩම් ටික සම්පූර්ණයෙන් ශුද්ධ කළා. පොල්වතු ටික ශුද්ධ කර දැම්මා. හැබැයි, කෝ අද වොක්ස්වැගන්? ඒ වෙනුවට හොරාට කැලි ගෙනැල්ලා එකතු කරන සමාගමක් තමයි පටන් ගන්න යන්නේ. අපේ ඉඩම් ටික ගියා. අපේ පොල්වතු ටික ගියා. හැබැයි, ආපු ආයෝජනයකුත් නැහැ. දෙවැනි ආයෝජනය තමයි හොරණ ටයර් කර්මාන්ත ශාලාව. ටයර් කර්මාන්ත ශාලාව කාගේද?

මුලින්ම කිව්වා, ඩුබායිවල Marriott Hotel එක නාමල් රාජපක්ෂ මැතිතුමන්ගේ කියලා. මහින්ද රාජපක්ෂ මැතිතුමාට චෝදනා කළා, මේක එතුමන්ලාගේ කියලා. හැබැයි, අන්තිමට මලික් සමරවික්‍රම මැතිතුමාගේ සහ සුජීව සේනසිංහ රාජ්‍ය අමාත්‍යතුමාගේ අමාත්‍යාංශය හරහා එතුමාටම අක්කර 100ක් දෙනවා, අක්කරය රුපියල් 100ට. ඉතින් මේවා තමයි ආයෝජන කියන්නේ. විදේශ ආයෝජන විශාල වශයෙන් ආවා ලු. කෝ, දැන් ඒ ආයෝජන? අද වෙද්දි රටට ආයෝජනය එන්නේ නැහැ. එදා තිබුණු ආයෝජන ටිකම තමයි මේ ගොල්ලන් කරකව කරකව ඉන්නේ. ඇයි, මේ රටට ආයෝජන එන්නේ? කොහොමද, මේ රටට ආයෝජන එන්නේ? චීනය එළෙව්වා. චීනයට බැන්නා. හැබැයි, අද ඒ චීනයටම යන්න වුණා.

අපි දන්නවා, කොහොමද ආයෝජන එන්නේ කියලා. මොකද අගමැතිතුමා නායකත්වය දෙන අගමැතිතුමාගේ අමාත්‍යාංශය හරහාම ලංකා ඉතිහාසයේ ලොකුම වංචාව වෙනකොට, චීනය, පිටරටවල්, එන්නේ කොහොමද? කොහොමද, ආයෝජන වෙන්නේ? අගමැතිතුමාගේ අමාත්‍යාංශයේ බැඳුම්කර වංචාව සිදු වෙන විට, මුලින්ම මහ බැංකුව එතුමාගේ යටතට ගන්නේ එතුමායි. මහ බැංකුව එතුමාගේ යටතට ගත්තාට පසු ලංකා ඉතිහාසයේ ලොකුම වංචාව සිදු වෙනවා. හැබැයි, ඒවා සාධාරණීකරණය කරන්න අගමැතිතුමා ඇතුළු මන්ත්‍රීවරු සියලුදෙනාම උත්සාහ කළා. අන්තිමට ඒකේ ප්‍රතිඵලයක් වශයෙන් ලංකාවට රුපියල් කෝටි ගණනක් පාඩු වුණා. ඒ පාඩුව වහන්න, අද වෙද්දි ජනතාවට බදු ගහනවා. අද බැඳුම්කරයේ පාඩුව රුපියල් ට්‍රිලියනයයි. ඒ වාගේම 2014ට සාපේක්ෂව වැඩි වෙච්ච බදු ප්‍රමාණයත් ට්‍රිලියනයයි. ගරු සුජීව සේනසිංහ මැතිතුමනි, මේක මම කියපු දෙයක් නොවෙයි; ලක්ෂ්මන් යාපා අබේවර්ධන රාජ්‍ය ඇමතිතුමායි කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2014 ඉඳන් වැඩි වෙච්ච බදු ආදායම සමානයි මේ බැඳුම්කර වංචාවේ පාඩුවට. ඒ කියන්නේ, තනිකරම මේ බදු ගහලා තිබෙන්නේ බැඳුම්කරයේ පාඩුව වහන්න. මට මතකයි, 2015 වර්ෂයේදී ඩිව් ගුණසේකර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති COPE එකෙන් මේ බැඳුම්කර වංචාව පිළිබඳ මුල්ම වාර්තාව එනවා. මේ වාර්තාව එළිදක්වන්න දවසක් තියලා ජනාධිපතිතුමාගේ මැදිහත්වීමෙන් පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා. හැබැයි, එම කමිටුවේ සුජීව සේනසිංහ මැතිතුමාත් සාමාජිකයෙක් විධියට හිටියා. හැබැයි, එතුමා කාටද කඩේ ගියේ? එතුමා යනවා, උසාවියට. නීතිඥයෙක් වශයෙන් එතුමා පෙනී සිටිනවා දැක්ක එකම පැමිණිල්ලයි මේක. එතුමා උසාවියට යනවා දැක්කෙත් මේකටම තමයි. එතුමා මේ වාර්තාව එළියට එන්න දෙන්න එපා කියලා තහනම් නියෝගයක් ගන්න උසාවියට යනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා උසාවියක වැඩ කරලා තිබෙනවාද?

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රූපවාහිනියෙන් දකිනවා. රාජ්‍ය අමාත්‍යතුමනි, උසාවියේ වැඩ කරන්න ඕනෑ ද, උසාවි යන අය පෙන්වන්න? උසාවියේ වැඩ කරන්න ඕනෑද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ රාජ්‍ය අමාත්‍යතුමා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා හිරේ හිටියාද? එහෙම නැත්නම් කොහොමද ඔබතුමා අපව දකින්නේ, අපි උසාවි යනවාද, නැද්ද කියලා?

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ඔබතුමා කථා කරලා ඉවරයිද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔව්.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
දැන් ඔබතුමා කියන්නේ, උසාවි යන අය ඔක්කෝම පේන්න උසාවි යන්නම ඕනෑ කියලාද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒක තමයි මම ඇහුවේ, ඔබතුමා උසාවියේ වැඩ කරලා තිබෙනවාද කියලා.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
අපි රූපවාහිනියෙන් දැක්කා, ඔබතුමා ගිහිල්ලා පැමිණිලි දානවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා උසාවියක වැඩ කරලා තිබෙනවාද?

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ඔබතුමා ගිහිල්ලා පැමිණිලි දානවා අපි දැක්කා. අන්තිමට ඔබතුමා ගිහිල්ලා පැමිණිල්ල අයින් කර ගත්තා. ලජ්ජයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මම වෙන දවස්වලටත් උසාවි යනවා ද නැද්ද කියලා ඔබතුමා දැකලා තිබෙනවාද?

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ඔබතුමා වෙන දවස්වලට කොහේ උසාවියට ද යන්නේ කියලා කියන්නකෝ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒක තමයි මම අහන්නේ.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ඔබතුමා කරපු පැමිණිලි ටික මට කියන්න. ඔබතුමා කරලා තිබෙන්නේ මෙච්චරයි, ඒ අර්ජුන් ඇලෝසියස්ට කඩේ ගිය එක. වෙන කිසි දෙයක් කරලා නැහැ. අර්ජුන් ඇලෝසියස්ට කඩේ ගියා. මෙතුමා තමයි මුලින්ම-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ රාජ්‍ය අමාත්‍යතුමා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නාමල් රාජපක්ෂ මහත්තයා කඩේ ගියේ. අහගන්න, නාමල් රාජපක්ෂ මහත්තයාගෙන්. අහගන්න, ඔබතුමාගේ බොස්ගෙන්. අපෙන් අහලා හරියන්නේ නැහැ.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා, පොඩ්ඩක් ඉන්නකෝ. නාමල් රාජපක්ෂ මැතිතුමා ද, සුජීව සේනසිංහ ද කඩේ ගියේ කියලා මම දැන් කියන්නම්කෝ. මෙතුමා 2015 වසරේදී පළමුවෙනියටම උසාවියට යනවා, මේ වාර්තාව එළියට එවන්න එපා කියලා තහනම් නියෝගයක් ගන්න. නාමල් රාජපක්ෂ ද ගියේ? සුජීව සේනසිංහ ගියේ. සුජීව සේනසිංහ තමයි මේවා වහන්න ගියේ. ඊට පසුව මෙතුමා පොතක් ලියනවා. ඉන්න, ඔබතුමා මෙම වංචාව වහන්න ලියපු පොත ගැනත් මම කියන්නම්. මගේ ළඟ පොත තිබෙනවා. මොකක්ද, "මහ බැංකු බැඳුම්කර නිකුතුවේ ඇත්ත නැත්ත" කියන පොත. මෙතැන වංචාවක් වුණේ නැහැ, හොරකමක් වුණේ නැහැ කියලා සුජීව සේනසිංහ ලියන පොතයි, මේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මම ඔබතුමාගෙන් ඉතාමත්ම කරුණාවෙන් අහන්නේ. මේ පොතක් ගැන කිව්වා නේ. ඒ පොත ඔබතුමා ළගත් තිබෙනවා. බැඳුම්කර සිද්ධිය සම්බන්ධ අදාළ තොරතුරු ජනාධිපති කොමිසමට කැඳෙව්වා. දැන් ඔබතුමා කියන විධියට ඕක වැරදි නම් කොමිසටම මාව කැඳෙව්වේ නැත්තේ ඇයි? දැන් මම ඔය සම්බන්ධයෙන් පොතක් ලියලා තිබෙනවා. හැම ප්‍රකාශයක්ම කරපු බන්දුල ගුණවර්ධන, වීරකුමාර දිසානායක යන මන්ත්‍රීවරුන් වචනයක් කිව්වා නම් කොමිසමට කැඳෙව්වා. මම කොමිසමට අභියෝග කළා, "පුළුවන් නම් මාවත් කැඳවන්න. ඒ සම්බන්ධයෙන් මම උත්තර දෙන්නම්" කියලා.

ඔබතුමාට නීතිය ගැන දැනුමක් නැති නිසායි මම කියන්නේ. ඒ සම්බන්ධයෙන් මොනවා හෝ වැරදි දෙයක් කියලා තිබෙනවා නම් අනිවාර්යයෙන්ම මාව කැඳවන්න කොමිසමට පුළුවන්. නිකම් මඩ ගහන්න එපා. කට වාචාලකමට-

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අවස්ථාව දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට මෙතුමාව යවන්න තිබෙන්නේ කොමිසමට නොවෙයි, මෙතුමාට අර්ජුන ඇලෝසියස්ගෙන් ආපු telephone calls පිළිබඳව දැන ගත්තාම මෙතුමාට යන්න වෙන්නේ හිරේ. මේ හොරකම සම්බන්ධයෙන් හිරේ යන්නේ. කොමිසමට විතරක් යන්නේ නැහැ. ඔබතුමන්ලා මේ සල්ලි ටික ගෙවන්න ඕනෑ. මෙන්න, මෙතුමාගේ පොතේ මේ බැඳුම්කර වංචාව ගැන ලියන හැටි.

> "ඔබට යම් භාණ්ඩයක් මිල දී ගැනීමට අවශ්‍ය නම් හා, ඔබේ මාමාගේ වෙළෙඳසැලක් ඇත්නම් හා, ඔබට අවශ්‍ය භාණ්ඩ එම වෙළෙඳසැලේ විකිණීමට තබා ඇත්නම් සාමාන්‍ය ක්‍රමවේදය යටතේ නියමිත මුදල් ගෙවා එම වෙළෙඳසැලෙන් භාණ්ඩ මිල දී ගන්න, ඥාති සම්බන්ධතා මත සිදු වන අවස්ථා ගනුදෙනු යයි කියන්නේ කවර නම් සිහිබුද්ධියෙන් සිටින අයද? "

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේක ලිව්වේ සිහි බුද්ධියෙන්ද? මේක කඩයකට ගිහිල්ලා පාන් ගෙඩියක් ගන්නවා වාගේ දෙයක්ද? බෑණා ගිහිල්ලා මාමාගේ කඩෙන් පාන් ගෙඩියක්ද ගත්තේ? [බාධා කිරීමක්] මෙතැන රුපියල් ට්‍රිලියනයක පාඩුවක් වෙලා තිබෙන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මන්ත්‍රීතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බලාගෙන.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
රුපියල් ට්‍රිලියනයක පාඩුවක්.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මන්ත්‍රීතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පොඩ්ඩක් ඉන්න.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ඔබතුමාගේ ඔය සරමෙන් තමයි මුහුණ වහ ගෙන ඉන්නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීමක්]සරමෙන් මුහුණ වහගෙන ඉන්නේ. ලැජ්ජයි. ලැජ්ජයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු සුජීව සේනසිංහ මැතිතුමා

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමා, ප්‍රශ්නයක්. ප්‍රශ්නයක් අහන්නේ.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ලැජ්ජයි. ඔබතුමා පොත් ලිව්වා. බොරුවට පොත් ලිව්වා, බැඳුම්කර වංචාව වහන්න. ඔහු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
කෑගහන්න එපා, පපුව නවතී. ගරු මන්ත්‍රීතුමනි-

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
හා, ඔබතුමා කියන්නකෝ. හා, කියන්නකෝ. ඔබතුමා ප්‍රශ්නය අහන්නකෝ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
COPE කමිටුවේ සභාපති, හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ඇතුළු සියලුදෙනාම මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණයේදී කොහේවත් මේ ගනුදෙනුව සම්බන්ධනේ වංචාවක් සිදු වුණාය කියලා සඳහනක් නැහැ. එතකොට ඔබතුමා මේක කියන්න, මේ වංචාව තිබෙන්නේ කොහේද කියලා. හඳුන්නෙත්ති විරුද්ධ පක්ෂයේ ඉන්න මන්ත්‍රීතුමා, ඒ වාගේම මහින්දානන්ද අලුත්ගමගේ ඇතුළු COPE කමිටුවේ හිටපු ඔබතුමාගේ ඔය ගෝල කණ්ඩායම "බැඳුම්කර ගනුදෙනුව සම්බන්ධයෙන් අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා වගකියනු ලැබේ" කියනවා මිසක් වංචාවක් සිදු වුණු බවට කොහේවත් සඳහනක් නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් අහන්නේ නීතිය සම්බන්ධයෙන් දැනුමක් තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් එහෙම සඳහනක් නැත්තේ ඇයි කියලායි.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට සුජීව සේනසිංහ මැතිතුමා තවමත් විහිළු සපයනවා. අර්ජුන් ඇලෝසියස්ට කඩේ යන එක තවමත් නවත්වලා නැහැ. මෙතැන හොරකමක් වුණාය කියලා අද මුළු ලංකාවම දන්නවා. ඔබතුමා අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. ඔබතුමා හැර මුළු ලංකාවේ ඉන්න සියලුම දෙනා පිළිගන්නවා, මෙතැන හොරකමක් වුණාය කියලා. මෙතැන ඉන්න අමාත්‍ය මණ්ඩලයෙන් සියයට 50කට වැඩි පිරිසක් ඒක පිළිගන්නවා. පසු පෙළ මන්ත්‍රීවරු ඉන්නවා, ඒගොල්ලෝත් පිළිගන්නවා. හැබැයි, ඔබතුමාට පිළිගන්න බැහැ, ඔබතුමාට අර්ජුන් ඇලෝසියස් එක්ක තිබෙන සම්බන්ධතාව මත; ඔබතුමන්ලාට මැතිවරණයට cut-outs ගහන්න සල්ලි හම්බ වුණු නිසා. ඒ නිසා ඔබතුමන්ලාට පිළිගන්න බැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා, ඔය තරම් දන්නවා නම් COPE කමිටුව ඒක සඳහන් කළේ නැත්තේ ඇයි කියලා. කෑගහන්න දෙයක් නොවෙයි නේ. ඉතා සරල ප්‍රශ්නයක් මම ඔබතුමාගෙන් අහන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරි, ඔබතුමා උත්තර දෙන්න.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා විහිළු සපයනවා. එහෙම නම් ඉතින් මෙතැනම දඬුවම් කරන්න තිබුණා නේ. COPE කමිටුවෙන් දඬුවම් කරන්න පුළුවන් නම් මෙතැනදීම දඬුවම් කරන්න තිබුණා නේ. ඔබතුමා දකින්නේ නැද්ද, බැඳුම්කර වංචාව පිළිබඳව පරීක්ෂණය යද්දී මෙතැන වංචාවක් සිදුවෙලා තිබෙනවා කියලා?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය දෙන්න. මෙතුමා දැන් මගේ කාලය- [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මගේ කාලය දෙන්න. මෙතුමා මගේ කාලය ගන්නවා. මෙතුමාගේ නම සඳහන් කළාය කියමින්- [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මම ඔබතුමාගේ කාලය දෙන්නම්. ගරු සුජීව සේනසිංහ මැතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, COPE කමිටුවෙන් දඬුවම් කරන්න බැහැ. හැබැයි, COPE කමිටුවට කියන්න තිබුණා, මේ සම්බන්ධයෙන් වංචාවක් සිදු වුණාය කියලා. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ ඇයි, එහෙම සඳහන් නොකළේ කියලායි. ඒකට කැගහන්න ඕනෑ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම COPE කමිටුවේ සාමාජිකයෙක් නම් නොවෙයි. එතුමන්ලා නේ COPE කමිටුවේ හිටියේ. එතුමන්ලා නේ, හොරකමක් වෙලා නැහැයි කියන්නේත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම කියන්න ඕනෑ මෙතුමා COPE කමිටුවේ සාමාජිකයකු ලෙස පත් කිරීමේත් ලොකු වැරැද්දක් තිබෙනවාය කියලා. මොකද, 2015 මැතිවරණයට කලින් මෙතුමා පොතක් ලියනවා, මෙතැන වංචාවක් වුණේ නැහැයි කියලා. අර්ජුන් ඇලෝසියස්ට කඩේ යන කෙනෙක් පොතක් ලියලා තිබෙනවා, මෙතැන වංචාවක් සිදු වුණේ නැහැයි කියලා. මෙතුමා සාමාජිකයකු විධියට එන්නේ නිකම්ම නොවෙයි. හිටපු මන්ත්‍රීවරයෙක් අයින් කරලායි එන්නේ. අගමැතිතුමා හමුවෙලා "අනේ! මාවත් මේකට දමන්න" කියලා, වෙන කෙනෙක් අයින් කරගෙන තමයි මෙතුමා එන්නේ. මොකද, හේතුව. මෙතුමන්ලාගේ තිබෙන සමීප සම්බන්ධතා. මෙතුමා පොතක් ලියලා තිබෙනවා, වංචාවක් වුණේ නැහැයි කියලා. මෙතුමා උසාවියට ගිහිල්ලා තිබෙනවා, මෙතැන වංචාවක් වුණේ නැහැයි කියලා. එහෙම කෙනෙක් මෙතැන බැඳුම්කර පරීක්ෂණය සම්බන්ධයෙන් COPE කමිටුවේ සාමාජිකයෙක් වීමේම වැරැද්දක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා සම්බන්ධයෙන් තිබෙන පැමිණිලි ගැන කියන්න ගියොත් අපරාදයේ මගේ වෙලාවත් යනවා.

මේ COPE කමිටුව සම්බන්ධයෙන් පත්තර වාර්තා කරපු හැටි.

" කෝප් කමිටුවේ පහකට ඇලෝසියස් කථා කරලා"

මෙතුමා ඉන්න නිසා, එතුමාට ගත්ත telephone calls ගණන කියන්නම්කෝ.

"සුජීවට කෝල් 62ක්"

මේ telephone calls 62 එන්නේ නිකම් නොවෙයි. Telephone calls දෙසියගණනක් අරගෙන තිබෙනවා. එයින් telephone calls 62ක්ම එන්නේ COPE කමිටුවේම ඉන්න වෙලාවේ. COPE කමිටුවේ ඉන්න වෙලාවේ telephone calls 62ක් එනවා.[බාධා කිරීමක්] එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නාමල්ට කෝල් 800යි. කෝප් එකේ හිටියාට, අපට පෞද්ගලිකව පුද්ගලයෙකුට කථා කරන්න බැරි ඇයි? ඔබතුමා ඒ ගැන මට නීත්‍යනුකූලව පැහැදිලි කරලා දෙන්න. චූදිතයෙක් වශයෙන් නම් කරලාත් නැහැ. කෝප් එකේ අනෙක් නිලධාරින්ට කථා කරන්න පුළුවන් නම්, අපට යම් කිසි දැනුමක් ලබා ගන්න ඕනෑ නම්, කථා කළාම තිබෙන වැරැද්ද මොකක්ද කියලා ඔබතුමා කරුණාකරලා ප්‍රකාශ කරන්න.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැන සදාචාරාත්මකව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේක හරියට නඩුකාරතුමා චූදිතයාත් එක්ක දිගින් දිගටම සම්බන්ධතා පැවැත්වූවා වාගෙයි. අද උසාවිය තුළ නඩුකාරවරයාට චූදිතයා එක්ක සම්බන්ධතා පවත්වන්න දෙන්නේ නැත්තේ ඇයි? ඒ වාගේම ප්‍රශ්නයක් තමයි මෙතැනත් තිබෙන්නේ. අර්ජුන් ඇලෝසියස්ගේ උපදෙස් අරගෙන නේ ඔබතුමන්ලා කෝප් එකට යන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
අවස්ථාව දෙන්න, අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමනි, මේ ඔබතුමාගේ අවසාන point of Order එක. කරුණාකරලා මෙතුමාට කථා කරන්න දෙන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට යම් කිසි දැනුමක් ඇති නේ. කීයට හරි ඉගෙන ගෙන ඇති නේ. මම කියන්නේ මෙච්චරයි. රටේ සාමාන්‍ය පුරවැසියෙක් චූදිතයෙක් ලෙස නම් කරන්න කෝප් එකට බැහැ. පොඩ්ඩක් මේවා කියවන්න. කෝප් එකට අදාළ වෙන්නේ රාජ්‍ය සේවකයින් පමණයි. ඔබතුමාගේ යහළුවා, ඔතැන ඔය ඔබතුමාගේ ළඟ ඉන්න එක්කෙනා ඒ සම්බන්ධයෙන් හොඳට දන්නවා; දැනුමක් තිබෙනවා. සාමාන්‍ය පුරවැසියෙක් චූදිතයෙක් කරන්න කෝප් එකට බැහැ; අයිතිවාසිකමක් නැහැ; අපට mandate එකක් නැහැ. ඒ නිසා ඔබතුමා කථා කරනකොට පොඩ්ඩක් -ඔබතුමා කටින් කථා කරන නිසා, පස්සෙන් කථා කරන්නේ නැති නිසා - මොළේ පාවිච්චි කරලා කථා කරන්න. මෝඩයා කියලා පෙන්වන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා මෝඩකම් ගැන කථා කරනවා. හැබැයි අපි හොරකම් කරලා නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ හොරකම් කරලා නැහැ. [බාධා කිරීමක්]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ අපි හොරකම් කරලා නැහැ. [බාධා කිරීමක්] බැඳුම්කරයේ calls 52ක් අරගෙන තිබෙනවා. [බාධා කිරීමක්] Calls කෝල් 52ක් අරගෙන තිබෙනවා. [බාධා කිරීමක්] අර්ජුන් ඇලෝසියස් එක්ක මොනවාද කථා කළේ? [බාධා කිරීමක්] කෝල් 200 ගණනක් අරගෙන කථා කළේ මොනවාද? [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
හොරකම් කරලා තිබෙනවා. [බාධා කිරීමක්]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

බැඳුම්කරයේ හොරකමට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

සම්බන්ධයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒවායින් තමයි අර cutouts ගැහුවේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ඔබතුමා 2015 වසරේ පොත් ලිව්වා. [බාධා කිරීමක්] පොත් ලිව්වා, මේවා නවත්වන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
හැබැයි, හොරකම වහන්න බැහැ රාජ්‍ය ඇමතිතුමා. [බාධා කිරීමක්] මේවා අද එළියට ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඩී.වී. උපුල් කියන්නේ කවුද?

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේවා ගැන තවත් කථා කරන්න යන්නේ නැහැ. ඔබතුමා ගැන රටම දන්නවා. අර්ජුන් ඇලෝසියස්ගෙන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

හැටිත් දන්නවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඕනෑ නම් මෙතුමා ගැන තවත් කියන්නම්. මෙතුමාට මෙච්චර ඕනෑ නිසා මම තව එක වතාවක් කියන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් සිටින රාජ්‍ය ඇමතිවරයෙකුට චෝදනා කළාම එතුමා නැඟිටලා උත්තර දෙනවා. ඒ නිසා ඔබතුමා කරුණාකරලා මේ මාතෘකාව යටතේ කථා කරන්න.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ මාතෘකාව යටතේ තමයි කථා කරන්නේ. මේ රටට ආයෝජන එන්නේ නැති හේතුව මම මේ කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අවස්ථාව දෙන්න. මම කොහේවත් එතුමාගේ නම සඳහන් කරලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කිසිම වෙලාවක එතුමාගේ නම සඳහන් කළේ නැහැ. ඔබතුමා මට මගේ කාලය දෙන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Sir, when I intervened, he mentioned, “You have done this.” He does not have to mention the name. Even if he indicates it, that should be expunged from Hansard. He indicates that and he has no right to do that. At least, he must learn these things or get out; he must do one of the two.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනින් එළියට යන්න ඕනෑ මමද, එතුමාද කියලා එතුමා තීරණය කළා නම් හරි. මොකද, මෙතුමා පාර්ලිමේන්තුවේ ඉන්න සුදුසුද කියලා අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මෙතැන ඉන්න එක ඇමතිවරයෙක්, ගුවන් හමුදාපතිවරයා හන්තානේ ගෙයක් හදනකොට කියනවා, වනාන්තර එළි කරනවා කියලා. පර්චස් දහයයි, ඒ ඇමතිතුමාගේ ඉඩම. මම ඕනෑ නම් නඩු අංකය කියන්නම්; BLM - 34. මේ නඩුව නුවර උසාවියේ විභාග වෙන්නේ. මේ නඩුවේ තිබෙන්නේ, පර්චස් දහයයි, ඒ ඇමතිතුමාගේ ඉඩම. අන්තිමට මෙතුමා ගිහිල්ලා මෙතුමාගේ ඥාති කෙනෙකුට ඉඩම පවරනවා. ඉඩම පවරලා, සුද්ද කර ගෙන, සුද්ද කර ගෙන, කැලේ කපාගෙන යනවා. අන්තිමට ගමේ අය ගිහිල්ලා ඒකට විරුද්ධව පැමිණිල්ලක් දමනවා. පැමිණිල්ල දැම්මාට පසුව ඒ ඉඩමට ආරක්ෂාව දුන්නේ කවුද? MSD එකෙන්. ඇමති ආරක්ෂක අංශයෙන් ගිහිල්ලා තමයි ඒ ඉඩමට ආරක්ෂාව දුන්නේ. මේ පිළිබඳව දැනට උසාවියේ නඩුවක් තිබෙනවා. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලීසියට පැමිණිල්ල ගිහිල්ලා පැමිණිල්ල විභාග කරලා සතියයි. මම වගකීමෙන් කියන්නේ. සතියක් ඇතුළත OIC ඇතුළු පොලීසියම මාරු කළා. OIC ගිහිපු තැනක් නැහැ. පොලීසිය ගිහිපු තැනක් නැහැ. [බාධා කිරීමක්] තොප්පිය හරි නම් ඔබතුමා දමා ගන්න. අපට ප්‍රශ්නයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා ඉස්සර මවපු සුරංගනා ලෝක නොවෙයි දැන් තිබෙන්නේ. ඉස්සර 2015ට කලින් නම් ඔය ඇමතිවරු දැක්කාම අපිත් හිතුවා, හරි සුචරිත අය කියලා. සුදුවට ඉන්නවා. නැෂනල් එක ඇඳගෙන ඇවිල්ලා අපි හොරකම් කරන්නේ නැහැ, වංචා කරන්නේ නැහැ කියලා කියන කොට අපිත් එහෙම හිතුවා; රටේ තරුණයෝත් එහෙම හිතුවා. හැබැයි රැවටුණා. අද වෙද්දී හොරකම් කරන්නේ ඒ කණ්ඩායම. ඒ කණ්ඩායම තමයි වංචාවලට හසු වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගැන තවත් කථා කරන්න යන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මන්ත්‍රීතුමාගේ කාලයත් ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකය තුළ අපේ රටට තිබුණු තැන අද වනකොට නැති වෙලා තිබෙන්නේ. අද Bloomberg තුළින් කරපු වර්ගීකරණය අනුව අපේ රට එන්න එන්නම පහළට ගිහිල්ලා තිබෙනවා. ඒ වර්ගීකරණය අනුව ලකුණු 100කින් අපට ලැබෙන්නේ ලකුණු 12යි. ආයෝජන කරන්න මේ රටට එන එක සුදුසු නැහැයි කියලා අද ලෝකයම කියනවා. මෙකට එක් හේතුවක් තමයි, මේ බැඳුම්කර වංචාව. මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ඉදිරි පෙළියේ සිටින සියලුම ඇමතිවරුන්ට වාගේ අද වනකොට චෝදනා එල්ල වී තිබෙනවා. කිරිඇල්ල ඇමතිතුමාට විරුද්ධව චෝදනා තිබෙනවාද දන්නේ නැහැ. මේ සභාවේ ඇමතිවරුන් සියලු දෙනාටම වාගේ චෝදනා තිබෙනවා. එම නිසා තමයි අපේ රටට ආයෝජන එන එක සම්පූර්ණයෙන් නැවතිලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට අධිකරණය පිළිබඳව ලොකු විශ්වාසයක් තිබෙනවා. අධිකරණය පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධිකරණයට කරුණු දැක්වීම කරන්නේ පොලීසියේ නිලධාරීන් විසින්. හැබැයි, අපට ඒ සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. පොලීසියේ නිලධාරීන් විසින් නිවැරදිව මේ කරුණු දැක්වීම නොකිරීම තුළින් අද අප රටේ ජනතාවට විශාල අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන් ගත්තාම අද මේ ආණ්ඩුව පොදු දේපළ පනත යොදා ගෙන තිබෙන්නේ ජනතාව දඩයම් කරන්නයි. මත්තල ගුවන් තොටුපොළේ උද්ඝෝෂණයක් සිදුවනකොට ඒ උද්ඝෝෂණය කරපු කණ්ඩායම හිරේට දමන්නේ මේ පොදු දේපළ පනත යටතේ බව මා දන්නවා. එම උද්ඝෝෂණයේදී සිදු වූ හානිය මොකක්ද? පඹයෝ තුන්දෙනෙක් ගිනි තබද්දී එහි තිබෙන barriersවලට රුපියල් 130,000ක හානියක් සිදුවීම. මේක අරුම - පුදුම- හානියක්. තලතා අතුකෝරල මැතිතුමිය මේ ගැන දන්නවා. මේ හානිය කොහොමද වුණේ? මේ විධියට තමයි අද පොලීසිය අධිකරණයට කරුණු දක්වන්නේ. විශේෂයෙන්ම අද විපක්ෂය මර්දනය කරන්න, ආණ්ඩු විරෝධීන් මර්දනය කරන්න මේ කණ්ඩායම යොදා ගෙන තිබෙන්නේ අධිකරණයයි. හැබැයි, අධිකරණය ස්වාධීන වුණත්, අධිකරණයට කරුණු දක්වන පොලීසිය ස්වාධීන නොවීම තුළින් අද රටට විශාල අසාධාරණයක් සිදුවෙලා තිබෙනවා.

හම්බන්තොට වරාය ගැනත්, හම්බන්තොට වරායේ ගිවිසුම ගැනත් අද සරත් අමුණුගම මැතිතුමා විශාල වශයෙන් කථා කළා. රටට ආයෝජන එනවාට අපි විරුද්ධ නැහැ. අපට ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. රටට ආයෝජන එන එක හොඳයි. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ මේ රටට එන එම ආයෝජන අපට කොපමණ දුරට හොඳයිද කියන එක සම්බන්ධවයි. අද හම්බන්තොට වරාය දෙන්නේ සමාගම් දෙකකටයි. එක සමාගමක ඇතුළත් කරනවා, සියයට 85යි -15යි කියලා. ඒ සමාගම ඇතුළේ අපට තිබෙන්නේ සියයට 15යි. හැබැයි, මේ සමාගම ඇතුළේ තමයි රටට ආදායම් ලැබෙන සියලුම දේවල් තිබෙන්නේ. මේ සමාගම ඇතුළේ තමයි, තෙල් දෙන ඒවා - bunkering - තිබෙන්නේත්, නැව්වලට අවශ්‍ය සියලු දේවල් සපයන්නේත්. ඒ වාගේම තව සමාගමක් හදනවා, සියයට 50ක් අපට තිබෙන, අනික් සියයට 50 චීනයට තිබෙන විධියට. හැබැයි, ඒකේ තිබෙන්නේ මොනවාද? නැව්වලට ඉටි පන්දම් ගෙන යන ඒවා, නැව්වල තීන්ත ගාන ඒවා. හැබැයි, මේක ඇතුළේම තිබෙනවා, හම්බන්තොට වරාය භාරනවා නම්, ඒක කරන්න ඕනෑ ඒ සමාගම කියලා. එතකොට හම්බන්තොට වරාය භාරනවා නම්, ඒක භාරන වෙලාවට අපි සියයට 50ක් ගෙවන්න ඕනෑ. හැබැයි, එතකොට වැඩ කරන්නේ අපි; භාරන්නේ අපි. හැබැයි, ආදායම ගන්නේ චීනය. මේ ආණ්ඩුවේ ඉන්නේ චීනයට බැණපු ඇමතිවරු. හැබැයි, ඒ බැණපු චීනයටම අද මේ හම්බන්තොට වරාය දීලා අවසන්. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද වනකොට අලුත් කාර්යාලයක් දමා ඉඩම් ටික මැන ගෙන - මැන ගෙන යනවා. ආයෝජන එනවා නම්, කමක් නැහැ. හැබැයි, හම්බන්තොට වරාය ඇතුළේ පමණක් අක්කර 5,000ක් තිබෙනවා. මේ අක්කර 5,000 තුළ ආයෝජන මොකුත් නැහැ. මේ අක්කර 5,000 තුළ කිසිම කර්මාන්තශාලාවක් විවෘත කරන්නේ නැහැ. හැබැයි, එහෙම තියෙද්දි එතැනින් පිටට ගිහිල්ලා තවත් ඉඩම් අක්කර 10,000ක ප්‍රමාණයක මැනුම් කටයුතු මේ වෙද්දි කර ගෙන යනවා. අපේ රටට ආයෝජන ගේන්නේ මෙහෙමද? අද රටට ආයෝජන ගේනවා කියලා කරන්නේ රට තුළ තිබෙන ජාතික සම්පත් විකුණන එකයි. මත්තල ගුවන් තොටුපොළට කරන්න යන්නේත් මේකම තමයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රට තුළට කිසිම ආයෝජනයක් එන්නේ නැහැ. අපේ රට එන්න එන්න; දවසින් දවස කඩා ගෙන වැටෙනවා පමණයි. ඒ නිසා තමයි අපි මේ ආණ්ඩුවට විරුද්ධව මෙපමණ සටන් කරන්නේ. එම නිසා අපි මේ අය වැයට විරුද්ධව අනිවාර්යයෙන්ම ඡන්දය ලබා දෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ගරු තලතා අතුකෝරල ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 20ක් තිබෙනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ඇයි ඒ, මට විතරක් වෙලාව අඩු වෙලා තිබෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා පැමිණියේ නැත්නම්, ඔබතුමියට එතුමාගේ වෙලාවත් ගන්න පුළුවන්.

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

***අනතුරුව ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. J.M. ANANDA KUMARASIRI *left the Chair and* THE HON. SPEAKER *took the Chair.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමිය කථා කරන්න.

**[අ.භා. 4.51]**

**ගරු තලතා අතුකෝරල මහත්මිය (විදේශ රැකියා අමාත්‍යතුමිය සහ අධිකරණ අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - வெளிநாட்டுத் தொழில்வாய்ப்பு அமைச்சரும் நீதி அமைச்சரும்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Foreign Employment and Minister of Justice)
ගරු සභාපතිතුමනි, මා අධිකරණ අමාත්‍යාංශය භාරගෙන මාස තුනක් පමණ ගතවී තිබෙන අවස්ථාවක තමයි අද අය වැය කාරක සභා අවස්ථා විවාදයේදී අමාත්‍යාංශයේ වැය ශීර්ෂ වෙනුවෙන් මට කථා කරන්න ලැබෙන්නේ. 2018 අය වැය යෝජනා හදනකොට අපි -අධිකරණ අමාත්‍යාංශය- ඉල්ලූ දේවලට විශාල මුදලක් වෙන් කරලා අපට ශක්තියක් ලබාදීම පිළිබඳව ගරු මුදල් ඇමතිතුමාට මම ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

අපේ ගරු අගමැතිතුමා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට - ඇමතිවරු, නියෝජ්‍ය හෝ රාජ්‍ය ඇමතිවරු නොවන- විශාල වැඩ කොටසක් භාර දීලා, ආංශික අධීක්ෂණ කාරක සභා 16ක්, 17ක් විතර පත් කළා. ඒ අනුව අධිකරණ කටයුතු සම්බන්ධ අවශ්‍ය වෙනස්කම් කරන්න, ඒ සඳහා අවශ්‍ය යෝජනා කරන්න අපේ ගරු අජිත් මාන්නප්පෙරුම මැතිතුමාගේ සභාපතිත්වයෙන් නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව පත් කළා. එතුමා සහ එහි සාමාජික සියලු මන්ත්‍රීතුමන්ලාට ස්තුති කරන්නත් මම මෙය අවස්ථාවක් කර ගන්නවා. අධිකරණ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනවල ප්‍රධානීන් ඇතුළු වෙනත් අයගේ නියෝජනත් ලබාගෙන, ඒ සෑම ආයතනයකම කරුණු හොඳින් විමසා බලා මේ ක්ෂේත්‍රයේ විය යුතු වෙනස්කම් සම්බන්ධයෙන් වාර්තාවක් සකස් කර එය පාර්ලිමේන්තුවටත් ඉදිරිපත් කරලා, ඒ පිළිබඳව අපත් දැනුවත් කරලා විය යුතු වෙනස්කම් සම්බන්ධයෙන් ඒ කමිටුව අවශ්‍ය කටයුතු කළා. ඒ සඳහා ගත්ත මහන්සියට අපේ අජිත් මාන්නප්පෙරුම සභාපතිතුමාටත්, එම සාමාජික මණ්ඩලයේ සිටි මන්ත්‍රීවරු සියලුදෙනාටත්, ඊට සහයයෝගය ලබාදුන් සහ සහභාගි වුණු අපේ ආයතනවල සිටින සියලු නිලධාරින්ටත් මම මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා.

අද විපක්ෂයේත්, ආණ්ඩු පක්ෂයේත් මන්ත්‍රීවරුන් වැඩි දෙනෙක් අධිකරණ අමාත්‍යාංශය සහ එහි වැඩකටයුතු සම්බන්ධයෙන් අදහස් රාශියක් ඉදිරිපත් කළා. අපේ නියෝජ්‍ය ඇමතිතුමාත්, මමත් අපට ඉඩ කඩ තිබෙන විධියට ඒ හැම එකකටම උත්තර දෙන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම ගරු ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමාගේ කථාවේදී විනිශ්චයකාරවරු වැඩි කරන්න කියලා ඉල්ලීමක් කළා. අපි අධිකරණ සංවිධාන පනත සංශෝධනය කළාට පස්සේ, මුලිකවම හිටපු දහදෙනාට අමතරව, ආංශික අධීක්ෂණ කාරක සභාවේ යෝජනාව අනුව තවත් 25 දෙනෙක් වැඩි කරන්න කටයුතු කළා. එතුමා අපට ඉල්ලීමක් කරලා කිව්වා, ඒ 35දෙනා පත් කිරීමේදී පෞද්ගලික නීතිඥයන් හැටියට වැඩ කරන අයටත් ඒ සඳහා අවස්ථාවක් දෙන්න කියලා. ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අධිකරණ අමාත්‍යාංශයට වඩා ඒ බලය තිබෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු අග්‍ර විනිශ්චයකාරතුමාට හා අධිකරණ සේවා කොමිෂන් සභාවටයි. මේ හැම මන්ත්‍රීතුමෙක්ම ඉදිරිපත් කළ අදහස් පිළිබඳව එතුමන්ලා දැනුවත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, හිටපු ඇමති ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේත්, සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේත් විය යුතු වෙනස්වීම් සම්බන්ධයෙන් අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන්නට, සිවිල් නඩු විධාන සංග්‍රහය පනත සඳහා ගරු

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

අග්‍ර විනිශ්චයකාරතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවකුත්, අපරාධ නඩු විධාන සංග්‍රහයය පනත සඳහා නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් බුවනෙක අලුවිහාරේ මහතාගේ සභාපතිත්වයෙන් යුත් කමිටුවකුත් පත් කරලා තිබෙනවා. ඉදිරියේදී එම කමිටු වාර්තා සහ ඒ සම්බන්ධයෙන් කරන නිර්දේශවලට අවශ්‍ය අනුමැතිය ඇමති මණ්ඩලයෙන් ලබාගෙන කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමා විය යුතු දෙයක් විධියට ශ්‍රේෂ්ඨාධිකරණ රීති වෙනස් කිරීම සම්බන්ධයෙන් කථා කළා. ඒ සම්බන්ධයන් කියනවා නම්, අග්‍ර විනිශ්වයකාරතුමා විසින් කාලයෙන් කාලයට අවශ්‍ය රීති පිළිබඳව දැනුවත් කරලා, ඒවා අවශ්‍ය විධියට නිකුත් කරනු ලබන බව කියන්න කැමැතියි.

ගරු සභාපතිතුමනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාත් බොහොම හොඳ යෝජනා කීපයක් කළා. ඒ යෝජනාවලින් විශේෂයෙන්ම විනිශ්චයකාරතුමන්ලාගේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙනුත්, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව පිළිබඳවත් අදහස් ප්‍රකාශ කළා. ඒ කරුණු සම්බන්ධයන් මාත්, මට පෙර හිටපු ඇමතිතුමාත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාත්, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු අපි සියලුදෙනාත් ඉන්නේ එකම මතයකයි. මොකද, අවුරුදු 10ක් තිස්සේ ඒ අයට කිසිම විධියක වැටුප් වැඩිවීමක් වෙලා නැති නිසා. ඒ වාගේම පසු ගිය අවුරුදු 10 තුළ විය යුතුව තිබුණු දේවල් වුණේත් නැහැ. එම නිසා ඒ හැම දෙයකම දැනට තිබෙන ප්‍රමාණය මදියි කියන එකඟතාවට අපි කවුරුත් ඇවිල්ලා තිබෙනවා. මම මේ වෙලාවේ සන්තෝෂයෙන් මතක් කරන්නට ඕනෑ, ඒ සඳහා අවශ්‍ය පූර්ණ අනුමැතිය ගරු ජනාධිපතිතුමාගෙනුත්, ගරු අගමැතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයෙනුත්, මුදල් අමාත්‍යාංශයෙනුත් ලැබී තිබෙන බව. 2018 ජනවාරි මාසයේ 1වැනි දා සිට හෝ ඒ කටයුතු සාර්ථකව කරගන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ සම්බන්ධයෙන් පුංචි තාක්ෂණික ගැටලු කිහිපයක් තමයි තිබෙන්නේ. ඉතින්, ඒ සම්බන්ධයෙනුත් අපට යහපත් ප්‍රතිචාරයක් ලබාගන්න පුළුවන් වෙයි කියන විශ්වාසය තිබෙනවාය කියන එක මම මේ අවස්ථාවේ කියන්නට ඕනෑ.

ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කිව්වා, මහාධිකරණ විනිශ්චයකාරවරුන්ගේ පත්වීම්වල කටයුතු අවසන් කර නැහැයි කියලා. මේ වෙනකොට මහාධිකරණ විනිශ්චයකාරවරුන් සිටින ප්‍රමාණය 75 දෙනායි. සාමාන්‍ය සම්ප්‍රදාය තමයි, එයින් 74දෙනෙක් පත් කරන එක. මේ වෙනකොට 73දෙනෙක් පත් කරලා තිබෙනවා. මා හිතන හැටියට හෙට අනිද්දා වෙනකොට වැඩි කරපු ප්‍රමාණයටත් එක්කම තව එක්කෙනෙක් පත් කරන්න ඉඩ කඩ තිබෙනවා.

ශ්‍රේෂ්ඨාධිකරණය තුළ මූලික අයිතිවාසිකම් පෙත්සම් විශාල ප්‍රමාණයක් ගොඩගැසී තිබෙනවා, ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී සැහෙන කාලයක් ගතවෙනවා කියලාත් එතුමා කිව්වා. මගේ ළඟ ඒ සම්බන්ධ ගොඩක් විස්තර තිබෙනවා. මේ වෙලාවේ මම ඒ විස්තර සභාගත කරන්න බලාපොරොත්තු වෙනවා. නමුත්, ඒවා කෙරෙන්නේ ව්‍යවස්ථා වෙනස්කම් එක්කයි කියන එක තමයි එතුමා කියපු අනෙක් කරුණු සම්බන්ධයෙන් අපට කියන්න තිබෙන්නේ. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය සම්බන්ධයෙන් කටයුතු සිදු කෙරෙන්නේ ව්‍යවස්ථානුකූලවයි කියන එක මතක් කරන්න ඕනෑ. මේ වෙනකොට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කෙරෙමින් තිබෙන නිසා, අලුත් ව්‍යවස්ථාවට ඇතුළු වන අංග හැටියට ඒ කරුණු ඇතුළත් කර තිබෙනවාය කියන එක අපට දැනගන්නට ලැබී තිබෙනවා. ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා දිගින් දිගටම විනිශ්චයකාරතුමන්ලාගේ කටයුතු සම්බන්ධයන් කථා කළත්, මට මේ වෙලාවේදී කියන්න තිබෙන්නේ, විනිශ්චයකාරතුමන්ලා පාලනය කිරීම අධිකරණ අමාත්‍යාංශයට භාර කටයුත්තක් නොවෙයි කියන එකයි. ඒ සඳහා තමයි අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවා තිබෙන්නේ. විශේෂයෙන්ම මේ ඉදිරිපත් කරන අදහස් පිළිබඳව දැනුවත් කිරීමක් පමණක් කරන්නට පුළුවන්ය කියන එක එතුමාට මේ අවස්ථාවේ දී දන්වන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. අපේ ගරු වාසුදේව නානායක්කාර මැතිතුමාත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගැන ගොඩක් කථා කළා. එතුමා මට ලිඛිතවත් විස්තරයක් එව්වාම මා එතුමා දැනුවත් කළා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්වාධීන කොමිෂන් සභාවක් හැටියට ගරු ජනාධිපතිතුමා යටතේයි පවතින්නේ කියලා. ඒ සම්බන්ධයෙන් ඕනෑම පැමිණිල්ලක් කරන්නටත් පුළුවන්.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටවූ ස්වාධීන කොමිෂන් සභා සියල්ලේම වැඩ කටයුතු මේ වනකොට ස්වාධීනව කෙරෙනවාය කියන එක වග කීමක් ඇතිව අපට කියන්නට පුළුවන්. මේ අවස්ථාවේ දී වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාට මා මතක් කරන්න කැමැතියි, එතුමාටත් සාමාන්‍ය පුරවැසියකු හැටියට හෝ මේ කොමිෂන් සභාවට කරුණු දක්වන්න පුළුවන් බව. කවුරුන් මොන වාගේ චෝදනා ඉදිරිපත් කළත්, COPE එකේදී මතු වූ යම්කිසි ගනුදෙනුවක් සම්බන්ධයෙන් රටේ දෙවන පුරවැසියා වන ගරු අගමැතිතුමා අද කමිටුව ඉදිරියට ගියා. මේවා ඉතිහාසයේ මනුෂ්‍යයෙක් හීනෙකින්වත් හිතපු නැති දේවල්. ඕනෑම කෙනකුට තමන්ගේ අයිතිය වෙනුවෙන් වැඩ කටයුතු කරන්නට, ස්වාධීනව තමන්ගේ අයිතිය ආරක්ෂා කර ගන්නට, මේ හැම එකකටම අද වාතාවරණය තිබෙනවාය කියලා අපට කියන්නට පුළුවන්. මේ රජය ඒ වෙනුවෙන් පෙනී සිටින රජයක් වීම ගැන මා සන්තෝෂ වනවා. අපේ උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා මොන වාගේ දේවල් කියන්න උත්සාහ කළත්, මේ වැඩ කටයුතු ප්‍රශංසනීයයි කියලාත් අවසානයේ දී එතුමා කිව්වා.

ඉතිහාසයත් එක්ක බලනකොට අද අපේ රට විශාල පරිවර්තනයකට පත් වෙලා තිබෙන බව බොහොම පැහැදිලිව කියන්නට ඕනෑ. කර තිබෙන හැම දෙයක්ම අපට එකවර කරකවන්නට බැහැ. රටේ ජනතාව පුරුදු වුණු විධියක් තිබෙනවා. ඒ ගොල්ලෝ බලාපොරොත්තු වන විධියක් තිබෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා, සාමාන්‍යයෙන් අද ඇමතිවරයකු දිහා බැලුවත්, සාමාන්‍ය ක්‍රමවේදයේ හැටියට, "මෙයාද, ඇමති?" කියලා අහන තත්ත්වයට අද මේ රට පත්වෙලා තිබෙනවාය කියලා. ඇමති කෙනකු වුණත්, අද සාමාන්‍ය සරල කෙනෙක් බවට පත්වෙලා තිබෙන එක ගැන රටේ ජනතාවත් සන්තෝෂ වන්න ඕනෑ; අපි සියලුදෙනාමත් සන්තෝෂ වන්න ඕනෑ; මේ අදහස් ප්‍රකාශ කරපු ඒකාබද්ධ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් සන්තෝෂ වන්න ඕනෑ. මොකද, ඉස්සර ඇමති මණ්ඩලයට බලයක් තිබුණේත් නැහැ. එක පවුලක් විතරයි බලය තබාගෙන සිටියේ. අද මේ හැම එකක්ම වෙනස් වෙලා තිබෙනවා. මෙහිදී අපේ දේශපාලන කුහකකමක්, වෛරයක් නැහැ. කාගෙන්වත් පළිගන්න අපට අවශ්‍ය නැහැ.

ගරු සභාපතිතුමනි, මේ පුංචි දූපතේ අපට සියලුම සම්පත් තිබෙනවා. දැනුම, මිනිස් ශ්‍රමය, හොඳ දේශ ගුණය, රට වටේම මුහුද, මේ හැම දෙයක්ම තිබෙනවා. මේ හැම සම්පතක්ම තිබෙන අපට දියුණු වෙන්න බැරි ඇයි? අපි තවම සමෘද්ධියෙන් ජීවත්වන, සහනාධාරවලින් ජීවත්වන රටක් බවට පත්වෙලා තිබෙන්නේ ඇයි? අපේ රට ආදර්ශයට ගෙන ගොඩ නැඟෙන්න ඕනෑය කියපු සිංගප්පූරුව, ආපසු කවදාවත් ශ්‍රී ලංකාව ආදර්ශයට ගනියි කියලා හිතන්න බැහැ. ඒ රටේ එවැනි පරිවර්තනයක් කරපු හිටපු අගමැති ලී ක්වාන් යූ මහත්මයාම ඒක ලියා තිබෙනවා. අපි මේවායින් දැන්

වෙනස් වන්නට ඕනෑ. දේශපාලන කුහකකම, වෛරය නැති කරන්න ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් එකතුවෙලා තිබෙනවා. මේ යන ගමනේ දී අපට නොයෙකුත් බාධා තිබෙන්න පුළුවන්. මොකද, සමහර අය කල්පනා කරන්නේ විශාල මුදල් සම්භාරයක් හම්බ කරගන්නේ කොහොමද, එක පවුලක් විතරක් හැදෙන්නේ කොහොමද කියන එක ගැන විතරයි.

විශේෂයෙන්ම මේ කාරණය පිළිබඳවත් මා මතක් කරන්න ඕනෑ. මගේ හිතවත් වෛද්‍ය නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කිව්වා, අය වැය යෝජනා එකක්වත් ඒ අනුව සිදු වෙලා නැහැයි කියලා. අය වැය ලේඛනය ඉදිරිපත් කළේත් 09 වැනි දා. තවම අපි අය වැය පිළිබඳව විවාදය පවත්වාගෙන යනවා. ඒවා එන අවුරුද්දේ කෙරෙන වැඩ. එතුමා මමත් එක්ක තරහ වන එකක් නැහැ. එතුමා හදිසියේ ඒ වාගේ කල්පනා කළේ මොකද කියලා මා දන්නේ නැහැ. විශේෂයෙන්ම අපේ රටේ තිබෙන-

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ඒ කිව්වේ පසුගිය අවුරුදුවල අය වැය.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
නැහැ, මේ අවුරුද්ද ගැන කිව්වේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමා නොවෙයි, ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කිව්වේ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු සභාපතිතුමනි, දැන් මේ හැම එකක්ම වෙනස් වෙන්න ඕනෑ කියන එකයි අපි කියන්නේ. නඩු ප්‍රමාද වීම ගැන රටේ ලොකු මතයක් තිබෙනවා, ඇයි මේ නඩු ටික ඉක්මනට අහලා ඉවර කරන්නේ නැත්තේ කියලා. අපි දන්නවා නීතිපති දෙපාර්තමේන්තුව විශාල කාර්ය භාරයක් කරන බව. ඒ අයට විසඳන්නට තිබෙන නඩු ප්‍රමාණය ඉතා විශාලයි. මීට අවුරුදු 10කට ඉස්සෙල්ලා තිබුණු තත්ත්වයත් නොවෙයි, මීට අවුරුදු 2කට ඉස්සෙල්ලා තිබුණු තත්ත්වයත් නොවෙයි අද තිබෙන්නේ. ජනගහනය වැඩි වෙලා තිබෙනවා; ගොනු වෙන නඩු ප්‍රමාණය ඊට වඩා වැඩි වෙලා තිබෙනවා. මේ හැම දෙයක්ම වැඩි වෙන කොට වැඩි වෙන්න ඕනෑ තැන්වල දේවල් වැඩි වුණේ නැහැ.

මට තිබෙන කනගාටුව මේකයි. නීතිපති දෙපාර්තමේන්තුව ස්වාධීන ආයතනයක් වෙන්න ඕනෑ කියලා මගේ හිතවත් ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා චෝදනා කරන විට, එතුමාට පොඩ්ඩක්වත් මතක් වුණේ නැහැ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා යටතේ තමයි පසු ගිය අවුරුදු 10ක කාලයක් - 2015 වර්ෂයට පෙර - නීතිපති දෙපාර්තමේන්තුව තිබුණේ කියලා. ඇත්තටම එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ඉඳලාම තමයි නීතිපති දෙපාර්තමේන්තුවට අලුත් ගොඩනැඟිලි හදන්න, අලුතෙන් නීතිඥයින් බඳවා ගන්න, අනෙකුත් සම්පත් ලබා දෙන්න අවශ්‍යව තිබුණේ.

අපි දන්නවා, අද සමහර රජයේ නීතිඥවරුන්ට පිට පළාත්වලට ගියාම ඉන්න තැනක්වත් නැති බව. සමහර අයට යන්න එන්න වාහනයක් නැහැ. මෙවැනි ප්‍රශ්න තිබෙන බව අපි දන්නවා. මේවා ඔක්කෝම අපට එක රැයින් කරන්නත් අමාරුයි. ඒක නිසා ආංශික අධීක්ෂණ කාරක සභාවේ දී යෝජනාවක් කළා, තිබෙන අධික වැඩ ප්‍රමාණයත් සමඟ නීතිපති දෙපාර්තමේන්තුවට අලුතෙන් නීතිඥයින් බඳවා ගන්න ඕනෑ කියලා. දැන් ඒ සඳහා අවශ්‍ය කටයුතු කරනවා. ඒ වාගේම එක කාමරයක හතර පස් දෙනෙකුට ඉඳගෙන වැඩ කටයුතු කරන්නට බැහැ.

මේ හැම එකක් දිහාම බලන කොට අපට කනගාටු හිතෙන්නේ, පසුගිය ආණ්ඩුව මේ සියල්ල පසෙකලා වෙන වෙන වැඩ කළ නිසා. උදාහරණයක් විධියට 300ක්, 400ක් පටවාගෙන ගුවන් යානයකින් එතුමා විදේශගත වන විට එතුමාට කල්පනා කරන්නට තිබුණා, "නීතිපති දෙපාර්තමේන්තුව මගේ යටතේ තිබෙනවා, මේකට මොකක් හරි කළොත්, අඩුම ගණනේ ඩෙස්ක්, පුටු ටිකක්වත් අරගෙන දුන්නොත් හොඳයි" කියලා. දැන් අපි මේ ප්‍රශ්න තේරුම් අරගෙන තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම මේ අමාත්‍යාංශය භාර අරගෙන මාස තුනයි. ඔබතුමාත් දන්නවා, අපි මේවා ගැන අධ්‍යයනය කරලා විය යුතු දේ මොනවාද කියලා කල්පනා කර බලා කටයුතු කළ යුතු බව. අපට මේවා අමතක කරලා ඉන්නට බැහැ. ඇයි නඩු ප්‍රමාද වෙන්නේ? ඊයේ පෙරේදා එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරි මණ්ඩලයේ මධ්‍යම කාරක සභාවේ දී නඩු ප්‍රමාදය පිළිබඳව කථා බහක් සිදු වුණා. අපේ නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමාගෙන් ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉල්ලුවා. එතුමා කිව්වා, දූෂණ චෝදනා 92ක පරීක්ෂණ කටයුතු අවසන් කරලා නීතිපතිතුමාට යවලා තිබෙනවා කියලා. මමත් ඒ කරුණු සොයා බැලුවා. එයින් 18කට, 20කට විතර නඩු දාලා තිබෙනවා. සමහර විට මේ පරීක්ෂණ 92ම ඉස්සරහාට ගෙන යන්නට බැරි ඒවා වෙන්න පුළුවන්. ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් කිව්වේ මොක්කද? එතුමා කිව්වා නීතිපතිතුමාව සිරිකොතට ගෙනාවා කියලා. අධිකරණ තුනක් පිහිටුවන්නට තීරණය කළේ සිරිකොතේදී කථා කරලා කියලා එතුමා කිව්වා. ගරු සභාපතිතුමනි, අධිකරණ තුන පිහිටුවීම සහ ඒ සඳහා උපදෙස් දේශපාලන අධිකාරියෙන් ගන්න අවශ්‍ය නැහැ. නඩු ප්‍රමාද වීම පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපේ අධිකරණ ක්ෂේත්‍රය නියෝජනය කරන අග්‍රවිනිශ්චයකාරතුමා, නීතිපතිතුමා වාගේ හැම කෙනෙකුගෙන්ම අදහස් විමසා බලලා, මම පසුගිය මාසයේ 07වෙනි දා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. මොකද, ආංශික අධීක්ෂණ කාරක සභාවේ දී දූෂණ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරන එක උසාවියක් පමණයි යෝජනා කරලා තිබුණේ. මම උසාවි තුනක් යෝජනා කළා. මම ගරු මංගල සමරවීර ඇමතිතුමාගෙන් ඇහුවා, අපට මේවා 2018 ජනවාරි මාසයේ පටන් ගන්නට මුදල් දෙන්න පුළුවන්ද කියලා. එතුමා අපට 09වෙනි දා ඉදිරිපත් කළ අය වැය හරහා රුපියල් මිලියන 25ක මුදලක් අනුමත කරලා දීලා තිබෙනවා. එතකොට අනෙක් පැත්තෙන්-

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමිය මාගේ නම සඳහන් කළ නිසා පොඩි පැහැදිලි කිරීමක් කරන්නම්, ගරු සභාපතිතුමනි. ඇත්තටම ඔබතුමියට හොඳ recommendation එකක් දුන්නා, අධිකරණ අමාත්‍යාංශයේ කටයුතු කරගෙන යන්නට ඔය ප්‍රඥාව ඇති වෙයි කියලා . මම කිව්වේ, 2018 අය වැය යෝජනා ගැන නොවෙයි. ඒවා ක්‍රියාත්මක වෙයි කියලා කවුරුවත් බලාපොරොත්තු වෙන්නේ නැහැනේ. මා කිව්වේ, ඔබතුමියලාගේ ආණ්ඩුවේ 2016 සහ 2017 වර්ෂවල අය වැය යෝජනා ප්‍රමාණයක් ක්‍රියාත්මක වුණේ නැහැයි කියලා. ඔබතුමිය වැරැදියටයි තේරුම් ගෙන තිබෙන්නේ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
සමාවෙන්න ඕනෑ එහෙම නම්. එතැන ප්‍රශ්නයක් තිබෙනවා. මට ඉතින් ඒවාට උත්තර දෙන්නට බැහැ නේ. [බාධා කිරීමක්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමිය කතා කරන්න.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
එතුමා මගේ යාළුවා නේ.

ගරු සභාපතිතුමනි, මහාධිකරණ විනිශ්චයකාරවරුන් 10 දෙනකු වැඩි කරන්න කියා ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් කිව්වත් අපි අද මහාධිකරණ විනිශ්චයකාරවරුන් 35දෙනකු වැඩි කරගෙන තිබෙනවා. ඒ පත්වීම් කෙරෙන්න ඕනෑ. ඒ පත්වීම් කරන අයට ඒ සම්බන්ධයෙන් කාල වේලාවක් අවශ්‍ය වනවා. අවශ්‍ය ඉඩ ප්‍රමාණය ලැබෙන්න ඕනෑ. අපි ඒවා හැම එකක්ම හෙමිහිට කරගෙන යනවා. නමුත් මේ ගරු සභාවේදී කිව්වා, සිරිකොතට නීතිපතිතුමා ගෙන්නලා එතැනදී තීරණයක් ගත්තා කියා. මං පත්තර ඔක්කෝම වාගේ ගෙන්වාගෙන ඒ සම්බන්ධයෙන් තිබෙන ලිපි බැලුවා. මෙතැන තිබෙනවා, "ජන යුගය", "ලක්බිම", "දිවයින", "මව්බිම" පත්තර. එතුමා කරුණු උපුටා දක්වපු "ලංකාදීප" පත්තරයත් තිබෙනවා. මේ එකකවත් සඳහන් වෙලා නැහැ, නීතිපතිතුමා සිරිකොතට ආ එකක් ගැන. මේ එකකවත් සඳහන් වෙලා නැහැ, එය එතැනදී තීරණය කළා කියා. එතැනදී ස්තුතියක් ප්‍රකාශ කළා කියා විතරයි සඳහන් කර තිබෙන්නේ. සාගල රත්නායක අමාත්‍යතුමාගෙන් මේ කටයුතු සම්බන්ධයෙන් විස්තර අහලා, මෙහෙම දෙයක් කර තිබෙනවා, ඒ විධියට ඉදිරියට කටයුතු කරගෙන යන්න කියා අපේ අජිත් පී. පෙරේරා මහත්මයා ප්‍රශංසා කළා. එච්චරයි.

ගරු සභාපතිතුමනි, අපි මඩ ගහගන්න එක දැන් නතර කරන්න ඕනෑ. අපට දැන් වැඩ ගොඩක් කරන්න තිබෙනවා. නීති කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් අද මොකක්ද වෙලා තිබෙන්නේ? ලොකු මිනිසුන්ට, කොළඹ මිනිසුන්ට නම් එහි ප්‍රශ්නයක් නැහැ. නමුත් ගම්වල අහිංසක මිනිසුන්ගේ කාලය ඉවරයි, ශ්‍රමය ඉවරයි, මුදල ඉවරයි. බෙදුම් නඩුවක් එහෙම කියන්න අවුරුදු 50ක්, 60ක් විතර ගියා නම් ඒ මිනිසුන්ගේ මුළු ජීවිත කාලයම ඉවරටම ඉවරයි. අපි මේවා ගැන කල්පනා කරන්න ඕනෑ. අපි අලුතින් උසාවි හදන්න ඕනෑ; උසාවි වැඩි කරන්න ඕනෑ. බ්‍රිතාන්‍ය යුගයෙන් පසුව අප නිදහස් වන කොට තිබුණු උසාවි ප්‍රමාණය අදටත් ඇති කියා කවුරුන් හෝ සිතනවා නම්, ඒක වැරැදියි. අපි උසාවි සංඛ්‍යාව වැඩි කරගන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ඕනෑම මනුෂ්‍යයකුට වැඩ කරන්න පුළුවන් ප්‍රමාණයක් තිබෙනවා. එක විනිශ්චයකාරවරයකුට වැඩ කරන්න පුළුවන් ප්‍රමාණයක් තිබෙනවා. අවශ්‍ය නම් අපි තවත් විනිශ්චයකාරවරුන් බඳවාගැනීම කරන්න ඕනෑ. මේවා සම්බන්ධයෙන් කටයුතු කරන කොට නොයෙකුත් විධියේ චෝදනා කරන්න පටන් ගන්නවා. මේ රටේ අධිකරණය හෑල්ලු වන ඒ වාගේ කතන්දර මේ දේශපාලන මඩ ගොහොරුවේ ඉඳගෙන කියන නිසා අපට නොයෙකුත් විධියේ අවාසිදායක තත්ත්වයන් ඇති වෙනවා. අපි ඒ ගැන කනගාටු වෙනවා.

ගරු සභාපතිතුමනි, අපි දන්නවා, 2015 ජනවාරි 08වන දා වෙනසත් එක්ක අපේ රටට මේ ලෝකයේ ලැබුණු තත්ත්වය මොකක්ද කියා. මහින්ද රාජපක්ෂ මහත්මයා 2015 ජනවාරි 08වන දා ඡන්දයකට ගියේ -ජනාධිපතිවරණයට ගියේ- කැමැත්තෙන් නොවෙයි නේ. එතුමාව එතැනට තල්ලු කළා. එතුමාට ලෝකයෙන් කිසිම සහයෝගයක් ලැබුණේ නැහැ. අපේ රට කොන් වෙච්ච රටක් හැටියටයි තිබුණේ. අපේ රට එකම තැන පල් වන රටක් බවට පත් වෙමින් ආවා. ඉස්සරහට -එන මාසයේ- පඩි ගෙවාගන්නේ කොහොමද කියන තත්ත්වයකට පත්වූ නිසා තමයි එතුමාට ඒ ඡන්දය තියන්න වුණේ. එහෙම නැත්නම් එතුමා කීයටවත් කැමැත්තෙන් ඒ ඡන්දය තියන්නේ නැහැ නේ. අපි දන්නවා ඒ ඡන්දය තියන්න එපා කියා එතුමාට ලොකු විරෝධයක් ආ බව. හැබැයි එතුමා සිතුවා, 'හිර වෙච්ච නිසා ඉස්සරහට යන්න බැරි හින්දා අපි ඡන්දය තියනවා' කියා. අපි දැන් මේ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. අපට අහිමි වෙලා තිබුණු සහන දැන් ලැබෙමින් පවතිනවා. මා විශේෂයෙන් කියන්න ඕනෑ, මිනිස් ජාවාරමට ලක්වූ රටක් හැටියට නම් ලැබූ අපේ රටට අවුරුදු 4කට පසුව ගිය අවුරුද්දේ තමයි එයින් පොඩ්ඩක් හෝ වෙනස් වෙන්න පුළුවන් වුණේ කියා. මිනිස් ජාවාරම ආදි කාරණා නිසා අපට සම්බාධක පනවා තිබෙනවා. මේ තත්ත්වයෙන් මිදෙන්න අපිත් කැමැතියි.

ගරු මලික් සමරවීර අමාත්‍යතුමා -එතුමාගේ අමාත්‍යාංශය- පිට රටවල් එක්ක සම්බන්ධ වෙලා මේ රටට ආයෝජකයන් ගෙන එන්න උත්සාහ කරනවා. ආයෝජකයන් එන්න ඉස්සර වෙලා ගොඩක් දේවල් බලනවා.

ගරු සභාපතිතුමනි, හම්බන්තොට සිද්ධිය ගැන අපේ මන්ත්‍රීතුමෙක් සඳහන් කළා. හම්බන්තොට සිද්ධිය වුණේ ඉන්දියානු කොන්සල් කාර්යාලය අසලයි. එවිට පණිවිඩය යන්නේ වෙනස් විධියකටයි. මා දන්නේ නැහැ අර කියපු, පොලිසියේ කතාව මොකක්ද කියා. නමුත් SAITM විරෝධි පා ගමන්වලට ඕනෑ තරම් ඉඩ දුන්නා නේ. ඉස්සර වාගේ කවුරුවත් වෙඩි තියලා මරා දැම්මේ නැහැ නේ. හැම දාම SAITM විරෝධි උද්ඝෝෂණ. ඒ නිසා මනුස්සයකුට පිටකොටුවට යන්න බැරි වුණා; වැඩක් කරගන්න බැරි වුණා. උද්ඝෝෂකයන් කොයි පැත්තෙන් එනවාද දන්නේ නැහැ. කොළඹට ගියාම, ආයෙත් කොල්ලුපිටිය පැත්තට යන්න බැහැ. මේ වාගේ නොයෙකුත් අපහසුතාවලට රටේ ජනතාව පත් වුණා නේ. එහෙම වුණා කියා ඒවාට ගහන්න, ඒවා මර්දනය කරන්න කවුරුවත් ගියේ නැහැ නේ. හම්බන්තොට සිද්ධියේ මොකක් හෝ ඇති. අපිම කිව්වා, "කිසි වැඩකට නැති වරායක් හැදුවා" කියා. හැබැයි ඉතින්, වරාය අයින් කර දමන්න බැහැ නේ. එය ක්‍රියාකාරි වරායක් බවට පත් කරන්න ඕනෑ. මත්තල ගුවන් තොටුපොළ ගත්තත් එහෙමයි. ඒවා ඔක්කෝම පවත්වාගෙන යන්න ඕනෑ. ඒවාට අවශ්‍ය ආයෝජන ගෙනැල්ලා, කර්මාන්ත ගෙනැල්ලා වැඩ කටයුතු කරගෙන යන්න තිබෙනවා. නමුත් අර ඉහතින් කිව්වා වාගේ තත්ත්වයක් දැක්කාම එන්න සිටින විදේශ ආයෝජකයකුවත් මේ රටට එන්නේ නැහැ. මේක තමයි අප තේරුම් ගත යුතු, මෙහි තිබෙන යථාර්ථය.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අමාත්‍යතුමියනි, ඔබතුමියට තවත් විනාඩි 5ක කාලයක් තිබෙනවා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
හොඳයි, ගරු සභාපතිතුමනි.

ගරු ගම්මන්පිල මන්ත්‍රීතුමා දිගින් දිගටම නීතිපතිතුමාට නොයෙකුත් ආකාරයෙන් චෝදනා කළා. අපි එතුමාට කියනවා ඒ තනතුර හෑල්ලු කරන්න එපා කියලා. අපි දන්නේ නැහැ, මොන හේතුවක් නිසා සුහද ගම්මලත් මහත්මයාට -ඒක එතුමාගේ කටින් පැන්නා.- නීතිපති තනතුර නො ලැබුණාද කියන එක. ඔබතුමන්ලාත් දන්නවා, දැන් ඒවා තීරණය කරන්නේ ව්‍යවස්ථාදායක මණ්ඩලයක් මඟින් බව. ඒ ව්‍යවස්ථාදායක මණ්ඩලයත් පහත් කරලා අද එතුමා කථා කළා. ව්‍යවස්ථාදායක මණ්ඩලයේ ඉන්නේ ප්‍රවීණයින්. දේශපාලනඥයින් නොවෙයි. ඒ ප්‍රවීණයින් කල්පනා කරලා හොඳ දේ තමයි කරන්නේ.

දැන් එතුමාට අමතක වෙලා තිබෙනවා, මොහාන් පීරිස් මහත්තයා ආපු විධිය. හිටපු අධිකරණ ඇමතිතුමා අදටත් සාමාජිකයෙක් ඒකේ. මොහාන් පීරිස් මහත්තයා සෙලාන් බැංකුවේ සභාපති වෙලා ඉඳලා, අපරාධ නඩු ගණනාවකට පෙනී සිටි නීතිඥයා හැටියට පෞද්ගලික අභිමතය පරිදි පත් කළා නීතිපති හැටියට. අද ඉන්න අග්‍ර විනිශ්වයකාරතුමා තමයි එදා නීතිපති වෙන්න තිබුණේ. එතුමාට අවස්ථාව දුන්නේ නැහැ. ප්‍රියසාද් ඩෙප් අග්‍ර විනිශ්වයකාරතුමාත් කාලයක් තිස්සේ යම්කිසි බලාපොරොත්තුවක් තියාගෙන නේ ඉන්න ඇත්තේ.

දැන් අද ජයන්ත ජයසූරිය මහත්තයාව කවුරුවත් පිටින් ගෙනැල්ලා නැහැනේ. එතුමා නීතිපති දෙපාර්තමේන්තුවේ හිටපු නිලධාරියෙක්. ඉන්න විනිශ්වයකාරවරුන්ට වාගේම නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ටත් තැනක් තිබෙන්න ඕනෑ. සමහර කරුණු සලකා බලපුවාම, ජීවිතේට නීතිපති දෙපාර්තමේන්තුවේ මහත්මයෙකුට ඇපැල් උසාවියට යන්න බැහැ. ජ්‍යෙෂ්ඨත්වය, ඒවා මේවා බලන කොට තමන්ගේ කාලය එනකොට විශ්‍රාම යන විධියටයි වැඩ කෙරිලා තිබෙන්නේ. එහෙම නැතිව අපි බොහොම හොඳින් මේ කටයුතු කරගෙන යන්නයි මේ උත්සාහ කරන්නේ.

දැන් බලන්න, මේ රටේ දෙවැනි පුරවැසියායි අද Bond Commission එකට ගියේ. නීතිපති දෙපාර්තමේන්තුව කියන්නේ රජය වෙනුවෙන් නීති කටයුතුවලට මැදිහත් වෙන දෙපාර්තමේන්තුව. ජනාධිපතිතුමා වෙනුවෙන් ඉන්නත් ඕනෑ; අගමැතිතුමා වෙනුවෙන් ඉන්න ඕනෑ; ඇමතිවරු හැටියට ඉන්න අපි වෙනුවෙනුත් ඉන්න ඕනෑ. මොකක් හෝ රජය පැත්තෙන් වෙනවා නම් ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුයි. ඉතින් එතුමා යන්නේ නැතිව කාටද යන්න පුළුවන්? දප්පුල ද ලිවේරා මැතිතුමා යැව්වාට ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත්, අපි යන කොට දප්පුල ද ලිවේරා මැතිතුමාට යන්න පුළුවන් වේවි. හැබැයි, අගමැතිතුමා යන කොට ඒක කරන්න බැහැනේ. ඉතින් මේ ගැන ඇතැම් අය අද අසත්‍ය කථා හදනවා. නීතිපතිතුමාට ස්වාධීනව ඒ වැඩ කටයුතු කරගෙන යන්න අද අවස්ථාව තිබෙනවා. මා විශ්වාස කරනවා නීතිපති දෙපාර්තමේන්තුවට කවදාවත් තිබුණේ නැති විධියේ ස්වාධීනත්වයක් 2015 ජනවාරි 08වැනිදායින් පස්සේ ඇති වෙලා තිබෙනවා කියන එක. අපි ඒ සම්බන්ධයෙන් සන්තෝෂ වනවා. අපට ඒක හිතට එකඟව කියන්න පුළුවන්. මේ කටයුතු හරියට කෙරෙන නිසා අද ගොඩක් අයට කියන්න කථාන්දර නැහැ.

එක් ගරු මන්ත්‍රීතුමෙක් පත්තර කෑලි ටිකක් හොයා ගෙන ඇවිත් කරුණු ඉදිරිපත් කළා. ඒ එක පත්තරයකවත් නැහැනේ, සිරිකොතට නීතිපතිතුමා ආවායි, එදා අධිකරණ තුනක් පිහිටුවන්න තීරණය කළායි කියලා. එදා ඒ සම්බන්ධයෙන් ප්‍රශංසා කළාය කියන එකයි තිබෙන්නේ. මේ ඔක්කෝම ලංකාවේ මිනිස්සු කියවන පත්තර.

අනෙක් පැත්තෙන් බැලුවාම නීතිපතිතුමාට මෙහෙම කියන කොට මොහාන් පීරිස් මහත්තයලාවත් අපි අමතක කරන්න හොඳ නැහැ. එදා මහින්ද රාජපක්ෂ මහත්තයාගේ හිටපු ආරක්ෂක නිලධාරියෙක් තමයි නිව්ටන් කියන්නේ. මොකක්ද වුණේ? මරණ දඬුවම තිබුණා; අපරාධ නඩුව තිබුණා, නීතිපති දෙපාර්තමේන්තුවේ. එතුමා ගිය ගමන් අධි චෝදනා පත්‍රය අයින් කරලා නිදහස් කළා. ඊට පස්සේ ගිහිල්ලා අඟුලානේ මිනී මැරුවා. අද මරණ දඬුවම ලබා සිරගෙදර ඉන්නවා. ඒවා හොඳ වැඩ ද? මේ වාගේ ඒවා අපට ගොඩක් කියන්න පුළුවන්. නමුත්, මේවා කියාගෙන, දෙපැත්තේ අය මඩ ගහගෙන අපි එක තැන පල් වෙන රටක් බවට පත් නොවී නවීන විධියට හිතලා, අලුත් දේවල්වලට ගිහිල්ලා මේ වැඩ කටයුතු හොඳින් කර ගන්නට ඕනෑ. කාගෙන්වත් පළි ගන්නවත්, කා එක්කවත් තිබෙන තරහා පිරිමසා ගන්නවත් නොවෙයි, කටයුතු කරන්න ඕනෑ.

ඊළඟට කිව්වා, අකැමැති විනිශ්වයකාරවරුන් පත් කරන්නේ නැහැ, ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ ඉන්න අය පත් කරනවා කිව්වා. විනිශ්වයකාරවරුන් කියන්නේත් සාමාන්‍ය මනුෂ්‍යයින්. පෘථග්ජන මිනිස්සු. අපි අතින් වැරදි සිදු වෙන්න පුළුවන්. අපේ ආසාවන් වෙනස් වෙන්න පුළුවන්. මේ නොයෙක් කාරණා සම්බන්ධයෙන් අග්‍ර විනිශ්වයකාරතුමාට යන පැමිණිලි මටත් එවනවා. අපට ඒවා සම්බන්ධයෙන් කටයුතු කරන්න බැරි වුණත්, ඒ පැමිණිලි හැම එකක්ම එතුමා කියවනවා ඇති. එතකොට ඉහළ අධිකරණවලට promotions දෙන කොට මේවා සැලකිල්ලට ගන්නවා. මා එක දෙයක් කියන්න ඕනෑ. මේ රටේ අධිකරණ හැල්ලු කරපු විශාලතම -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමියනි, වේලාව අවසන්.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු සභාපතිතුමනි, අධිකරණය හොඳටම හැල්ලු කළේ ශිරානි බණ්ඩාරනායක අග්‍රවිනිශ්වයකාරතුමිය ගෙදර යවලා. එදා තිබුණු තත්ත්වය අපි දැක්කා නේ. එදා පාර්ලිමේන්තුවට ගෙන්වපු වෙලාවේ එතුමියට කථා කළේ, "තමුසේ" කියලායි. නිලතල දරන මිනිසුන්ව මොනම හේතුවකටවත් එහෙම හැල්ලු කරලා, දේශපාලන වශයෙන් තළා පෙළා කටයුතු කරන්න ගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා සහ ඇමති මණ්ඩලය ඇතුළු මේ රජය සූදානම් නැහැ කියලා මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා.

මම මේ අවස්ථාවේදී හිටපු අධිකරණ අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමාව විශේෂයෙන්ම මතක් කරනවා. මොකද, 2015 ජනවාරි 08 වැනි දායින් පස්සේ අධිකරණ ඇමතිවරයා හැටියට එතුමා විශාල වැඩ කොටසක් කරගෙන ඇවිල්ලා තිබෙනවා. මම අපේ රජයේ සියලුදෙනා වෙනුවෙන් එතුමාටත් මේ අවස්ථාවේදී ස්තුතිය පුද කරනවා. ඒ වාගේම අධිකරණ අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමා වන අපේ ජයමාන්න මැතිතුමාටත් මා විශේෂයෙන්ම ස්තුති කළ යුතුයි. එතුමා ඉතාම උනන්දුවෙන්, වුවමනාවෙන් හා මහන්සියෙන් රාජකාරි කටයුතු කරනවා. නොයෙකුත් අවස්ථාවල අපි රෑ වන තුරු වැඩ කළා. ඒ හැම වෙලාවකම එතුමා ඇතුළු, අපේ අතිරේක ලේකම්තුමිය හා ලේකම්තුමන්ලා, සහකාර සහ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු සියලුදෙනාම ඉතාම හොඳින්, බොහොම සුහදව කටයුතු කළා. සියලුදෙනාම විය යුතු දේ හොඳින් කරගෙන යනවා. ඒ වාගේම අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන අනෙක් ආයතනවල නිලධාරිනුත් ඒ විධියටම හැම කෙනෙකුගේම සහයෝගය ඇතිව බොහොම හොඳින් වැඩකටයුතු කරගෙන යනවා. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය දැක්වූ සහයෝගයට නැවත වාරයක් කෘතවේදීව මගේ ස්තුතිය පුද කරනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමා වැඩිපුර කාලය ලබා දුන්නාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තුතියි. එක මිනිත්තුවයි වැඩි වුණේ.

"110 වන ශීර්ෂයෙහි 01වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 922,600,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

110 වන ශීර්ෂයෙහි 01වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන -මූලධන වියදම, රු. 144,350,000

"110 වන ශීර්ෂයෙහි 01වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 144,350,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

110 වන ශීර්ෂයෙහි 01වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**205 වන ශීර්ෂය .- මහා භාරකාර දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන. - මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.59,235,000

"205 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.59,235,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

205 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන. - මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.6,800,000

"205 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.6,800,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

205 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**228 වන ශීර්ෂය.- අධිකරණ පරිපාලනය**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.5,825,312,000

"228 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.5,825,312,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

228 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.2,235,650,000

"228 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.2,235,650,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

228 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**229 වන ශීර්ෂය.- නීතිපති දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.739,300,000

"229 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.739,300,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

229 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.484,500,000

"229 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.484,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

229 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**230 වන ශීර්ෂය.- නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.102,792,000

"230 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.102,792,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

230 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.38,200,000

"230 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.38,200,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

230 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**231 වන ශීර්ෂය.- ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.27,720,000

"231 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.27,720,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

231 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.850,000

"231 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.850,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

231 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 233 වන ශීර්ෂය.- රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 263,855,000

"233 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.263,855,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

233 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු. 98,500,000

"233 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.98,500,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

233 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 234 වන ශීර්ෂය.- ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.169,912,000

"234 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.169,912,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

234 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.8,865,000

"234 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.8,865,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

234 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 235 වන ශීර්ෂය.- නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.19,520,000

"235 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.19,520,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

235 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.1,950,000

"235 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.1,950,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

235 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 110, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 922,600,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 110, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 144,350,000

"தலைப்பு 110, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 144,350,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 110, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

### தலைப்பு 205.- பொது நம்பிக்கைப் பொறுப்பாளர் திணைக்களம்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 59,235,000

"தலைப்பு 205, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 59,235,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 205, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 6,800,000

"தலைப்பு 205, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 6,800,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 205, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

### தலைப்பு 228.- நீதிமன்ற நிருவாகம்

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 5,825,312,000

"தலைப்பு 228, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 5,825,312,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 228, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 2,235,650,000

"தலைப்பு 228, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 2,235,650,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 228, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 229.- சட்ட மாஅதிபர் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 739,300,000

"தலைப்பு 229, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 739,300,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 229, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 484,500,000

"தலைப்பு 229, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 484,500,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 229, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 230.- சட்டவரைஞர் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 102,792,000

"தலைப்பு 230, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 102,792,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 230, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 38,200,000

"தலைப்பு 230, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 38,200,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 230, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 231.- கடன் இணக்கச்சபைத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 27,720,000

"தலைப்பு 231, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 27,720,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 231, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 850,000

"தலைப்பு 231, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 850,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 231, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 233.- அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 263,855,000

"தலைப்பு 233, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 263,855,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 233, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 98,500,000

"தலைப்பு 233, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 98,500,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 233, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 234.- உயர் நீதிமன்றப் பதிவாளர் அலுவலகம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 169,912,000

"தலைப்பு 234, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 169,912,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 234, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 8,865,000

"தலைப்பு 234, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 8,865,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 234, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 235.- சட்ட ஆணைக்குழு திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 19,520,000

"தலைப்பு 235, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 19,520,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.

தலைப்பு 235, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,950,000

"தலைப்பு 235, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 1,950,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 235, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 922,600,000, for Head 110, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 110 Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 144,350,000

Question, "That the sum of Rs. 144,350,000, for Head 110, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 110, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 205.- DEPARTMENT OF PUBLIC TRUSTEE

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 59,235,000

Question, "That the sum of Rs. 59,235,000, for Head 205, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 205, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 6,800,000

Question, "That the sum of Rs. 6,800,000, for Head 205, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 205, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 228.- COURTS ADMINISTRATION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 5,825,312,000

Question, "That the sum of Rs. 5,825,312,000 for Head 228, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 228, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 2,235,650,000

Question, "That the sum of Rs. 2,235,650,000 for Head 228, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 228, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 229.- DEPARTMENT OF ATTORNEY GENERAL

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 739,300,000

Question, "That the sum of Rs. 739,300,000, for Head 229, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 229, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 484,500,000

Question, "That the sum of Rs. 484,500,000, for Head 229, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 229, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 230.- DEPARTMENT OF LEGAL DRAFTSMAN

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 102,792,000

Question, "That the sum of Rs. 102,792,000, for Head 230, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 230, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 38,200,000

Question, "That the sum of Rs. 38,200,000, for Head 230, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 230, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 231.- DEPARTMENT OF DEBT CONCILIATION BOARD

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 27,720,000

Question, "That the sum of Rs. 27,720,000, for Head 231, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 231, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 850,000

Question, "That the sum of Rs. 850,000, for Head 231, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 231, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 233.- DEPARTMENT OF GOVERNMENT ANALYST

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 263,855,000

Question, "That the sum of Rs. 263,855,000, for Head 233, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 233, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 98,500,000

Question, "That the sum of Rs. 98,500,000, for Head 233, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 233, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 234.- REGISTRAR OF SUPREME COURT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 169,912,000

Question, "That the sum of Rs. 169,912,000, for Head 234, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 234, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 8,865,000

Question, "That the sum of Rs. 8,865,000, for Head 234, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 234, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 235.- DEPARTMENT OF LAW COMMISSION

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 19,520,000

Question, "That the sum of Rs. 19,520,000, for Head 235, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 235, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 1,950,000

Question, "That the sum of Rs. 1,950,000, for Head 235, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 235, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

"195 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම් සඳහා රු.267,110,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

195 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.309,850,000

"195 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.309,850,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

195 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.277,000,000

"195 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.277,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

195 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු.1,180,000,000

"195 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.1,180,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

195 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**296 වන ශීර්ෂය.- ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු.60,690,000

"296 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු.60,690,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

296 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම, රු.2,350,000

"296 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු.2,350,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

296 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 195, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 267,110,000 அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 195, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 309,850,000

"தலைப்பு 195, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 309,850,000அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 195, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 277,000,000

"தலைப்பு 195, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 277,000,000அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 195, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,180,000,000

"தலைப்பு 195, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 1,180,000,000அட்டவணையிற் சேர்க்கப் படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 195, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 296.- இறக்குமதி மற்றும் ஏற்றுமதி திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 60,690,000

"தலைப்பு 296, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 60,690,000அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 296, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 2,350,000

"தலைப்பு 296, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 2,350,000அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 296, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs, 267,110,000, for Head 195, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 195, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 309,850,000

Question, "That the sum of Rs. 309,850,000, for Head 195, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 195, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Recurrent Expenditure, Rs. 277,000,000

Question, "That the sum of Rs. 277,000,000, for Head 195, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 195, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 1,180,000,000

Question, "That the sum of Rs. 1,180,000,000, for Head 195, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 195, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 296.- DEPARTMENT OF IMPORTS AND EXPORTS CONTROL

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 60,690,000

Question, "That the sum of Rs. 60,690,000, for Head 296, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 296, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 2,350,000

Question, "That the sum of Rs. 2,350,000, for Head 296, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 296, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

"කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයිද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය"යි ද මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ. භා. 5.25ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.***

***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2017 නොවැම්බර් 21වන අඟහරුවාදා.***

*பி.ப. 5.25 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும்பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*
*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2017 நவம்பர் 21, செவ்வாய்க்கிழமை.*

*At 5.25 p.m., the Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Tuesday, 21st November, 2017.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
න්‍යාය පත්‍රයේ විෂය අංක 2 අනුමත කිරීම.

## ආනයන හා අපනයන (පාලන) පනත: නියෝග
## இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் (கட்டுப்பாடு) சட்டம்: ஒழுங்குவிதிகள்
## IMPORTS AND EXPORTS (CONTROL) ACT: REGULATIONS

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Development Strategies and International Trade, I move,

> "That the Regulations made by the Minister of Development Strategies and International Trade under Section 20 read with Subsection (3) of Section 4 and Section 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 relating to Special Import License Fee and published in the Gazette Extraordinary No. 2039/4 of 02nd October 2017, which were presented on 07.11.2017, be approved.
>
> (Cabinet approval signified.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.26ට, 2017 නොවැම්බර් 15 වන දින සභා සම්මතිය අනුව 2017 නොවැම්බර් 21 වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 5.26 மணிக்கு பாராளுமன்றம், அதனது 2017 நவம்பர் 15 ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க, 2017 நவம்பர் 21, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 5.26 p.m. until 9.30 a.m. on Tuesday, 21st November, 2017 pursuant to the Resolution of Parliament of 15th November, 2017.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව **www.parliament.lk** වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.